2027

අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ශ්‍රී ලංකාව**

2026 නොවැම්බර් 12



අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2027

අනුර කුමාර දිසානායක,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය,
ශ්‍රී ලංකාව

2026 නොවැම්බර් 12

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරන ලදී.

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදුව, කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණාලයේ මුද්‍රණය කර, ශ්‍රී ලංකාව, කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.

පටුන

පිටුව

මූලික ආර්ථික දර්ශක vii

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කළයුතු වාර්තා viii

අනුකූලතාවය – 2026 x

I කොටස

01. මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය

1.1 සමාලෝචනය 3

1.2 සාර්ව රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය 7

1.3 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය 10

II කොටස

02. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

2.1 සමාලෝචනය 25

2.2 රාජ්‍ය ආදායම 29

2.3 රාජ්‍ය වියදම 45

2.4 මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය 47

2.5 රාජ්‍ය ණය කළමනාකරණය 49

2.6 විදේශ මූල්‍යයනය 49

03. ආර්ථික උපනතීන්

3.1 සමාලෝචනය 55

3.2 ආර්ථික වර්ධනය 57

3.3 මුදල් අංශයේ වර්ධනයන් 65

3.4 කොටස් වෙළඳපොළ 69

3.5 විදේශ අංශයේ වර්ධනයන් 70

3.6 ගෝලීය ආර්ථික දැක්ම 73

04. රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය

4.1 සමාලෝචනය 79

4.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය 79

05. 2027 අයවැය සැකසීම සඳහා යෝදාගත් පදනම

5.1 සමාලෝචනය 89

5.2 දළ දේශීය නිෂ්පාදිතය 89

5.3 පාරිභෝගික මිල ගණන් 89

5.4 සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය 90

5.5 විදේශීය අංශය 90

5.6 මුදල් සමස්තයන් 90

5.7 ආදායම 90

5.8 වියදම 90

5.9 ණය ගැනීම් 92

5.10 ඇස්තමේන්තුවල සංවේදීතාව 92

වගු

I කොටස

1.1 වගුව	මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව: 2027 – 2031	15

II කොටස

2.1 වගුව	රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය	26
2.2 වගුව	ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම සහ වියදම - 2026	28
2.3 වගුව	රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය - 2026	31
2.4 වගුව	ආදායම් බදු කාර්යසාධනය	32
2.5 වගුව	එකතු කළ අගය මත බදු කාර්යසාධනය	33
2.6 වගුව	නිෂ්පාදන බදු/ සුරා බදු කාර්යසාධනය	34
2.7 වගුව	මෝටර් රථ වාහන ආනයනය	35
2.8 වගුව	නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්	35
2.9 වගුව	ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම	35
2.10 වගුව	රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය	36
2.11 වගුව	රාජ්‍ය වියදම් කාර්යසාධනය	45
2.12 වගුව	සුභසාධන වැඩසටහන් සඳහා වියදම	46
2.13 වගුව	රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්වය	48
2.14 වගුව	රජයේ සුරැකුම්පත් මත ගෙවන ඵලදා අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන්හි හැසිරීම	2025-2026	48
2.15 වගුව	දේශීය ණය නිකුත් කිරීම්	ජනවාරි - අගෝස්තු	49
2.16 වගුව	විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි ප්‍රමාණය : 2026 ජනවාරි - අගෝස්තු	50
3.1 වගුව	ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි.යෙහි ආංශික සංයුතිය	57
3.2 වගුව	සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්	62
3.3 වගුව	සංචාරක අංශයේ කාර්යසාධනය	65
3.4 වගුව	ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)	66
3.5 වගුව	පාරිභෝගික මිල උද්ධමනය (පදනම් වර්ෂය: 2021=100)	69
3.6 වගුව	ප්‍රාග්ධන වෙළඳපොළේ වෙනස්වීම්	69
3.7 වගුව	විදේශීය වෙළඳාම	73
3.8 වගුව	තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක: 2026 (පුරෝකථන)	76
4.1 වගුව	විදුලි උත්පාදනයේ සහ ධාරිතාවයේ සංයුතිය	81
4.2 වගුව	ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් 52 හි බදු පෙර ලාභය	85
4.3 වගුව	රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ලාභාංශ ආදායම	86

රූපසටහන්

I කොටස

1.1 රූපසටහන	පොලී ගෙවීම්	3
1.2 රූපසටහන	ප්‍රධාන රාජ්‍ය මූල්‍ය සමස්තයන් : 2023–2025	9

II කොටස

2.1 රූපසටහන	මුළු ආදායම් සංයුතිය : 2026 ජනවාරි - අගෝස්තු	31
2.2 රූපසටහන	මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම: 2026 ජනවාරි - අගෝස්තු	32
2.3 රූපසටහන	නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය: 2026 ජනවාරි - අගෝස්තු	34
2.4 රූපසටහන	සංවර්ධන පාර්ශ්වකරුවන් අනුව ප්‍රතිලබ්ධි – 2026 ජනවාරි - අගෝස්තු	30
2.5 රූපසටහන	අරමුණු අනුව ප්‍රතිලබ්ධි – 2026 ජනවාරි - අගෝස්තු	51
3.1 රූපසටහන	ආර්ථික අර්බුදයේ සිට ප්‍රකෘති තත්ත්වය දක්වා - ප්‍රධාන දර්ශක: 2022 සහ 2025	55
3.2 රූපසටහන	දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	56
3.3 රූපසටහන	දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය: 2026 පළමු භාගය	56
3.4 රූපසටහන	කෘෂිකාර්මික අංශයේ සංයුතිය: 2026 පළමු භාගය	59
3.5 රූපසටහන	කර්මාන්ත අංශයේ සංයුතිය: 2026 පළමු භාගය	61
3.6 රූපසටහන	නිෂ්පාදන අංශයේ සංයුතිය: 2026 පළමු භාගය	61
3.7 රූපසටහන	සේවා අංශයේ සංයුතිය: 2026 පළමු භාගය	63
3.8 රූපසටහන	ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය	65
3.9 රූපසටහන	ඵලදා අනුපාත, මුදල් සමස්තයන්, මුදල් සැපයුම සහ පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය	67
3.10 රූපසටහන	මතුපිට, මූලික සහ ආහාර උද්ධමන විචලතා (පදනම් වර්ෂය : 2021 = 100)	68
3.11 රූපසටහන	වෙළඳ ශේෂය සහ විනිමය අනුපාතයේ වෙනස්වීම්	70
3.12 රූපසටහන	අපනයන සංයුතිය	71
3.13 රූපසටහන	ආනයන සංයුතිය	72

සටහන්

2.1 සටහන	ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග: 2026 ජනවාරි - සැප්තැම්බර්	39

ඇමුණුම්

ඇමුණුම I	2026.08.31 දක්වා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද හිඟ භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි ලැයිස්තුව	95
ඇමුණුම II	සාර්ව ආර්ථික දර්ශක	97
ඇමුණුම III	2027 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන	105

මූලික ආර්ථික දර්ශක

දර්ශකය	කාලපරිච්ඡේදය	ඒකක	වටිනාකම	
			2025	2026
මූර්ත අංශය				
ආර්ථික වර්ධනය	පළමු භාගය	%	4.8	4.7
කෘෂිකර්මාන්ත	පළමු භාගය	%	0.6	-0.6
කර්මාන්ත	පළමු භාගය	%	7.9	7.2
සේවා	පළමු භාගය	%	3.3	3.1
උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) - කොපාමිද. (2021=100)	ඔක්තෝබර් අවසානයට	%	2.1	8.3
උද්ධමනය (සාමාන්‍ය)-කොපාමිද. (2021=100)	ඔක්තෝබර් අවසානයට	%	-1.2	5.0
සේවා වියුක්ති අනුපාතය	දෙවන කාර්තුව	%	3.8	4.0
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය	දෙවන කාර්තුව	%	49.3	50.0
රාජ්‍ය මූල්‍ය අංශය				
අයවැය ශේෂය	ජන-අගෝ.	රු. බිලි.	-411	35
මුළු ආදායම	ජන-අගෝ.	රු. බිලි.	3,295	3,998
බදු ආදායම	ජන-අගෝ.	රු. බිලි.	3,068	3,684
බදු නොවන ආදායම	ජන-අගෝ.	රු. බිලි.	226	315
මුළු වියදම	ජන-අගෝ.	රු. බිලි.	3,712	3,967
වර්තන වියදම්	ජන-අගෝ.	රු. බිලි.	3,381	3,531
රාජ්‍ය ආයෝජන	ජන-අගෝ.	රු. බිලි.	339	446
රාජ්‍ය ණය	ජූනි අවසානයට	රු. බිලි.	29,635	31,278
විදේශ අංශය				
අපනයන	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	10,215	10,754
කෘෂි අපනයන	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	2,324	2,317
කාර්මික අපනයන	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	7,854	8,398
රෙදිපිළි හා ඇඟළුම්	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	4,021	3,797
අනෙකුත්	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	3,833	4,601
ආනයන	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	15,390	18,666
පාරිභෝගික භාණ්ඩ	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	3,816	4,485
අන්තර් භාණ්ඩ	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	8,617	10,456
එයින් ඛනිජ තෙල් නිෂ්පාදන	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	2,961	4,487
ආයෝජන භාණ්ඩ සහ අනෙකුත්	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	2,956	3,725
වෙළඳ ශේෂය	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	-5,174	-7,912
සංචාරක පැමිණීම්	ජන-සැප්.	සංඛ්‍යාව	1,725,494	1,693,679
සංචාරක ඉපැයීම්	ජන-සැප්.	ඇ.ඩො. මිලි.	2,473	2,245
ශ්‍රමික ප්‍රේෂණ	ජන-අගෝ.	ඇ.ඩො. මිලි.	5,812	6,865
කළඹ ආයෝජනය (ශුද්ධ)	ජූනි අවසානයට	ඇ.ඩො. මිලි.	526	450
සමස්ත ගෙවුම් ශේෂය (BOP)	ජන-ජූනි	ඇ.ඩො. මිලි.	522	136
දළ නිල සංචිත	අගෝස්තු අවසානයට	ඇ.ඩො. මිලි.	6,178	6,929
විනිමය අනුපාතය (මාසය අග)	ඔක්තෝබර් අවසානයට	රු./ඇ.ඩො.	304.42	332.61
විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය)	ඔක්තෝබර්	රු./ඇ.ඩො.	303.13	331.42
මූල්‍ය අංශය				
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)	සැප්තැම්බර් අවසානයට	%	7.25	8.25
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)	සැප්තැම්බර් අවසානයට	%	8.25	9.25
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය (SRR)	සැප්තැම්බර් අවසානයට	%	2.00	2.00
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය සතිපතා (AWPR)	සැප්තැම්බර් අවසානයට	%	8.10	11.04
භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91)	සැප්තැම්බර් අවසානයට	%	7.57	9.25
භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364)	සැප්තැම්බර් අවසානයට	%	8.02	9.95
මුදල් සැපයුමේ වර්ධනය (M_{2b})	2025 අගෝ./2026 අගෝ.	%	10.7	11.5
පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය	2025 අගෝ./2026 අගෝ.	%	20.5	24.5

වගන්තිය	අවශ්‍යතාවය	අරමුණ	අනුකූල වීමේ ක්‍රමය
11 වන වගන්තිය	මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම*	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(4) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි වාර්ෂික අයවැය පිළියෙල කිරීමට පෙර ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම, එළඹෙන වර්ෂයට අදාළ වාර්ෂික අයවැය සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශ සැපයීම, මූල්‍ය කාර්යසාධනය වාස්තවික ලෙස ඇගයීමේ පදනම පිහිටුවීම, ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපායෙහි කාර්යසාධනය පිළිබඳව වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම.	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු, එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින හෝ එදිනට පෙර මුදල් අමාත්‍යවරයා විසින් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවේ දී නිවේදනය කළ යුතු ය. මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.
49 වන වගන්තිය	අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම*	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන තොරතුරු සැපයීම	සෑම වර්ෂයක දීම විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී, පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු වාර්තාව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය
50 වන වගන්තිය	වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම*	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීම	අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස අවසාන දින හෝ අදාළ වර්ෂයේ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය; එමෙන්ම, වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, ඒ වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය

වගන්තිය	අවශ්‍යතාවය	අරමුණ	අනුකූල වීමේ ක්‍රමය
51 වන වගන්තිය	අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව) *	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 51(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව අදාළ මුදල් වර්ෂය සඳහා වන ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වාර්ෂික මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීම.	මුදල් වර්ෂය අවසාන වී මාස හයක් ගතවීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය; එමෙන්ම වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම් ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය
52 වන වගන්තිය	මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම**	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව රටේ මූල්‍ය තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු මහජනයා වෙත නිකුත් කිරීම.	පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ ආඥාවක් ප්‍රසිද්ධ කර සති තුනක් ඇතුළත දී නිකුත් කිරීමට කටයුතු යෙදිය යුතු ය; එමෙන්ම, නව පාර්ලිමේන්තුව පළමුවරට රැස් වූ දින සිට සති දෙකක් ඇතුළත වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු අතර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ද පළ කරනු ලැබිය යුතු ය. මෙම වාර්තාව පිළියෙල කිරීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හැකි වනු පිණිස, මුදල් අමාත්‍යවරයා විසින් ඔහුගේ දැනීම අනුව, සැලකිය යුතු ප්‍රමාණයකට මූල්‍යමය හෝ ආර්ථිකමය බලපෑමක් ඇති කරවන්නා වූ හෝ ඇති කිරීමට ඉඩ ඇති ආණ්ඩුවේ තීරණ සහ වෙනත් පරිවේෂණ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය.
53 වන වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම*	රජයේ ආදායම් හා වියදම් ඇතුළු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම.	අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර ඒ ප්‍රකාශය එක් එක් කාර්තුව අවසානයේ දින හතළිස්පහකට නොඅඩු දිනයක දී, නියම කරනු ලැබ ඇති ආකාරයට මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ සමගාමීව පළ කරනු ලැබිය යුතු ය.

* මුදල් අමාත්‍යවරයා විසින්

** භාණ්ඩාගාර ලේකම් විසින්

අනුකූලතාවය – 2026

- **අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2025**

  2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 51(1) වගන්තියට අනුව, අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව, මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ කොටසක් ලෙස, 2026 ජූනි 30 වන දින මුදල් අමාත්‍යවරයා විසින් මහජනතාව වෙත නිකුත් කරන ලදී.

- **මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය – 2027**

  2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(3) වගන්තියට අනුව, මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026 ජූනි 26 වන දින මුදල් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ දී නිවේදනය කරන ලදී. මුදල් අමාත්‍යවරයා විසින් කරන ලද එම නිවේදනයත් සමඟ, 2026 ජූනි 26 වන දින මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී.

- **වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2026**

  2026 වර්ෂයේ පළමු මාස හයෙහි මූල්‍ය සහ ආර්ථික තත්ත්වය 2026 ඔක්තෝබර් 31 වන දින මහජනතාව වෙත නිකුත් කරන ලද අතර, 2026 නොවැම්බර් 12 වන දින පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලදී.

- **අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2027**

  මෙම වාර්තාවේ දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන්, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය, ගෙවුම් ශේෂය, ආදායම සහ වියදම සහ රජයේ ණය ගැනීම් සම්බන්ධ ඇස්තමේන්තු, ඉහත ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී භාවිත කළ පදනම, එම ඇස්තමේන්තුවල සංවේදීතාව සහ ඒවා පිළියෙල කිරීමේ දී භාවිත කළ ආර්ථික හෝ වෙනත් පදනම් සම්බන්ධයෙන් සිදුවිය හැකි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයක්, මූල්‍ය තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අවදානම් පිළිබඳ, ප්‍රායෝගික වශයෙන් හැකිතාක් දුරට ප්‍රමාණාත්මකව දක්වන ලද ප්‍රකාශයක් ඇතුළු වෙනත් තොරතුරු අඩංගු වන අතර, එය 2026 නොවැම්බර් 12 වන දින පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලදී.

අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2027

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ: I කොටස මඟින්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ඉදිරිපත් කෙරේ; II කොටස මඟින්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49(2) වගන්තියේ දක්වා ඇති කරුණු ද ඇතුළුව, ආණ්ඩුවේ මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ආණ්ඩුවේ සියලු තීරණ සහ අනෙකුත් සියලු පරිවේෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ.

I කොටස

01 මධ්‍යකාලීන රාජ්‍ය මූලික්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය

1.1 සමාලෝචනය

සාර්ව ආර්ථික ස්ථාවරත්වය යළි ස්ථාපිත කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සහ ආර්ථිකය පිළිබඳ විශ්වාසය නැවත ගොඩනැගීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාව 2026 වසරට පිවිසියේ වඩා ශක්තිමත් සාර්ව ආර්ථික හා රාජ්‍ය මූල්‍ය පදනමක් සහිතවය. දිට්වා සුළි කුණාටුවේ බලපෑම සහ මැදපෙරදිග කලාපය ආශ්‍රිතව උත්සන්න වූ භූ දේශපාලනික ආතතීන් ඇතුළු දේශීය හා බාහිර ආපදා තත්ත්වයන්ට අඛණ්ඩව මුහුණ දීමට සිදු වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවරත්වයකට පත්විය.

2026 වසරේ දෙවන කාර්තුවේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.ය) පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.2 කින් වර්ධනය වූ අතර, ඒ අනුව අඛණ්ඩව කාර්තු දොළහක් තුළ ධනාත්මක ආර්ථික වර්ධනයක් වාර්තා විය. මීට අමතරව, ලෝක බැංකුව විසින් 2026 වසරේ ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකාව නැවතත් ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස වර්ගීකරණය කරන ලදී. ආර්ථික ක්‍රියාකාරකම්වල මෑතකාලීන ප්‍රවණතා පිළිබිඹු කරන නිරන්තරයෙන් වාර්තා කරන දර්ශක මඟින් ද ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් ප්‍රසාරණය වෙමින් පවතින බව පිළිඹිබු කරනු ලබයි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී පෙර වසරේ අදාළ මාසයට සාපේක්ෂව සියයට 8.3 ක් ලෙස වාර්තා විය.


ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ඇමෙරිකානු ඩොලර් (ඇ.ඩො) බිලියන 1.5 ක ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්වල දායකත්වය සහිත, චීන මහජන බැංකුව සමඟ පවතින විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත් දළ නිල සංචිත, 2026 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට ඇ.ඩො. බිලියන 6.9 ක් පමණ දක්වා ඉහළ ගොස් ඇති අතර, එය මාස තුනකට වැඩි ආනයන ආවරණයක් සඳහා ප්‍රමාණවත් වේ.

මැදපෙරදිග කලාපයේ ගැටුම් උත්සන්න වීම හමුවේ විදේශීය අංශය කෙරෙහි ඇති වූ පීඩනය ඉහළ යාම පිළිබිඹු කරමින් 2026 වසරේ පළමු මාස නවය තුළ ජංගම ගිණුම ඇ.ඩො මිලියන 420.4 ක සමස්ථ හිඟයක් වාර්තා කළ අතර, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො මිලියන 1,853.2 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. භාණ්ඩ ආශ්‍රිත වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය ඇ.ඩො බිලියන 5.2 ක සිට ඇ.ඩො බිලියන 7.9 ක් දක්වා පුළුල් විය. 2025 වසරේ සමස්ථ වාර්ෂික ඉන්ධන ආනයන වියදම ද ඉක්මවා යමින් 2026 වසරේ පළමු මාස නවය තුළ සමස්ථ ඉන්ධන ආනයන වියදම පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 51.5 කින් ඇ.ඩො. බිලියන 4.5 ක් දක්වා වර්ධනය විය. මැදපෙරදිග කලාපයේ ගැටුම් හේතුවෙන් ඇති වූ බාධා සහ සංචාරකයකුගේ සාමාන්‍ය වියදම පිළිබඳ ඇස්තමේන්තු පහළ අගයක් තෙක් සංශෝධනය කිරීමේ බලපෑම පිළිබිඹු කරමින්, සංචාරක ඉපැයීම් පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 9.2 කින් පහළ ගොස් ඇ.ඩො බිලියන 2.2 ක් ලෙස වාර්තා විය. කෙසේ වුවද, විදේශ ශ්‍රමික ප්‍රේෂණ විදේශ විනිමය ලැබීම් ඉහළ නැංවීම සඳහා වැදගත් දායකත්වයක් ලබාදුන් අතර, 2026 වසරේ පළමු මාස නවය තුළ එම ප්‍රේෂණ පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 18.1 කින් වර්ධනය වී ඇ.ඩො බිලියන 6.9 ක් දක්වා ළඟා විය.

රාජ්‍ය ආදායම රැස්කිරීමේ අඛණ්ඩ ප්‍රයත්නයන් සහ වියදම් ආශ්‍රිත විනය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබිඹු කරමින් 2026 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සාධනීය මට්ටමක පැවතුණි. බදු ප්‍රතිපත්ති සහ ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් මෑතකදී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ හේතුවෙන්, රාජ්‍ය ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.6 ක් වූ ආර්ථික අර්බුදයට පෙර පැවති (2015–2019 කාලපරිච්ඡේදයේ) සාමාන්‍ය මට්ටමට වඩා සැළකිය යුතු ලෙස වර්ධනය වී ඇත. 2026 වසරේ දී ප්‍රදාන ද ඇතුළුව සමස්ත රාජ්‍ය ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.6 ක් දක්වා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට පෙර ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.1 ක් ලෙස පුරෝකථනය කර තිබූ ප්‍රාථමික අතිරික්තය සියයට 3.6 ක් දක්වා වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2025 වසරේ සැප්තැම්බර් මාසය අවසානයේ දී රු. බිලියන 1,220 ක් ලෙස පැවති භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ මෙහෙයුම්වල අවසාන මුදල් ශේෂය, 2026 වසරේ සැප්තැම්බර් මාසය අවසානයේ දී රු. බිලියන 1,131ක් ලෙස වාර්තා විය. මීට අමතරව, සමස්ත රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් 2022 වසරේ දී පැවති සියයට 79.1 ක මට්ටමේ සිට 2025 වසරේ දී සියයට 45.9 ක් දක්වා සැළකිය යුතු ලෙස පහළ ගොස් ඇති අතර, 2026 වසරේ පළමු මාස අට තුළ දී එම අනුපාතය සියයට 40.2 ක් ලෙස වාර්තා විය.

1.1 රූපසටහන | පොලී ගෙවීම්

මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස



මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වසරේ දෙවන කාර්තුවේ සිට මැදපෙරදිග කලාපයේ පවතින ගැටුම් හේතුවෙන් මෙහෙයුම් හා මූල්‍යමය පීඩනයන් ඉහළ ගොස් තිබුණද, අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ආයතනික පාලන හා මෙහෙයුම් ප්‍රතිසංස්කරණවල දායකත්වය හේතුවෙන් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය කාර්යසාධනය සමස්තයක් ලෙස ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී. 2025 වසරේ පළමු මාස අට තුළ දී ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 51 ක් විසින් වාර්තා කරන ලද රු. බිලියන 307.5 ක සමස්ත බදු පෙර ලාභයට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම ව්‍යවසායයන් විසින් රු. බිලියන 366.9 ක සමස්ත බදු පෙර ලාභයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, බලශක්ති හා නිෂ්පාදන යෙදවුම් පිරිවැය ඉහළ යාම, වෙළෙඳ හා ප්‍රවාහන කටයුතුවලට ඇති වූ බාධා සහ අවිනිශ්චිතතාව ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක මූල්‍ය තත්ත්වය කෙරෙහි නැවතත් පීඩනයක් එල්ල වී ඇත.

සාර්ව ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වයන්හි ඇති වූ ප්‍රගතිය, මෑතකාලීන වශයෙන් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම්වල සිදු වූ වෙනස්කම් මගින් ද පිළිබිඹු වේ. සාර්ව ආර්ථික ස්ථායීකරණය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අත්කරගෙන ඇති ප්‍රගතිය, රාජ්‍ය මූල්‍ය හා විදේශීය අංශයේ ශේෂයන්හි ඇති වූ වැඩිදියුණු වීම් සහ විදේශ විනිමය සංචිත යළි ගොඩනැංවීම සැලකිල්ලට ගනිමින්, ෆිච් රේටින්ග්ස් (Fitch Ratings) ආයතනය විසින් 2026 වසරේ සැප්තැම්බර් මස 22 වන දින ශ්‍රී ලංකාවේ දිගුකාලීන ණය නිකුත්කරන්නාගේ ණය පැහැර හැරීමේ අවදානම් ශ්‍රේණිගත කිරීම (Long-Term Issuer Default Ratings) 'CCC+' මට්ටමේ සිට 'B-' මට්ටම දක්වා උසස් කරන ලද අතර, ඒ සඳහා ස්ථාවර ඉදිරි දැක්මක් (Stable Outlook) ද ප්‍රකාශයට පත් කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය ආයතනය (Institute of International Finance – IIF) විසින් ප්‍රකාශයට පත් කරන ලද "ආයෝජක සබඳතා සහ ණය විනිවිදභාවය: විනිවිදභාවයේ ප්‍රතිලාභ" (Investor Relations and Debt Transparency: The Transparency Dividend) නමැති වාර්තාවට අනුව, නැඟී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් 57 ක් අතරින්, ආයෝජක සබඳතාවයන්හි වාර්ෂික ප්‍රගතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සිව්වන ස්ථානයට ද, ණය විනිවිදභාවය වැඩිදියුණු කිරීමේදී ඉහළම ප්‍රගතියක් අත්කරගත් රටවල් අතර පස්වන ස්ථානයට ද පත්ව ඇත. මෙම ප්‍රගතිය මගින් රාජ්‍ය ණය පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමේ විනිවිදභාවය ඉහළ නැංවීම සහ ආයෝජකයන් සමඟ පවත්වනු ලබන සබඳතා ශක්තිමත් වීම පිළිබඳ පිළිබිඹු කෙරේ.

කෙසේ වුවද, සාර්ව ආර්ථික ස්ථාවරත්වය, රාජ්‍ය මූල්‍ය අංශයෙහි ඔරොත්තු දීමේ හැකියාව සහ විදේශීය අංශය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් අත්කරගෙන ඇති ප්‍රගතිය, දිටිවා සුළි කුණාටුවෙන් ඇති වූ පසුකාලීන බලපෑම් හමුවේ තවදුරටත් අභියෝගයට ලක්වෙමින් පවතී. පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව (Post-Disaster Needs Assessment – PDNA) අනුව, වසර තුනක කාලපරිච්ඡේදයක් තුළ ආපදාව මඟින් යථා තත්ත්වයට එළැඹීමේ හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය සමස්ත මූල්‍ය ප්‍රතිපාදනය රු. බිලියන 1,022.5 ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තුගත කර ඇත. ආපදාවෙන් පසු කඩිනමින් යථා තත්ත්වයට පත්කිරීම හා ප්‍රතිසංස්කරණ අවශ්‍යතා සපුරාලීම සඳහා හානියට පත් යටිතල පහසුකම් සහ නිවාස යළි යථා තත්ත්වයට පත් කිරීම, ජනතාවගේ ජීවනෝපාය මාර්ග යළි ගොඩනැංවීම සහ අනෙකුත් හදිසි පශ්චාත් ආපදා අවශ්‍යතා සඳහා සහාය ලබාදීම අරමුණු කරගනිමින්, 2026 වසර සඳහා රු. බිලියන 500 ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා 2027 වසර තුළ දී ද සැළකිය යුතු වියදම් ප්‍රමාණයක් අඛණ්ඩව දැරීමට සිදුවනු ඇත. මෙය රාජ්‍ය මූල්‍ය රාමුවට සැළකිය යුතු අභියෝගයක් එල්ල කරනු ඇති අතර, අත්‍යවශ්‍ය ලෙස ආපදාව ආශ්‍රිත යථා තත්ත්වයට පත් කරලීමේ අවශ්‍යතා සපුරාලීම සහ රාජ්‍ය මූල්‍ය විනය මෙන්ම මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය තිරසරභාවය ආරක්ෂා කරගැනීම අතර නිසි සමතුලිතතාවයක් පවත්වාගෙන යාම රජය විසින් සිදු කළ යුතු වේ. දැනට සිදු කර ඇති තක්සේරුවලට අනුව, 2027 වසරේ දී මේ සඳහා රු. බිලියන 260 ක පමණ අතිරේක වියදමක් දැරීමට සිදුවනු ඇතැයි ඇස්තමේන්තුගත කර ඇත.

2027 වසර දක්වා ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සිදුවීම හේතුවෙන්, මීට පෙර සැලසුම් කර තිබූ රාජ්‍ය වියදම් සැලැස්ම තාවකාලිකව සංශෝධනය කිරීමට සිදුවනු ඇත. 2027 වසර සඳහා වූ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින්, ද.දේ.නි.යෙන් සියයට 13.0 ක් වන ව්‍යවස්ථාපිත වියදම් සීමාව තුළ ප්‍රාථමික වියදම සියයට 12.9 ක් පමණ ලෙස පවත්වාගෙන යාමට අපේක්ෂා කර තිබුණ ද, අනෙකුත් ප්‍රමුඛතාගත ආයෝජන කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොවන පරිදි, වියදම් ප්‍රමුඛතා නැවත සකස් කිරීමෙන් පමණක් අතිරේක ප්‍රතිසංස්කරණ වියදම් අවශ්‍යතාව සම්පූර්ණයෙන් සපුරාලීමට නොහැකි වනු ඇත. ඒ අනුව, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ, 2027 වසරේ දී ප්‍රාථමික වියදම ද.දේ.නි.යෙන් සියයට 13.6 ක් පමණ දක්වා තාවකාලිකව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙන් සියයට 4.4 ක සිට සියයට 5.1 ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, ප්‍රාථමික වියදම් සීමාවෙන් තාවකාලිකව බැහැර වීම, රාජ්‍ය මූල්‍ය

කළමනාකරණ පනතේ සුවිශේෂී තත්ත්වයන් සඳහා අදාළ වන විධිවිධානවලට අනුකූලව සිදු කරනු ලබන අතර, එම ව්‍යවස්ථාපිත වියදම් සීමාවට නැවත අනුකූලතාව ඇති කරගැනීම සඳහා පැහැදිලි ක්‍රියාමාර්ග සහිත සැලැස්මක් ද ඉදිරිපත් කරනු ඇත.

ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය ආයෝජනවල ගුණාත්මකභාවය, ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව සහ කාර්යක්ෂමතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත. අවශ්‍යතාවයේ හදිසි ස්වභාවය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම, ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව සහ ආර්ථික හා සමාජීය වැදගත්කම යන සාධක පදනම් කරගනිමින් වියදම් සඳහා ප්‍රමුඛතාව ලබා දෙනු ඇත. එමෙන්ම, ප්‍රතිසංස්කරණය කරනු ලබන පොදු වත්කම්වල සහ ප්‍රජාවන්හි අනාගත ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා, තාක්ෂණික හා ආර්ථික වශයෙන් යෝග්‍ය වන අවස්ථාවලදී "පෙරට වඩා හොඳින් යළි ගොඩනැංවීම" (Build Back Better) යන මූලධර්ම ද අනුගමනය කරනු ඇත. මනා වියදම් පාලන ක්‍රමවේද, විනිවිදභාවයෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ වියදම් සඳහා වන බැඳීම්, මුදල් නිදහස් කිරීම් හා සත්‍ය වශයෙන් දරන ලද වියදම් පිළිබඳ නිරන්තර අධීක්ෂණය මඟින් මෙම වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත. දිට්වා සුළි කුණාටුවට අදාළ වියදම් වෙනම හඳුනාගෙන වාර්තා කිරීමට කටයුතු කරනු ලබන අතර, එමඟින් එම වියදම් තාවකාලික, නිශ්චිත අවශ්‍යතා ඉලක්ක කරගත් සහ පවත්නා වියදම්වලට අතිරේක වූ වියදම් බව සහතික කිරීමට අපේක්ෂා කෙරේ. එසේම, ආපදා තත්ත්වය හේතුවෙන් තාවකාලිකව දැරීමට සිදුවන පුනරාවර්තන වියදම්, දිගුකාලීනව රජයට දැරීමට සිදුවන ස්ථිර රාජ්‍ය මූල්‍ය බැඳීම් බවට පත්වීම වැළැක්වීමට ද පියවර ගනු ඇත.

දේශීය වශයෙන් දිට්වා සුළි කුණාටුව මඟින් ඇති වූ බලපෑම්වලට අමතරව, බලශක්ති මිල ගණන්, ආනයන පිරිවැය, සංචාරක කර්මාන්තය, විදේශීය අංශය සහ අවදානමට ලක්විය හැකි පවුල් කෙරෙහි ඇති වන බලපෑම් ඔස්සේ සාර්ව ආර්ථික හා රාජ්‍ය මූල්‍ය අවදානම් ඇතිවීමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස මැදපෙරදිග කලාපයේ පවතින අහිතකර තත්ත්වයන් තවදුරටත් පවතී. බලශක්ති පිරිවැය තියුණු ලෙස ඉහළ යාම සහ ඒ හේතුවෙන් ගෘහස්ථ ආදායම් හා නිෂ්පාදන අංශ කෙරෙහි ඇති වූ පීඩනයන්ට ප්‍රතිචාර වශයෙන්, රජය විසින් ආරම්භයේ දී රු. බිලියන 100 ක ප්‍රතිපාදනයක් සහිත තාවකාලික සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී. මෙම සහන පැකේජය 2026 වසරේ සැප්තැම්බර් මාසයේ දී අවසන් වූ අතර, ඒ සඳහා දරන ලද සමස්ථ වියදම් රු. බිලියන 105.9 ක් විය. මැදපෙරදිග ගැටුම් තවදුරටත් උත්සන්න වීමෙන් අනතුරුව, 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී, 2026 වසරේ ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ අතිරේක ඉන්ධන සහනාධාර ලබාදීම සඳහා රු. බිලියන 41 ක නව සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී. මෙම මැදිහත්වීම්වල අරමුණ වූයේ බාහිර ආර්ථික කම්පනය හේතුවෙන් හටගත් ක්ෂණික බලපෑම් අවම කිරීමත්, ජීවන වියදම සහ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි දෙවන වරටත් ඇති විය හැකි දැඩි බලපෑම් අවම කිරීමත් ය. ඒ සමඟම, මධ්‍යකාලීන වශයෙන් බලශක්ති මිල ගණන් පිරිවැය නිරූපණය වන පරිදි තීරණය කිරීමේ ප්‍රතිපත්තිය රජය විසින් අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. එමඟින් ඉහළ රාජ්‍ය මූල්‍ය පිරිවැයක් ඇති කිරීමට, රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය දුර්වල කිරීමට සහ ආපදා ප්‍රතිසංස්කරණ කටයුතු හා ඵලදායී රාජ්‍ය ආයෝජන සඳහා අවශ්‍ය සම්පත් සීමා කිරීමට හේතු විය හැකි, වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් ආවරණය වන පරිදි දීර්ඝ කාලයක් මුළුල්ලේ සහනාධාර ලබා දීම අවම කිරීමට අපේක්ෂා කෙරේ.

දේශගුණික හා කාලගුණික තත්ත්වයන් ආශ්‍රිත අවදානම් ද සාර්ව ආර්ථික හා රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම කෙරෙහි අවිනිශ්චිතතාවයක් ඇති කරන වැදගත් සාධකයක් ලෙස තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට පවතින එල් නිනෝ තත්ත්වය 2027 වසරේ මුල් කාලය දක්වා ප්‍රබලව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමඟින් අසාමාන්‍ය වර්ෂාපතන රටාවන් ඇතිවීම, කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු හා ජලය ලබාගැනීමේ හැකියාවට බාධා ඇතිවීම සහ ආහාර මිල ගණන් ඉහළ යාමේ පීඩනයන් යළි මතුවීම ආදිය සිදුවිය හැකිය. ආර්ථික ක්‍රියාකාරකම් සහ රාජ්‍ය ආදායම කෙරෙහි ඇති කරන බලපෑම් මෙන්ම, ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම, සමාජ ආරක්ෂණය සහ නිශ්චිත අවශ්‍යතා ඉලක්ක කරගත් අනෙකුත් මැදිහත්වීම් සඳහා අතිරේක වියදම් දැරීමට සිදුවීම ඔස්සේ ද මෙවැනි තත්ත්වයන් පුළුල් රාජ්‍ය මූල්‍ය බලපෑම් ඇති කළ හැකිය. මෙම අවදානම් හමුවේ, ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක සහ හදිසි අවස්ථා සඳහා අවශ්‍ය පූර්ව සූදානම් විධිවිධාන පවත්වාගෙන යාම, ආපදා අවදානම් අධීක්ෂණය සහ ආපදාවලට මුහුණ දීම සඳහා වන සූදානම ශක්තිමත් කිරීම මෙන්ම, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව රාජ්‍ය ආයෝජන සැලසුම්කරණයට සහ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය සැලසුම්කරණයට ඒකාබද්ධ කිරීමේ වැදගත්කම තවදුරටත් තහවුරු කරනු ලබයි.

සුවිශේෂී වියදම් අවශ්‍යතාවයන් හටගෙන තිබුණද, ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කරනු ඇත. ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ සංශෝධිත මාවත යටතේ, 2027 වසරේ දී රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙ.න් සියයට 15.8 ක් පමණ වනු ඇතැයි ද, ඉන් අනතුරුව එය සියයට 16.0 ක පමණ මට්ටමක පවතිනු ඇතැයි ද පුරෝකථනය කර ඇත. ප්‍රාථමික අතිරික්තය ආරක්ෂා කරගනිමින්

සහ රාජ්‍ය ණය ක්‍රමයෙන් අඩු වන ප්‍රවණතාව පවත්වාගෙන යමින්, තාවකාලික ප්‍රතිසංස්කරණ වියදම් අවශ්‍යතා සපුරාලීම සඳහා රාජ්‍ය ආදායම් රැස්කිරීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. එක්වරක් පමණක් දැරීමට සිදුවන වියදම් මූල්‍යයනය කිරීම සඳහා තාවකාලික හෝ ආර්ථික ක්‍රියාකාරකම්වලට අහිතකර බලපෑම් ඇති කරන බදු මත රඳා පැවතීම වෙනුවට, රාජ්‍ය ආදායම් පද්ධතියේ දිගුකාලීන තිරසරභාවය, කාර්යක්ෂමතාව සහ සාධාරණත්වය ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් මධ්‍යකාලීන රාජ්‍ය ආදායම් ක්‍රමෝපාය හඳුන්වා දෙනු ඇත. ප්‍රමුඛතාගත ප්‍රතිසංස්කරණ ප්‍රධාන වශයෙන් ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීම කෙරෙහි යොමු වන අතර, එමඟින් මධ්‍යකාලීනව ද.දේ.නි.යෙන් සියයට 2.0 ක පමණ අතිරේක රාජ්‍ය ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිසංස්කරණ යටතේ බදු පදනම සහ බදු ජාලය තවදුරටත් පුළුල් කිරීම, අවදානම් පදනම් කරගත් බදු විගණන සහ බදු අනුකූලතා කළමනාකරණය ශක්තිමත් කිරීම, බදු පරිපාලනය ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (Revenue Administration Management Information System – RAMIS) වැඩිදියුණු කිරීම, ඉලෙක්ට්‍රොනික ඉන්වොයිසින් ක්‍රමවේදය (e-invoicing) ක්‍රියාත්මක කිරීම සහ බදු පැහැර හැරීම් හා රාජ්‍ය ආදායම් අහිමිවීම් අවම කිරීම සඳහා තවදුරටත් පියවර ගැනීම ප්‍රමුඛ වේ.

විශේෂිත ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා දැරීමට සිදුවන වියදම් හමුවේ වුවද, සංශෝධිත රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ සාධනීය ප්‍රාථමික ශේෂයක් පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ. දැනට සැලසුම් කර ඇති ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් කිරීමේ සැලැස්ම අනුව, 2027 වසරේ දී ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යෙන් සියයට 2.3 ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. දිවිවා සුළි කුණාටුවට අදාළ විශේෂිත වියදම් ක්‍රමයෙන් අඩු වීමත් සමඟ, 2028 වසරේ දී ප්‍රාථමික වියදම ද.දේ.නි.යෙන් සියයට 12.9 ක් පමණ දක්වා නැවත අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එමඟින් ප්‍රාථමික වියදම් සඳහා පනවා ඇති නීතිමය සීමාවට නැවත අනුකූල වීමට අපේක්ෂා කෙරේ. ඒ සමඟම, මධ්‍යකාලීනව ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යෙන් සියයට 3.0 ක් දක්වා තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2028 වසරේ සිට ප්‍රාථමික වියදම් නීතිමය සීමාව තුළ පවත්වාගෙන යාමට අපේක්ෂා කරන අතර, රාජ්‍ය ආදායම් රැස්කිරීම ශක්තිමත් කිරීම, ප්‍රාථමික අතිරික්තය පිළිබඳ ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහ රාජ්‍ය ණය අඛණ්ඩව අඩු කිරීම යන අරමුණු මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව මෙහෙයවන ප්‍රධාන සාධක වනු ඇත.

සමාජ ආරක්ෂණය මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස තවදුරටත් පවතිනු ඇත. ආර්ථික අර්බුදය, දිවිවා සුළි කුණාටුව සහ මැදපෙරදිග ගැටුම් හේතුවෙන් ලැබූ අත්දැකීම් තුළින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සහ ඵලදායී සමාජ ආරක්ෂණය එකිනෙක ශක්තිමත් කරන, අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ වූ අරමුණු දෙකක් බව පැහැදිළි වේ. රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක සාධනීය මට්ටමක පැවතීම මඟින් සුවිශේෂී අර්බුදකාරී තත්ත්වයන් ඇති වන අවස්ථාවලදී අවදානමට ලක්විය හැකි පවුල් සඳහා සහාය ලබාදීමට රජයට හැකියාව ලැබෙන අතර, නිසි ලෙස ඉලක්කගත සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අධික පිරිවැයක් දැරීමට සිදුවන සහ නිසි පරිදි ඉලක්කගත කිරීමකින් තොරව සිදු කරනු ලබන පොදු සහනාධාර ක්‍රමවේදයන් වෙත යොමු නොවී අවශ්‍ය පාර්ශ්වයන් හට සහාය ලබාදීමට හැකි වේ. එබැවින්, ප්‍රතිලාභීන් හඳුනාගැනීම, සුදුසු ප්‍රතිලාභීන් නිවැරදිව ඉලක්කගත කිරීම සහ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදයන් අඛණ්ඩව වැඩිදියුණු කිරීම තවදුරටත් වැදගත් වනු ඇත.

රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය වැඩිදියුණු කරන අතරම, රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම අරමුණු කරගත් ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යාමට ද රජය අඛණ්ඩව කටයුතු කරනු ඇත. මෙහි ප්‍රධාන ප්‍රමුඛතා අතර රාජ්‍ය ව්‍යවසායයන්හි පාලනය සහ මූල්‍ය කාර්යසාධනය ශක්තිමත් කිරීම, රාජ්‍ය වත්කම් කළමනාකරණය සහ උපයෝජනය වැඩිදියුණු කිරීම මෙන්ම ප්‍රමුඛතා සංවර්ධන වැඩසටහන් සඳහා පෞද්ගලික අංශයේ විශේෂඥ දැනුම සහ මූල්‍ය සම්පත් දායක කරගැනීම පිණිස රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා ශක්තිමත් නියාමන හා ආයතනික රාමුවක් ස්ථාපිත කිරීම ආදිය ඇතුළත් වේ. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත රාජ්‍ය ව්‍යවසාය පනත් කෙටුම්පත, රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පනත් කෙටුම්පත මඟින් අවශ්‍ය නෛතික පදනම සපයනු ලැබේ. ඊට සමගාමීව, 2025–2029 ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම සහ රාජ්‍ය පාලනය පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුළින් පාලනය ශක්තිමත් කිරීමට සහ දූෂණය වැළැක්වීමේ ක්‍රියාමාර්ග තවදුරටත් පුළුල් කිරීමට රජය කටයුතු කරනු ඇත. ඒ යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ආයතනික ධාරිතාව සහ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම, විද්‍යුත් වත්කම් ප්‍රකාශන පද්ධතිය වැඩිදියුණු කිරීම, සමාගම් සහ අනෙකුත් නෛතික ආයතනවල සැබෑ ප්‍රතිලාභ හිමිකරුවන් පිළිබඳ තොරතුරුවල විශ්වසනීයත්වය සහ එම තොරතුරු සත්‍යාපනය කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම මෙන්ම රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සහ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්වල විනිවිදභාවය හා වගවීම ඉහළ නැංවීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

2026 වසරේ ඔක්තෝබර් මස 04 වන දින, ශ්‍රී ලංකා බලධාරීන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ

නිලධාරීන් අතර, සිව් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ හත්වන සමාලෝචනය අවසන් කිරීමට අදාළ ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිලධාරී මට්ටමේ එකඟතාවයකට එළඹුණු අතර, ඊට සමගාමීව 2026 වසර සඳහා වූ IV වන වගන්තිය යටතේ පැවැත්වෙන උපදේශන සාකච්ඡා ද අවසන් කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතියට යටත්ව, මෙම සමාලෝචනය සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට විශේෂ ගැණුම් හිමිකම් මිලියන 254 ක, එනම් ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 345 ක අතිරේක මූල්‍ය පහසුකම් ලබාගැනීමට අවස්ථාව සැලසෙනු ඇත. අයහපත් භූ දේශපාලනික සහ කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇති විය හැකි අවදානම් තවදුරටත් පවතින පසුබිමක, රාජ්‍ය මූල්‍ය හා විදේශීය අංශයේ ස්වාරක්ෂක යළි ගොඩනැංවීම, මිල ස්ථායීතාව පවත්වාගෙන යාම, සමාජ ආරක්ෂණ ජාලයන් ශක්තිමත් කිරීම මෙන්ම පාලන හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ වැදගත්කම ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඇගයීම මඟින් අවධාරණය කර ඇත.

ඒ අනුව, මධ්‍යකාලීනව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී, එකිනෙකට අන්තර් සම්බන්ධිත ප්‍රමුඛතා ත්‍රිත්වයක් අතර නිසි සමතුලිතතාවක් පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ. එනම්, දිට්වා සුළි කුණාටුවෙන් සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීමේ සහ අනාගත ආපදාවන්ට ඔරොත්තු දිය හැකි පරිදි නැවත ගොඩනැංවීමේ කටයුතු සම්පූර්ණ කිරීම, විශේෂිත වූ බාහිර ආපදා තත්ත්වයන් හේතුවෙන් ඇතිවන ආර්ථික හා සමාජීය බලපෑම් අවම කිරීම සඳහා තාවකාලික හා නිසි ලෙස ඉලක්කගත මැදිහත්වීම් සිදු කිරීම සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය හා ණය තිරසාරභාවය ආරක්ෂා කරගැනීම සඳහා අත්‍යවශ්‍ය වන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිළිවෙළ සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වාගෙන යාම යන ප්‍රමුඛතා ත්‍රිත්වයයි.

2026 වසරේ ලද අත්දැකීම් සහ 2027 වසරේ දී ඇති විය හැකියැයි අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය පීඩනයන් මඟින් රාජ්‍ය මූල්‍ය චිනය පවත්වාගෙන යන අතරම සුවිශේෂී අවස්ථාවන්හි දී මනාව නිර්වචනය කරන ලද එමෙන්ම නම්‍යශීලීභාවයකට ඉඩ සලසන, විශ්වසනීය හා රීති මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය රාමුවක් පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කරනු ලබයි. ඒ අනුව, දිට්වා සුළි කුණාටුවෙන් සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් සපයා ගැනීම වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය ඉලක්කවලින් තාවකාලිකව බැහැර වීමට සිදුවුව ද එය, අඛණ්ඩව රාජ්‍ය ආදායම් රැස්කිරීම, රාජ්‍ය වියදම් දැඩි ලෙස පාලනය කිරීම, විනිවිදභාවයෙන් යුතුව තොරතුරු වාර්තා කිරීම සහ නීතිය මඟින් නියම කර ඇති ප්‍රාථමික වියදම් සීමාවට නැවත අනුකූල වීම සඳහා පැහැදිළි හා නිශ්චිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම මත රඳා පවතිනු ඇත. මෙම ප්‍රවේශය මගින්, රාජ්‍ය මූල්‍ය හා ණය තිරසාරභාවය පවත්වාගෙන යන අතරම, ආර්ථික ගැළපුම් හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළින් අත්කරගෙන ඇති සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරගනිමින්, කඩිනමින් සපුරාලිය යුතු ප්‍රතිසංස්කරණ හා සමාජීය අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමට රජයට හැකි වනු ඇත.

1.2 සාර්ව රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය

අඛණ්ඩව දේශීය හා බාහිර අවදානම් තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවීම හමුවේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය සිය ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින් 2026 වසරේ පළමු භාගය තුළ තවදුරටත් වර්ධනය විය. 2026 වසරේ පළමු භාගය තුළ මූර්ත ද.දේ.නි.ය පෙර වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.7 කින් වර්ධනය වූ අතර, පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 5.1 ක ආර්ථික වර්ධනය දෙවන කාර්තුවේ දී සියයට 4.2 ක් දක්වා මන්දගාමී විය. 2026 වසරේ දෙවන කාර්තුව තුළ කාර්මික අංශයේ ක්‍රියාකාරකම් සියයට 7.3 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, සේවා අංශයේ ක්‍රියාකාරකම් සියයට 2.7 කින් වර්ධනය විය. කෙසේ වුවද, අයහපත් කාලගුණික තත්ත්වයන්හි බලපෑම ද අර්ධ වශයෙන් පිළිබිඹු කරමින් කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරකම් සියයට 2.3 කින් සංකෝචනය වූ අතර, නිෂ්පාදන මත පනවන බදුවලින් නිෂ්පාදන සඳහා ලබාදෙන සහනාධාර අඩු කළ පසු ලැබෙන ශුද්ධ අගය සියයට 11.9 කින් වර්ධනය විය.

භූ දේශපාලනික ආතතීන් උත්සන්න වීම, බලශක්ති වෙළෙඳපොළ තුළ ඇති වූ බාධා සහ ගෝලීය මූල්‍ය හා වෙළෙඳ පරිසරය තුළ අඛණ්ඩව පැවති අවිනිශ්චිතතාවයන් හමුවේ, 2026 වසරේ මේ දක්වා ගෝලීය ආර්ථික තත්ත්වයන් අභියෝගාත්මක මට්ටමක පැවතුණි. භූ දේශපාලනික ගැටුම්වල බලපෑම් විශේෂයෙන්ම බලශක්ති ආනයනය මත රඳා පවතින ආර්ථිකයන්ට සහ අවදානමට ලක්විය හැකි ආර්ථිකයන්ට අහිතකර ලෙස බලපාන අතර, ගෝලීය උද්ධමනය පහළ යාමේ ප්‍රවණතාවය ද නැවතී ඇති පසුබිමක, ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම තවදුරටත් අස්ථාවර ස්වභාවයක් පෙන්නුම් කරයි. එබැවින්, තවදුරටත් මිල ස්ථායීතාව පවත්වාගෙන යාම, රාජ්‍ය මූල්‍ය අවකාශය යළි ගොඩනැංවීම සහ අනාගතයේ දී ඇතිවිය හැකි කම්පනවලට අනුවර්තනය වීම සඳහා ආර්ථිකයට ඇති හැකියාව ඉහළ නැංවීම වැදගත් වේ.

ශ්‍රී ලංකාව 2026 වසරේදී ද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී. 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 3,301.5 ක් වූ රජයේ ආදායම සහ ප්‍රදාන,

2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 21.2 කින් රු. බිලියන 4,002.3 ක් දක්වා වර්ධනය විය. 2026 වසරේ පළමු මාස අට තුළ බදු ආදායම සියයට 20.0 කින් රු. බිලියන 3,683.6 ක් දක්වා වර්ධනය වූ අතර, බදු නොවන ආදායම සියයට 39.1 කින් රු. බිලියන 314.8 ක් දක්වා වර්ධනය විය. ආදායම් බදුවලින්, එකතු කළ අගය මත බද්දෙන් සහ මෝටර් රථ ආනයනය මත පනවන ලද බදුවලින් ලැබුණු ඉහළ ආදායම් මෙන්ම බදු පරිපාලනයේ අඛණ්ඩව සිදු කරන ලද වැඩිදියුණු කිරීම් රාජ්‍ය ආදායමෙහි මෙම ඉහළ කාර්යසාධනය සඳහා දායක විය. එමෙන්ම, 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට, 2026 වසර සඳහා ඇස්තමේන්තුගත සමස්ත බදු ආදායමෙන් ආසන්න වශයෙන් සියයට 75.0 ක් ලභා කර ගැනීමට හැකි විය.

2025 වසරේ පළමු මාස අට තුළ ආදායම් බදුවලින් ලද ආදායම, රු. බිලියන 702.4 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 17.6 කින් රු. බිලියන 825.6 ක් දක්වා වර්ධනය විය. එසේම, 2025 වසරේ පළමු මාස අට තුළ භාණ්ඩ හා සේවා මත බදුවලින් ලද ආදායම රු. බිලියන 1,939.1 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,366.7 දක්වා වර්ධනය විය. මේ අතර, විදේශ වෙළෙඳාම මත බදුවලින් ලද ආදායම, 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 427 ට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 491.2 ක් දක්වා වර්ධනය විය. තවද, 2025 වසරේ පළමු මාස අට තුළ එකතු කළ අගය මත බදු මඟින් ලද ආදායම රු. බිලියන 1,084.2 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 22.0 කින් රු. බිලියන 1,322.7 ක් දක්වා වර්ධනය විය.

2026 වසරේ පළමු මාස අට තුළ ආදායම් රැස්කිරීමේ ප්‍රධාන ආයතනවල ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය ඉහළ මට්ටමක පැවතුණි. ශ්‍රී ලංකා රේගුව විසින් රු. බිලියන 1,726.8 ක පමණ ආදායමක් රැස්කරගෙන ඇති අතර, එය එම ආයතනයේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 78.3 ක් විය. මේ අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු.බිලියන 1,727.5 ක පමණ ආදායමක් රැස්කරගෙන ඇති අතර, එය එම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 71.9 ක් විය. සුරාබදු දෙපාර්තමේන්තුව විසින් රු. බිලියන 182.4 ක පමණ ආදායමක් රැස්කරගෙන ඇති අතර, එය එම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 74.5 ක් නියෝජනය කරනු ලබයි.

ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ, බදු ගෙවන්නන්ගේ අනුකූලතාව ශක්තිමත් කිරීම සහ ඩිජිටල්කරණය තුළින් බදු පරිපාලනය නවීකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. බදු නීති බලාත්මක කිරීම, බදු විගණනය සඳහා බදු ගෙවන්නන් තෝරාගැනීම සහ බදු ගෙවන්නන්ට සපයනු ලබන සේවාවන් වඩාත් කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අනුකූලතා අවදානම් කළමනාකරණ රාමුව (Compliance Risk Management Framework) භාවිත කිරීම තවදුරටත් ශක්තිමත් කරන ලදී. මේ අතර, ඉහළ වත්කම් හිමි පුද්ගලයන් සම්බන්ධ වැඩසටහන යටතේ, ඉහළ අවදානමක් සහිත පුද්ගලයන් සහ ඔවුන්ට සම්බන්ධ ආයතන ඉලක්ක කරගනිමින් අවදානම් පදනම් කරගත් බදු විගණන කටයුතු ආරම්භ කරන ලදී. තවද, එකතු කළ අගය මත බදු සම්බන්ධ අනුකූලතාව ඉහළ නැංවීම, බදු ගෙවන්නන්ගේ ලේඛනයේ පවතින අඩුපාඩු නිවැරදි කර එය යාවත්කාලීන කිරීම සහ බදු වාර්තා නියමිත පරිදි ඉදිරිපත් කිරීමේ අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා ද පියවර ගන්නා ලදී. මෙම ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංගයක් ලෙස ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය අඛණ්ඩව නවීකරණය කිරීම සිදු කෙරෙන අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන සියලුම බදු මෙම පද්ධතිය හරහා සැකසීම සහ රැස්කිරීම සඳහා ක්‍රමානුකූලව යොමු කෙරෙමින් පවතී. ඊට සමගාමීව, ජාතික විද්‍යුත් ඉන්වොයිසි පද්ධතිය අදියරගත ප්‍රවේශයක් යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව, පරිගණක පද්ධති අතර දත්ත ස්වයංක්‍රීයව හුවමාරු කරගැනීමට පහසුකම් සලසන ආරක්ෂිත යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත් තාක්ෂණය (Web API) ඔස්සේ බදු ගෙවන්නන්ගේ ව්‍යවසායය සම්පත් සැලසුම්කරණ (Enterprise Resource Planning – ERP) පද්ධතිවලින් එකතු කළ අගය මත බදු ඉන්වොයිස් දත්ත, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙත තත්‍ය කාලීනව සම්ප්‍රේෂණය කිරීමට (real time transmission) පහසුකම් සැලසෙන අතර මෙම පද්ධති අතර ඒකාබද්ධතාව ක්‍රමානුකූලව තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ.

සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමවේදයේ සිට අවදානම් පදනම් කරගත් සාමාන්‍ය එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය වෙත සංක්‍රමණය වීමේ ක්‍රියාවලිය 2026 වසර තුළ ද අඛණ්ඩව සිදු කෙරිණි. 2025 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය අභෝසි කිරීමෙන් අනතුරුව, වැඩිදියුණු කළ අධීක්ෂණ ක්‍රමවේදයන්, මෙහෙයුම් ධාරිතාව ශක්තිමත් කිරීම සහ බදු ගෙවන්නන් සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණය පවත්වාගෙන යාම තුළින් අවදානම් පදනම් කරගත්, බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම තවදුරටත් ශක්තිමත් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. 2026 වසරේ ජනවාරි මාසයේ සිට එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩිදියුණු


කිරීමේ වැඩසටහන සාම්ප්‍රදායික එකතු කළ අගය මත බදු ක්‍රමවේදය දක්වා ද ව්‍යාප්ත කරන ලද අතර ඒ යටතේ, ක්ෂේත්‍ර මට්ටමින් බදු අනුකූලතාව තහවුරු කිරීමේ ක්‍රියාකාරකම් සිදු කිරීම, තාවකාලික එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි අංකවල වලංගුභාවය තහවුරු කිරීම සහ බදු ගෙවන්නන්ගේ ලේඛනයේ පවතින අඩුපාඩු නිවැරදි කර එය යාවත්කාලීන කිරීම ඇතුළු ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවන ලදී. මීට අමතරව, 2026 වසරේ ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා වන වාර්ෂික ලියාපදිංචි වීමේ සීමාව රු. මිලියන 60 සිට රු. මිලියන 36 දක්වා අඩු කරන ලද අතර, එමගින් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වන බදු පදනම පුළුල් විය. මෙම ප්‍රතිසංස්කරණවලට සමගාමීව බදු පරිපාලනය ඩිජිටල්කරණය කිරීමේ කටයුතු ද අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලදී. ඒ යටතට ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා එකතු කළ අගය මත බදු වාර්තාකරණය සහ බදු අනුකූලතාව ශක්තිමත් කිරීම මෙන්ම විද්‍යුත් ඉන්වොයිසි ක්‍රමවේදය අදියරගතව ක්‍රියාත්මක කිරීම සහ යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත් (API) මත පදනම්ව එකතු කළ අගය මත ඉන්වොයිස් දත්ත සම්ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ද ඇතුළත් විය.

රාජ්‍ය වියදම් පිළිබඳ සැලකීමේ දී 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 3,712.5 ක් වූ රජයේ සමස්ථ වියදම, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 6.9 කින් රු. බිලියන 3,966.9 දක්වා මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. පුනරාවර්තන වියදම සියයට 4.4 කින් රු. බිලියන 3,531 දක්වා වර්ධනය වූ අතර, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් සියයට 31.6 කින් රු. බිලියන 435.9 දක්වා වර්ධනය විය. 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 1,687.6 ක් වූ පොලී ගෙවීම්, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.6 කින් රු. බිලියන 1,609.2 ක් දක්වා අඩු විය. සමස්ත පුනරාවර්තන වියදමෙන් සියයට 45.6 ක් පොලී ගෙවීම් සඳහා වැය වී ඇති අතර, සියයට 23.4 ක් වැටුප් හා වේතන සඳහා ද, සියයට 25.2 ක් සහනාධාර හා පැවරුම් සඳහා ද, ආසන්න වශයෙන් සියයට 5.8 ක් භාණ්ඩ හා සේවා සඳහා ද වැය වී ඇත.

රාජ්‍ය ආදායමෙහි ඉහළ කාර්යසාධනය සහ රාජ්‍ය වියදම් මනා විනයකින් යුතුව කළමනාකරණය කිරීම හේතුවෙන් 2026 වසරේ පළමු මාස අට තුළ රාජ්‍ය මූල්‍ය ශේෂයන්හි සැළකිය යුතු වර්ධනයක් වාර්තා විය. 2025 වසරේ පළමු මාස අට තුළ රු.බිලියන 1,276.5 ක් වූ ප්‍රාථමික අතිරික්තය, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,644.6 දක්වා වර්ධනය විය. එමෙන්ම, 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 411 ක සමස්ත අයවැය හිඟයක් වාර්තා වූ අතර, ඊට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 35.4 ක සමස්ත අයවැය අතිරික්තයක් වාර්තා විය. මෙම වර්ධනය මඟින් ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩව ශක්තිමත් වෙමින් පවතින බව පිළිබිඹු වේ. කෙසේ වුවද, ආපදා හේතුවෙන් සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීම සහ නැවත ගොඩනැංවීම සඳහා සැළකිය යුතු වියදමක් 2026 වසරේ ඉතිරි කාලය තුළ මෙන්ම 2027 වසර තුළ ද දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.2 රූපසටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය සමස්තයන්: 2023-2025

ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස



මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

එසේ වුවද, රාජ්‍ය ණය මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ දී තවදුරටත් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ යුතු කරුණක් ලෙස පවතී. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරන ලද කාර්තුමය සංඛ්‍යානමය ණය වාර්තාවට අනුව, 2026 වසරේ ජූනි මස අවසානය වන විට සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය ආසන්න වශයෙන් රු. බිලියන 32,977 ක් ලෙස වාර්තා විය. ඉන් මධ්‍යම රජයේ ණය ප්‍රමාණය ආසන්න වශයෙන් රු. බිලියන 31,999 ක් වූ අතර, එයට රු. බිලියන 19,203 ක පමණ දේශීය ණය සහ රු. බිලියන 12,796 ක පමණ විදේශීය ණය ඇතුළත් විය. අඛණ්ඩව ප්‍රාථමික අතිරික්තයන් පවත්වාගෙන යාම සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වීම මධ්‍යකාලීනව රාජ්‍ය ණය අඩු කිරීමේ වැඩපිළිවෙළට සහාය වන නමුත්, ණය සම්බන්ධ අවදානම් අවම කිරීම සඳහා විචක්ෂණශීලීව ණය ලබාගැනීම, ඵලදායී ණය හා මුදල් කළමනාකරණය සහ අඛණ්ඩව රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූලව කටයුතු කිරීම තවදුරටත් අත්‍යවශ්‍ය වේ.

2026 වසර තුළ උද්ධමන පීඩනය සහ විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය ඉහළ ගිය අතර, විශේෂයෙන් මැදපෙරදිග කලාපයේ භූ දේශපාලනික ආතතීන් උත්සන්න වීම සහ ඒ හා සමගාමීව ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යාම මේ සඳහා බලපාන ලදී. වසර ආරම්භයේ සිට 2026 වසරේ ඔක්තෝබර් මස අවසානය වන විට, ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 6.8 කින් අවප්‍රමාණය වී තිබුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 වසරේ මාර්තු මාසයේ දී වාර්තා වූ සියයට 2.2 සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 8.3 දක්වා ඉහළ යන ලදී. ඔක්තෝබර් මාසයේ දී

ආහාර උද්ධමනය සියයට 8.8 ක් දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන උද්ධමනය සියයට 8.0 ක මට්ටමේ පැවතිණි. මේ අතර, මූලික උද්ධමනය සියයට 5.6 ක් දක්වා ඉහළ යන ලදී. උද්ධමනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බලශක්ති පිරිවැය ඉහළ යාමේ බලපෑම දේශීය මිල ගණන් වෙත සම්ප්‍රේෂණය වීම සහ එමගින් ආර්ථිකයේ අනෙකුත් අංශ වෙත ඇති වූ වක්‍ර බලපෑමය. ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන අනුව, මතුපිට උද්ධමනය 2027 වසරේ පළමු කාර්තුව දක්වා ඉහළ තනි ඉලක්කමක මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඉන් අනතුරුව ක්‍රමානුකූලව පහළ ගොස් සියයට 5.0 ක උද්ධමන ඉලක්කය වෙත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2026 වසරේ මුල් කාලපරිච්ඡේදය තුළ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 7.75 ක මට්ටමේ පවත්වාගෙන යන ලදී. කෙසේ වුවද, උද්ගත වෙමින් පැවති උද්ධමන පීඩනය, ඉහළ ගිය ගෝලීය බලශක්ති මිල ගණන්, ඉහළ යමින් පැවති දේශීය ඉල්ලුම සහ මැදපෙරදිග ගැටුම් හේතුවෙන් උත්සන්න වූ අවිනිශ්චිතතාවයන් ආදියට ප්‍රතිචාර වශයෙන්, 2026 වසරේ මැයි මාසයේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 100 කින් සියයට 8.75 දක්වා ඉහළ නංවන ලදී. මින් පෙර සිදු කරන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ බලපෑම් සහ වෙනස් වෙමින් පවතින දේශීය හා ගෝලීය ආර්ථික තත්ත්වයන් අඛණ්ඩව ඇගයීමට ලක් කරමින්, 2026 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයේදී ද, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 8.75 මට්ටමේ නොවෙනස්ව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට ප්‍රමාණවත් ණය ප්‍රවාහයක් පවත්වාගෙන යන අතරම, උද්ධමනයේ දෙවන වටයේ බලපෑම් හේතුවෙන් ඇතිවන පීඩනය පාලනය කිරීම සහ උද්ධමන අපේක්ෂාවන් ස්ථාවරව පවත්වාගෙන යාමට අපේක්ෂා කරන ලදී. ඉදිරියේ දී ක්‍රියාවට නැංවීමේ දී යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා, භූ දේශපාලනික ප්‍රවණතාවයන්, ගෝලීය වෙළෙඳ භාණ්ඩ මිල ගණන් සහ එල් නිනෝ තත්ත්වයන් හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව අධීක්ෂණය කරමින් සිටියි.

1.3 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් පාලනය වන අතර, එම පනත වගකීම්සහගත රාජ්‍ය මූල්‍ය කළමනාකරණය උදෙසා රීති මත පදනම් වූ රාමුවක් ස්ථාපනය කරනු ලබයි. තිරසාර රාජ්‍ය ණය මට්ටමක් පවත්වාගෙන යාම, අනාගතයේදී ඇතිවිය හැකි ආපදා තත්ත්වයන්ට මුහුණදීම සඳහා ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක පවත්වාගෙන යාම, රාජ්‍ය මූල්‍ය අවදානම් විවක්ෂණශීලීව කළමනාකරණය කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනය, විනිවිදභාවය හා වගවීම ශක්තිමත් කිරීම ආදිය සපුරාලීමට එම පනත මඟින් රජයට නියම කර ඇත. එමෙන්ම, වාර්ෂික මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ සෑම වසරකම යාවත්කාලීන කෙරෙන පස් අවුරුදු මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව ඔස්සේ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය සැලසුම්කරණය ආයතනගත කිරීමට ද මෙම පනත මඟින් විධිවිධාන සලසා ඇති අතර මෙම මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය සහ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව වාර්ෂික අයවැය සකස් කිරීම සහ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ඇගයීම සඳහා අවශ්‍ය උපායමාර්ගික පදනම සපයනු ලබයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11 වන වගන්තියට අනුකූලව 2026 වසරේ ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද 2027 වසර සඳහා වූ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි 2027–2031 කාලපරිච්ඡේදයට අදාළ වූ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සහ මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශය ඇතුළත් වේ.

2026 වසර තුළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු ද අඛණ්ඩව ඉදිරියට ගෙන යන ලද අතර, එම පනත මගින් ස්ථාපිත කර ඇති නෛතික රාමුව ඵලදායී ලෙස අයවැය ක්‍රියාත්මක කිරීම, වියදම් සඳහා වන බැඳීම් පාලනය කිරීම , රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය සහ රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම කෙරෙහි වැඩි අවධානයක් යොමුකරනු ලබයි. පනතේ විධිවිධාන තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ අරමුණින්, අයවැය ක්‍රියාත්මක කිරීම, වියදම් සඳහා වන බැඳීම් පාලනය සහ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් ආවරණය වන පරිදි අවශ්‍ය රෙගුලාසි සහ නියෝග සකස් කිරීමේ කටයුතු ද සිදු කෙරෙමින් පවතී. නව රෙගුලාසි බලාත්මක වන තෙක්, දැනට පවතින මුදල් රෙගුලාසි සහ අදාළ භාණ්ඩාගාර චක්‍රලේඛ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට පටහැනි නොවන පරිදි අඛණ්ඩව බලාත්මකව පවතිනු ඇත. මීට අමතරව, ආපදා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සහ සැබෑ ප්‍රතිලාභ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු ඇතුළුව, සුවිශේෂී අවස්ථාවන්හිදී දරනු ලබන වියදම් අධීක්ෂණය කිරීම සහ ඒ පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමේ ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කර ඇත.

රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණ, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවන ප්‍රධාන පදනම ලෙස තවදුරටත් පවතින අතර, එම අරමුණ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ ස්ථාපිත කර ඇති ප්‍රාථමික ශේෂ ඉලක්කය සහ ප්‍රාථමික වියදම් සීමාව ඔස්සේ ක්‍රියාවට නංවනු ලබයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 15 වන

වගන්තිය අනුව, ප්‍රාථමික වියදම් ඇස්තමේන්තුගත නාමික ද.දේ.නි.යෙන් සියයට 13.0 කට සීමා කළ යුතු අතර, ප්‍රාථමික ශේෂ ඉලක්කය මධ්‍යකාලීන රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණට අනුකූල වන පරිදි තීරණය කරනු ලැබේ. තවද, පනතේ 16 වන වගන්තිය මඟින්, අදාළ නෛතික අවශ්‍යතාවයන්ට යටත්ව සුදුසුකම් ලබන අනපේක්ෂිත සිදුවීම් සහ ස්වාභාවික ආපදා හේතුවෙන් ඇතිවන අතිරේක, තාවකාලික හා නිශ්චිතව ඉලක්කගත වියදම් දැරීම සඳහා පැහැදිලිව සඳහන් කරනු ලබන කරන ල අවශ්‍යතාවයට උචිත පරිදි වියදම් හැසිරවීම සඳහා අවස්ථාවක්ද සලසා දී ඇත. ඒ සඳහා අවශ්‍ය පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම සහ රාජ්‍ය මූල්‍ය රීතිවලට නැවත අනුකූල වීම සඳහා යථා තත්ත්වයට එළැඹීමේ පැහැදිලි වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීම ඇතුළු අදාළ නෛතික අවශ්‍යතා සපුරාලිය යුතු වේ.

ඒ අනුව, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය සමස්ත රාජ්‍ය මූල්‍ය දර්ශක සාධනීය මට්ටමක පවත්වාගෙන යාමට පමණක් නොව, එම දර්ශකවල ගුණාත්මකභාවය සහ දිගුකාලීනව තිරසාරව පවත්වාගෙන යාමේ හැකියාව වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරනු ඇත. ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීම සහ වඩාත් පුළුල් හා කාර්යක්ෂම බදු පදනමක් ස්ථාපිත කිරීම මඟින් දේශීය ආදායම් රැස්කිරීම අඛණ්ඩව ඉහළ නැංවීම, රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙන් සියයට 16.0 ක පමණ මට්ටමක පවත්වාගෙන යාම ආදිය සඳහා මධ්‍යකාලීන ආදායම් ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් ලෙස තවදුරටත් පවතිනු ඇත. රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් සැලකීමේ දී, වියදම් පිළිබඳ ප්‍රමුඛතා නිර්ණය කිරීම, වියදම් සඳහා වන බැඳීම් ඵලදායී ලෙස පාලනය කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය ආයෝජන කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ තාවකාලික ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා දරනු ලබන පුනරාවර්තන වියදම් ස්ථිර බැඳීම් බවට පත්වීම වැළැක්වීම ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත. එමෙන්ම, රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය සඳහා ද වැඩි ප්‍රමුඛතාවක් ලබාදෙනු ඇති අතර, විශේෂයෙන්ම ස්වාභාවික ආපදා සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් තත්ත්වයන්, රාජ්‍ය ව්‍යවසායයන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ රජයේ ඇපකර සම්බන්ධයෙන් පැනනගින රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත. මෙම ක්‍රියාමාර්ග මඟින් මධ්‍යකාලීන වශයෙන් රාජ්‍ය ණය අඩුවීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරගනිමින්, අනාගත ආර්ථික අවදානම් තත්ත්වයන්ට මුහුණදීම සඳහා අවශ්‍ය රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක යළි ගොඩනැංවීමට අපේක්ෂා කෙරේ.

රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය, 2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ අඩංගු 2027–2031 කාලපරිච්ඡේදය සඳහා වන මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව මත පදනම් වන අතර, එය රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය මූල්‍ය වගකීම් රාමුවට අනුකූලව ක්‍රියාත්මක කෙරේ. රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක යළි ගොඩනැංවීම, රාජ්‍ය ආදායම් රැස්කිරීම ශක්තිමත් කිරීම, රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාව සහ සංයුතිය වැඩිදියුණු කිරීම මෙන්ම සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරගැනීමත් සමඟ රාජ්‍ය ණය තිරසාර ලෙස අඛණ්ඩව අඩු වන මාවතකට යොමු කිරීම මෙම රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායෙහි ප්‍රධාන අරමුණ වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ, රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණ මධ්‍යකාලීන ප්‍රාථමික ශේෂ ඉලක්ක සහ ප්‍රාථමික වියදම් සීමාව ඔස්සේ ක්‍රියාවට නංවනු ලබන අතර, පනත ක්‍රියාත්මක කිරීමේ ආරම්භක කාලපරිච්ඡේදය තුළ ප්‍රාථමික වියදම් සාමාන්‍යයෙන් ද.දේ.නි.යෙන් සියයට 13.0 කට අඩු මට්ටමක පවත්වාගෙන යා යුතු වේ. එමෙන්ම, අනපේක්ෂිත හදිසි අවස්ථා සහ ස්වාභාවික ආපදා හේතුවෙන් පැනනගින තාවකාලික හා නිශ්චිතව ඉලක්කගත අතිරේක වියදම් දැරීම සඳහා, අදාළ නෛතික අවශ්‍යතා සපුරාලීමට යටත්ව, පැහැදිලිව නිර්වචනය කරන ලද අවශ්‍යතාවයට උචිත පරිදි වියදම් හැසිරවීම සඳහා අවස්ථාවක්ද මෙම පනත මඟින් සලසා ඇත.

2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය, ප්‍රකාශයට පත් කරන අවස්ථාවේ දී අපේක්ෂා කළ මට්ටමට වඩා 2026 වසරේ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ඉහළ ප්‍රගතියක් පෙන්වන ලදී. දිට්වා සුළි කුණාටුව සහ මැදපෙරදිග කලාපයේ ඇති වූ අහිතකර තත්ත්වයන් හේතුවෙන් සැළකිය යුතු ලෙස අතිරේක වියදම් අවශ්‍යතා පැනනැඟී තිබුණද, රාජ්‍ය ආදායම් රැස්කිරීම අඛණ්ඩව ශක්තිමත් වීම සහ රාජ්‍ය වියදම් මනා විනයක් සහිතව කළමනාකරණය කිරීම මෙම ඉහළ කාර්යසාධනයට දායක විය. සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුව, 2026 වසරේ සමස්ත රාජ්‍ය ආදායම සහ ප්‍රදාන ද.දේ.නි.යෙන් සියයට 16.6 ක පමණ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර තිබේ. මේ අතර, ප්‍රකාශයට පත් කරන ලද 2027 වසරට අදාළ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි අඩංගු ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.1 ක් වූ ප්‍රාථමික අතිරික්තයෙහි පුරෝකථනයට සාපේක්ෂව, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ එම අතිරික්තය සියයට 3.6 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙලෙස සාධනීය මට්ටමකට ලභා වූ රාජ්‍ය මූල්‍ය තත්ත්වය, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, සුවිශේෂී තත්ත්වයන් හේතුවෙන් පැනනගින අතිරේක වියදම්

අවශ්‍යතා සපුරාලීම සඳහා වැදගත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂකයක් සපයනු ලබයි.

2027 වසර සඳහා ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් ප්‍රාථමික වියදම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.9 ක්, සමස්ත රාජ්‍ය ආදායම සහ ප්‍රදාන සියයට 15.5 ක් සහ ප්‍රාථමික අතිරික්තය සියයට 2.6 ක් ලෙස මූලික වශයෙන් ඇස්තමේන්තුගත කර තිබුණි. කෙසේ වුවද, රාජ්‍ය ආදායම් පිළිබඳ ඉදිරි දැක්මෙහි ප්‍රගතිය සහ දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැනනැගුණු පුනරුත්ථාපන හා නැවත ගොඩනැංවීමේ අතිරේක අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, මෙම මූලික පුරෝකථන යාවත්කාලීන කිරීමට අවශ්‍ය විය.ඒ අනුව, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ, අතිරේක ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළත් කිරීමට පෙර, 2027 වසර සඳහා සමස්ත රාජ්‍ය ආදායම සහ ප්‍රදාන ද.දේ.නි.යෙන් සියයට 15.8 ක පමණ මට්ටමක ද, ප්‍රාථමික අතිරික්තය සියයට 2.9 ක පමණ මට්ටමක ද පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. දිට්වා සුළි කුණාටුවට අදාළ අතිරේක වියදම් ඇතුළත් කිරීමෙන් අනතුරුව, ප්‍රාථමික වියදම් තාවකාලිකව ද.දේ.නි.යෙන් සියයට 13.6 ක් පමණ ද, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය ලබාදීම් සියයට 5.1 ක් පමණ ද දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 තෙක් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.5 ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෙම තාවකාලික බැහැරවීම රීති මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය රාමුව තුළ කළමනාකරණය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2028 වසරේ සිට ප්‍රාථමික වියදම් නැවත ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.9 ක පමණ මට්ටමකට අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, මධ්‍යකාලීන වශයෙන් ඉතිරි කාලය තුළ ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.0 ක පමණ මට්ටමක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආදායම් ඉහළ නැංවීම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායේ ප්‍රධාන අංගයක් ලෙස පවතිනු ඇත. ප්‍රකාශයට පත් කරන ලද 2027 වසරට අදාළ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් මධ්‍යකාලීනව රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙන් සියයට 15.5 ක පමණ මට්ටමක පවත්වාගෙන යාමට අපේක්ෂා කළ ද, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව අනුව 2027 වසරේ සිට රාජ්‍ය ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16 ක පමණ මට්ටමක පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, බදු පදනම පුළුල් කිරීම, බදු නිදහස් කිරීම් සහ බදු දිරිගැන්වීම් තාර්කිකකරණය කිරීම, බදු පරිපාලනය සහ බදු අනුකූලතාව ශක්තිමත් කිරීම මෙන්ම බදු ක්‍රමයේ කාර්යක්ෂමතාව සහ සාධාරණත්වය වැඩිදියුණු කිරීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කරනු ඇත. මධ්‍යකාලීන ආදායම් ක්‍රමෝපාය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මඟින් බදු ප්‍රතිපත්තිය, ආදායම් පරිපාලනය සහ නෛතික රාමුව යන ක්ෂේත්‍රයන්හි ප්‍රතිසංස්කරණ සැලසුම්සහගතව හා අදියරෙන් අදියර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික රාමුව සපයනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ මෑතකදී පැවැති සාකච්ඡාවලදී ද, රාජ්‍ය ආදායම් රැස්කිරීම අඛණ්ඩව ශක්තිමත් කිරීම, බදු පදනම පුළුල් කිරීම සහ ආදායම් පරිපාලනය වැඩිදියුණු කිරීම ප්‍රධාන ප්‍රමුඛතා ලෙස අවධාරණය කර තිබේ. රාජ්‍ය ආදායම දිගුකාලීනව ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 20.0 ක මට්ටමක් කරා ඉහළ නැංවීම සහ සෘජු බදු හා වක්‍ර බදු අතර අනුපාතය ක්‍රමානුකූලව 40:60 මට්ටමක් කරා වැඩිදියුණු කිරීම යන ප්‍රතිපත්තිමය අරමුණු, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුවේ පුරෝකථනවලින් වෙන් වූ එහෙත් රජයේ පුළුල් ආදායම් ක්‍රමෝපායෙහි අංගයන් ලෙස තවදුරටත් පවතිනු ඇත.

රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් ගත් කළ, අත්‍යවශ්‍ය සමාජ වියදම් පවත්වා ගනිමින් සහ ඵලදායී රාජ්‍ය ආයෝජන සඳහා වෙන් කෙරෙන සම්පත්වල ප්‍රතිශතය ඉහළ නංවමින්, විචක්ෂණශීලී ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම සඳහා රජය අඛණ්ඩව ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත. 2027 වසරට අදාළ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් 2027 වසරේ සිට රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.0 කට වඩා ඉහළ මට්ටමක පවත්වාගෙන යාමට අපේක්ෂිතය. සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව අනුව, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැන නැඟුණු නැවත ගොඩනැංවීමේ කටයුතු සඳහා දරනු ලබන වියදම්වල බලපෑම ද අර්ධ වශයෙන් පිළිබිඹු කරමින්, 2027 වසරේ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය ලබාදීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.1 ක පමණ මට්ටමක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉන් අනතුරුව ද මධ්‍යකාලීන වශයෙන් එම වියදම් සාපේක්ෂව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරනු ලබන ඉහළ ප්‍රතිපාදන කාලෝචිත හා ඵලදායී ආයෝජන බවට පරිවර්තනය වන බව සහතික කිරීම සඳහා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම, ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතා නිර්ණය කිරීම, ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ වැය කරන මුදලට සරිලන ප්‍රතිලාභ ලබාගැනීම ආදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත. මෑත කාලයේ දී ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන අපේක්ෂිත මට්ටමින් උපයෝජනය නොවීම සහ පුනරාවර්තන වියදම් සඳහා ස්ථීර බැඳීම් ඇතිවීම වළක්වා ගනිමින් නැවත ගොඩනැංවීමේ කටයුතු කඩිනම් කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගැනීමේ දී, මෙම ප්‍රවේශය විශේෂයෙන් වැදගත් වේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ මඟින් රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීම සඳහා

අවශ්‍ය ආයතනික පදනම තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත. ඒ අනුව, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ සහාය ඇතිව, අයවැය ක්‍රියාත්මක කිරීම, වියදම් සඳහා වන බැඳීම් පාලනය, රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය සහ අදාළ නීතිරීති බලාත්මක කිරීම වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. තවද, 2026 වසර තුළ ආපදා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතුවල විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම සඳහා ප්‍රසම්පාදන වියදම් සහ සැබෑ ප්‍රතිලාභ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු වාර්තා කිරීම ඇතුළු තොරතුරු අනාවරණය කිරීමේ අවශ්‍යතාවය රජය විසින් හඳුන්වා දෙන ලදී. ඊට සමගාමීව, රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී. මුදල් අමාත්‍යාංශය විසින් වාර්තා කර ඇති පරිදි, 2026 වසරේ ජූලි මාසය වන විට ජාතික විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය (National e-GP Platform) තුළ ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ආයතන 324 ක් සක්‍රීයව පැවති අතර, විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියේ මීළඟ අදියර 2027 වසරේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

රාජ්‍ය ණය තිරසාරභාවය යළි තහවුරු කිරීම සහ එය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රජය තවදුරටත් කැපවී සිටියි. මේ වන විට රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට අවසන් කර ඇති අතර, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුව පිහිටුවන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය යටතේ ණය කළමනාකරණ කටයුතු ආයතනගත කර ඇත. 2026–2030 කාලපරිච්ඡේදය සඳහා වූ මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සහ 2026 වසර සඳහා වන වාර්ෂික ණය ලබාගැනීමේ සැලැස්ම මඟින් ණය ලබාගැනීමේ පිරිවැය සහ ඒ ආශ්‍රිත අවදානම් කළමනාකරණය කිරීම සඳහා වන වර්තමාන සැලැස්ම සපයනු ලැබේ. මෙම උපායමාර්ගය යටතේ, ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික මූලාශ්‍රවලින් ලබාගත හැකි සහනදායී විදේශීය මූල්‍යයන පහසුකම් මත වැඩි වශයෙන් රඳා පැවතීම, දිගු කල්පිරීමේ කාලසීමාවන් සහිත දේශීය ණය මෙවලම් භාවිතය තුළින් ණය ප්‍රතිමූල්‍යකරණ අවදානම ක්‍රමානුකූලව අඩු කිරීම, දේශීය රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය කිරීම මෙන්ම ණය කළමනාකරණයේ විනිවිදභාවය සහ පවතින ණය වගකීම් කළමනාකරණය වැඩිදියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. 2032 වසර වන විට රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 95.0 කට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යාමේ ණය අඩු කිරීමේ අරමුණ, මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවන වැදගත් පදනමක් ලෙස තවදුරටත් පවතී. මේ අතර, රජයේ ඇපකර සම්බන්ධ සැකැස්ම යටතේ, පවතින රජයේ ඇපකරවල සමස්ත වටිනාකම අදාළ වසර තුනක සාමාන්‍ය ද.දේ.නි.යෙන් සියයට 7.5 කට අඩු මට්ටමක පවත්වාගෙන යාමට අදාළව නෛතික සීමා පනවා ඇත.

2027–2031 කාලපරිච්ඡේදය සඳහා වූ මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව තුළ අන්තර්ගත වන 2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය, 2027 වසරට අදාළ අයවැය සකස් කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික පදනම සැපයීමේ අරමුණින් 2026 වසරේ ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව ඇති වූ සාර්ව ආර්ථික හා රාජ්‍ය මූල්‍ය ප්‍රවණතාවයන් මෙන්ම දිට්වා සුළි කුණාටුව හේතුවෙන් 2027 වසර සඳහා පැනනැගුණු අතිරේක වියදම් අවශ්‍යතා සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සැකසීමේ දී සැලකිල්ලට ගෙන ඇත. ඒ අතරම, මධ්‍යකාලීනව නීතිමය වශයෙන් නියම කර ඇති රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ සීමාවන්ට නැවත අනුකූල වීම සඳහා පැහැදිලිව නිර්වචනය කරන ලද සැලැස්මක් ද එම රාමුව තුළ පැහැදිළිව දක්නට ලැබේ.

රාජ්‍ය මූල්‍ය ගමන් මග:

- රාජ්‍ය ආදායම් ඉහළ නැංවීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් ගැනීම සහ රාජ්‍ය වියදම් තාර්කිකකරණය කිරීම තුළින් මධ්‍යකාලීනව ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගෙන යාම.

- මධ්‍යකාලීනව රජයේ ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.0 ක පමණ මට්ටමක පවත්වාගෙන යන අතරම, දිගුකාලීනව එම ආදායම ද.දේ.නි.යෙන් සියයට 20.0 ක පමණ මට්ටමක් දක්වා ඉහළ නැංවීමේ අරමුණ තෙක් ක්‍රමානුකූලව ප්‍රගතියක් අත්කර ගැනීම.

- බදු ක්‍රමයේ ප්‍රගතිශීලීභාවය සහ සාධාරණත්වය ඉහළ නැංවීම සඳහා මධ්‍යකාලීන හා දිගුකාලීනව සෘජු බදු සහ වක්‍ර බදු අතර අනුපාතය ක්‍රමානුකූලව 40:60 මට්ටමක් කරා ගෙන ඒම.

- ප්‍රධාන බදු සම්බන්ධයෙන් වන බදු අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා එකතු කළ අගය මත බදු අනුකූලතාව ඉහළ නැංවීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමවේදය අහෝසි කිරීමෙන් අනතුරුව අවදානම් පදනම් කරගත් එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය නියමිත කාලසීමාවන් තුළ ක්‍රියාත්මක කිරීම, බදු අනුකූලතාව පිළිබඳ ප්‍රධාන කාර්යසාධන දර්ශක අධීක්ෂණය කිරීම, බදු ගෙවන්නන්ගේ ලේඛනයේ පවතින අඩුපාඩු නිවැරදි කර එය යාවත්කාලීන කිරීම, අවදානම් පදනම් කරගත් බදු විගණන සිදු

කිරීම සහ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය අඛණ්ඩව නවීකරණය කිරීම.

- බදු ක්‍රමය පිළිබඳ විශ්ලේෂණාත්මක ඇගයීම් සිදු කිරීම, බදු පදනම් පුළුල් කිරීම, බදු නිදහස් කිරීම් සහ දිරිගැන්වීම් තාර්කිකකරණය කිරීම, බදු පරිපාලනය සහ අනුකූලතාව වැඩිදියුණු කිරීම මෙන්ම බදු ප්‍රතිපත්තිය, බදු පරිපාලනය සහ නෛතික රාමුව ආවරණය වන පරිදි අදියරගත ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යකාලීන ආදායම් ක්‍රමෝපාය සකස් කර ක්‍රියාත්මක කිරීම.

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව ප්‍රාථමික වියදම් කළමනාකරණය කිරීම. ඒ යටතේ, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැනනැගුණු සුවිශේෂී වියදම් අවශ්‍යතා සපුරාලීම සඳහා 2027 වසරේ දී ප්‍රාථමික වියදම් තාවකාලිකව ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.6 ක පමණ මට්ටමක් දක්වා ඉහළ යාම සැලකිල්ලට ගනිමින්, 2028 වසරේ සිට එම වියදම් නැවත සියයට 12.9 ක පමණ මට්ටමකට අඩු කිරීම.

- රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණට අනුකූලව, මධ්‍යකාලීනව සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.0 කට අඩු මට්ටමක පවත්වාගෙන යාම.

- අඛණ්ඩව ප්‍රාථමික අතිරික්තයන් පවත්වාගෙන යාම, විවක්ෂණශීලීව ණය ලබාගැනීම සහ ණය කළමනාකරණය ශක්තිමත් කිරීම තුළින්, 2032 වසර වන විට රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 95.0 කට වඩා අඩු මට්ටමක් දක්වා අඩු කිරීමේ අරමුණට අනුකූලව රාජ්‍ය ණය අඛණ්ඩව අඩු කිරීම.

- රජයේ ඇපකර නිකුත් කිරීම සම්බන්ධ ඇගයීම් සහ අධීක්ෂණ ක්‍රමවේද ශක්තිමත් කිරීම තුළින් ඒ ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය අවදානම් පාලනය කිරීම. ඒ අනුව, රජයේ පවතින ඇපකරවල සමස්ත වටිනාකම අදාළ මුදල් වර්ෂයේ සහ ඊට පෙර මුදල් වර්ෂ දෙකේ සාමාන්‍ය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 7.5 කට අඩු මට්ටමක පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය මූල්‍ය රීතිය මඟින් නියම කර ඇති සීමාවට අනුකූලව කටයුතු කිරීම.

- රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.0 කට වඩා ඉහළ මට්ටමක පවත්වාගෙන යන අතරම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම, ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතා නිර්ණය කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව ඉහළ නැංවීම.

- පුළුල් පදනමක් මත ක්‍රියාත්මක වන සහ නිසි ලෙස ඉලක්කගත නොවූ සහනාධාර ක්‍රමවේදයන්ගෙන් වැළකී, ආර්ථික අර්බුද, ස්වාභාවික ආපදා සහ බාහිර කම්පන හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම්වලින් අවදානමට ලක්විය හැකි පවුල් ආරක්ෂා කිරීම සඳහා නිසි ලෙස ඉලක්කගත සමාජ ආරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම.

- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන තවදුරටත් ක්‍රියාත්මක කිරීම තුළින් අයවැය ක්‍රියාත්මක කිරීම, වියදම් සඳහා වන බැඳීම් පාලනය, රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය සහ මුදල් කළමනාකරණය වැඩිදියුණු කිරීම මෙන්ම ගෙවිය යුතු වියදම් හිඟ මුදල් එකතු වීම වැළැක්වීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම.

- රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය (e-GP) පුළුල් කිරීම, රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතුවල විනිවිදභාවය සහ වගවීම ශක්තිමත් කිරීම, ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියට සමගාමීව e-GP පද්ධතිය පුළුල් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති සමඟ ඒකාබද්ධ කිරීම මෙන්ම ආපදා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සහ සැබෑ ප්‍රතිලාභ හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම වැඩිදියුණු කිරීම.

- බලශක්ති මිල ගණන් ඒවායේ සැබෑ පිරිවැය නිරූපනය වන පරිදි පවත්වාගෙන යන අතරම, අවශ්‍ය අවස්ථාවලදී තාවකාලික හා නිසි ලෙස ඉලක්කගත සහන ලබාදීම තුළින් රාජ්‍ය ව්‍යවසායයන් හේතුවෙන් පැනනගින රාජ්‍ය මූල්‍ය අවදානම් සීමා කිරීම. එමෙන්ම, රාජ්‍ය ව්‍යවසායයන්, රාජ්‍ය වත්කම් සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සම්බන්ධ ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් පාලනය, මූල්‍ය ශක්‍යතාව, රාජ්‍ය වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කිරීම සහ අනාගතයේදී රජයට මූල්‍ය වගකීම් ඇති කළ හැකි අවිනිශ්චිත බැඳීම් ආශ්‍රිත රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යකාලීන උද්ධමන ඉලක්කකරණ රාමුවට සහ රාජ්‍ය මූල්‍ය හා විදේශීය අංශයේ ස්වාරක්ෂක යළි ගොඩනැංවීමේ අවශ්‍යතාවට අනුකූලව, මිල ස්ථායීතාව සහ පුළුල් සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වාගෙන යාම සඳහා සහාය වීම.

මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව

මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව පහත සඳහන් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අරමුණු මත පදනම් වේ:

- මධ්‍යකාලීනව රාජ්‍ය ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.0 ක පමණ මට්ටමක පවත්වා ගැනීම.

- සුවිශේෂී අවස්ථාවන්හිදී රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අවසර ලබාදී ඇති තාවකාලික බැහැරවීම් හැර, මධ්‍යකාලීනව ප්‍රාථමික වියදම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.0 ක් වන නෛතික සීමාව තුළ පවත්වාගෙන යන අතරම, රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.0 කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීම.

- මධ්‍යකාලීනව ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස අවම වශයෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් පවත්වාගෙන යාම.

- රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණුවලට අනුකූලව, මධ්‍යකාලීනව සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.0 කට අඩු මට්ටමක පවත්වාගෙන යාම.

- මධ්‍යකාලීන රාජ්‍ය ණය අඩු කිරීමේ අරමුණට අනුකූලව, රාජ්‍ය ණය ප්‍රමාණය ක්‍රමානුකූලව තිරසාර මට්ටමක් දක්වා අඩු කිරීම.

1.1 වගුව | මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව: 2027-2031

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

දර්ශකය	2025	2026	2027	2027	2028	2029	2030	2031
	තාවකාලික	සංශෝධිත ඇස්තමේන්තු	ඇස්තමේන්තු	අයවැය(අ)	පුරෝකථන			
මුළු ආදායම හා ප්‍රදාන	**16.7**	**16.6**	**15.8**	**15.8**	**15.9**	**16.0**	**16.0**	**16.0**
මුළු ආදායම	**16.6**	**16.5**	**15.8**	**15.8**	**15.8**	**15.9**	**15.9**	**15.9**
බදු ආදායම	15.4	15.2	14.6	14.6	14.6	14.7	14.7	14.7
බදු නොවන ආදායම	1.2	1.3	1.2	1.2	1.2	1.2	1.2	1.2
ප්‍රදාන	**0.1**	**0.1**	**0.1**	**0.1**	**0.1**	**0.1**	**0.1**	**0.1**
මුළු වියදම	**19.0**	**20.3**	**19.7**	**20.3**	**19.8**	**19.7**	**19.4**	**19.3**
වර්තන වියදම	**16.0**	**16.2**	**15.2**	**15.2**	**15.2**	**14.9**	**14.5**	**14.3**
පොලී නොවන පුනරාවර්තන වියදම	8.3	9.0	8.4	8.5	8.3	8.1	8.0	8.0
පොලී ගෙවීම්	7.6	7.3	6.8	6.8	6.8	6.7	6.5	6.3
ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම	**3.0**	**4.1**	**4.5**	**5.1**	**4.6**	**4.8**	**4.9**	**5.0**
එයින් රාජ්‍ය ආයෝජන	3.1	4.1	4.5	5.1	4.6	4.8	4.9	5.0
ප්‍රාථමික ශේෂය	**5.4**	**3.6**	**2.9**	**2.3**	**3.0**	**3.0**	**3.0**	**3.0**
අයවැය ශේෂය	**-2.3**	**-3.7**	**-3.8**	**-4.5**	**-3.9**	**-3.7**	**-3.5**	**-3.3**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ)පරිපූරක ඇස්තමේන්තුව ඇතුලත්ව

රාජ්‍ය මූල්‍ය රාමුවේ සඳහන් කරන ලද ඉලක්කයන්ගෙන් සිදු වූ අපගමනයන් සඳහා වන සාධාරණීකරණය

සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව සැකසීමේදී රාජ්‍ය ආදායම් පිළිබඳ වඩාත් සාධනීය පුරෝකථන, 2026 වසරේ දී ප්‍රාග්ධන වියදම් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා මන්දගාමීව ක්‍රියාත්මක වීම සහ 2027 වසරේ දී ආපදා හේතුවෙන් සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීම හා නැවත ගොඩනැංවීම සඳහා පැනනැගුණු අතිරේක වියදම් අවශ්‍යතා සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව, රාජ්‍ය ආදායම, ප්‍රාථමික වියදම සහ රාජ්‍ය මූල්‍ය ශේෂයන් සම්බන්ධයෙන් සිදු කරන ලද සංශෝධන පහත සඳහන් පරිදි පැහැදිලි කෙරේ.

රාජ්‍ය ආදායම

2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් 2026 වසර සඳහා සමස්ත රාජ්‍ය ආදායම සහ ප්‍රදාන, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 15.8 ක් ලෙස ද, 2027 වසර සඳහා සියයට 15.5 ක් ලෙස ද පුරෝකථනය කර තිබුණි. කෙසේ වුවද, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ මෙම පුරෝකථන 2026 වසර සඳහා ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.6 දක්වාත්, 2027 වසර සඳහා සියයට 15.8 දක්වාත් ඉහළ අගයන්වලට සංශෝධනය කර ඇත. ඒ අනුව, ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ ඇතුළත් පුරෝකථනවලට සාපේක්ෂව, 2026 වසර සඳහා ද.දේ.නි.යේ ප්‍රතිශතාංක 0.8 ක සහ 2027 වසර

සඳහා ප්‍රතිශතාංක 0.3 ක ධනාත්මක අපගමනයක් මෙම සංශෝධිත පුරෝකථන මගින් පිළිබිඹු වේ.

රාජ්‍ය ආදායම් පිළිබඳ වඩාත් හිතකර ඉදිරි දැක්ම මගින්, බදු ප්‍රතිපත්ති සහ ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණවල අඛණ්ඩ බලපෑම, බදු අනුකූලතාව වැඩිදියුණු වීම, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ මෝටර් රථ ආනයනය ආශ්‍රිත බදු ඇතුළු ප්‍රධාන බදු කාණ්ඩ කිහිපයකින් අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ බදු ආදායමක් රැස්කර ගැනීමට හැකිවීම ආදිය පිළිබිඹු වේ. 2027 වසරට අදාළ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මගින් ද 2026 වසරේ මුල් මාස කිහිපය තුළ රාජ්‍ය ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය අපේක්ෂිත මට්ටම සැලකිය යුතු ලෙස ඉක්මවා ගොස් ඇති බව පෙන්වා දී තිබුණු අතර මේ සඳහා ප්‍රධාන බදු කාණ්ඩවලින් ලද ආදායමේ කැපී පෙනෙන වර්ධනය සහ මෝටර් රථ ආනයනය ආශ්‍රිත බදු ආදායම් ඉහළ යාම ද දායක විය. ආදායම් පරිපාලන ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මගින්, මෙලෙස ඉහළ ගොස් ඇති රාජ්‍ය ආදායමෙහි පදනම මධ්‍යකාලීනව තිරසාර ලෙස පවත්වාගෙන යාමට සහාය ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික වියදම

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින්, අනපේක්ෂිත සිදුවීම් සහ ස්වාභාවික ආපදා වැනි සුවිශේෂී තත්ත්වයන් සඳහා අදාළ වන විධිවිධානවලට යටත්ව, ප්‍රාථමික වියදම් සඳහා ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.0 ක ව්‍යවස්ථාපිත සීමාවක් නියම කර ඇත. 2027 වසරට අදාළ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් 2026 වසර සඳහා ප්‍රාථමික වියදම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.7 ක් ලෙස මූලික වශයෙන් පුරෝකථනය කර තිබූ අතර, එය නෛතිකමය වශයෙන් නියම කර ඇති සීමාව ප්‍රතිශතාංක 0.7 කින් ඉක්මවා යාමකි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ දිට්වා සුළි කුණාටුවෙන් පසුව නිවාස, යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම, පුනරුත්ථාපන කටයුතු සහ ජීවනෝපාය මාර්ග යළි නහාසිටුවීම සඳහා අනුමත කරන ලද රු. බිලියන 500 ක පරිපූරක ප්‍රතිපාදන වෙන් කිරීමයි. කෙසේ වුවද, මෙම පරිපූරක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, විශේෂයෙන් ආපදා හේතුවෙන් සිදුවූ හානි යථා තත්ත්වයට පත් කිරීම සහ නැවත ගොඩනැංවීම සඳහා වන කටයුතු ඇතුළු ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මක කිරීම, මුලින් අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු වේගයකින් සිදු විය.

ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් 2027 වසරේ දී ප්‍රාථමික වියදම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.9 ක මට්ටමක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, ඉන් අනතුරුව සිදු කරන ලද ඇගයීම් අනුව, පුනරුත්ථාපන හා නැවත ගොඩනැංවීමේ අවශ්‍යතා සැලකිය යුතු ප්‍රමාණයක් 2026 වසරෙන් ඔබ්බට ද අඛණ්ඩව පවතිනු ඇති බව අනාවරණය වී ඇත. ඒ අනුව, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ, 2027 වසරේ දී මෙම කටයුතු සඳහා ආසන්න වශයෙන් රු. බිලියන 260 ක අතිරේක වියදමක් දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2027 වසරේ දී ප්‍රාථමික වියදම් තාවකාලිකව ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 13.6 ක පමණ මට්ටමක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය නීතියෙන් නියම කර ඇති ප්‍රාථමික වියදම් සීමාව ප්‍රතිශතාංක 0.6 කින් පමණ ඉක්මවා යාමකි.

ඒ අනුව, 2027 වසරේ දී අපේක්ෂිත ප්‍රාථමික වියදම් සීමාව ඉක්මවා යාම පුනරාවර්තන වියදම්වල ව්‍යුහාත්මක වශයෙන් සිදුවන ස්ථිර ඉහළ යාමක් නොව, ඒ සඳහා සුවිශේෂී ආපදා තත්ත්වයන් හේතුවෙන් පැනනැගුණු, නිශ්චිත කාලසීමාවකට සීමා වූ නැවත යථා තත්ත්වයට පත් කිරීමේ වියදම් අඛණ්ඩව දැරීමට සිදුවීම හේතු විය. මෙම අතිරේක වියදම් වෙනම හඳුනාගෙන, ප්‍රමුඛතා පදනමක් මත වෙන් කරමින් අඛණ්ඩව අධීක්ෂණය කිරීමට කටයුතු කෙරෙන අතර, එහි පුනරාවර්තන වියදම් සංරචකය තාවකාලික යථා තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතා සඳහා පමණක් දැඩි ලෙස සීමා කෙරෙනු ඇත. 2028 වසරේ දී ප්‍රාථමික වියදම් නැවත ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.9 ක පමණ මට්ටමක් දක්වා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ඉන් අනතුරුව ද නීතියෙන් නියම කර ඇති ප්‍රාථමික වියදම් සීමාව තුළ පවත්වාගෙන යාමට අපේක්ෂා කෙරේ. මෙලෙස නෛතික වියදම් සීමාවට නැවත අනුකූල වීම සඳහා පැහැදිලිව නිර්වචනය කර ඇති වැඩපිළිවෙළ මගින්, මෙම සීමාව ඉක්මවා යාම තාවකාලික ස්වභාවයක් ගන්නා බවත්, එය රීති මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය රාමුවේ මූලධර්මවලට අනුකූල වන බවත් තහවුරු කිරීම සඳහා වැදගත් පදනමක් සපයනු ලබයි.

ප්‍රාග්ධන වියදම් සහ රාජ්‍ය ආයෝජන

රාජ්‍ය වියදම්වල සංයුතිය ද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් මූලික වශයෙන් අපේක්ෂා කරන ලද තත්ත්වයට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය ලබාදීම් 2026 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.8 ක් පමණ ද, 2027 වසරේ දී සියයට 4.4 ක් පමණ ද වනු ඇතැයි පුරෝකථනය කර තිබුණි. කෙසේ වුවද, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව අනුව, ඇතැම් ප්‍රාග්ධන වියදම් අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමීව ක්‍රියාත්මක වීම හේතුවෙන් 2026 වසරේ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය ලබාදීම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.1ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ අතර, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදුවූ හානි යථා

තත්ත්වයට පත් කිරීම සහ නැවත ගොඩනැංවීම සඳහා අවශ්‍ය අතිරේක වියදම් ඇතුළත් කිරීමෙන් අනතුරුව, 2027 වසරේදී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය ලබාදීම් ද.දේ.නි.යෙන් සියයට 5.1 ක පමණ මට්ටමක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ප්‍රාථමික අතිරික්තය

2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් මූලික වශයෙන් අපේක්ෂා කරන ලද මට්ටමට වඩා 2026 වසරේ ප්‍රාථමික ශේෂයේ සැලකිය යුතු යහපත් කාර්යසාධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. දිට්වා සුළි කුණාටුව සහ බාහිර වශයෙන් ඇති වූ අවදානම් තත්ත්වයන් හේතුවෙන් පැනනැගුණු අතිරේක වියදම් අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ප්‍රකාශයට පත් කරන ලද 2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් 2026 වසර සඳහා වූ ප්‍රාථමික අතිරික්ත ඉලක්කය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.1 ක් ලෙස සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද, නවතම ඇස්තමේන්තුවලට අනුව, 2026 වසරේ ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.6 ක පමණ මට්ටමකට ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ ඇතුළත් පුරෝකථනයට සාපේක්ෂව ප්‍රතිශතාංක 1.5 ක පමණ හිතකර ධනාත්මක අපගමනයක් පිළිබිඹු කරයි. මෙම ඉහළ කාර්යසාධනය සඳහා අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ රාජ්‍ය ආදායමක් රැස්කර ගැනීමට හැකිවීම, රාජ්‍ය වියදම් මනා විනයකින් යුතුව කළමනාකරණය කිරීම සහ වසර තුළ ඇතැම් ප්‍රාග්ධන වියදම් අපේක්ෂිත මට්ටමට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වීම දායක වී ඇත.

ප්‍රකාශයට පත් කරන ලද 2027 සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් 2027 වසර සඳහා ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 වනු ඇතැයි අපේක්ෂා කර තිබුණි. සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ, අතිරේක ප්‍රතිසංස්කරණ හා නැවත ගොඩනැගීමේ වියදම් ඇතුළත් කිරීමට පෙර, රාජ්‍ය ආදායම් පිළිබඳ වඩාත් හිතකර ඉදිරි දැක්ම හේතුවෙන් ද.දේ.නි.යෙන් සියයට 2.9 ක පමණ ප්‍රාථමික අයවැය අතිරික්තයක් පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි. එහෙත්, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැනනැගුණු අතිරේක වියදම් ඇතුළත් කිරීමෙන් අනතුරුව, ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යෙන් සියයට 2.3 ක පමණ මට්ටමක් දක්වා අඩු වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, නැවත ගොඩනැංවීමේ කටයුතු සඳහා සැලකිය යුතු අතිරේක වියදමක් දැරීමට සිදුවුවද, 2027 වසර සඳහා සංශෝධිත ප්‍රාථමික අතිරික්තය, ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ ඇතුළත් ඉලක්කයට සාපේක්ෂව ප්‍රතිශතාංක 0.3 ක සුළු ඍණ අපගමනයක් පමණක් පෙන්නුම් කරයි.

2027 වසර සඳහා පුරෝකථනය කර ඇති ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2027 වසර සඳහා මධ්‍යකාලීන ඉලක්කය ලෙස හඳුනාගෙන ඇති සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයට සමානය. ඒ අනුව, නැවත ගොඩනැංවීමේ වැඩසටහන සඳහා වන අතිරේක වියදම් හේතුවෙන්, පරිපූරක ප්‍රතිපාදන ඇතුළත් කිරීමට පෙර යාවත්කාලීන කරන ලද මූලික පුරෝකථනයට සාපේක්ෂව ප්‍රාථමික අතිරික්තය අඩු අගයක් වූව ද, සංශෝධිත ප්‍රාථමික ශේෂය මධ්‍යකාලීන ණය තිරසාරභාවය පිළිබඳ අරමුණු සමඟ පුළුල් වශයෙන් අනුකූලව පවතී.

සමස්ත අයවැය හිඟය

සමස්ත අයවැය ශේෂය ද ප්‍රකාශයට පත් කරන ලද මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් මූලික වශයෙන් අපේක්ෂා කළ මට්ටමට වඩා යහපත් කාර්යසාධනයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2027 වසර සඳහා වන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින්, ප්‍රධාන වශයෙන් දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැනනැගුණු පරිපූරක වියදම්වල බලපෑම සැලකිල්ලට ගනිමින්, 2026 වසරේ සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.6 ක් වනු ඇතැයි පුරෝකථනය කර තිබුණි. එමෙන්ම, 2027 වසරේදී සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.5ක් දක්වා අඩු වනු ඇති බවත්, ඉන් අනතුරුව ද එම හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 5.0 කට අඩු මට්ටමක පවතිනු ඇති බවත් පුරෝකථනය කර තිබුණි.

සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව අනුව, 2026 වසරේ සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.7 ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයේ ඇතුළත් පුරෝකථනයට වඩා සැලකිය යුතු ලෙස අඩු අගයක් වන අතර, වසර තුළ රාජ්‍ය ආදායම් රැස්කිරීමේ ශක්තිමත් කාර්යසාධනය සහ රාජ්‍ය වියදම්වල සිදුවූ වෙනස්වීම් මෙම යහපත් තත්ත්වයට දායක වී ඇත. 2027 වසර සඳහා, නැවත ගොඩනැංවීමේ අතිරේක වියදම් ඇතුළත් කිරීමට පෙර යාවත්කාලීන කරන ලද මූලික පුරෝකථනය අනුව, සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.8 ක් පමණ වනු ඇතැයි අපේක්ෂා කර තිබුණි. කෙසේ වුව ද, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පැනනැගුණු අතිරේක වියදම් ඇතුළත් කිරීමෙන් අනතුරුව, එම හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4. 5 ක් පමණ දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. ඒ අනුව, අතිරේක වියදම් හේතුවෙන් පරිපූරක ප්‍රතිපාදන අවශ්‍යතා ඇතුළත් කිරීමට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව 2027 වසරේ සමස්ත අයවැය හිඟය ඉහළ ගියද, එය මධ්‍යකාලීනව පවත්වාගෙන යාමට අපේක්ෂිත ද.දේ.නි.යෙන් සියයට 5.0 ක සීමාවට වඩා පහළ මට්ටමක පවතී.

ඒ අනුව, 2026 සහ 2027 වසරවල දී රාජ්‍ය වියදම් සම්බන්ධයෙන් සිදුවන තාවකාලික බැහැරවීම්, රජයේ පුළුල් රාජ්‍ය මූල්‍ය ඒකග්‍රතා උපායමාර්ගයෙන් බැහැරවීමක් ලෙස අදහස් නොකෙරේ. ඒ වෙනුවට, රාජ්‍ය ආදායමේ ඉහළ කාර්යසාධනය, ප්‍රාථමික අයවැය අතිරික්තයන් සහ මධ්‍යකාලීන වශයෙන් රාජ්‍ය ණය අඩු කිරීමේ වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යන අතරම, සුවිශේෂී ආපදා තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා පැහැදිලිව අර්ථකථනය කරන ලද නිසි අවශ්‍යතාවය සඳහා පමණක් රාජ්‍ය මූල්‍ය යෙදවීම මෙමගින් පිළිබිඹු වේ.

මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය මාවතට යළි පැමිණීම

මෙම තාවකාලික බැහැරවීම්වල විශ්වසනීයත්වය රඳා පවතින්නේ සුවිශේෂී තත්ත්වයන් හේතුවෙන් දරනු ලබන අතිරේක වියදම් තාවකාලික, නිශ්චිතව ඉලක්කගත සහ විනිවිදභාවයෙන් යුතුව කළමනාකරණය කෙරෙන බව සහතික කිරීමට රජයට ඇති හැකියාව මතය. ඒ අනුව, සංශෝධිත මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව මඟින් 2028 වසරේ සිට ප්‍රාථමික වියදම් නැවත ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 12.9 දක්වා අඩු කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම, මධ්‍යකාලීනව ප්‍රාථමික අතිරික්තය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.0 දක්වා ඉහළ යනු ඇතැයි ද, රජයේ ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.0 ක පමණ මට්ටමක පවතිනු ඇතැයි ද පුරෝකථනය කර ඇත.

රාජ්‍ය ආදායම් රැස්කිරීම අඛණ්ඩව ශක්තිමත් කිරීම, රාජ්‍ය වියදම් සඳහා ප්‍රමුඛතා නිර්ණය කිරීම, රාජ්‍ය ආයෝජන කළමනාකරණය වැඩිදියුණු කිරීම, වියදම් සඳහා වන බැඳීම් සහ මුදල් පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීම මෙන්ම ආපදා සම්බන්ධ වියදම් විනිවිදභාවයෙන් යුතුව අධීක්ෂණය කිරීම යන ක්‍රියාමාර්ග, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය නැවත සාමාන්‍ය මාවතට යොමු කිරීම සඳහා අවශ්‍ය පදනම සපයනු ඇත. එමෙන්ම, රාජ්‍ය ණය තිරසාරභාවයට හානි නොවන පරිදි අනාගතයේ දී ඇතිවිය හැකි දේශීය හා බාහිර ආපදා තත්ත්වයන්ට මුහුණදීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක යළි ගොඩනැංවීමට ද රජය අඛණ්ඩව කටයුතු කරනු ඇත.

ඒ අනුව, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ සීමාවන්ගෙන් සිදුවන තාවකාලික බැහැරවීම්, රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගෙන යන අතරම සුවිශේෂී තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා පැහැදිලිව අර්ථකථනය කරන ලද නිසි අවශ්‍යතාවය සඳහා පමණක් රාජ්‍ය මූල්‍ය යෙදවීම පිණිස අවකාශය සලසන, රීති මත පදනම් වූ පුළුල් රාජ්‍ය මූල්‍ය රාමුව තුළ සලකා බැලිය යුතුය. 2028 වසරේ සිට නෛතිකමය වශයෙන් නියම කර ඇති රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ සීමාවන්ට නැවත අනුකූල වීම සඳහා නිශ්චිතව දක්වා ඇති වැඩපිළිවෙළ, අඛණ්ඩව ප්‍රාථමික අතිරික්තයන් පවත්වාගෙන යාම සහ රාජ්‍ය ආදායම් රැස්කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම යන ක්‍රියාමාර්ග මගින් රාජ්‍ය මූල්‍ය රාමුවේ විශ්වසනීයත්වය ආරක්ෂා කරගැනීමටත්, රාජ්‍ය ණය අඛණ්ඩව පහළ යාමේ ප්‍රවණතාවයට සහාය වීමටත් උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

II කොටස

අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2027

2024 අංක 44 දරන රාජ්‍ය මුල්‍ය කළමනාකරණ පනතේ 49 වන වගන්තිය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මුල්‍ය කළමනාකරණ පනතේ 49 වන වගන්තිය අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී මෙම වාර්තාව සෑම වසරකම පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට ගරු මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතුය.

ඊට අනෙකුත් තොරතුරුවලට අමතරව දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන්, රැකියාව සහ විරැකියාව, ගෙවුම් ශේෂය, ආදායම් හා වියදම්, ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු හා ඉහත සඳහන් ඇස්තමේන්තු පදනම් වූ සාධක අන්තර්ගත වේ. මෙම වාර්තාවේ අන්තර්ගත තොරතුරු, හැකිතාක් දුරට, මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන ඇත.

02

රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

2.1 සමාලෝචනය

දේශීය හා විදේශීය යන දෙඅංශයෙන්ම එල්ල වූ කම්පන රැසක් හමුවේ වුවද, 2026 වසරේ පළමු මාස අට තුළ දී රාජ්‍ය මූල්‍ය තත්ත්වය ස්ථාවරව පැවතුණි. එමඟින් දුප්පත් හා අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම සඳහා කඩිනම් ප්‍රතිපත්තිමය ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නිර්මාණය වූ අතර, වර්තන ගිණුමේ ශේෂය, ප්‍රාථමික ශේෂය සහ සමස්ත අයවැය ශේෂය යන සියල්ලෙහිම අතිරික්තයන් වාර්තා විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී ප්‍රදාන ද ඇතුළුව රජයේ ආදායම සියයට 21.2 කින් වර්ධනය වූ අතර, පුනරාවර්තන වියදම් සියයට 4.4 කින් සුළු වශයෙන් වර්ධනය විය. දේශීය මෙන්ම විදේශීය වශයෙන් පැන නැඟි අභියෝග හේතුවෙන් ප්‍රාග්ධන වියදම් භාවිතය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 25.4 ක් ලෙස පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, 2025 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 411.0 ක සමස්ත අයවැය හිඟයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 35.4 ක සමස්ත අයවැය අතිරික්තයක් වාර්තා වූ අතර, ප්‍රාථමික අතිරික්තය රු. බිලියන 1,276.5 සිට රු. බිලියන 1,644.6 ක් දක්වා රු. බිලියන 368.1 කින් වර්ධනය විය. දිවිවා සුළි කුණාටුවෙන් අනතුරුව ක්‍රියාත්මක වූ යථා තත්ත්වයට පත් කිරීමේ හා නැවත ගොඩනැඟීමේ කටයුතු හේතුවෙන් පැනනැඟුණු අතිරේක වියදම් අවශ්‍යතා සහ මැදපෙරදිග ගැටුමේ බලපෑම අවම කිරීම සඳහා හඳුන්වා දුන් සහන ක්‍රියාමාර්ග මධ්‍යයේ වුවද මෙම ප්‍රගතිය ළඟා කර ගැනීමට හැකි විය. ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග සහ ව්‍යුහාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම මෙම රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයට මනා පිටිවහලක් විය. බදු පදනම පුළුල් කිරීම සඳහා වූ බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ආදායම් පරිපාලනය නවීකරණය කිරීම, රජය සතු ව්‍යවසායයන් පිළිබඳ රාජ්‍ය මූල්‍ය අධීක්ෂණය ශක්තිමත් කිරීම, සහ රාජ්‍ය මූල්‍ය හා ආයෝජන කළමනාකරණය වැඩිදියුණු කිරීම මීට ඇතුළත් විය.

2026 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,244.1 ක් වූ ප්‍රාථමික අතිරික්තය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ නියම කර තිබූ රු. බිලියන 72 ක ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක (QPC) ඉලක්කය සැලකිය යුතු ලෙස ඉක්මවා යන ලදී. දිවිවා සුළි කුණාටුවේ රාජ්‍ය මූල්‍ය බලපෑම සැලකිල්ලට ගනිමින්, 2026 වසරේ දී ප්‍රාථමික වියදම් ද.දේ.නි.යෙන් සියයට 13 ක උපරිම සීමාව ඉක්මවා යාමට ඉඩ සැලසීම සඳහා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 16 වන වගන්තිය යටතේ වන ව්‍යතිරේක විධිවිධානය ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2026 වසර සඳහා මුලින් නියම කර තිබූ ද.දේ.නි.යෙන් සියයට 2.3 ක ප්‍රාථමික ශේෂ ඉලක්කය පහත හෙළන ලද නමුත්, 2027 වසරේ සිට නැවතත් ද.දේ.නි.යෙන් සියයට 2.3 ක ප්‍රාථමික ශේෂ ඉලක්කයට එළඹීමට සහ ප්‍රාථමික වියදම් සීමාවට අනුකූල වීමට රජය කැපවී සිටී. මේ අතර, වර්තන ගිණුමේ ශේෂය 2025 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 86.6 ක හිඟයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 467.2 ක අතිරික්තයක් දක්වා පරිවර්තනය වූ අතර, පොලී ගෙවීම් ද ඇතුළුව පුනරාවර්තන වියදම් සම්පූර්ණයෙන්ම මූල්‍යයනය කිරීමට රජයේ ආදායම ප්‍රමාණවත් වූ බව මෙයින් පිළිබිඹු වේ.

ප්‍රදාන ද ඇතුළුව රජයේ මුළු ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 3,301.5 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 4,002.3 දක්වා සියයට 21.2 කින් වර්ධනය වූ අතර, මෙය රු. බිලියන 5,300.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 75.5 ක සාක්ෂාත් කර ගැනීමකි. බදු ආදායම රු. බිලියන 3,683.5 දක්වා සියයට 20.0 කින් වර්ධනය වූ අතර, ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබුණු රු. බිලියන 42.1 ක ලාභ පැවරුම් හේතුවෙන් බදු නොවන ආදායම රු. බිලියන 314.8 දක්වා සියයට 39.1 කින් වර්ධනය විය. 2026 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 2,710.6 ක් වූ බදු ආදායම, රු. බිලියන 2,000 ක් වූ බදු ආදායම් ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක ඉලක්කය රු. බිලියන 710.6 කින් ඉක්මවා යන ලදී. ආදායම් එකතු කරන ආයතන අතුරින්, ශ්‍රී ලංකා රේගුව 2026 වසරේ පළමු මාස අට තුළ දී සිය වාර්ෂික බදු ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 78.3 ක් ළඟා කරගත් අතර, වාර්ෂික ඇස්තමේන්තුව සියයට 30.5 කින් ඉක්මවා ගිය මෝටර් වාහන බදු මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සිය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවලින් පිළිවෙළින් සියයට 71.9 ක් සහ සියයට 74.5 ක් ළඟා කර ගන්නා ලදී. ශ්‍රී ලංකා රේගුව විසින් එකතු කරන ලද ආදායමේ විශාලතම කොටස ලෙස ආනයන මත වන එකතු කළ අගය මත බද්ද තවදුරටත් පැවති අතර, එය රේගුවේ සමස්ත ආදායම් එකතු කිරීම්වලින් සියයට 35 ක් පමණ විය.

2.1 වගුව | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය

රු. මිලියන

අයිතමය	ජනවාරි - අගෝස්තු	
	2025	2026 (අ)
ආදායම් හා ප්‍රදාන	**3,301,459**	**4,002,317**
ආදායම	**3,294,740**	**3,998,291**
බදු	3,068,495	3,683,527
බදු නොවන	226,244	314,764
ප්‍රදාන	6,720	4,026
වියදම්	**3,712,492**	**3,966,913**
පුනරාවර්තන	**3,381,309**	**3,531,045**
වැටුප්	760,687	826,962
පොලී ගෙවීම්	1,687,571	1,609,194
අනෙකුත්	933,051	1,094,889
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	**331,183**	**435,867**
රාජ්‍ය ආයෝජන	338,846	446,283
අනෙකුත්	-7,663	-10,416
ජංගම ගිණුමේ හිඟය (-)/අතිරික්තය (+)	**-86,569**	**467,245**
ප්‍රාථමික ශේෂය හිඟය (-)/අතිරික්තය (+)	**1,276,538**	**1,644,598**
සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+)	**-411,033**	**35,404**
මූල්‍යයනය	**411,033**	**-35,404**
විදේශ මූල්‍යයනය (ශුද්ධ)	-51,849	29,712
දේශීය මූල්‍යයනය (ශුද්ධ)	462,882	-65,116

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

බදු ආදායම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් එකතු කළ අගය මත බද්ද, ආදායම් බදු සහ නිෂ්පාදන බදු මඟින් ලද ආදායම ඉහළ යාම හේතු වූ අතර, එම බදු පිළිවෙළින් මුළු බදු ආදායමෙන් සියයට 35.9 ක්, සියයට 22.4 ක් සහ සියයට 20.3 ක් සඳහා දායකත්වය දැක්වීය. එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 1,322.7 දක්වා සියයට 22.0 කින් වර්ධනය විය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම සහ එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩිදියුණු වීම ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින්, දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්ද සියයට 27.5 කින් වර්ධනය විය. විශේෂයෙන්ම මෝටර් රථ ආනයනය ඇතුළු ආනයන ඉහළ යාම සහ රුපියල අවප්‍රමාණය වීම මඟින් සහාය ලබමින් ආනයන මත වන එකතු කළ අගය මත බද්ද සියයට 15.9 කින් වර්ධනය විය. නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 748.0 දක්වා සියයට 23.0 කින් වර්ධනය වූ අතර, මෝටර් වාහන මත නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 347.0 දක්වා සියයට 28.3 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. නිෂ්පාදනය ඉහළ යාම හේතුවෙන් මත්පැන් මත සුරා බද්ද සියයට 24.3 කින් වර්ධනය වූ අතර, දුම්වැටි මත නිෂ්පාදන බද්ද සියයට 22.6 කින් වර්ධනය විය.

ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 825.6 දක්වා සියයට 17.6 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, මත්පැන්, දුම්කොළ සහ ඔට්ටු ඇල්ලීමේ හා සූදු ක්‍රීඩා කර්මාන්ත සඳහා අදාළ බදු අනුපාතිකය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නැංවීමේ සහ විදේශීය මූලාශ්‍රවලින් ලැබෙන ඉපැයීම් සහ ලාභ මත සියයට 15 ක බද්දක් හඳුන්වා දීමේ පූර්ණ වාර්ෂික බලපෑම පිළිබිඹු කරමින්, සංස්ථාපිත ආදායම් බදු ආදායම සියයට 21.9 කින් වර්ධනය වීමයි. පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම ද මෙයින් පිළිඹිඹු වේ. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම රු. බිලියන 233.2 දක්වා සියයට 22.2 කින් වර්ධනය වූ අතර, ආනයන මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සියයට 53.0 කින් වර්ධනය විය. විදේශ වෙළෙඳාම මත බදු මඟින් ලද ආදායම රු. බිලියන 491.2 දක්වා සියයට 15.0 කින් වර්ධනය වූ අතර, වාහන ආනයන ඉහළ යාම සහ මෝටර් වාහන සඳහා අදාළ රේගු ආනයන බද්ද මත සියයට 50 ක අධිභාරයක් පැනවීම පිළිඹිඹු කරමින් රේගු ආනයන බද්දෙන් ලද ආදායම සියයට 33.1 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

මෙම කාලපරිච්ඡේදය තුළ දී ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීම සඳහා බදු ප්‍රතිපත්ති හා පරිපාලන ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. 2026 වසරේ දී හඳුන්වා දුන් බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අතරට, 2026 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනික රෙදිපිළි මත සම්මත එකතු කළ අගය මත බදු අනුපාතය පැනවීම සහ 2026 වසරේ මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනය, නිෂ්පාදනයකර අලෙවි කරන අවස්ථාවේ දී මෝටර් වාහන මත සමාජ ආරක්ෂණ

දායකත්ව බද්ද පැනවීම ද ඇතුළත් විය. එසේම, තීරුබදු කාණ්ඩ හතරකින් සමන්විත රේගු ආනයන බදු ව්‍යුහයක් හඳුන්වා දීම සහ අතරමැදි යෙදවුම් මත අය කරන සෙස් බද්ද ඉවත් කිරීම හරහා ජාතික තීරුබදු ප්‍රතිපත්තියේ පළමු අදියර ද ක්‍රියාත්මක කරන ලදී.

ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් ගත් කල, සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ක්‍රමයේ සිට අවදානම මත පදනම් වූ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමයක් වෙත මාරුවීම සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන්ගේ ලියාපදිංචි ලේඛනය නිවැරදි කිරීමේ හා යාවත්කාලීන කිරීමේ පළමු අදියර සම්පූර්ණ කරන ලද අතර, ඉහළ ආදායම් උපයන පුද්ගලයන් ඉලක්ක කරගත් අවදානම මත පදනම් වූ විගණනයන් ද ආරම්භ කරන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන සියලුම බදුවලට අදාළ කටයුතු අඛණ්ඩව ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (Revenue Administration Management Information System - RAMIS) හරහාම සිදු කෙරෙන අතර, පෙර පුරවා ඇති තොරතුරු නැවත ඇතුළත් කිරීමට අවශ්‍ය නොවන විකල්පයක් ද ඇතුළත් සරල කරන ලද පුද්ගල ආදායම් බදු වාර්තා පත්‍රයක් ද භාවිතා කෙරෙමින් පවතී. බදු අනුකූලතාව පිළිබඳ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) අඛණ්ඩව නිරීක්ෂණය කර කාර්තුමය වශයෙන් වාර්තා කරනු ලබන අතර, එක් එක් ආදායම් එකතු කරන ආයතන විසින් ක්‍රියාත්මක කරන දූෂණ විරෝධී ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පිළිබඳව කාර්තුමය වාර්තාවක් අඛණ්ඩව ප්‍රකාශයට පත් කරනු ලැබේ. මේ අතර, ශ්‍රී ලංකා රේගුව, ඩිජිටල් අත්සන් හඳුන්වා දීමත් සමඟ රේගු ප්‍රකාශන මුහුණට මුහුණලා සමාලෝචනය කිරීම නවතා ඇති අතර, අවදානම මත පදනම් වූ නිෂ්කාශන ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.

තවද, මධ්‍යකාලීන රාජ්‍ය ආදායම් ක්‍රමෝපායක් (Medium-Term Revenue Strategy) සකස් කිරීමට මඟපෙන්වීමක් ලබා ගැනීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව බදු ප්‍රතිපත්ති සහ බදු පරිපාලනය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී. යහපාලනය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සහ කොළඹ වරාය නගරය හරහා බදු නිදහස් කිරීම් ලබන සමාගම් ලැයිස්තුවක් එම නිදහස් කිරීම්වල ඇස්තමේන්තුගත වටිනාකම ද සමඟ, අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී.

2026 වසරේ පළමු මාස අට තුළ දී රජයේ මුළු වියදම, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වූ රු. බිලියන 3,712.5 සිට රු. බිලියන 3,966.9 දක්වා සියයට 6.9 කින් වර්ධනය විය. මෙය රු. බිලියන 7,557.0 ක වන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 52.5 ක ලභාකරගැනීමක් වන අතර, මෙම වාර්ෂික ඇස්තමේන්තුවට දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව යථා තත්ත්වයට පත්වීමේ සහ නැවත ගොඩනැඟීමේ කටයුතු සඳහා 2025 වසරේ දෙසැම්බර් මස 19 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රු. බිලියන 500 ක පරිපූරක ඇස්තමේන්තුව ද ඇතුළත් වේ. පොලී ගෙවීම් ඇතුළත් නොවන ප්‍රාථමික වියදම, රු. බිලියන 2,357.7 දක්වා සියයට 16.4 කින් ඉහළ ගිය අතර, සහනාධාර සහ පැවරුම්, වැටුප් හා වේතන, සහ ප්‍රාග්ධන වියදම් ඉහළ යාම මෙයින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු වේ.

පුනරාවර්තන වියදම් රු. බිලියන 3,531.0 දක්වා සියයට 4.4 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, සහනාධාර හා පැවරුම් සඳහා වූ වියදම් රු. බිලියන 890.3 දක්වා සියයට 23.2 කින් ද, වැටුප් හා වේතන සඳහා වූ වියදම රු. බිලියන 827.0 දක්වා සියයට 8.7 කින් ද වර්ධනය වීම, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. වැටුප් හා වේතන සඳහා වූ වියදම ඉහළ යාමට, 2026 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනයේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම හේතු විය. කුටුම්භ සඳහා පැවරුම් අතරින්, විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කිරීම සහ විශ්‍රාම වැටුප් සංශෝධන පිළිබිඹු කරමින් විශ්‍රාම වැටුප් ගෙවීම් රු. බිලියන 332.4 දක්වා සියයට 17.5 කින් වර්ධනය වූ අතර, දිට්වා සුළි කුණාටුවේ බලපෑමට ප්‍රතිචාර වශයෙන් 'අවදානමට ලක්විය හැකි' කාණ්ඩයට අයත් කුටුම්භ සඳහා ප්‍රතිලාභ ගෙවීම් මාස හයකින් දීර්ඝ කිරීම සහ 2026 වසරේ අප්‍රේල් මාසයේ දී එක් වරක් පමණක් ලබා දුන් අතිරේක මුදල් ගෙවීම පිළිබිඹු කරමින් අස්වැසුම මුදල් පැවරුම් රු. බිලියන 164.3 දක්වා සියයට 14.6 කින් වර්ධනය විය. රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් වෙනුවෙන් දැරූ වියදම ඉහළ යාම පිළිඹිබු කරමින් නොමිලේ ලබා දෙන ඖෂධ සඳහා වූ වියදම රු. බිලියන 115.3 දක්වා සියයට 52.4 කින් වර්ධනය විය. කෙසේ නමුත්, භාණ්ඩ හා සේවා සඳහා වූ වියදම රු. බිලියන 204.6 දක්වා සියයට 2.9 කින් පහත වැටුණු අතර, එවැනි මෙහෙයුම් වියදම් සම්බන්ධයෙන් පැනවූ දැඩි පාලනයන් මෙයින් පිළිබිඹු වේ.

මැදපෙරදිග ගැටුම හේතුවෙන් බලශක්ති මිල ඉහළ යාමට ප්‍රතිචාර වශයෙන්, රජය විසින් තාවකාලික සහන පැකේජයක් හඳුන්වා දුන් අතර, එයට ඩීසල් ලීටරයකට රු. 100 ක් බැගින් සහ පෙට්‍රල් ලීටරයකට රු. 20 ක් බැගින් වූ ඉන්ධන සහනාධාර, මසකට කිලෝවොට් පැය 180 ට අඩුවෙන් පරිභෝජනය කරන කුටුම්භ සඳහා සහ තෝරාගත් නේවාසික නොවන විදුලි ගාස්තු කාණ්ඩවල අඩු පරිභෝජන ඛණ්ඩ සඳහා විදුලි ගාස්තු ස්ථාවරව පවත්වා ගැනීමට විදුලි සහනාධාර, යල කන්නය සඳහා ගොවීන්ට ඉහළ නැංවූ පොහොර සහනාධාරයක්, ධීවරයින් සඳහා සහනාධාරයක් සහ අස්වැසුම ප්‍රතිලාභී කුටුම්භ

සඳහා එක් වරක් පමණක් ලබා දෙන අතිරේක මුදල් ගෙවීමක් ඇතුළත් විය. 2026 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට රු. බිලියන 105.9 ක් වූ මෙම පැකේජය, අයවැය තුළින්ම කළමනාකරණය කරගන්නා ලද අතර, වාර්ෂික අයවැය සංචිතය සහ වියදම් ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් මඟින් මූල්‍යයනය කරන ලදී. මෙම සහනාධාර මඟින්, ඉහළ ගිය පිරිවැය පරිශීලකයන් වෙත අර්ධ වශයෙන් පමණක් පැවරීම නිසා ඉන්ධන සැපයුම්කරුවන්ට සහ විදුලිබල අංශයට ඇති වූ අලාභයන් වෙනුවෙන් මෙම සහනාධාර ලබාදෙන ලද අතර, 2026 වසරේ මැයි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ නැංවීමක් සිදු විය.

මැද පෙරදිග ගැටුම තවදුරටත් පැවතීම හේතුවෙන්, 2026 වසර අවසානය දක්වාම, රු. බිලියන 47 ක ඇස්තමේන්තුගත පිරිවැයකට යටත්ව, ඉලක්කගත සහාය දීර්ඝ කිරීමට රජය තීරණය කරන ලද අතර, එම පිරිවැය 2026 අයවැයේ අනුමත වියදම් සීමාව තුළම ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් හරහා සපයා ගැනීමට නියමිතය. ඒ අනුව, 2026 වසරේ ඔක්තෝබර් මස සිට දෙසැම්බර් මස දක්වා ඔටෝ ඩීසල් සඳහා රු. බිලියන 40.7 ක් දක්වා සහනාධාරයක්, 2026 වසරේ දෙසැම්බර් මස 31 වන දින අවසන් වන පරිදි ලබා දෙන අතර, 2027 අයවැයෙහි ඉන්ධන සහනාධාර සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නොමැත.

2.2 වගුව | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම - 2026

රු. බිලියන

අයිතමය	වාර්ෂික ඇස්තමේන්තුව	ජන. - අගෝ. (තාවකාලික)	ළඟා කර ගැනීම (%)
මුළු ආදායම	**5,270.0**	**3,998.3**	**75.9**
බදු ආදායම	**4,910.0**	**3,683.5**	**75.0**
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව			
ආදායම් සහ ලාභ මත බද්ද	1,210.0	825.6	68.2
එකතු කල අගය මත බද්ද - දේශීය (ශුද්ධ)	937.0	723.6	77.2
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (දේශීය)	236.0	164.3	69.6
වෙනත්	18.1	13.9	77.0
උප එකතුව	**2,401.1**	**1,727.5**	**71.9**
ශ්‍රී ලංකා රේගුව			
එකතු කල අගය මත බද්ද - ආනයන (ශුද්ධ)	875.0	599.0	68.5
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (ආනයන)	97.0	68.9	71.0
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද	190.0	130.8	68.8
සෙස් බද්ද	90.0	54.5	60.5
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	129.0	105.0	81.4
ආනයන බද්ද	235.0	201.0	85.5
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද			
දුම්වැටි	105.0	75.7	72.1
ඛනිජ තෙල් නිෂ්පාදන	205.0	135.1	65.9
මොටර් වාහන සහ අනෙකුත්	279.0	354.8	127.2
වෙනත්	1.1	2.1	181.6
උප එකතුව	**2,206.1**	1,726.8	**78.3**
සුරාබදු දෙපාර්තමේන්තුව			
මත්පැන්/දුම්කොළ	245.0	182.4	74.5
උප එකතුව	**245.0**	**182.4**	**74.5**
අනෙකුත්			
විදුලි සංදේශ බද්ද	17.0	9.3	54.9
බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්	40.8	37.5	92.0
උප එකතුව	**57.8**	46.8	**81.1**
බදු නොවන ආදායම	**360.0**	**314.8**	**87.4**
මුළු වියදම	**7,557.0**	**3,966.9**	**52.5**
වර්තන වියදම	**5,838.0**	**3,531.0**	**60.5**
වැටුප් හා වේතන	1,323.0	827.0	62.5
පොලී ගෙවීම	2,617.0	1,609.2	61.5
විශ්‍රාම වැටුප් ගෙවීම	517.0	332.4	64.3
රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම්	184.0	84.7	46.0
අනෙකුත්	1,197.0	677.8	56.6
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය	**1,719.0**	**435.9**	**25.4**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මීට අමතරව, අස්වැසුම ප්‍රතිලාභීන් අතුරින් අතිශය දුප්පත් කාණ්ඩයේ කුටුම්භයකට රු. 6,250 ක් සහ දුප්පත් කාණ්ඩයේ කුටුම්භයකට රු. 4,000 ක් බැගින් මුදල් ගෙවීමක් සිදු කෙරෙන අතර, ඒ සඳහා රු. බිලියන 6 ක ඇස්තමේන්තුගත පිරිවැයක් දැරීමට නියමිතය.

පොලී ගෙවීම්, 2025 වසරේ පළමු මාස අට තුළ දී වූ රු. බිලියන 1,687.6 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,609.2 දක්වා සියයට 4.6 කින් පහත වැටුණි. මුළු පොලී වියදමෙන් සියයට 86.4 ක් වූ දේශීය ණය ගැනීම් මත වූ පොලී ගෙවීම් රු. බිලියන 1,389.7 දක්වා සියයට 5.2 කින් පහත වැටුණු අතර, විදේශීය ණය ගැනීම් මත වූ පොලී ගෙවීම් රු. බිලියන 219.5 දක්වා සියයට 0.7 කින් සුළු වශයෙන් පහත වැටුණි. ඒ අනුව, 2025 වසරේ පළමු මාස අට තුළ දී බදු ආදායමෙන් සියයට 55.0 ක් වූ පොලී ගෙවීම් 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී බදු ආදායමෙන් සියයට 43.7 ක් පමණ විය.

රාජ්‍ය ආයෝජන සඳහා වූ වියදම, 2025 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ රු. බිලියන 338.8 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 446.3 දක්වා සියයට 31.7 කින් වර්ධනය විය. වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව රාජ්‍ය ආයෝජන වියදම් ලඟාකරගැනීම සියයට 25.8 ක් ලෙස පහළ මට්ටමක පැවතුණි.

අයවැය ක්‍රියාත්මක කිරීම කාර්යක්ෂම කිරීමට සහ රාජ්‍ය මූල්‍ය විනය වැඩිදියුණු කිරීමට, රාජ්‍ය මූල්‍ය හා ආයෝජන කළමනාකරණය ශක්තිමත් කිරීම රජය අඛණ්ඩව සිදු කරන ලදී. 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී, ව්‍යාපෘති සූදානම්භාවය ඇගයීම සඳහා වූ ප්‍රමිතිගත ක්‍රමවේදයක් සහ රාජ්‍ය ආයෝජන කමිටුව සඳහා විනිවිදභාවයෙන් යුත් ව්‍යාපෘති තෝරාගැනීමේ නිර්ණායක ප්‍රකාශයට පත් කරන ලද අතර, දැනට පවතින රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති කළඹ පිළිබඳ සමාලෝචනයක් ද සිදු කෙරෙමින් පවතී. වියදම් බැඳීම් පාලනය ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියේ (Integrated Treasury Management Information System) ප්‍රධාන මොඩියුලයන් සියලුම වැය ශීර්ෂ වෙත ව්‍යාප්ත කළ අතර, මීට පෙර එකතු වී තිබූ වියදම් හිඟ මුදල් පියවා දමන ලදී. තවද, රාජ්‍ය මූල්‍ය අවදානම් පිළිබඳ ප්‍රකාශයක් ද ඇතුළත් 2027 මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2026 වසරේ ජුනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. සුළි කුණාටුව ආශ්‍රිත ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු සඳහා ලංසු තබන සමාගම්වලට සිය අර්ථලාභී හිමිකාරිත්වය (beneficial ownership) පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම ද අනිවාර්ය කර ඇති අතර, එමඟින් නැවත ගොඩනැඟීමේ කටයුතු සඳහා වන වියදම්වල විනිවිදභාවය සහතික කෙරේ.

සමස්තයක් වශයෙන් ගත්කල, 2026 වසරේ පළමු මාස අට තුළ දී වාර්තා වූ අයවැය අතිරික්තයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බදු ප්‍රතිපත්ති සහ පරිපාලන ප්‍රතිසංස්කරණ මඟින් සහාය ලැබූ ශක්තිමත් ආදායම් කාර්යසාධනය, පොලී ගෙවීම් පහත වැටීම සහ සැලසුම් කළ ආකාරයට වඩා මන්දගාමීව ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මක වීමයි. මෙම සාධකවලට, වැටුප්, විශ්‍රාම වැටුප් සහ සමාජ පැවරුම් සඳහා වූ ඉහළ වියදම් සහ දිට්වා සුළි කුණාටුව හා මැදපෙරදිග ගැටුම ආශ්‍රිත වියදම්වල බලපෑම ඉක්මවා යාමට හැකි විය. මෙම අතිරික්තය සහ රු. බිලියන 29.7 ක ශුද්ධ විදේශ මූල්‍යයනය යොදා ගනිමින්, දේශීය මූල්‍යනයෙන් රු. බිලියන 65.1 ක් ශුද්ධ වශයෙන් ආපසු ගෙවීමට හැකියාව ලැබුණි. ඉදිරියේ දී, වාහන ආනයනවලින් ආදායමට ලැබුණු තාවකාලික උත්තේජනය ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමඟ, ආදායම් කාර්යසාධනය අඛණ්ඩව පවත්වා ගැනීම බදු පදනම තවදුරටත් පුළුල් කිරීම සහ බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම මත රඳා පවතිනු ඇත. ඒ සමඟම, විශේෂයෙන්ම සුළි කුණාටුවෙන් පසු නැවත ගොඩනැඟීමේ කටයුතු ඇතුළු ප්‍රාග්ධන වියදම් ක්‍රියාත්මක කිරීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් ලෙස පවතී.

2.2 රාජ්‍ය ආදායම

2026 වසරේ පළමු මාස අට තුළ ප්‍රදාන හැර සමස්ත රාජ්‍ය ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 3,294.7 ට සාපේක්ෂව රු. බිලියන 3,998.3 ක් දක්වා සියයට 21.4 කින් වර්ධනය වී ඇත. 2026 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ බදු ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 3,068.5ට සාපේක්ෂව රු. බිලියන 3,683.5 ක් දක්වා සියයට 20.0 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

බදු ආදායමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ;

1. මත්පැන්, දුම්කොළ සහ ඔට්ටු ඇල්ලීම් හා සූදු කර්මාන්ත සඳහා අදාළ බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නැංවීම සහ 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි යම් විදේශීය මූලාශ්‍රයකින් උපයාගත් හෝ ලැබූ ලාභ සහ ඉපැයීම් මත සියයට 15 ක බද්දක් හඳුන්වාදීම හේතුවෙන් සංස්ථාපිත ආදායම් බද්දෙන් ලද ආදායම රු. බිලියන 484.2 ක් දක්වා සියයට 21.9 කින් වර්ධනය වීම, 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි පොලී ආදායම මත අය කෙරෙන රඳවා ගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම සහ පොලී අනුපාතවල ඉහළයාම පිළිඹිබු කරමින් රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම රු. බිලියන 142.9 ක් දක්වා සියයට 21.2 කින් වර්ධනය වීම මෙන්ම බදු පරිපාලනයේ සිදු වූ වැඩිදියුණු කිරීම්

පෙන්නුම් කරමින් 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත ලියාපදිංචි ආදායම් බදු ගොනු සංඛ්‍යාව 2025 වසරේ අගෝස්තු අවසානයට සාපේක්ෂව 1,425,144 ක් දක්වා සියයට 12.1 කින් වර්ධනය වීම යන ප්‍රධාන සාධක හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 17.6 කින් හෙවත් රු. බිලියන 123.3 කින් වර්ධනය වීම;

2. 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සියලුම වර්ගයේ මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ, 2026 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ මෝටර් රථ ආනයනය වාහන 445,546 ක් දක්වා සියයට 154 කින් ඉහළ යාම මෙන්ම 2026 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනික රෙදිපිළි මත එකතු කළ අගය මත බදු පැනවීම හේතුවෙන් ආනයන මත අය කෙරෙන එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 599.0 ක් දක්වා සියයට 15.9 කින් වර්ධනය වීමත් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම සහ බදු පරිපාලන ක්‍රියාමාර්ග හේතුවෙන් මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද සඳහා වූ ලියාපදිංචිවීම් ද ඇතුළුව සමස්ත එකතු කළ අගය මත බද්ද සඳහා වූ ලියාපදිංචිවීම් සංඛ්‍යාව, 2025 වසරේ අගෝස්තු මස අවසානයට සාපේක්ෂව 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට බදු ගොනු 38,024 ක් දක්වා සියයට 25.5 කින් වර්ධනය වීම හේතුවෙන් දේශීය එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 723.6 ක් දක්වා සියයට 27.5 කින් වර්ධනය වීමත් නිසා සමස්ත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 22.0කින් හෙවත් රු. බිලියන 238.4 කින් වර්ධනය වීම;

3. 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සියලු වර්ගයේ මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ ආනයන සීමා ලිහිල් කිරීමත් සමඟ, 2026 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ මෝටර් රථ ආනයනය වාහන 441,097ක් දක්වා සියයට 150 කින් වර්ධනය වීම හේතුවෙන් මෝටර් රථ මත අය කෙරෙන නිෂ්පාදන බද්දෙන් ලද ආදායම සියයට 28.3 කින් හෙවත් රු. බිලියන 76.5 කින් වර්ධනය වීම;


4. 2026 වසරේ පළමු මාස අට තුළ මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මිලියන 26.1 ක් දක්වා සියයට 9.2 කින් වර්ධනය වීම හේතුවෙන් මත්පැන් මත අය කෙරෙන සුරාබදු ආදායම සියයට 24.3 කින් හෙවත් රු. බිලියන 35.4 කින් වර්ධනය වීම;

5. 2026 වසරේ මැයි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනය කරන අවස්ථාවේ දී මෝටර් රථ මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම හේතුවෙන් ආනයන මත අය කෙරෙන සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම රු. බිලියන 68.9 ක් දක්වා සියයට 53.0 කින් වර්ධනය වීම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීමත් බදු පරිපාලන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම නිසා 2025 වසරේ අගෝස්තු මස අවසානයට සාපේක්ෂව සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි බදු ගොනු සංඛ්‍යාව 19,957ක් දක්වා සියයට 34.0 කින් වර්ධනය වීමත් පිළිඹිබු කරමින් දේශීය සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම රු. බිලියන 164.3 ක් දක්වා සියයට 12.7 කින් වර්ධනය වීම යන සාධක හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 22.2 කින් හෙවත් රු. බිලියන 42.4 කින් වර්ධනය වීම;

6. මෝටර් රථ මත රේගු ආනයන බද්ද අය කිරීම මෙන්ම මෝටර් රථ සඳහා අදාළ රේගු ආනයන බද්ද මත සියයට 50 ක අධිභාරයක් පැනවීම සහ අදාළ කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ ආනයන වටිනාකම ඇ. ඩො. මිලියන 16,557ක් දක්වා සියයට 24.1 කින් ඉහළ යාම හේතුවෙන් රේගු ආනයන බද්ද සියයට 33.1කින්, එනම් රු. බිලියන 50.0 කින් වර්ධනය වීම; සහ

7. ආනයන ඉහළ යාම හේතුවෙන් වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සියයට 12.9 කින්, එනම් රුපියල් බිලියන 14.9 කින් වර්ධනය වීම;

2.1 රූපසටහන | මුළු ආදායම් සංයුතිය: 2026 ජනවාරි - අගෝස්තු



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2026 වසරේ පළමු මාස අට තුළ බදු නොවන ආදායම සියයට 39.1 කින්, එනම් රු. බිලියන 88.5 කින් ඉහළ යාම ද සමස්ත ආදායමේ වර්ධනයට දායක විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රු. බිලියන 42.1ක ලාභය රජයට පැවරීම සහ දඩ, ගාස්තු හා අය කිරීම්වලින් ලැබුණු ආදායම රු. බිලියන 21.0කින් ඉහළ යාම හේතු විය. මේ අතර, පොලී ආදායම සහ සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලැබුණු ආදායම ඉහළ යාම ද බදු නොවන ආදායමේ මෙම වර්ධනයට ධනාත්මක ලෙස දායක විය.

2.3 වගුව | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය - 2026


රු. මිලියන

අයිතමය	ජන. - අගෝ.		වෙනස (%)
	2025	2026(අ)	
බදු ආදායම	**3,068,495**	**3,683,527**	**20.0**
ආදායම් බදු	**702,351**	**825,625**	**17.6**
දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු	**929,865**	**1,153,779**	**24.1**
එකතු කළ අගය මත බද්ද (වැට්)	567,470	723,643	27.5
නිෂ්පාදන/සුරා බද්ද	216,614	265,825	22.7
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	145,781	164,310	12.7
ආනයන මත පදනම් වූ බදු	**1,380,169**	**1,641,284**	**18.9**
ආනයන බද්ද	150,988	200,975	33.1
එකතු කළ අගය මත බද්ද (වැට්)	516,778	599,037	15.9
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	45,032	68,905	53.0
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද	115,886	130,806	12.9
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	103,641	104,959	1.3
නිෂ්පාදන/සුරා බද්ද	391,313	482,148	23.2
සෙස් බද්ද	56,529	54,454	-3.7
බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්	**56,110**	**62,840**	**12.0**
බදු නොවන ආදායම	**226,244**	**314,764**	**39.1**
මුළු ආදායම	**3,294,740**	**3,998,291**	**21.4**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

2.2 රූපසටහන | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම: 2026 ජනවාරි - අගෝස්තු



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආදායම් බදු

2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 702.4 ක් වූ ආදායම් බද්දෙන් ලද ආදායම 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 825.6 දක්වා සියයට 17.6 කින් වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 1,210.0 කින් සියයට 68.2 ක ළඟා කර ගැනීමකි. අඛණ්ඩ පරිපාලනමය වැඩිදියුණු කිරීම් සහ බදු අනුකූලතාව ඉහළ නැංවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වී ඇත.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 143.9 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 152.7 ක් දක්වා සියයට 6.1 කින් වැඩි විය. 2026 වසරේ පළමු මාස අට තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 215.0 කින් සියයට 71.0 ක ළඟා කර ගැනීමකි.

පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 43.2 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 45.8 දක්වා සියයට 5.9 කින් වර්ධනය වී ඇති අතර, එය වාර්ෂික ඉලක්කය වන රු. බිලියන 100.0 න් සියයට 45.8 ක ළඟා කර ගැනීමකි. මේ අතර, සංස්ථාපිත බදු ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 397.3 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී රු. බිලියන 484.2 දක්වා සියයට 21.9 කින් වර්ධනය විය. සමස්තයක් ලෙස, සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන බදු ආදායම සියයට 20.3 කින් රු. බිලියන 530.0 දක්වා වර්ධනය විය (එය වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 810.0 කින් සියයට 65.4 ක ළඟා කර ගැනීමකි). ප්‍රධාන වර්ධන ක්ෂේත්‍රයන්හි සමාගම්වල ලාභදායීතාව ඉහළ යාම සහ ව්‍යවස්ථාපිත බදු සංශෝධන හේතුවෙන් බදු ආදායම් රැස් කිරීම ශක්තිමත් වීම මෙම වර්ධනයෙන් පිළිබිඹු වේ.

රඳවා ගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 117.9 සිට 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 142.9 ක් දක්වා සියයට 21.2 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 185.0 න් සියයට 77.2 ක ළඟා කර ගැනීමකි.

2.4 වගුව | ආදායම් බදු කාර්යසාධනය

රු. මිලියන

බදු පදනම	ජන. - අගෝ.		වර්ධනය (%)
	2025	2026 (අ)	
සංස්ථාපිත හා සංස්ථාපිත නොවන	440,513	530,033	20.3
උපයන විට ගෙවීම	143,949	152,686	6.1
පොළි ආදායම් මත බදු	117,890	142,905	21.2
එකතුව	**702,351**	**825,625**	**17.6**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
(අ) තාවකාලික

එකතු කළ අගය මත බද්ද

එකතු කල අගය මත බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 1,084.2 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,322.7 දක්වා සියයට 22.0 කින් වර්ධනය වූ අතර දේශීය සහ ආනයන ආශ්‍රිත බදු එකතු කිරීම් ඉහළ යාම, බදු පරිපාලනයේ සිදුවූ වැඩිදියුණු කිරීම් මෙන්ම බදු අනුකූලතාවය සහ බදු එකතුකිරීමේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් සිදු කළ බදු පරිපාලනය අඛණ්ඩව ඩිජිටල්කරණය කිරීම මීට හේතු විය. දේශීය ආර්ථික කටයුතු පුළුල් වීම හේතුවෙන් දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම 2025 වසරේ මුල් මාස අට තුළ වූ රු. බිලියන 567.5 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 723.6 දක්වා සියයට 27.5 කින් වර්ධනය විය. ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, 2025 වසරේ වසරේ මුල් මාස අට තුළ වූ රු. බිලියන 516.8 සිට 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 599.0 දක්වා සියයට 15.9 කින් වර්ධනය වූ අතර, එයට ප්‍රධාන වශයෙන් ආනයනික වාහන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම හේතු විය. ඒ අනුව , 2026 වසරේ මුල් මාස අට තුළ දී එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 1,812.0 න් සියයට 73.0 ක ළඟාකරගැනීමකි.

2.5 වගුව | එකතු කළ අගය මත බදු කාර්යසාධනය

රු. මිලියන

බදු පදනම	ජන. - අගෝ.		වර්ධනය (%)
	2025	2026 (අ)	
දේශීය	567,470	723,643	27.5
ආනයන	516,778	599,037	15.9
ශුද්ධ ආදායම	**1,084,248**	**1,322,680**	**22.0**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

නිෂ්පාදන/ සුරා බද්ද

නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 607.9 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 748.0 ක් දක්වා සියයට 23.0 කින් වර්ධනය විය. නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම මගින් ලැබුණු ආදායමේ පහත වැටීමක් වාර්තා වුවද, මෝටර් වාහන, මත්පැන්, ඛනිජ තෙල් සහ දුම්වැටි වලින් ලැබුණු ඉහළ ආදායම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය . 2026 වසරේ මුල් මාස අට තුළ නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද ආදායම සමස්ත බදු ආදායමෙන් සියයට 20.3 ක් සහ සමස්ත ආදායමෙන් සියයට 18.7 ක් වූ අතර, එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 89.7 ක ළඟා කර ගැනීමකි. 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින දක්වා ආනයන සීමා කර තිබූ පසුබිමක මෝටර් වාහන සඳහා අඛණ්ඩව පැවති ඉහළ ඉල්ලුම හේතුවෙන් මෝටර් වාහන මත නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 270.5 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 347.0 දක්වා සියයට 28.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 120.8 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 135.1 ක් දක්වා සියයට 11.9 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පවතින මැද පෙරදිග ගැටුම් හේතුවෙන් ගෝලීය ඉන්ධන මිල ඉහළ යාමයි.

මත්පැන් මත සුරාබදු වලින් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 145.7 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සමස්ත නිෂ්පාදන බදු ආදායමෙන් සියයට 24.2 කට දායකත්වය සපයමින් රු. බිලියන 181.1 ක් දක්වා සියයට 24.3 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. 2026 වසරේ පළමු මාස අට තුළ සුරා බදු වලින් ලද ආදායම 2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 74.5 ක ළඟා කර ගැනීමකි. 2025 වසරේ පළමු මාස අට තුළ නිෂ්පාදනය වූ මධ්‍යසාර ලීටර් මිලියන 23.9 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සමස්ත මධ්‍යසාර නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මිලියන 26.1 ක් දක්වා සියයට 9.2 කින් වැඩි විය. 2026 වසරේ පළමු මාස අට තුළ සැර මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මිලියන 16.4 ක් දක්වා සියයට 16.3 කින් වැඩි වූ අතර ධාන්‍ය මත්පැන් (බියර්) නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මිලියන 9.4 ක් දක්වා සියයට 2 කින් සුළු වශයෙන් අඩු විය.

මේ අතර, පැණි බීම වර්ග, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල ඇතුළු නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම මඟින් ලද නිෂ්පාදන බදු ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 8.1 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 7.7 ක් දක්වා සියයට 4.7 කින් සුළු වශයෙන් අඩු විය. කෙසේ වෙතත්, දුම්කොළ ද ඇතුළුව සිගරට්වලින් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 62.8 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 77.0 ක් දක්වා සියයට 22.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

2.6 වගුව | නිෂ්පාදන / සුරා බදු කාර්යසාධනය


රු. මිලියන

බදු පදනම	ජන. - අගෝ.		වර්ධනය
	2025	2026 (අ)	(%)
මත්පැන්	145,698	181,105	24.3
දුම්වැටි/දුම්කොළ	62,810	76,995	22.6
මෝටර් වාහන	270,526	347,032	28.3
ඛනිජ තෙල් නිෂ්පාදන	120,787	135,116	11.9
අනෙකුත්	8,105	7,726	-4.7
එකතුව	**607,927**	**747,973**	**23.0**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

2.3 රූපසටහන | නිෂ්පාදන / සුරා බදු කාර්යසාධනය: 2026 ජනවාරි - අගෝස්තු



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 190.8 ට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස අට තුළ දී රු. බිලියන 233.2 දක්වා සියයට 22.2 කින් වර්ධනය විය. දේශීය සහ විදේශීය ක්‍රියාකාරකම් පුළුල් වීම මෙන්ම වැඩිදියුණු කළ බදු පරිපාලන ක්‍රියාමාර්ග මීට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර 2026 වසරේ මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයන අවස්ථාවේදී මෝටර් රථ සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම හේතුවෙන් ආනයන මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 53.0 ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 68.9 දක්වා වර්ධනය විය. ඒ අනුව, 2026 වසරේ පළමු මාස අට තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 333.0 න් සියයට 70.0 ක් ලභා කර ගැනීමට සමත් වී ඇත.

රේගු ආනයන බදු

රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 151.0 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එහි වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 85.5 ක් ලභාකරගනිමින් රු. බිලියන 201.0 ක් දක්වා සියයට 33.1 කින් වර්ධනය විය. ආනයන පරිමාවෙහි සිදු වූ සාමාන්‍ය ඉහළ යාම, මෝටර් රථ ආනයනය වැඩි වීම සහ රේගු ආනයන බදු මත අධිභාරයක් පැනවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 103.6 ට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එහි වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 81.4 ක් ලභාකරගනිමින් රු. බිලියන 105.0 ක් දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් වර්ධනය විය. බඩඉරිඟු ආනයනය සඳහා පනවා තිබූ සීමා ඉවත් කිරීම, අර්තාපල් සහ ලොකු ළූණු සඳහා අදාළ බදු අනුපාත ඉහළ නැංවීම සහ සහල් ආනයනය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත.

භාණ්ඩ අපනයන සහනාධාර යෝජනා ක්‍රමය (සෙස්)

සෙස් බද්දෙන් ලද ආදායම 2025 පළමු මාස අට තුළ වූ රු. බිලියන 56.5 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 54.5 ක් දක්වා සියයට 3.7 කින් අඩු වී ඇත. භාණ්ඩ ආනයනයේදී පනවන අනෙකුත් බදු වර්ග (Para -Tariffs) ඉවත් කිරීමේ රජයේ වැඩසටහන යටතේ සෙස් බද්ද ඉවත් කිරීම මෙන්ම, 2026 වසරේ අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනික රෙදිපිළි මත පනවා තිබූ සෙස් බද්ද ඉවත් කිරීම මේ සඳහා හේතු විය.

වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලද මුළු ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 115.9 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එහි වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 68.8 ක් ලභාකරගනිමින් රු. බිලියන 130.8 ක් දක්වා සියයට 12.9 කින් වර්ධනය විය. ආනයන පරිමාවෙහි සිදු වූ සාමාන්‍ය ඉහළ යාම සහ 2026 වසරේ පළමු මාස අට තුළ ආනයන වටිනාකම් ඇ. ඩො. මිලියන 16,557.1 ක් දක්වා සියයට 24.1 කින් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

විදුලි සංදේශ බද්ද

විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 10.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 9.3 දක්වා සියයට 11.6 කින් අඩු විය. අන්තර්ජාල නොවන විදුලි සංදේශ සේවාවල සැපයුම් වටිනාකම් පහළ යාම මෙම අඛණ්ඩ අඩුවීමට හේතු විය.

සුඛෝපභෝගී මෝටර් රථ වාහන මත බදු සහ අනෙකුත් බදු

මෝටර් රථ වාහන මත බදු සහ අනෙකුත් බදු වලින් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 45.1 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 53.5 දක්වා සියයට 18.6 කින් වර්ධනය විය. සුඛෝපභෝගී මෝටර් රථ වාහන බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 22.3 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 29.5 දක්වා සියයට 32.1 කින් වර්ධනය විය. ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා වලින් ලද බදු ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 6.0 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 9.9 දක්වා සියයට 65.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වෙතත්, කොටස් ගනුදෙනු බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 4.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3.8 ක් දක්වා සියයට 16.0 කින් අඩු විය. විදේශීය ආර්ථික කම්පන හේතුවෙන් කොටස් ගනුදෙනුවල වටිනාකම සහ පරිමාව විචලනය වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2.7 වගුව | මොටර් රථ වාහන ආනයන

අයිතමය	ආනයන ජන - අගෝ		වෙනස (ඒකක)	%
	2025	2026		
මෝටර් රථ	36,969	75,321	38,352	103.7
බස් රථ හා මගී වෑන් රථ	1,077	3,000	1,923	178.6
ත්‍රිරෝද රථ	9,479	38,667	29,188	307.9
යතුරු පැදි	97,969	288,573	190,604	194.6
භාණ්ඩ ප්‍රවාහන රථ (අ)	4,942	10,443	5,501	111.3
ඉඩම් වාහන (ආ)	4,373	7,265	2,892	66.1
අනෙකුත් (ඇ)	20,861	22,277	1,416	6.8
එකතුව	**175,670**	**445,546**	**269,876**	**154**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගුව

(අ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන සහ විශේෂිත වාහන

(ආ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, බවුසර් සහ අනෙකුත් ඉඩම් වාහන

(ඇ) කැබ් රථ, ද්විත්ව කාර්ය වාහන, ක්වඩ්‍රි සයිකල් සහ මෝටර් නිවාස

2.8 වගුව | නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්

නිදහස් වෙළෙඳ ගිවිසුම්	2026 ජන. - අගෝ.			
	ආනයන වටිනාකම		අපනයන වටිනාකම	
	(මි.ර.ගැ./ රු. මිලියන)	(මි.ර.ගැ./ ඇ.ඩො. මිලියන	(නැ.තෙ.මි./ රු. මිලියන)	(නැ.තෙ.මි./ ඇ.ඩො. මිලියන
ඉන්දීය - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA)	96,950	301	147,071	456
පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA)	4,631	14	11,569	36
දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)	4,792	15	32,279	100
ආසියා - ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (APTA)	9,187	29	55,742	173
සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (SSFTA)	2,969	9	33	0.1
එකතුව	**118,529**	**368**	**246,694**	**766**

මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව සහ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.9 වගුව | ජාත්‍යන්තර වෙළඳාමෙන් ලද සෙස් බදු ආදායම

රු. මිලියන

අයිතම	ජන. -අගෝ.	
	2025	2026(අ)
අපනයන සෙස් බද්ද	**954**	**1,261**
තේ - (බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ	312	326
රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ	2	4
පොල් - පොල් සංවර්ධන පනත යටතේ	96	112
අ.සං.ම සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ	544	819
ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ	55,575	53,193
එකතුව	**56,529**	**54,454**

මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව

(අ) තාවකාලික

බදු නොවන ආදායම

බදු නොවන ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 226.2 ට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 314.8 දක්වා සියයට 39.1 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය වී ඇති අතර බදු නොවන ආදායම සියයට 7.9 කින් මුළු ආදායමට දායක වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම් රු. බිලියන 42.1 ක් ද ඇතුලුව ලාභ හා ලාභාංශ, කුලී, දඩ, ගාස්තු හා අය කිරීම්, පොළී ආදායම සහ සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලද ආදායම ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, පොළී ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 43.4 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 51.7 ක් දක්වා සියයට 19.1 කින් වර්ධනය විය. දඩ, ගාස්තු සහ අයකිරීම් වලින් ලද ආදායම ද 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 112.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 133.6 ක් දක්වා සියයට 18.7 කින් වර්ධනය වී ඇති අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙතින් ලද ගාස්තු හා අය කිරීම්වල ආදායම ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ඉහළ යාම හා දායකත්ව අනුපාතය ඉහළ දැමීම හේතුවෙන්, සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලද ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 36.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 45.3 ක් දක්වා සියයට 23.8 කින් වර්ධනය විය. කුලී ආදායම ද 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 3.9 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 5.1 දක්වා සියයට 31.8 කින් වර්ධනය විය. මේ අතර, රජය සතු ව්‍යවසායන්ගෙන් ලද ලාභ හා ලාභාංශ ආදායම 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 14.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 19.9 ක් දක්වා සියයට 36.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2026 වසරේ පළමු මාස අට තුළ බදු නොවන ආදායම එහි වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 360 න් සියයට 87.4 ක් ලහාකර ගෙන ඇත.

වගුව 2.10 | රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - අගෝස්තු	2026 ඇස්තමේන්තුව	2026(අ) ජනවාරි - අගෝස්තු	විචලනය සඳහා ප්‍රධාන හේතු
ආදායම් බද්ද	702.3	1,210.0	825.6	2026 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 68.2 ක් ලහා කරගනිමින් 2026 වසරේ පළමු මාස අට තුළ ආදායම් බදු ආදායම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී රු. බිලියන 825.6 දක්වා සියයට 17.6 කින් වර්ධනය වී ඇත. මෙම ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත. - 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි මත්පැන්, දුම්කොළ සහ ඔට්ටු සහ සූදු ඇල්ලීමේ කර්මාන්ත සඳහා සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ දැමීම; - 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි යම් විදේශ මූලාශ්‍රයකින් ලැබෙන ඉපයීම් හා ලාභ මත සියයට 15 ක ආදායම් බද්දක් පැනවීම; - 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි පොලී මත රඳවාගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ දැමීම; - රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළයාම; - තනි පුද්ගල සහ හවුල් ව්‍යාපාර සඳහා අදාළ ප්‍රාග්ධන ලාභ බද්ද 2026 වසරේ ජුනි මස 03 දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීම; - ආර්ථික ක්‍රියාකාරකම්හී පුළුල් වීම පිළිබිඹු කරමින් 2026 වර්ෂයේ මුල් භාගයේදී දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය වීම; සහ - බදු පදනම පුළුල් කිරීම සඳහා බදු පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම හේතුවෙන් 2025 වසරේ අගෝස්තු මාසය අවසාන වනවිට 1,270,851 ක් වූ ලියාපදිංචි බදු ලිපිගොනු සංඛ්‍යාව 2026 වසරේ අගෝස්තු මස අවසාන වන විට 1,425,144 ක් දක්වා සියයට 12.1 කින් වර්ධනය වීම. කෙසේ වුව ද, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස අට තුළ අත්තිකාරම් පුද්ගල බද්දෙන් ලද ආදායම සියයට 6.1 කින් ඉහළ ගිය ද, 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට රු. මිලියන 1.2 ක් ව පැවති අත්තිකාරම් පුද්ගල බද්දට අදාළ වන බදු නිදහස් සීමාව වසරකට රු. මිලියන 1.8 දක්වා වැඩි කිරීම සහ සියයට 18 බදු ස්ථරය පුළුල් කිරීමේ සංයුක්ත බලපෑම සමස්ත ආදායම් බදු ආදායම අඩු වීම සඳහා බලපා ඇත.

වගුව 2.10 | රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය - (සම්බන්ධිතයි...)

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - අගෝස්තු	2026 ඇස්තමේන්තුව	2026(අ) ජනවාරි - අගෝස්තු	විචලනය සඳහා ප්‍රධාන හේතු
එකතුකළ අගය මත බදු	1,084.2	1,812.0	1,322.7	2026 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 73.0 ලභාකරගනිමින් 2026 වසරේ පළමු මාස අට තුළ එකතුකළ අගය මත බදු ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී රු. බිලියන 1,322.7 ක් දක්වා සියයට 22.0 කින් වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත. - ආර්ථික ක්‍රියාකාරකම් හී පුළුල් වීම පිළිබිබු කරමින් 2026 වසරේ මුල් භාගයේ දී දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය වීම; - ආනයනික රෙදි පිළි සඳහා පැවති ශූන්‍ය එකතුකළ අගය මත බදු අනුපාතය 2026 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කර ඒ සඳහා සම්මත එකතුකළ අගය මත බදු අනුපාතයක් පැනවීම; - 2026 වසරේ පළමු මාස අට තුළ ආනයනය කරන ලද මෝටර් රථ ප්‍රමාණය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 441,097 දක්වා සියයට 150.1 කින් ඉහළ යාම; - 2026 වසරේ පළමු මාස අට තුළ මුළු භාණ්ඩ ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 16,557.1 දක්වා සියයට 24.1 කින් ඉහළ යාම; සහ - බදු පරිපාලන ක්‍රියාමාර්ගයන් හේතුවෙන් එකතුකළ අගය මත බදු අනුකූලතාවය වැඩිදියුණු වීම පිළිඹිබු කරමින් 2026 වසරේ අගෝස්තු මස අවසන් වන විට ලියාපදිංචි බදු ගෙවන්නන් සංඛ්‍යාව 2025 වසරේ අගෝස්තු මස අවසන් වන විට වූ 30,298 සිට 38,024 ක් දක්වා සියයට 25.5 කින් ඉහළ යාම.
නිෂ්පාදන බද්ද	607.9	834.0	748.0	නිෂ්පාදන බදු ආදායම 2026 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 89.7 ක් ලභාකර ගෙන ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - 2026 වසරේ පළමු මාස අට තුළ මත්පැන් නිෂ්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව නිරපේක්ෂ ලීටර් මිලියන 26.1 ක් දක්වා සියයට 9.2 කින් ඉහළයාම; - 2025 වසරේ පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සියලුම වර්ගයේ මෝටර් රථ ආනයන සඳහා පැවති ආනයන සීමා ඉවත් කිරීම හේතුවෙන් මෝටර් රථ මත වූ නිෂ්පාදන බදු ආදායම වර්ධනය වීම; - 2026 වසරේ පළමු මාස අට තුළ ආනයනය කළ මෝටර් රථ සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලයට සාපේක්ෂව 441,097 දක්වා සියයට 150.1 කින් ඉහළ යාම; - දුම්වැටි අලෙවිය දුම්වැටි මිලියන 1,282 දක්වා සියයට 5.0 කින් සලකා බලනු ලබන කාලය තුළදී ඉහළයාම හේතුවෙන් සිගරට් මගින් ලද නිෂ්පාදන බදු ආදායම රු. බිලියන 75.7 දක්වා සියයට 22.2 කින් වර්ධනය වීම ; සහ - 2026 වසරේ පළමු මාස අට තුළ ඩීසල් ආනයනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 8.7 කින් සහ පෙට්‍රල් ආනයනය සියයට 2.2 කින් ඉහළයාම හේතුවෙන් බණිජතෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම සියයට 11.9 කින් වර්ධනය වීම. කෙසේවුවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළදී පාම් තෙල්, මේද අම්ල, ශීතකරණ හා පැණි බීම වර්ග ඇතුලත් අනෙකුත් නිෂ්පාදන බදු මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම සියයට 4.7 කින් පහත වැටී ඇති අතර, එය සමස්ත නිෂ්පාදන බදු ආදායම් කාර්යසාධනයට සෘණාත්මකව බලපෑම් එල්ලකර ඇත.

වගුව 2.10 | රාජ්‍ය ආදායම් විචලනා විශ්ලේෂණය - (සම්බන්ධිතයි...)

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - අගෝස්තු	2026 ඇස්තමේන්තුව	2026(අ) ජනවාරි - අගෝස්තු	විචලනය සඳහා ප්‍රධාන හේතු
රේගු ආනයන බදු	151.0	235.0	201.0	2026 වසර සඳහා වූ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 85.5 ක් ලභාකරගනිමින් රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 201 ක් දක්වා සියයට 33.1 කින් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇති අතර, මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - මෝටර් රථ මත රේගු ආනයන බද්දක් හඳුන්වාදීමත් සමඟින් මෝටර් රථ මත වූ රේගු ආනයන බදු මත සියයට 50 ක අධිභාරයක් පැනවීම; - 2026 වසරේ පළමු මාස අට තුළ ආනයනය කළ මෝටර් රථ සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 445,546 දක්වා සියයට 154.0 කින් ඉහළ යාම; - 2026 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි දැනට පවත්නා සියයට 0, සියයට 15, සහ සියයට 20 යන ආනයන බදු අනුපාතයන් සියයට 0, සියයට 10, සියයට 20 සහ සියයට 30 ලෙස කාණ්ඩ හතරේ තීරුබදු ව්‍යුහයක් හඳුන්වාදීම; සහ - 2026 වසරේ පළමු මාස අට තුළ මුළු භාණ්ඩ ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 16,557.1 දක්වා සියයට 24.1 කින් වර්ධනය වීම .
වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද	115.9	190.0	130.8	2026 වසරේ පළමු මාස අට තුළදී වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් ලද ආදායම 2026 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 68.8 ක් ලභා කරගෙන ඇත. මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් හේතුවූයේ; - 2026 වසරේ පළමු මාස අට තුළ මුළු භාණ්ඩ ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලයට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 16,557.1 දක්වා සියයට 24.1 කින් ඉහළ යාම.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	103.6	129.0	105.0	2026 වසරේ අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 81.4 ලභාකරගනිමින් 2026 වසරේ පළමු මාස අට තුළදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 105.0 දක්වා සියයට 1.3 කින් සුළු වශයෙන් වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - 2025 වසරේ අගෝස්තු මස 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලොකු ඒණු සඳහා වන බදු අනුපාතය කිලෝග්‍රෑමයකට රු. 10 සිට කිලෝග්‍රෑමයකට රු. 50 දක්වා සහ අර්තාපල් සඳහා වන බදු අනුපාතය කිලෝග්‍රෑමයකට රු. 60 සිට කිලෝග්‍රෑමයකට රු. 80 දක්වා ඉහළ නැංවීම
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	190.8	333.0	233.2	2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 70.0 ක් ලභාකරගනිමින් පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2026 වසරේ පළමු මාස අට තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම රු. බිලියන 233.2 දක්වා සියයට 22.2 කින් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම පිළිඹිබු කරමින් 2026 වසරේ මුල් භාගයේ දී දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය වීම - 2026 වසරේ මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි මෝටර් රථ ආනයනය කරනු ලබන අවස්ථාවේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම; සහ - 2026 වසරේ පළමු මාස අට තුළ මුළු භාණ්ඩ ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 16,557.1 දක්වා සියයට 24.1 කින් වර්ධනය වීම.

වගුව 2.10 | රාජ්‍ය ආදායම් විචලතා විශ්ලේෂණය - (සම්බන්ධිතයි...)

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - අගෝස්තු	2026 ඇස්තමේන්තුව	2026(අ) ජනවාරි - අගෝස්තු	විචලනය සඳහා ප්‍රධාන හේතු
වෙනත් බදු	112.6	167.0	117.3	2026 වසර සඳහා වන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 70.2 ක් ලභාකරගනිමින් 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2026 වසරේ පළමු මාස අට තුළ වෙනත් බදු මඟින් ලද ආදායම රු. බිලියන 117.3 දක්වා සියයට 4.1 කින් වර්ධනය වී ඇත. මේ සඳහා මූලික වශයෙන් හේතුවූයේ; - මෝටර් රථ ආනයන සඳහා පැවති සීමාවන් ඉවත් කිරීමත් සමඟින් 2026 වසරේ පළමු මාස අට තුළ මෝටර් රථ මත සුඛෝපභෝගි බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 22.3 සිට රු. බිලියන 29.5 දක්වා වර්ධනය වීම; කෙසේ වුවද, විදුලි සංදේශ සේවා පරිභෝජනය අඩුවීම හේතුවෙන් 2026 වසරේ පළමු මාස අට තුළ විදුලි සංදේශ බද්ද මඟින් ලද ආදායම සියයට 11.6 කින් පහළ යාම වෙනත් බදු ආදායමේ කාර්යසාධනය යම් ප්‍රමාණයකින් අඩු වීම සඳහා හේතු වී ඇත. මීට අමතරව, සෙස් බද්දෙන් ලද ආදායම සියයට 3.7 කින් පහළ යාම තවදුරටත් ඇස්තමේන්තුවෙන් විචලනය වීමට හේතු වී ඇත.
බදු නොවන ආදායම	226.2	360.0	314.8	2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 87.4 ක් ලභාකරගනිමින් 2026 වසරේ පළමු මාස අට තුළ බදු නොවන ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 39.1 කින් වර්ධනය වී ඇත. මෙම ශක්තිමත් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකු ලාභ පැවරුම්, පොලී ආදායම, සමාජ ආරක්ෂණ දායකත්ව ආදායම් ලැබීම, දඩ මුදල්, ගාස්තු සහ අය කිරීම්, කුලී ආදායම් සහ රජය සතු ව්‍යවසායන් මඟින් ලද ලාභ හා ලාභාංශ ආදායම් ඉහළයාම බලපා ඇත.
එකතුව	3,294.7	5,270.0	3,998.3	

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.
(අ) තාවකාලික

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග: 2026 ජනවාරි - සැප්තැම්බර්

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන	
2026.06.03	2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත - 2025 සහ 2026 අයවැය මඟින් යෝජනා කරන ලද බදු සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා 2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත බලාත්මක කරන ලදී. • ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය (SET) ගොනු කිරීමේ අවශ්‍යතාවය 2025/2026 තක්සේරු වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීම. • පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු එක් එක් බදු වාරිකයක වටිනාකම එම පුද්ගලයා විසින් පෙර තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද මත පදනම්ව ගණනය කිරීම. • ගුවන් යානා, මෘදුකාංග බලපත්‍ර හෝ සම්බන්ධිත සේවාවන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නිර්වාසික පුද්ගලයන් හට කරන ගෙවීම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම. • ජීවිත රක්ෂණ ඔප්පු වලින් ලැබෙන මුදල් මත ආදායම් බදු අය කෙරෙන ආකාරය පැහැදිලි කිරීම. ඒ අනුව, රක්ෂිත පුද්ගලයාගේ මරණයේ දී, රක්ෂණ ඔප්පුවේ කල්පිරීමේ දී හෝ පවාරන අගයක් අත්කර ගැනීමේ දී, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ පුද්ගලයෙකු විසින් ලබන එම මුදල් තක්සේරු ආදායම ගණනය කිරීමේ දී බැහැර කරන ලදී. කෙසේ වෙතත්, ජීවිත රක්ෂණ ඔප්පුව යටතේ සිදු කරන යම් වාර්ෂික දීමනා, විශ්‍රාම වැටුප්, විශ්‍රාම දීමනා හෝ ඒ හා සමාන ගෙවීම් තක්සේරු කළ හැකි ආදායමෙන් බැහැර කර නොමැත.

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
	• ශ්‍රී ලංකා රජයට හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ ස්ථාපිත හෝ ස්ථාපිත කර ඇති බවට සැලකෙන විශ්ව විද්‍යාලයකට තෑග්ගක් හෝ පරිත්‍යාගයක් ලෙස වත්කමක් පැවරීමෙන් ලැබෙන මුදල, වත්කම මාරු කිරීමට වහාම පෙරාතුව පැවති එහි ශුද්ධ පිරිවැයට සමාන ලෙස සැලකීම. • පුද්ගලයන්ට සහ හවුල්කාරිත්වයන්ට අදාළ වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීම. අනෙකුත් සියලුම ආයතන සඳහා අදාළ වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය සියයට 30 කි. • බදු වාසිකභාවය පිළිබඳ වන නීති පහත පරිදි සංශෝධනය කිරීම: - i. විශේෂිත නේවාසික වීසා බලපත්‍රයක් ඇති යම් පුද්ගලයෙකු ආදායම් බදු කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු ලෙස නොසැලකේ. ii. ශ්‍රී ලංකා ධජය සහිත යාත්‍රාවක සේවය කරන පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ වාසිකයෙකු ලෙස සලකනු ලබන්නේ ඔවුන් යාත්‍රාවේ සේවය කරන කාලය සඳහා පමණි. iii. ශ්‍රී ලංකා ධජය සහිත යාත්‍රාවක සේවය කරන විදේශීය පුරවැසියෙකු ආදායම් බදු ගෙවනු ලබන්නේ එම රැකියාවෙන් ලැබෙන ආදායම මත පමණක් වන අතර වෙනත් කිසිදු විදේශීය ආදායමක් මේ සඳහා අයත් නොවේ. • කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ආදායම, බද්දෙන් නිදහස් මුදල් ප්‍රමාණ, රඳවා ගැනීමේ බදු සහ වෙනත් යම් තොරතුරු ඇතුළත් සහතිකයක් ඒකක හිමියන්ට ලබා දීමට අපොහොසත් වන ඕනෑම ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සලකනු ලැබීම, වාසික සමාගම් සඳහා අදාළ වන පනතේ විධිවිධාන ඒ අනුව අදාළ වේ. • තක්සේරු වර්ෂයේදී සම්පූර්ණයෙන්ම අඩු කළ නොහැකි රජයට හෝ රජය විසින් ස්ථාපිත අරමුදල්වලට ලබා දෙන ඕනෑම පරිත්‍යාගයක් ඊළඟ වසරවලදී සුදුසුකම් ලත් අඩු කිරීම් ලෙස ඉදිරියට ගෙන යාමට අවසර දෙනු ලැබීම. • 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ 2022 අංක 14 දරන අධිභාර බදු පනතේ විධිවිධාන යටතේ පනවන ලද පොලිය නිදහස් කිරීම. • වැඩි කළ ප්‍රාග්ධන දීමනා සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 3 සිට ඇමරිකානු ඩොලර් 250,000 දක්වා අඩු කිරීම. • අනෙකුත් පරිපාලන විධිවිධාන ඉහත සංශෝධන වලට අමතරව, අනුකූලතාව වැඩි දියුණු කිරීම, ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහ බදු පරිපාලනයේ කාර්යක්ෂමතාවය සහ සඵලදායිතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් විවිධ පරිපාලන ප්‍රතිසංස්කරණ දේශීය ආදායම් පනත් කෙටුම්පතට ඇතුළත් කර ඇත.
මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත	
2026.02.24	2026.02.24 දිනැති අංක 2477/22 දරන ගැසට් නිවේදනය - ආපදාවලින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආපදා සහන දීමනා මත අදාල වන මුද්දර ගාස්තු ගෙවීමේ දී, රජය විසින් ගෙවනු ලබන රු. 25,000/= ඉක්මවන ගෙවීම් සඳහා නිකුත් කරන ලද රිසිට්පත් මත අය කරන ලද රු. 25/= ක මුද්දර ගාස්තුව නිදහස් කිරීම.
ඔට්ටු ඇල්ලීම සහ සූදු බද්ද - 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත	
2025.12.17 බ.පැ. 2026.01.01	2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත - 2025 අයවැය කතාවේ යෝජනා කර ඇති පරිදි පහත සඳහන් ආදායම් පියවරයන් බලාත්මක කිරීම සඳහා 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු පනත සංශෝධනය කරන ලදී. • දළ එකතු කිරීමේ බද්ද සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීමට; සහ • ශ්‍රී ලාංකික පුරවැසියන් මත පනවා ඇති කැසිනෝ ප්‍රවේශ බද්ද ඇමරිකානු ඩොලර් 50 සිට ඇමරිකානු ඩොලර් 100 දක්වා වැඩි කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග: 2026 ජනවාරි - සැප්තැම්බර් (සම්බන්ධිතයි...)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන **සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත**	
2026.04.09 බ.පැ. 2026.07.01 බ.පැ. 2026.05.01	2026 අංක 10 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත • 2026 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 36 දක්වා අඩු කිරීම; සහ • 2026 මැයි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, වාහන ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කර විකිණීමේ දී සමාජ ආරක්ෂණ දායකත්ව බදු අය කිරීම සහ අදාළ වාහන අලෙවියෙන් පසු අවස්ථාවේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම.
එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/07 දරන ගැසට් නිවේදනය - ආනයනික රෙදි මත වන ශූන්‍ය අනුපාත එකතු කළ අගය මත බද්ද ඉවත් කර සම්මත එකතු කළ අගය මත බද්ද අය කිරීම.
2026.06.30	2026 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත පහත දැක්වෙන ප්‍රධාන පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා 2026 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත බලාත්මක කරන ලදී. • නිර්වාසික සැපයුම්කරුවන් විසින් ඉලෙක්ට්‍රොනික වේදිකා හරහා සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද පැනවීම ක්‍රියාත්මක වන දිනය 2026 ජූලි 01 වන දින දක්වා කල් දැමීම. • නිර්වාසික සැපයුම්කරුවන් විසින් ඩිජිටල් වේදිකා හරහා සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද පැනවීම සඳහා ලියාපදිංචි කිරීමේ, අය කිරීමේ, එකතු කිරීමේ, වාර්තා ගොනු කිරීම යනාදියට අදාළ විධිවිධාන හඳුන්වාදීම. • සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය පහසු කිරීමට එකතු කළ අගය මත බදු පනතට සංශෝධන ඇතුළත් කිරීම. • චිත්‍රපට ප්‍රදර්ශන සේවා සැපයුමේ වටිනාකම තීරණය කිරීමේදී පළාත් පාලන ආයතන විසින් අය කරනු ලබන විනෝද බද්ද අඩු කිරීම සඳහා ඉඩදීම. • දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ වාර්තාවලට අනුව සුනාමි ව්‍යාපෘතිවල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් වන හිඟ එකතු කළ අගය මත බදු මුදල් කපා හැරීම. • නැවත අපනයනය කිරීමේ පදනම මත ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද යන්ත්‍ර, උපකරණ හෝ වාහන වැනි ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේ අත්හිටුවන ලද එකතු කළ අගය මත බද්ද, එකඟ වූ පරිදි එම භාණ්ඩ නැවත අපනයනය නොකළහොත් යෙදවුම් බදු ලෙස අඩු කිරීමට ඉඩ නොදීම. • නියම කරනු ලබන දිනක සිට මාස තුනක් ඇතුළත එකතු කළ අගය මත බදු ලියාපදිංචි පුද්ගලයින් විසින් විකුණුම් ස්ථාන (POS) යන්ත්‍ර භාවිතය සහ ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම. • සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඒකාබද්ධ කර, මූල්‍ය සේවා මත සියයට 20.5 ක වැඩි අනුපාතයකින් එකතු කළ අගය මත බද්ද අය කිරීම. • එකතු කළ අගය මත බදු පනත යටතේ සිදු කරන ලද වැරදි සඳහා අපරාධ නඩු විධිවිධාන සහ දඬුවම් හඳුන්වාදීම, සහ • ලාභාංශ ආදායම මත මූල්‍ය සේවා සැපයීම සඳහා වන එකතු කළ අගය මත බද්දේ ප්‍රතිපත්තිමය අභිප්‍රාය පැහැදිලි කිරීම.

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/06 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා, දැනට අදාළ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය/ උප-බෙදීමට බලපැවැත්වෙන අනුපාත පදනම් කරගෙන නිෂ්පාදන බද්ද පැනවීම.
සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)	
2025.12.12	සුරාබදු නිවේදන අංක 03/2025 (2025.12.11 දිනැති අංක 2466/22 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව සහ ආරක්ෂිත ඇප තැන්පතු මුදල සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුවක් පැනවීම.
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද- 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/05 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා , දැනට අදාළ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය/ උප-බෙදීමට බලපැවැත්වෙන අනුපාත පදනම් කරගෙන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පැනවීම.
සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/04 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද හෝ සංශෝධිත නව ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා සෙස් බද්ද පැනවීම.
2026.04.01	2026.03.10 දිනැති අංක 2479/38 දරන ගැසට් නිවේදනය - 2026 අයවැය කතාවේ යෝජනා පරිදි ආනයනික රෙදි මත වන සෙස් බද්ද ඉවත් කිරීම. - සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුමට අනුකූලව අතරමැදි යෙදවුම් සඳහා සෙස් අනුපාතය සියයට 50 කින් අඩු කිරීම.
රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත	
2026.04.01	ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2026 (2026.03.03 දිනැති අංක 2478/03 දරන ගැසට් නිවේදනය) - 2026 අප්‍රේල් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, එතෙක් පැවති සියයට 0, සියයට 15 සහ සියයට 20 රේගු ආනයන තීරු බදු අනුපාත සියයට 0, සියයට 10, සියයට 20 සහ සියයට 30 දක්වා සංශෝධනය කරමින්, සිව්-වැදෑරුම් රේගු ආනයන තීරු බදු ව්‍යුහයක් හඳුන්වා දීම.
රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)	
2026.02.01	2026.01.31 දිනැති අංක 2473/31 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා ඇති සියයට 50 ක අධිභාරය, 2026 දෙසැම්බර් මස 31 දින දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
2026.04.01	2026.03.12 දිනැති අංක 2479/55 දරන ගැසට් නිවේදනය - 2026 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බද්ද සියයට 20 සිට සියයට 30 දක්වා වැඩි කිරීම සැලකිල්ලට ගනිමින්, මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා තිබූ සියයට 50 ක අධිභාරය ඉවත් කිරීම.
2026.05.16	2026.05.15 දිනැති අංක 2488/56 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා ඇති සියයට 15 ක අධිභාරය 2026 මැයි මස 16 දින සිට මාස 03 ක කාල සීමාවක් සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
2026.05.18	2026.05.17 දිනැති අංක 2488/69 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය සඳහා 2026 මැයි 15 හෝ ඊට පෙර ස්ථාපිත ණයවර ලිපි සඳහා ලබා දී ඇති සහනය අවභාවිත කිරීම වැළැක්වීම.

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2026.08.15	2026.08.14 දිනැති අංක 2501/88 දරන ගැසට් නිවේදනය - මැද පෙරදිග පවතින යුධමය තත්ත්වය සහ විදේශ විනිමය අනුපාතය මත එල්ල වී ඇති පීඩනය සැලකිල්ලට ගනිමින් 2026 අගෝස්තු මස මස 15 වැනිදා සිට 2026 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා කාලය තුළ, මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා ඇති සියයට 50 ක අධිභාරය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත	
2026.01.01	2025.12.31 දිනැති අංක 2469/12 දරන ගැසට් නිවේදනය - ආනයනික අයිතම 62 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2026 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම.
2026.04.01	2026.03.31 දිනැති අංක 2482/09 දරන ගැසට් නිවේදනය - 2026 අප්‍රේල් මස 01 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි දේශීය පොල්තෙල් නිෂ්පාදනය සඳහා විජලනය කළ පොල් කැබලි ආනයනය කිරීමේදී සහ ඖෂධ නිෂ්පාදන කටයුතු සඳහා ලුණු ආනයනය කිරීමේදී, නිශ්චිත නියාමන අනුමැතීන්ට යටත්ව, අදාළ බද්දේ ඉතිරි කොටස නිදහස් කරමින් සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ලබා දීමට අවසර දීම.
2026.05.05	2026.05.04 දිනැති අංක 2487/02 දරන ගැසට් නිවේදනය - ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටුවේ නිර්දේශය සැලකිල්ලට ගනිමින්, බඩ ඉරිඟු ආනයනය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ඉහළ දැමීම.
ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත	
2026.03.23	2026 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.03.23 දිනැති අංක 2481/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - අන්තර්ජාතික ගුවන් සේවා සපයන ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සමාගම් වෙත සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 4012.13 යටතේ වර්ගීකරණය කර ඇති සහ අන්තර්ජාතිකව පිළිගත් ගුවන් සේවා අධිකාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල වන නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර් කොන්දේසි සහිතව ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.
2026.04.01	2026 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.03.31 දිනැති අංක 2482/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ආදායම් සංරක්ෂණ නියෝග මගින් ප්‍රකාශයට පත්කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදීම්වලට අනුකූලව 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි යාවත්කාලීන කිරීම.
2026.04.02	2026 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.04.02 දිනැති අංක 2482/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - පිළිවෙලින්, සම්බා සහ කිරි සම්බා සඳහා ආදේශක සේ සළකනු ලබන සහ සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කර ඇති, පොන්නි සම්බා සහ කිරි/පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 සහල් ලෙස හඳුන්වන සහල් වර්ගය ආනයනය කිරීමේදී පැවති ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය 2026 අප්‍රේල් 30 වැනි දින දක්වා ඉවත් කිරීම.
2026.06.06, 2028.01.01	2026 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.05.07 දිනැති අංක 2487/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2026 ජූනි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 84.15, 84.18, 84.19, 84.79, 87.04 සහ 87.07 යටතේ වර්ගීකරණය කරන ලද සහ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) සමඟ පමණක් ක්‍රියා කරන ශීතකරණ සහ වායු සමීකරණ උපකරණ සහ උපාංග ආනයනය තහනම් කිරීම, සහ 2028 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි එවැනි ශීතකරණ සහ වායු සමීකරණ උපකරණ සහ උපාංග සඳහා ශීතකරණ පද්ධතියේ සංරචකයක් ලෙස භාවිතා කරන සහ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) සමඟ පමණක් ක්‍රියා කරන සංයෝජිත වර්ගීකරණ කේත 8414.30 යටතේ වර්ගීකරණය කරන ලද සම්පීඩක ආනයනය තහනම් කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග: 2026 ජනවාරි - සැප්තැම්බර් (සම්බන්ධිතයි...)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2026.06.15	2026 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.06.15 දිනැති අංක 2493/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - සංයෝජිත වර්ගීකරණ සංකේතාංක පනස් පහක් (55) යටතේ වර්ගීකරණය කර ඇති ලෝහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අපනයන පාලන බලපත්‍ර (ECL) අවශ්‍යතාව පැනවීම.
2026.06.19	2026 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.06.18 දිනැති අංක 2493/39 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - භාණ්ඩ ආනයනය කිරීමේ ගෙවීම් ක්‍රම වලට අදාළ රෙගුලාසි, පහත සඳහන් කරුණු අනිවාර්ය කරමින් සංශෝධනය කිරීම; • සියලුම බැංකු විසින් එක් එක් ගනුදෙනුව සඳහා අනන්‍ය අංකයක් ලබා දීම සහ එලෙස ලබා දෙන ලද අංකයට අදාළ හෝ ඒ යටතේ සිදු කරනු ලබන එක් එක් ගනුදෙනුව සම්බන්ධ අදාළ ප්‍රේෂණකරුගේ (ආනයනකරුගේ) වලංගු බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය, ප්‍රේෂණකරුගේ (ආනයනකරුගේ) ලිපිනය, ප්‍රතිලාභියාගේ ලිපිනය, ප්‍රතිලාභියාගේ ගිණුම් අංකය, බැංකු කේතය, ශාඛා කේතය, විදේශ මුදල් වර්ගය සහ ප්‍රමාණය, ගෙවීම් ක්‍රමය, භාරදීමේ කොන්දේසි, ප්‍රේෂණය සිදුකළ දිනය, නාමමාත්‍ර ඉන්වොයිසි අංකය, සහ භාණ්ඩ පිළිබඳ විස්තරය යන තොරතුරු ඇතුළුව සියලුම තොරතුරු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත වහාම දැනුම් දීම. • පෙර ගෙවීම් සිදු කිරීමට ප්‍රථම, ආනයනකරු විසින් පෙර ගෙවීමක් සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් ආනයනකරුවෙකු ලෙස ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම.
2026.07.10	2026 අංක 07 දරන භාණ්ඩ ආනයනය තහනම් කිරීම පිළිබඳ ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.07.10 දිනැති අංක 2496/38 දරන අති විශේෂ ගැසට් පත්‍රය) - බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය මගින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් කැණීම් කරනු ලබන, නිෂ්පාදනය කරනු ලබන හෝ නිම කරනු ලබන භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කිරීම.
අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත	
2025.12.29	2025.12.29 දිනැති අංක 2469/03 දරන ගැසට් නිවේදනය - මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම සඳහා, බදු නිදහස් කිරීමේ කාලය 2025 දෙසැම්බර් මස 29 දින සිට 2027 ජූනි මස 26 දින දක්වා මාස 18 දීර්ඝ කිරීම.
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත	
2026.02.08	2026.02.08 දිනැති අංක 2474/66 දරන ගැසට් නිවේදනය - ව්‍යාපෘති, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගැනීම සඳහා වන සුදුසුකම් ලැබීමේ නිර්ණායක ප්‍රකාශයට පත් කිරීම සහ අදාළ වන බදු නිදහස් කිරීම් සහ සහන නියම කිරීම.
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත - 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත	
2026.01.20	2026 අංක 1 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත - පහත සඳහන් ප්‍රධාන පියවරයන් බලාත්මක කිරීම සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කරන ලදී: • කොළඹ වරාය නගරය ප්‍රදේශය තුළ සේවයේ නියුතු පුද්ගලයන්ගේ සේවා නියුක්ති ආදායම් මත අදාලවන ආදායම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම. • වාර්ෂිකව බදු ආදායම් අභිමිවීම් ප්‍රකාශයට පත් කිරීම සහ ඇස්තමේන්තුගත කිරීම, අනිවාර්ය සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම සහ තවදුරටත් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් කාර්ය සාධන ඉලක්ක (රැකියා, උපලබ්ධි වූ ආයෝජනය, නියම කර ඇති කාලසීමා) අධීක්ෂණය හරහා අනුකූලතාව සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම. • ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායී බැංකු අධීක්ෂණය ඇතුළු නියාමන ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම.

2.3 රාජ්‍ය වියදම

රාජ්‍ය වියදම 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 3,966.9 ක් වූ අතර ඉන් රු. බිලියන 3,531.0 ක් පුනරාවර්තන වියදම් සහ රු. බිලියන 435.9 ක් ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් ලෙස සටහන් විය. රාජ්‍ය වියදම සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව බලය ලබා දිය යුතු වේ. ඒ අනුව, 2026 වසරේ රජයට වියදම් දැරීමට හැකි වනු පිණිස 2025 අංක 23 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

2.11 වගුව | රාජ්‍ය වියදම් කාර්යසාධනය

රු. මිලියන

අයිතමය	ජන. අගෝ	
	2025	2026(අ)
පුනරාවර්තන වියදම්	**3,381,309**	**3,531,045**
වැටුප්	760,687	826,962
විශ්‍රාම වැටුප්	282,905	332,363
පොලී ගෙවීම්	1,687,571	1,609,194
වෙනත්	650,146	762,526
ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්	**331,183**	**435,867**
එකතුව	**3,712,492**	**3,966,913**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

පුද්ගල පඩිනඩි සහ විශ්‍රාම වැටුප්

2026 වසරේ පළමු මාස අට තුළ පළාත් සභා සේවකයින් ඇතුළු රාජ්‍ය සේවකයින්ගේ වැටුප් සඳහා වූ වියදම, 2025 වසරේ එම කාලපරිච්ඡේදයේ පැවති රු. බිලියන 760.7 සිට සියයට 8.7 කින් ඉහළ ගොස් රු. බිලියන 827.0 ක් දක්වා වැඩි වී තිබේ. මේ අතර, විශ්‍රාම වැටුප් ගෙවීම් සඳහා වූ වියදම 2025 වසරේ එම කාලපරිච්ඡේදයේ පැවති රු. බිලියන 282.9 ට සාපේක්ෂව, 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 332.4 ක් දක්වා සියයට 17.5 කින් ඉහළ ගොස් ඇත. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2025 අයවැය යෝජනාවට අනුකූලව රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප් වැඩි කිරීම සහ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම ය.

පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීම් සඳහා වියදම 2025 වසරේ පළමු මාස අටෙහි වූ රු. බිලියන 1,687.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,609.2 ක් දක්වා සියයට 4.6 කින් අඩු විය. දේශීය ණය සඳහා වන පොලී ගෙවීම් 2025 වසරේ පළමු මාස අටෙහි වූ රු. බිලියන 1,466.5 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 1,389.7 දක්වා සියයට 5.2 කින් අඩු විය. විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් 2025 වසරේ පළමු මාස අටෙහි වූ රු. බිලියන 221.1ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. බිලියන 219.5ක් දක්වා සියයට 0.7 කින් අඩු විය.

සුබසාධනය

රජය විසින් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරන අතර සමාජයේ අවදානමට ලක්විය හැකි සහ ආන්තිකකරණයට ලක් වූ කොටස්වලට විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ සවිබල ගැන්වීමට කටයුතු කරන ලදී.

සමාජ සුබසාධනය, සමාජ ආරක්ෂණය, අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය, නිෂ්පාදන හා ශ්‍රම වෙළඳපළ සඳහා සංවර්ධන සහායන් හා සහනාධාර ඇතුළු ප්‍රධාන සුබසාධන වියදම් සඳහා 2026 පළමු මාස අට තුළ රු. බිලියන 738.1 ක් වැය දරා ඇති අතර එය පසුගිය වර්ෂයේ එම කාලච්ඡේදයේ වියදම වන රු. බිලියන 629.4 ට සාපේක්ෂව සියයට 17.2 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 2026 වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලසීමාව තුළ සමාජ සුභසාධන සහ සමාජ ආරක්ෂණ වියදම් සඳහා රු. බිලියන 667.4 ක් වැය කර ඇති අතර ඒ තුළ වැඩිහිටි දීමනාව, ආබාධිත පුද්ගලයින් සඳහා දීමනා, වකුගඩු රෝගීන්ට ගෙවනු ලබන දීමනාව ඇතුළුව "අස්වැසුම" වැඩසටහනට අදාළ රු. බිලියන 164.2 ක වියදම ඇතුළත් වේ. එය 2025 වර්ෂයේ එම කාලසීමාවේ වියදමට සාපේක්ෂව සියයට 14.5ක වර්ධනයකි.

තවද, ආයුර්වේද රෝහල් ඇතුළු රජයේ රෝහල් සඳහා වන වෛද්‍ය සැපයුම් වෙනුවෙන් රජය දරන ලද වියදම 2025 වසරේ පළමු මාස අට තුළ පැවති රු. බිලියන 74.9 සිට 2026 වසරේ අදාළ කාලසීමාව තුළ රු. බිලියන 115.4 දක්වා සියයට 54 ක වැඩිවීමකි. ප්‍රසම්පාදන ක්‍රමවේදවල කාර්යක්ෂමතාව ඉහළ යාම සහ වෛද්‍ය සැපයුම් දාමයන්හි ක්‍රියාකාරිත්වය සුමටව පවත්වාගෙන යාම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2.12 වගුව | සුබසාධන වැඩසටහන් සඳහා වියදම්

රු. මිලියන

වැඩසටහන	ජන. - අගෝ.	
	2025	2026 තාවකාලික
සමාජ සුබසාධනය	**94,426**	**133,030**
රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් ඇතුළුව)	74,952	115,394
පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය (සුරක්ෂා)	1,376	857
විශ්‍රාමිකයන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය	486	602
පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා	490	565
රණවිරු මාපිය රැකවරණ දීමනාව	916	994
රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී	958	856
ආර්ථික වශයෙන් ලාභ නොලබන මාර්ග සඳහා ශ්‍රී ලංගමට ලබාදෙන සහනාධාර, සමාජීය වශයෙන් අනිවාර්ය බස් සේවා (සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය) සහ සන්නද්ධ හමුදා නිදහස් ගමන් ප්‍රවේශපත්‍ර	2,608	2,778
1990 "සුව සැරිය" නොමිලේ ගිලන්රථ සේවාව	1,686	2,021
ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොළී ගෙවීම්	10,000	1,734
ලෝක ආහාර වැඩසටහන	332	136
ගංවතුර සහ නියං ආධාර	41	6683
වෙනත්	581	411
සමාජ ආරක්ෂණය	**462,944**	**534,407**
අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආධාර	98,132	113,200
අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර	9,453	12,331
වැඩිහිටි පුද්ගලයින් සඳහා මුලික ආධාර	29,769	32,305
වකුගඩු රෝගීන් සඳහා මූලික ආධාර	3,166	3,649
පාසල් ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර	2,833	2,793
විශ්‍රාම වැටුප්	282,631	332,363
මියගිය හා තුවාල ලැබූ රණවිරුවන් සඳහා සේවා වන්දී	33,312	34,653
ගොවි විශ්‍රාම වැටුප	3,523	2,942
වෙනත්	126	171
සෞඛ්‍ය හා පෝෂණ	**25,442**	**25,123**
ත්‍රීපෝෂ වැඩසටහන	1,750	1,621
ගැබිණි මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය (පෝෂණ මල්ල)	4,196	3,472
පාසල් පෝෂ්‍යදායී ආහාර වැඩසටහන	17,894	18,219
පෙර පාසල් ළමුන් සඳහා උදැසන ආහාරය	1,342	1,229
වෙනත්	260	582
අධ්‍යාපනය	**18,931**	**19,000**
පාසල් පෙළ පොත්	1,567	867
පාසල් නිල ඇඳුම්	58	236
දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන්	2,490	1,891
ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන්	824	347
මහපොළ සහ ශිෂ්‍යාධාර	3,245	3,578
රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය	1,335	1,059
පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර	8,250	9,000
වෙනත්	1,162	2,022
සංවර්ධන සහනාධාර	**27,683**	**26,628**
පොහොර සහනාධාර	22,625	23,179
වෙනත්	5,058	3,449
එකතුව	**629,426**	**738,188**

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

රාජ්‍ය ආයෝජනය

ගිණුම්කරණ වර්ගීකරණයට අනුව 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 445.5 ඉක්ම වූ රාජ්‍ය ආයෝජනයක් සිදු කර ඇත. එම මුදලින් රු. බිලියන 45.2ක් "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හානි වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වැය කර ඇත. සමස්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ආසන්න වශයෙන් සියයට 27ක් විය. සැපයුම් දාමයේ බාධා විශේෂයෙන් මාර්ග ඉදිකිරීම් සඳහා අවශ්‍ය තාර හිඟය, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන්, ඉඩම් අත්පත් කර ගැනීම

හා පාරිසරික අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාදයන්, ව්‍යාපෘතිවල විෂය පථය වෙනස් වීම සහ ව්‍යාපෘති කළමනාකරණයට අදාළ ගැටලු ඇතුළු බාධා ප්‍රධාන වශයෙන් රජයේ මූලධන වියදම්වල ප්‍රගතිය අඩුවීම කෙරෙහි බලපා ඇත.

2026 වසරේ පළමු මාස අට තුළ ඉහත රාජ්‍ය ආයෝජන ප්‍රධාන වශයෙන් පහත සඳහන් අංශ සඳහා සිදු කර ඇත.

1. ග්‍රාමීය මාර්ග, පාලම්, මහාමාර්ග සහ අධිවේගී මාර්ග නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 126.0

2. නළ ජල සැපයුම් යෝජනා ක්‍රම සංවර්ධනය හා පුළුල් කිරීම, නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම සහ නාගරික ප්‍රදේශවල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 25.7

3. දුම්රිය ඇණිය හා දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය සහ බස් ප්‍රවාහනය වැඩිදියුණු කිරීම ඇතුළුව ප්‍රවාහන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රු. බිලියන 28.7

4. නවීන තාක්ෂණය හඳුන්වා දීම තුළින් කෘෂිකාර්මික අගයදාමයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා රු. බිලියන 23.5

5. ප්‍රධාන වශයෙන් වාරිමාර්ග ආශ්‍රිත යටිතල පහසුකම් ඉදිකිරීම හා නඩත්තු කිරීම මඟින් කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රු. බිලියන 22.5

6. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් පාසල්, උසස් අධ්‍යාපන ආයතන සහ ත්‍රිත්වීය පුහුණු මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ගුරු පුහුණු වැඩසටහන් සඳහා රු. බිලියන 19.1

7. රෝහල් නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සහ රෝහල් සඳහා වෛද්‍ය උපකරණ සැපයීම සඳහා රු. බිලියන 24.4

8. විදුලි සැපයුමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 2.3

9. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන ණය යෝජනා ක්‍රම සඳහා රු. බිලියන 28.2

10. රජය සතු ව්‍යවසායන් සඳහා හිමිකම් ප්‍රාග්ධනය සැලසීම සඳහා රු. බිලියන 55.2

2.4 මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

අයවැය ඇස්තමේන්තු හා සසඳන විට 2026 වසර තුළ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ මෙහෙයුම් රජයේ මූල්‍ය ද්‍රවශීලතා තත්ත්වයේ ප්‍රබල දියුණුවක් පෙන්නුම් කරයි. අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි මුදල් ගලා ඒම සහ විවක්ෂණශීලී වියදම් කළමනාකරණය හේතුවෙන්, ප්‍රක්ෂේපිත මුදල් හිඟය සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමටත්, කාලපරිච්ඡේදය අවසානයේ ධන මුදල් ශේෂයක් පවත්වා ගැනීමටත් භාණ්ඩාගාරයට හැකි විය. මෙම වර්ධනයන් මඟින් ආදායම් එකතු කිරීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට, මූල්‍ය විනය නැංවීමට සහ පොදු මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට රජය ගන්නා අඛණ්ඩ උත්සාහයන් පිළිබිඹු වේ.

භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව, ආදායම් සහ අනෙකුත් ලැබීම්වලින් ලැබුණු මුළු මුදල් ගලා ඒම රු. බිලියන 3,347.5 ක ඇස්තමේන්තුගත ගලා ඒමට සාපේක්ෂව රු. බිලියන 3,886.8 ක් දක්වා ළඟා වී ඇත. මෙය ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 539.3 ක හෝ සියයට 16.1 ක වැඩිවීමකි. මෙම වාසිදායක කාර්යසාධනය තුළින් ආදායම් වැඩිදියුණු කළ රැස්කිරීම සහ රජයේ ආදායම් මාර්ග සහ අනෙකුත් ලැබීම්වලින් අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි එකතු කිරීම් පෙන්නුම් කරයි.

වියදම් පාර්ශවය සලකා බැලීමේදී, පුනරාවර්තන ගෙවීම් සඳහා වූ මුළු මුදල් පිටතට ගලා යාම ඇස්තමේන්තුගත රු. බිලියන 4,342.8 කට සාපේක්ෂව රු. බිලියන 3,441.0 ක් විය. මෙය අයවැය ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 901.8 ක අඩුවීමක් වන අතර, එමඟින් සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ඵලදායී වියදම් කළමනාකරණයක් සහ පුනරාවර්තන වියදම් පාලනය කිරීමක් පෙන්නුම් කරයි. එලෙසම, ප්‍රාග්ධන ගෙවීම් සඳහා වූ මුදල් පිටතට ගලා යාම රු. බිලියන 774.0 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට සාපේක්ෂව රු. බිලියන 497.7 ක් වූ අතර, එමඟින් රු. බිලියන 276.3 ක ඉතිරියක් පෙන්නුම් කරයි. මෙම ප්‍රතිඵලයට සංවර්ධන ව්‍යාපෘති අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ආයෝජන වියදම් ප්‍රමුඛතාගත කිරීම හේතු විය හැක.

ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා වැඩි මුදල් ගලා ඒම සහ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩු වියදම් හේතුවෙන්, ශුද්ධ මුදල් හිඟය මුලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු විය. රු. බිලියන 1,769.2 ක හිඟයක් ප්‍රක්ෂේපණය කර තිබූ නමුත්, සැබෑ හිඟය රු. බිලියන 51.9 ක් පමණි. මෙය ඇස්තමේන්තුගත තත්ත්වයට වඩා රු. බිලියන 1,717.3 ක දියුණුවක් නිරූපණය කරන අතර, සමස්ත භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා ඉහළ නැංවූ ආදායම් කාර්යසාධනය සහ වියදම් පාලන පියවරයන්හි ධනාත්මක බලපෑම මින් ඉස්මතු වේ.

තම බැඳීම් සඳහා අරමුදල් සැපයීමට, රජය එම කාලසීමාව තුළ රු. බිලියන 2,217.9 ක දළ ණය ගැනීම් සිදු කර ඇති අතර, එය රු. බිලියන 2,214.1 ක් වූ ඇස්තමේන්තුගත ණය අවශ්‍යතාවයට වඩා සුළු වශයෙන් වැඩි අගයකි. මේ අතර, ණය පියවීම්

රු. බිලියන 2,225.1 ක ඇස්තමේන්තුගත ණය පියවීමේ අවශ්‍යතාවයට සාපේක්ෂව රු. බිලියන 2,206.3 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඇස්තමේන්තුගත සෘණ ශුද්ධ ණය ගැනීමේ තත්ත්වය වූ රු. බිලියන 11.0 කට එරෙහිව, ශුද්ධ ණය ගැනීම් රු. බිලියන 11.6 ක ධන ශේෂයක් වාර්තා කළේය. මෙයින් එම කාලසීමාව තුළ භාණ්ඩාගාර මූල්‍යකරණයේ ව්‍යුහාත්මක ගතිකත්වය පිළිබිඹු වේ.

2.13 වගුව | රජයේ භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්වය

රු. බිලියන

අයිතමය	2025	ජන. - අගෝ. 2026	
	තක්‍ෂ	ඇස්තමේන්තු	තක්‍ෂ
ආරම්භක මුදල් ශේෂය	**805.1**	**915.8**	**915.8**
ආදායම් හා වෙනත් ලැබීම් මගින් සමස්ථ මුදල් ගලා ඒම	3,187.4	3,347.5	3,886.8
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා සමස්ථ මුදල් ගලා යෑම්	-3,292.4	-4,342.8	-3,441.0
ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලා යෑම්	-327.7	-774.0	-497.7
ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය)	-432.7	-1,769.2	-51.9
දළ ණය ගැනීම්	2,295.6	2,214.1	2,217.9
ණය ආපසු ගෙවීම්	-1,457.6	-2,225.1	-2,206.3
ශුද්ධ ණය ගැනීම්	838.0	-11.0	11.6
ගැලපීම් ගිණුමේ ශේෂය (TEB, ශුද්ධ තැන්පතු, වෙනත් පැවරුම් යනාදිය)	-4.7	-	60.5
අවසාන මුදල් ශේෂය	**1,205.8**	**-864.3**	**936.0**

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

2.14 වගුව | රජයේ සුරැකුම්පත් මත ගෙවන ඵලදා අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන්හි හැසිරීම : 2025-2026

කාලපරිච්ඡේදය		භාණ්ඩාගාර බිල්පත් (%)			භාණ්ඩාගාර බැඳුම්කර (%)				සාමාන්‍ය විනිමය අනුපාතය රු/ඇ.ඩො
		දින 91	දින 182	දින 364	වසර 2	වසර 3	වසර 4	වසර 5	
2025	ජනවාරි	7.93	8.09	8.47	-	-	10.42	10.73	296.18
	පෙබරවාරි	7.57	7.87	8.35	-	-	10.63		296.80
	මාර්තු	7.50	7.84	8.25	-	-		10.72	295.91
	අප්‍රේල්	7.65	7.97	8.30	-	-	10.30	10.64	298.53
	මැයි	7.55	7.77	7.98	-	8.85	9.47		299.41
	ජූනි	7.55	7.75	7.94	-	-	9.41		299.90
	ජූලි	7.62	7.91	8.03	-	-	9.46	9.77	301.12
	අගෝස්තු	7.58	7.89	8.03	-	-			301.49
	සැප්තැම්බර්	7.57	7.89	8.02	-	-		9.76	302.20
	ඔක්තෝබර්	7.52	7.90	8.04	-	-		9.80	303.13
	නොවැම්බර්	7.52	7.91	8.03	-	-	9.53	9.56	306.35
	දෙසැම්බර්	7.74	8.27	8.45	-	-	9.55	9.80	309.20
2026	ජනවාරි	7.84	8.26	8.36	-	-	9.72		309.65
	පෙබරවාරි	7.63	7.92	8.24	-	-	9.50		309.36
	මාර්තු	7.80	8.09	8.41	-	-	9.63		311.91
	අප්‍රේල්	8.20	8.25	8.52	-	-	10.12		316.45
	මැයි	9.36	9.68	9.83	-	-	11.86		324.91
	ජූනි	10.14	10.21	10.17	-	-	11.44		334.43
	ජූලි	9.86	10.21	10.20	-	-	11.57	11.90	336.02
	අගෝස්තු	9.06	9.44	9.89	-	-	10.54	-	332.91

මූලාශ්‍ර : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සහ ශ්‍රී ලංකා මහ බැංකුව

එහි ප්‍රතිඵලයක් වශයෙන්, කාලච්ඡේදය අවසානයේ අවසාන මුදල් ශේෂය රු. බිලියන 936.0 ක් ලෙස පැවති අතර, එය රු. බිලියන 864.3 ක ඇස්තමේන්තුගත ඍණ ශේෂය සැලකිය යුතු ලෙස අභිබවා යාමකි. සැලකිය යුතු ධන මුදල් ශේෂයක් පවත්වා ගැනීමෙන් රජයේ මුදල් කළමනාකරණ උපාය මාර්ගවල ඵලදායීතාවය පෙන්නුම් කරන අතර, අනාගත වියදම් අවශ්‍යතා සහ ණය සේවාකරණ බැඳීම් ඉටු කිරීම සඳහා වැදගත් ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් සපයයි.

සමස්තයක් වශයෙන් ගත් කල, 2026 වසරේ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ කාර්යසාධනය මඟින් ශක්තිමත් ආදායම් වර්ධනය, පාලනය කළ වියදම් මට්ටම් සහ විවක්ෂණශීලී ණය කළමනාකරණ පිළිවෙත්වල සහාය ඇතිව මූල්‍ය මෙහෙයුම්වල කැපී පෙනෙන ශක්තිමත් වීමක් පිළිබිඹු කරයි. මෙම කාලසීමාව තුළ අත්පත් කර ගත් ඉහළ මුදල් තත්ත්වය රජයේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන අතර ප්‍රමුඛතා ආර්ථික හා සමාජීය වැඩසටහන්වලට සහාය වෙමින් මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමට ඇති හැකියාව ශක්තිමත් කරයි.

2.5 රාජ්‍ය ණය කළමනාකරණය

2026 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු දළ ණය ගැනීමේ සීමාව රු. බිලියන 3,740 ක් වූ අතර, එයින් රු. බිලියන 2,536 ක් 2026 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා කාලය සඳහා වෙන් කරන ලදී. මෙම කාල සීමාව තුළ ණය ගැනීම් දේශීය හා විදේශීය වෙළඳපොළවල්වලින් ලබා ගන්නා ලද අතර, ඒවා පිළිවෙළින් රු. බිලියන 1,859.8 ක් සහ රු. බිලියන 304.1 ක් වේ. ණය සේවාකරණ වගකීම් ඉටු කිරීම සහ විවිධ සංවර්ධන මුලපිරීම් සඳහා අරමුදල් සැපයීම මෙම ණය ගැනීම්වල මූලික අරමුණු වේ.

වාර්තාකරණ දිනය වන විට, 2026 වසරේ පළමු මාස අට තුළ ලබාගත් සමස්ත ණය ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 85.9ක් දේශීය වෙළෙඳපොළෙන් සපයාගෙන තිබුණි. මෙම කාලසීමාව සඳහා අනුමත කරන ලද ණය ගැනීමේ සීමාවෙන් රු. බිලියන 1,403.9ක මුදලක් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් ලබාගෙන ඇත. භාණ්ඩාගාර බැඳුම්කර, දේශීය ණය සේවාකරණ කටයුතු සඳහා පමණක් භාවිත කර ඇත.

භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම සම්බන්ධ දත්ත අනුව, ආසන්න වශයෙන් රු. බිලියන 760ක ශුද්ධ ඍණ නිකුත් කිරීමක් වාර්තා වී ඇත. එනම්, නව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ ප්‍රමාණයට වඩා කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත් සඳහා ගෙවීම් කිරීමේ ප්‍රමාණය ඉහළ මට්ටමක පැවති බවයි. මෙමඟින් පෙන්නුම් කරන්නේ අදාළ කාලසීමාව තුළ භාණ්ඩාගාර බිල්පත්වල නොපියවූ ශේෂය අඩු කිරීම සඳහා වෙනත් අරමුදල් මූලාශ්‍ර භාවිත කර ඇති බවයි. දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් ප්‍රමාණය රු. බිලියන 3,568.8ක් වූ අතර, 2026 අගෝස්තු මස අවසානය වන විට භාණ්ඩාගාර බිල්පත්වල නොපියවූ ශේෂය රු. බිලියන 2,378.6ක් විය.

2026 වසරේ අගෝස්තු 31 දින වන විට මධ්‍යම රජයේ නොපියවූ දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 19,419.2ක් විය. එම දේශීය ණය ශේෂයෙන් සියයට 83.8ක් (රු. බිලියන 16,278.4ක්) භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත වූ අතර, සියයට 12.2ක් (රු. බිලියන 2,378.6ක්) භාණ්ඩාගාර බිල්පත්වලින් ද, සියයට 3.7ක් (රු. බිලියන 716.4ක්) කාලීන ණයවලින් ද සමන්විත විය.

2.15 වගුව | දේශීය ණය නිකුත් කිරීම් : 2026 ජනවාරි - අගෝස්තු

රු. බිලියන

මූලාශ්‍ර	ජන. - අගෝ. 2026
භාණ්ඩාගාර බැඳුම්කර (දළ)	1,859.8
භාණ්ඩාගාර බිල්පත් (දළ)	3,568.8
එකතුව	**5,428.6**

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

2.6 විදේශ මූල්‍යයනය

සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මේ වන විට බොහෝ දුරට අවසන් වී ඇති අතර, එය ණය තිරසාරභාවය යළි ස්ථාපිත කිරීම සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඇති කිරීම සඳහා වූ වැදගත් පියවරකි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සිව් අවුරුදු වැඩසටහන් කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ණය සේවාකරණ ගෙවීම් වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 9.5ක පමණ සහනයක් හිමිවනු ඇත. එසේම, ශ්‍රී ලංකාවේ බැඳුම්කරවල කූපන් පොලී අනුපාතිකය සියයට 31කින් අඩු කර සියයට 4.4ක් දක්වා පහත හෙළීමටත්, ණයවල සාමාන්‍ය කල්පිරීමේ කාලය වසර පහකට වැඩි කාලයකින් දීර්ඝ කිරීමටත් හැකි වී ඇත.

විදේශ මූල්‍යයන එකඟතා

ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම පිණිස රජය ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (IDA) සමඟ ඇ.ඩො. මිලියන 50 ක ණය ගිවිසුමකට එළඹුණි. මෙම ගිවිසුම 2026 වසරේ මැයි මස 13 වන දින අත්සන් කරන ලද අතර, වසර 5 ක සහන කාලයක් ඇතුළත්ව ණය කල්පිරීමේ කාලය වසර 25 ක් වන අතර පොලී අනුපාතය සියයට 1.5 කි.

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදුවූ විනාශයට පිළියම් යෙදීම සඳහා වන ඉන්දීය ණය පහසුකම – පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ පැකේජය යටතේ ඇ.ඩො. මිලියන 350 ක සමස්ත මූල්‍ය පහසුකමක් ලබා ගැනීම සඳහා රජය 2026 අගෝස්තු 04 දින

ඉන්දියානු අපනයන-ආනයන බැංකුව (EXIM Bank) සමඟ ගිවිසුමකට එළඹ ඇත. මෙම පහසුකම ඇ.ඩො. මිලියන 250 ක සහ මිලියන 100 ක ණය කොටස් දෙකකින් සමන්විත වන අතර, ඒ සඳහා අදාළ වන පාවෙන පොලී අනුපාතික පිළිවෙළින් වසරක MCLR අනුපාතිකයට වඩා ප්‍රතිශත ලකුණු 1.5 කින් සහ 0.3 කින් අඩු වේ. මෙම ණය පහසුකම් දෙකෙහිම සමස්ත කාලසීමාව වසර 20 ක් වන අතර, ඊට වසර 5 ක සහන කාලයක් ද ඇතුළත් වේ.

විදේශ මූල්‍යනය, ප්‍රතිලබ්ධි සහ උපයෝජනය

2026 ජනවාරි 1 සිට අගෝස්තු 31 දක්වා කාලය තුළ, මුළු විදේශ ණය ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,069.1 ක් විය.

එම ප්‍රතිලබ්ධි වලින් විශාලතම කොටස වාර්තා වූයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම (IMF-EFF) යටතේ වන අතර, එය මුළු එකතුවෙන් සියයට 77.5 කි. ඉන්පසු ලෝක බැංකුව (සියයට 10) සහ ආසියා සංවර්ධන බැංකුව (සියයට 7) සමඟ ඇති කරගත් ණය ගිවිසුම් යටතේ ප්‍රතිලබ්ධිවීම් සිදු විය. ප්‍රධාන ද්විපාර්ශ්වික ණය හිමියන් සමඟ ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු, ප්‍රතිලබ්ධිවීම් නැවත ආරම්භ වූ අතර, මෙම කාල සීමාව තුළ ද්විපාර්ශ්වික ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.ඩො. මිලියන 30.1 ක් විය.

අරමුණ අනුව ප්‍රතිලබ්ධි වෙන්කිරීම් සැලකීමේ දී, සමස්ත ප්‍රතිලබ්ධීන් වලින් අයවැය මූල්‍යකරණ අංශය සියයට 82 ක් ලෙස වැඩිම ප්‍රතිශතයක් හිමි කරගෙන ඇති අතර, ඉන් පසුව, මාර්ග හා පාලම් සංවර්ධනය (සියයට 6ක්) සහ ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශය (සියයට 2.5 ක්) ලෙස පවතී.

2.16 වගුව | විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි ප්‍රමාණය: 2026 ජනවාරි-අගෝස්තු

ඇ.ඩො. මිලියන

සංවර්ධන පාර්ශ්වකරු/ ණය නියෝජිත ආයතනය	ප්‍රතිලබ්ධි ප්‍රමාණය *
	ණය
ද්විපාර්ශ්වික	**30.1**
ජපානය	15.1
සෞදි අරමුදල	9.7
ඉන්දියා අපනයන ආනයන බැංකුව	5.3
බහුපාර්ශ්වික	**1,039.0**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	828.2
ලෝක බැංකුව	103.1
ආසියානු සංවර්ධන බැංකුව	75.9
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	23.5
ඔපෙක් අරමුදල	4.8
කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල	3.5
එකතුව	**1,069.1**


මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයන් ඇමරිකානු ඩොලර් බවට පරිවර්තනය කිරීම සඳහා, එක් එක් ප්‍රතිලබ්ධීන් දිනයේ පැවති විනිමය අනුපාත භාවිතා කර ඇත.

විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇමරිකානු ඩොලර් බවට පරිවර්තනය කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතයන් භාවිතා කර ඇත.


**තාවකාලික*

2.4 රූපසටහන | සංවර්ධන පාර්ශවකරුවන් අනුව ප්‍රතිලබ්ධි 2026 ජනවාරි - අගෝස්තු



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

2.5 රූපසටහන | අරමුණු අනුව ප්‍රතිලබ්ධි 2026 ජනවාරි - අගෝස්තු



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය
වෙනත් = අධ්‍යාපනය සහ පුහුණුව, සෞඛ්‍ය සහ සමාජ සුභසාධනය, ඉඩම් සංවර්ධනය, බලශක්තිය, ග්‍රාමීය සංවර්ධනය, මාධ්‍ය, මූල්‍ය සහ රක්ෂණ, සංචාරක සහ හෝටල් කර්මාන්තය, විද්‍යාව සහ තාක්ෂණය, වෙළඳාම

විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2026 අගෝස්තු මස අවසානය වන විට රජයේ සමස්ත විදේශීය ණය ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 37.7ක් විය.[1] සමස්ත රජයේ විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 39ක් බහුපාර්ශ්වික ණයවලින් සමන්විත වූ අතර, වාණිජ ණය සියයට 33ක් ද, ද්විපාර්ශ්වික ණය සියයට 28ක් ද වශයෙන් පැවතුණි. වාණිජ ණයවලින් ආසන්න වශයෙන් සියයට 81ක් ජාත්‍යන්තර ස්ථෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම්වල නොපියවූ ශේෂයෙන් සමන්විත වූ අතර, ඉතිරි කොටස විදේශ මුදලින් ලබාගත් කාලීන මූල්‍ය පහසුකම් (සමූහ ණය – Syndicated Loans) වලින් සමන්විත විය.

බහුපාර්ශ්වික ණය හිමියන් අතරින්, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ලෝක බැංකුව (WB) එක්ව සමස්ත බහුපාර්ශ්වික ණය ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් සියයට 78ක් නියෝජනය කළේය. ද්විපාර්ශ්වික ණය සම්බන්ධයෙන් ගත් කල, එම ණය ප්‍රමාණයෙන් සියයට 59ක් පැරිස් සමාජයට (Paris Club) අයත් නොවන ණය හිමියන් සතු වූ අතර, ඉතිරි සියයට 41 පැරිස් සමාජයේ සාමාජික රටවලින් ලබාගත් ණයවලින් සමන්විත විය. 2026 ජනවාරි 01 දින සිට අගෝස්තු 31 දින දක්වා කාලසීමාව තුළ සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය ඇමරිකානු ඩොලර් මිලියන 1,708.8ක් විය[2]. ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 1,039.1ක් ණය මුදල් ආපසු ගෙවීම සඳහා ද, ඉතිරි ඇමරිකානු ඩොලර් මිලියන 669.7ක මුදල පොලී ගෙවීම් සඳහා ද වැය කර ඇත.

2026 අගෝස්තු මස අවසානය වන විට කිසිදු විදේශීය ගෙවීම් හිඟයක් වාර්තා වී නොතිබුණි. ගිවිසුම්වල සඳහන් නියමිත ගෙවීම් දිනයන්ට අනුව, අදාළ සහන කාලසීමාවන්ට යටත්ව, විදේශීය පදිංචිකරුවන්ට ගෙවිය යුතු නමුත් නියමිත පරිදි ගෙවා නොමැති ණය සේවාකරණ බැඳීම් (ණය මුල් මුදල් සහ පොලී) විදේශීය ගෙවීම් හිඟයන් ලෙස සැලකේ. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ අරමුදල් පහසුකම (IMF-EFF) වැඩසටහනේ ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ අරමුණින්, ආරවුලට ලක්ව ඇති කල් ඉකුත් වූ ණය සහ ණය සේවාකරණ බැඳීම් විදේශීය ගෙවීම් හිඟයන් ලෙස සලකනු නොලැබේ. එසේම, ණය ප්‍රතිලේඛනගත කිරීමේ හෝ ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුමකට එළඹීමේ අපේක්ෂාවෙන් ණය සේවාකරණ ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ඇතිවන හිඟ මුදල් ද මෙම අර්ථ දැක්වීමට ඇතුළත් නොවේ. ප්‍රතිව්‍යුහගත කරන ලද සහ ප්‍රතිව්‍යුහගත නොකරන ලද ණය ගිවිසුම් දෙවර්ගය යටතේම පවතින ගෙවීම් අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය විධිවිධාන සලසමින් පවතී.

---

[1] ඉදිරිපත් කර ඇති සංඛ්‍යා දත්ත තාවකාලික වන අතර, මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය පමණක් නිරූපණය කරයි.

ණය ගෙවීම් අත්හිටුවීමේ ප්‍රතිපත්තිය (Debt Standstill Policy) ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ දිනයේ සිට සමුච්චිත වූ නොගෙවූ ණය මුල් මුදල් ද මෙයට ඇතුළත් වේ.

අනේවාසිකයන් සතු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මෙයට ඇතුළත් කර නොමැත.

ජාත්‍යන්තර ස්ථෛරීත්ව බැඳුම්කරවල (ISBs) නොපියවූ ශේෂය, ඒවායේ හිමිකාරිත්වය අනුව එක්මන් නේවාසික/අනේවාසික වර්ගීකරණය මත පදනම්ව වෙන් කර නොමැත.

[2] ණය සේවාකරණය = ණය මුල් මුදල් ආපසු ගෙවීම් + පොලී ගෙවීම්.

03 ආර්ථික උපනතීන්

3.1 සමාලෝචනය


අඛණ්ඩව බලපෑ කම්පන මධ්‍යයේ වුව ද, 2026 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවරව පැවතුණි: 'දිට්වා' සුළි කුණාටුව සහ මෑද පෙරදිග ගැටුම් හේතුවෙන් බලශක්ති මිල ගණන් ඉහළ ගිය ද, වසරේ පළමු භාගය තුළ සියයට 4.7 ක ආර්ථික වර්ධනයක් වාර්තා වූ අතර, නොකඩවා කාර්තු දොළහක් මුළුල්ලේ ධනාත්මක වර්ධනයක් පවත්වා ගැනීමට හැකි විය. මෙය 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසුව අත්කර ගත් වැඩිදියුණු වූ කාර්යසාධනයකි. ආර්ථිකය, 2022 වසරේ සියයට 7.3 ක සංකෝචනයකින් පසු 2025 වසරේ දී සියයට 5.0 ක වර්ධනයක් කරා ළඟා වූ අතර, වසර අවසානයේ උද්ධමනය සියයට 57.2 සිට සියයට 2.1 දක්වා පහත වැටුණි. එම කාලසීමාව තුළම, ද.දේ.නි.යෙන් සියයට 8.2 ක් වූ පැවති රාජ්‍ය ආදායම සියයට 16.6 ක් දක්වා දෙගුණ වූ අතර, ද.දේ.නි.යෙන් සියයට 3.7 ක හිඟයක්ව පැවති ප්‍රාථමික ශේෂය සියයට 5.4 ක අතිරික්තයක් දක්වා වර්ධනය විය. තවද, මධ්‍යම රජයේ ණය බර ද.දේ.නි.යෙන් සියයට 114.2 සිට සියයට 91.6 ක් දක්වා අඩු විය. 2022 වසර අවසානයේ දී ඇ.ඩො. බිලියන 1.9 ක් වූ පැවති දළ නිල සංචිත ප්‍රමාණය, 2026 සැප්තැම්බර් මස අවසාන වන විට මාස තුනකට වැඩි ආනයන වියදම් පියවීමට ප්‍රමාණවත් මට්ටමකට එනම් ඇ.ඩො. බිලියන 6.9 ක් දක්වා වර්ධනය වී ඇති අතර, වසරේ පළමු මාස අට තුළ ප්‍රාථමික අතිරික්තයක් සහ සමස්ත අයවැය අතිරික්තයක් පවත්වා ගනිමින් 2026 වසරේදී ද මෙම ජයග්‍රහණ තවදුරටත් පවත්වා ගැනීමට හැකි වී ඇත. මෙම ආර්ථික යථා තත්ත්වයට පත්වීම සැලකිල්ලට ගනිමින් ලෝක බැංකුව විසින් 2026 වසරේ ජූලි මස 01 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාව 'ඉහළ මැදි ආදායම් ලබන රටක්' ලෙස නැවත වර්ගීකරණය කරන ලදී.

2026 වසරේ පළමු භාගය තුළ කෘෂිකර්මාන්තය හැර ආර්ථිකයේ අනෙකුත් සියළුම අංශ වර්ධනය වී ඇතත්, පළමු කාර්තුවේ දී සියයට 5.1 ක් වූ වර්ධනය, දෙවන කාර්තුවේ දී සියයට 4.2 දක්වා මදක් අඩු වී ඇත. ඉදිකිරීම්, පතල් හා කැණීම් මෙන්ම ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන යන අංශවල දායකත්වය හේතුවෙන් කර්මාන්ත අංශය සියයට 7.2 කින් වර්ධනය වූ අතර, මූල්‍ය සේවා, ප්‍රවාහන සහ තොරතුරු තාක්ෂණ සේවාවන්හි දායකත්වය හේතුවෙන් සේවා අංශය සියයට 3.1 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් කරදිය ධීවර කර්මාන්තයෙන් සහ වී වගාවෙන් ලැබුණු නිෂ්පාදන පහත වැටීම හේතුවෙන් කෘෂිකාර්මික අංශය සියයට 0.6 කින් සංකෝචනය විය. පෞද්ගලික අංශයේ ණය වර්ධනය වේගවත් වීම සහ පාරිභෝගික හා ආයෝජන භාණ්ඩ ආනයනය ඉහළ යාම මඟින් දේශීය ඉල්ලුම ශක්තිමත්ව පවතින බව පිළිබිඹු වන අතර, ඉදිරි ගමන් මග පෙන්නුම් කරන දර්ශකයන්ගේ වර්ධන ප්‍රවණතා මඟින් ආර්ථිකයේ වේගවත් බව තහවුරු වේ.

2026 වසරේ පළමු කාර්තුවේ දී සියයට 3.7 ක් වූ පැවති සේවා වියුක්ති අනුපාතය දෙවන කාර්තුවේ දී සියයට 4.0 දක්වා වැඩි වූ අතර, ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පිළිවෙළින් සියයට 49.2 සිට සියයට 50.0 දක්වා වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යාමේ බලපෑම දේශීය වෙළඳපොළ වෙත අවතීර්ණ වීමත් සමඟ දේශීය බලශක්ති සහ ආහාර මිල ගණන් වැඩි වීම හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික

3.1 රූප සටහන | ආර්ථික අර්බුදයේ සිට ප්‍රකෘති තත්ත්වය දක්වා - ප්‍රධාන දර්ශක: 2022 සහ 2025



මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 වසරේ ජනවාරි මාසයේ දී වූ සියයට 2.3 ක සිට 2026 වසරේ ඔක්තෝබර් මාසය වන විට සියයට 8.3 දක්වා වැඩි විය. බලශක්ති මිල ඉහළ යාමේ ද්විතීයික බලපෑම සහ ඉල්ලුම් තත්ත්වයන් වර්ධනය වීම පිළිබිඹු කරමින් මූලික උද්ධමනය ද සියයට 5.6 ක් දක්වා වැඩි විය. මතුපිට උද්ධමනය, සියයට 5 ක ඉලක්කය වෙත ක්‍රමයෙන් ලඟා වීමට පෙර 2027 වසරේ පළමු කාර්තුවේ දී එම ඉලක්කයට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින් මධ්‍ය කාලීන උද්ධමන අපේක්ෂාවන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කෙරේ.


ඉහළ යන උද්ධමන අපේක්ෂාවන්, බලශක්ති මිල ගණන් ගැලපීම් හේතුවෙන් ඇති විය හැකි ද්විතීයික බලපෑම්, පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය අඛණ්ඩව වර්ධනය වීම හේතුවෙන් වැඩි වන ආනයන ඉල්ලුම සහ විදේශ අංශයට එල්ල වන පීඩනය සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2026 වසරේ මැයි මාසයේ දී එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 8.75 ක් දක්වා පදනම් අංක 100 කින් වැඩි කළ අතර එතැන් සිට එම මට්ටමේම පවත්වා ගෙන ගොස් ඇත.

මැදපෙරදිග ගැටුම් උත්සන්න වීම හේතුවෙන් ගෝලීය ඉන්ධන මිල ගණන් ඉහළ යාම සහ වාහන ආනයනය ඉහළ යාම නිසා රටේ ආනයන වියදම වැඩි වීමෙන් විදේශ අංශය පීඩනයට ලක් විය. 2026 වසරේ පළමු මාස නවය තුළ, ආනයන ඇ.ඩො. බිලියන 18.7 ක් දක්වා සියයට 21.3 කින් වර්ධනය වීම හා අපනයන ඇ.ඩො. බිලියන 10.8 ක් දක්වා සියයට 5.3 කින් වර්ධනය වීම හේතුවෙන් වෙළඳ හිඟය 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වූ ඇ.ඩො. බිලියන 5.2 සිට ඇ.ඩො. බිලියන 7.9 දක්වා පුළුල් විය. 'දිට්වා' සුළි කුණාටුවෙන් පසු සහන සැලසීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලැබුණු අරමුදල් යම්තාක් දුරට බලපෑම හේතුවෙන් 2026 වසරේ පළමු මාස නවය තුළ, ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො. බිලියන 6.9 දක්වා සියයට 18.1 කින් වර්ධනය වූ අතර, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක ආදායම් ඇස්තමේන්තු කිරීම සඳහා අනුගමනය කරන ලද සංශෝධිත ක්‍රමවේදය මෙන්ම දිගු කාලයක් රැඳී සිටින යුරෝපීය වෙළෙඳපොළවලින් පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාව අඩුවීම යම්තාක් දුරට බලපෑම හේතුවෙන් සංචාරක ඉපැයීම් ඇ.ඩො. බිලියන 2.2 දක්වා සියයට 9.2 කින් අඩු විය. ඒ හා සමගාමීව 2025 වසරේ පළමු මාස නවය තුළ ජංගම ගිණුමේ පැවති ඇ.ඩො. මිලියන 1,853.2 ක අතිරික්තයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 420.4 ක හිඟයක් වාර්තා විය. වසර ආරම්භයේ සිට 2026 වසරේ ඔක්තෝබර් මස අවසාන වන විට ශ්‍රී ලංකාවේ රුපියල, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 6.8 කින් අවප්‍රමාණය විය.

පළමු මාස නවය තුළ රු. බිලියන 56.8 ක ශුද්ධ විදේශීය විකිණීම් මධ්‍යයේ කොටස් වෙළෙඳපොළ වෙනස්වන ස්වභාවයක් පිළිබිඹු කරමින් 2026 වසරේ සැප්තැම්බර් මස අවසාන වන විට සමස්ත කොටස් මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව සියයට 4.4 කින් පහත වැටී ඒකක 20,813 ක් ලෙස සටහන් වූ අතර, එය 2025 වසර අවසානයේ පැවති මට්ටමට වඩා සියයට 8.0 කින් පහත වැටීමකි.


ශ්‍රී ලංකාවේ වැඩිදියුණු වූ සාර්ව ආර්ථික මූලධර්ම ජාත්‍යන්තර පිළිගැනීමට ලක් විය. ෆිච් ශ්‍රේණිගත කිරීම් මඟින් ස්ථාවර ඉදිරි දැක්මක් සහිතව 2026 වසරේ සැප්තැම්බර් මස 22 වන දින ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත්කරන්නන්ගේ පැහැරහැරීම් ශ්‍රේණිගත කිරීම 'CCC+' මට්ටමේ සිට 'B-' මට්ටම දක්වා ඉහළ නංවන ලදී. 2026 වසරේ ඔක්තෝබර් මස 04 වන දින ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ හත්වන සමාලෝචනය පිළිබඳ කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹුණු අතර, 2026 වසරේ IV වගන්තිය යටතේ වන උපදේශනයේ අවසානයත් සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතියට යටත්ව ඇ.ඩො. මිලියන 345 ක් පමණ ලබා ගැනීමේ ප්‍රවේශය සැලසෙනු ඇත.

3.2 රූපසටහන | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3.3 රූපසටහන | දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2026 පළමු භාගය (අ)



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(අ) ස්ථාවර මිල ගණන් අනුව

3.2 ආර්ථික වර්ධනය

ශ්‍රී ලංකා ආර්ථිකය, 2025 වසරේ පළමු භාගයේ දී වූ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී සියයට 4.7 ක වර්ධනයක් ළඟා කරගන්නා ලදී. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ කර්මාන්ත අංශය 2025 වසරේ පළමු භාගය තුළ දී ළඟා කරගත් සියයට 7.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 7.2 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර එය සමස්ත ආර්ථික වර්ධනයෙන් සියයට 43.4 කි. සේවා අංශය 2025 වසරේ පළමු භාගයේ දී වූ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.1 ක වර්ධනයක් ළඟා කරගන්නා ලදී. සහනාධාර අඩු කළ පසු නිමැවුම් මත බදු 2025 වසරේ පළමු භාගයේ දී වූ සියයට 10.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 13.5 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, කෘෂිකර්මාන්ත අංශය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 0.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.6 කින් සංකෝචනය විය. ඒ අනුව, සමස්ත වර්ධනය සඳහා සේවා අංශය සියයට 38.2 කින් සහ සහනාධාර අඩු කළ පසු නිමැවුම් මත බදු සියයට 19.5 කින් දායක වූ අතර කෘෂිකර්මාන්ත අංශය සියයට 1.0 ක සෘණ දායකත්වයක් දී ඇත.

කෘෂිකර්මාන්තය

පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද. දේ. නි.යෙන් සියයට 7.8 කට දායකත්වය දක්වන කෘෂිකර්මාන්ත අංශය, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 0.6 ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී සියයට 0.6 කින් සංකෝචනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව (සියයට 19.1), වී වගාව (සියයට 11.2), සහ මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව (සියයට 50.8) හි සිදු වූ සංකෝචනයන් මෙන්ම, රබර් වගාව (සියයට 8.5), තේ වගාව (සියයට 2.6) සහ සත්ව නිෂ්පාදනය (සියයට 1.3) යන ක්ෂේත්‍රවල සිදු වූ පසුබෑමයි. කෙසේ වෙතත්, තෙල් සහිත පළතුරු (පොල්, තැඹිලි සහ කටු පොල්) වගා කිරීමේ උප අංශයන්හි සියයට 30.8 ක සැලකිය යුතු වර්ධනයක් අත්කර ගනිමින්, සමස්ත සංකෝචනයෙන් කොටසක් පියවා ගැනීමට දායක විය. වන වගාව දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන (සියයට 12.5), කුළුබඩු, සුවඳ විලවුන්, ඖෂධීය සහ ඖෂධීය භෝග වගාව (සියයට 3.9), එළවළු වගාව (සියයට 2.2) සහ පලතුරු වගාව (සියයට 2.1) යන උප අංශයන් ද වර්ධනය වී ඇත.

3.1 වගුව | ස්ථාවර (2015) මිල ගණන් අනුව ද. දේ . නි. යෙහි ආංශික සංයුතිය

රු. මිලියන

	අංශය	2022	2023 (අ)	2024 (අ)	2025(අ)	පළමු භාගය		වර්ධනය (%)	
						2025(අ)	2026(අ)	2025(අ)	2026(අ)
	කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**911,252**	**911,839**	**916,971**	**929,668**	**465,380**	**462,422**	**0.6**	**-0.6**
1	ධාන්‍ය (වී හැර)	16,507	15,971	16,635	16,676	8,313	8,356	5.0	0.5
2	වී වගාව	94,730	110,946	115,438	121,533	61,409	54,511	9.6	-11.2
3	එළවළු වගාව	103,161	97,959	97,173	90,317	45,663	46,652	-7.6	2.2
4	උක් වගාව දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික නොවන භෝග	3,803	3,742	3,697	3,850	1,928	1,717	2.6	-11.0
5	පළතුරු වගාව	73,310	73,995	75,472	76,927	39,458	40,284	3.8	2.1
6	තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල් තැඹිලි සහ කටු පොල් වගාව)	111,196	104,758	92,716	100,334	44,813	58,613	-12.5	30.8
7	තේ වගාව	62,867	61,912	63,080	63,966	32,831	31,961	7.0	-2.6
8	වෙනත් පානීය භෝග වගාවන් (කෝපි කොකෝවා ආදී)	1,229	1,141	1,169	1,051	526	523	-10.1	-0.5
9	කුළුබඩු , සුවඳ දෙන භෝග බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වර්ග	101,653	99,982	101,492	101,792	52,723	54,769	-0.4	3.9
10	රබර් වගාව	23,871	22,024	22,910	21,541	11,055	10,119	-9.1	-8.5
11	වෙනත් බහු වාර්ෂික භෝග වගාව	27,533	28,086	25,005	23,729	11,974	11,799	-4.7	-1.5
12	සත්ව නිෂ්පාදනයන්	83,307	83,645	97,155	107,309	53,407	52,417	15.8	-1.3
13	පැල බෝ කිරීම	965	728	596	763	324	333	15.0	2.6
14	කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	33,062	32,888	28,966	30,552	17,137	17,104	4.3	-0.2
15	වන වගාව දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	50,931	47,221	46,227	51,191	23,037	25,925	2.9	12.5
16	කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව	95,447	100,099	104,949	104,850	54,043	43,728	5.2	-19.1
17	මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව	27,682	26,739	24,290	13,288	6,740	3,314	-46.8	-50.8

3.1 වගුව | ස්ථාවර (2015) මිල ගණන් අනුව ද. දේ . නි. යෙහි ආංශික සංයුතිය (සම්බන්ධිතයි...)

රු. මිලියන


	අංශය	2022	2023 (අ)	2024 (අ)	2025(අ)	පළමු භාගය		වර්ධනය (%)	
						2025(අ)	2026(ඇ)	2025(අ)	2026(ඇ)
	කර්මාන්ත	**3,308,573**	**3,002,981**	**3,337,231**	**3,597,326**	**1,784,136**	**1,912,985**	**7.9**	**7.2**
18	පතල් හා කැණීම් කර්මාන්තය	198,613	154,313	184,430	215,568	101,799	120,668	14.3	18.5
19	ආහාර බීම සහ දුම් කොළ නිෂ්පාදනය	869,371	899,739	954,559	1,004,413	491,177	515,332	4.2	4.9
20	රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය	511,860	450,438	500,445	540,558	282,837	274,688	13.4	-2.9
21	ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	29,758	23,807	24,975	26,232	11,805	12,727	1.4	7.8
22	කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය	52,069	47,259	48,734	53,846	30,885	31,668	14.7	2.5
23	අඟුරු සහ බනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන	6,474	21,895	19,690	23,026	12,485	11,438	10.0	-8.4
24	රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	82,349	82,949	90,995	93,549	49,408	54,003	-1.7	9.3
25	රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	67,505	56,157	60,973	62,587	32,190	29,217	3.5	-9.2
26	ලෝහමය නොවන වෙනත් බනිජ නිෂ්පාදන	85,182	84,670	86,816	100,890	54,783	61,898	20.3	13.0
27	ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	58,780	60,303	70,963	82,144	34,167	39,078	9.9	14.4
28	යන්ත්‍රෝපකරණ නිෂ්පාදන	59,181	50,229	53,372	54,145	23,679	24,729	7.3	4.4
29	ගෘහ භාණ්ඩ නිෂ්පාදන	60,837	56,089	61,740	63,528	40,272	43,454	9.9	7.9
30	කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව සහ සවිකිරීම	79,088	66,747	72,427	68,239	39,205	37,416	-7.5	-4.6
31	විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම	178,059	174,017	184,480	201,472	99,754	106,867	7.0	7.1
32	ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම	14,059	11,590	11,900	12,584	6,824	7,306	2.3	7.1
33	මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිවක්‍රීකරණය	28,070	27,955	28,319	30,612	13,955	14,258	6.2	2.2
34	ඉදිකිරීම් කර්මාන්තය	927,319	734,823	882,411	963,935	458,911	528,238	9.0	15.1
	සේවාවන්	**7,217,485**	**7,256,690**	**7,431,130**	**7,676,443**	**3,706,256**	**3,819,622**	**3.3**	**3.1**
35	තොග හා සිල්ලර වෙළඳාම	1,675,528	1,677,941	1,697,914	1,722,223	865,521	878,458	1.4	1.5
36	මහින් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම	1,364,677	1,428,381	1,461,417	1,505,214	738,577	763,808	3.6	3.4
37	තැපැල් හා කුරියර් සේවාවන්	19,780	20,349	21,416	23,320	11,585	12,144	10.5	4.8
38	නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	166,030	209,106	276,975	311,444	147,677	154,387	14.2	4.5
39	ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු	37,350	36,551	37,760	38,502	19,629	19,969	1.6	1.7
40	විදුලි සංදේශ සේවාවන්	140,524	137,078	142,540	146,976	72,160	75,547	3.0	4.7
41	පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්	238,455	232,331	246,185	277,594	136,313	153,808	12.5	12.8
42	මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා	529,744	475,201	491,206	543,449	263,987	290,922	11.1	10.2
43	රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල්	78,187	103,519	88,934	101,901	47,456	54,394	4.5	14.6
44	නිවාස අයිතිය හා දේපල වෙළඳාම	554,456	521,463	543,273	562,911	285,695	295,459	3.8	3.4
45	වෘත්තියමය සේවාවන්	248,467	254,360	263,382	269,829	120,504	122,344	2.7	1.5
46	රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව	629,031	618,542	600,314	592,529	274,576	269,540	-2.5	-1.8
47	අධ්‍යාපනය	302,435	307,712	314,759	318,736	163,462	165,157	1.2	1.0
48	සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන්	237,677	236,087	234,361	241,337	102,979	104,221	2.7	1.2
49	වෙනත් පෞද්ගලික සේවාවන්	995,147	998,069	1,010,693	1,020,480	456,137	459,467	0.9	0.7
	සමස්ත එකතුකළ අගය (GVA) මූලික මිළ ගණන් අනුව	**11,437,311**	**11,171,510**	**11,685,332**	**12,203,438**	**5,955,772**	**6,195,030**	**4.4**	**4.0**
	(+) නිමැවුම් මත අයකරන බදු	**723,576**	**742,640**	**823,623**	**925,140**	**429,461**	**487,289**	**10.7**	**13.5**
	(-) සහනාධාර								
	දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළඳපොළ මිල අනුව	**12,160,886**	**11,914,150**	**12,508,954**	**13,128,577**	**6,385,234**	**6,682,319**	**4.8**	**4.7**

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(අ) සංශෝධිත

3.4 රූපසටහන | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2026 පළමු භාගය [අ]



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
[අ] ස්ථාවර මිල ගණන් අනුව

වී

වී වගාව යන උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වූ සියයට 9.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 11.2 කින් සංකෝචනය විය. කෙසේවෙතත්, කන්නය ආරම්භයේ දී ඇති වූ 'දීවිවා' සුළි කුණාටුවේ දැඩි බලපෑම නොසලකමින් හෙක්ටයාර 831,105 ක දළ වපුරන ලද බිම් ප්‍රමාණයන් මත පදනම්ව සහ භෝග හානි සැලකිල්ලට ගත් පසු, 2025/26 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.82 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය 2024/25 මහ කන්නයේ වී නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් මිලියන 2.75 ට සාපේක්ෂව සියයට 2.7 ක වර්ධනයකි. 2026 යල කන්නය සඳහා, 2026 වසරේ ජූනි මස අවසානය වන විට වූ හෙක්ටයාර 508,793 ක දළ වපුරන ලද බිම් ප්‍රමාණයන් මත පදනම්ව, වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.01 ක් ලෙස පුරෝකථනය ඇති අතර එය 2025 යල කන්නයේ වී නිෂ්පාදනය වූ මෙට්‍රික් ටොන් මිලියන 2.31 ට සාපේක්ෂව සියයට 12.9 ක පහළ යාමකි. මැදපෙරදිග ගැටුම් හේතුවෙන් යෙදවුම් පිරිවැය ඉහළ යාම නිසා ගොවීන්ට ඇති වූ පීඩනය ලිහිල් කිරීම සඳහා, රජය විසින් තාවකාලික සහන පැකේජයක කොටසක් ලෙස 2026 යල කන්නය සඳහා රුපියල් බිලියන 5.5 ක අතිරේක පොහොර සහනාධාරයක් ලබා දී ඇත.

සම්බා සහ කීරි සම්බා වර්ගවල හිහය පිළිබිඹු කරමින්, කීරි සම්බා සහල්වල සාමාන්‍ය සිල්ලර මිල 2026 වසරේ ජනවාරි මාසයේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 370.21 දක්වා පසුගිය වසරට සාපේක්ෂව සියයට 38.4 කින් ඉහළ ගිය අතර, 2026 අප්‍රේල් මාසයේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 375.11 දක්වා තවදුරටත් ඉහළ ගොස් ඇත. 2026 වසරේ මැයි මාසය වන විට දැඩි හිහයක් ඇති විය හැකි බවට අපේක්ෂා කළ බැවින්, පාරිභෝගික ඉල්ලුම සපුරාලීමට සහ මිල ස්ථාවර කිරීමට 2026 වසරේ අප්‍රේල් මාසයේ දී GR 11 සහල් සහ එවැනි ආදේශක වර්ග ආනයනය කිරීමට රජය අවසර ලබා දෙන ලදී. ඉන් පසුව, කීරි සම්බාවල සාමාන්‍ය සිල්ලර මිල අප්‍රේල් මාසයට වඩා සියයට 22.5 කින් අඩු වී 2026 වසරේ අගෝස්තු මාසයේ දී කිලෝග්‍රෑමයකට රුපියල් 290.69 දක්වා පහත වැටුණි.

තේ, රබර් සහ පොල්

තේ වගාව යන උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 7.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.6 කින් සංකෝචනය විය. තේ නිෂ්පාදනය 2025 වසරේ පළමු භාගයේ දී වූ කිලෝග්‍රෑම් මිලියන 135.8 ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 131.2 දක්වා සියයට 3.3 කින් පහත වැටුණි. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2026 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවල පැවති වියළි කාලගුණික තත්ත්වය සහ පොහොර යෙදීම අඩු වීමයි. රබර් වගාව යන උප අංශය 2025 වසරේ පළමු භාගය තුළ වූ සියයට 9.1 ක සංකෝචනයට සාපේක්ෂව සියයට 8.5 කින් සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් අහිතකර

කාලගුණික තත්ත්වයන් හේතුවෙන් වසරේ මුල් මාසවල පැවති වියළි කාලගුණය රබර් කිරි අස්වැන්න කෙරෙහි බලපෑම සහ 2026 වසරේ මැයි මාසයේ වැසි සහිත දින වැඩි වීම නිසා කිරි කැපීමේ කටයුතු අඩුවීම හේතුවෙන්, රබර් නිෂ්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ කිලෝග්‍රෑම් මිලියන 34.2 ට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගයේ දී කිලෝග්‍රෑම් මිලියන 32.6 ක් දක්වා සියයට 4.7 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සියයට 12.5 ක සංකෝචනයක් පෙන්නුම් කළ තෙල් සහිත පලතුරු (පොල්, තැඹිලි සහ කටු පොල්) උප ක්ෂේත්‍රය, 2026 වසරේ පළමු භාගයේ දී සියයට 30.8 ක සැලකිය යුතු වර්ධනයක් ළඟා කරගෙන ඇත. ඒ අනුව, 2025 වසරේ වූ සාපේක්ෂව අඩු නිෂ්පාදන ප්‍රමාණයෙන් යථා තත්ත්වයට පත්වීම පිළිඹිබු කරමින්, පොල් නිෂ්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ පොල් ගෙඩි මිලියන 1,343 ට සාපේක්ෂව පොල් ගෙඩි මිලියන 1,747 ක් දක්වා සියයට 30.1 ඉහළ යන ලදී.

ධාන්‍ය, එළවළු, පලතුරු, කුළුබඩු සහ ඖෂධීය භෝග

ධාන්‍ය වගාව (වී හැර) යන උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. එළවළු වගාව යන උප අංශය 2025 වසරේ පළමු භාගය තුළ වූ සියයට 7.6 ක සංකෝචනයට සාපේක්ෂව සියයට 2.2 කින් වර්ධනය වූ අතර පළතුරු වගාව යන උප අංශය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 3.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.1 කින් වර්ධනය විය. කුළුබඩු, සුවඳ ද්‍රව්‍ය, ඖෂධ සහ ඖෂධීය භෝග වගාව යන උප අංශය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 0.4 ක සංකෝචනයට සාපේක්ෂව සියයට 3.9 කින් වර්ධනය විය.

ධීවර සහ සත්ව පාලනය

කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව යන උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව සියයට 19.1 කින් සංකෝචනය විය. කරදිය මත්ස්‍ය නිෂ්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ කිලෝග්‍රෑම් මිලියන 158.8 ට සාපේක්ෂව කිලෝග්‍රෑම් මිලියන 128.6 ක් දක්වා සියයට 19.0 කින් පහත වැටුණි. මෙය මුහුදු මතුපිට උෂ්ණත්වය ඉහළ යාම සහ ඉන්ධන මිල ඉහළ යාම පිළිබිඹු කරයි. ජලාශවල මත්ස්‍ය ගහනය පහළ යාම යම්තාක් දුරට පිළිඹිබු කරමින්, මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව යන උප අංශය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 46.8 ක සංකෝචනයට සාපේක්ෂ 2026 වසරේ පළමු භාගයේ දී සියයට 50.8 කින් සැලකිය යුතු ලෙස සංකෝචනය විය. මේ අතර, 'දිවිවා' සුළි කුණාටුව හේතුවෙන් කුකුළන් සහ ගෘහස්ථ සතුන් අහිමි වීම යම්තාක් දුරට පිළිඹුබු කරමින්, සත්ව නිෂ්පාදන උප අංශය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 15.8 ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී සියයට 1.3 කින් සංකෝචනය විය.

කර්මාන්ත සහ නිෂ්පාදන

පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද. දේ. නි.යෙන් සියයට 26.6 ක ප්‍රතිශතයකට දායකත්වය දක්වන කර්මාන්ත අංශය, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ සියයට 7.9 ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී සියයට 7.2 කින් වර්ධනය විය. මීට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉදිකිරීම් (සියයට 15.1), පතල් සහ කැණීම් (සියයට 18.5), ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන (සියයට 4.9), අනෙකුත් ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන (සියයට 13.0), ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 14.4), රසායනික නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත ඖෂධ හා නිෂ්පාදන (සියයට 9.3) සහ විදුලිය, ගෑස්, වායු සහ වායුසමීකරණ සැපයුම (සියයට 7.1) යන උප අංශවල වර්ධනයයි.


ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 7.8), ගෘහ භාණ්ඩ නිෂ්පාදනය (සියයට 7.9), යන්ත්‍රෝපකරණ නිෂ්පාදන (සියයට 4.4), කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය (සියයට 2.5), ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම (සියයට 7.1) මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය (සියයට 2.2) යන අංශ ද 2026 වසරේ පළමු භාගයේ දී වර්ධනය විය.

කෙසේ වෙතත්, 2026 වසරේ පළමු භාගයේ දී සමහර උප අංශ සංකෝචනය විය. බාහිර ඉල්ලුම අඩුවීම මධ්‍යයේ රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම පහත වැටීම පිළිබිඹු කරමින් රෙදිපිළි, ඇඟලුම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදිත 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 13.4 ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.9 කින් සංකෝචනය විය. මැදපෙරදිග ගැටුම් හේතුවෙන් සැපයුම් බාධා ඇතිවීම මධ්‍යයේ පිරිපහදු කිරීම සඳහා ආනයනය කළ බොරතෙල් ප්‍රමාණය අඩුවීම පිළිබිඹු කරමින් අඟුරු සහ ඛණිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන සියයට 8.4 කින් සංකෝචනය විය. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සියයට 9.2 කින් සංකෝචනය වූ අතර, අනෙකුත් නිෂ්පාදන සහ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ අලුත්වැඩියා කිරීම සහ ස්ථාපනය කිරීම සියයට 4.6 කින් සංකෝචනය විය.

මුළු විදුලි උත්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ ගිගාවොට් පැය 8,688 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී ගිගාවොට් පැය 9,304 ක් දක්වා සියයට 7.1 කින් වර්ධනය විය. ජලය මගින් විදුලිය උත්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ ගිගාවොට් පැය


2,975 ට සාපේක්ෂව ගිගාවොට් පැය 2,294 ක් දක්වා සියයට 22.9 කින් පහත වැටුණු අතර සුළං බලයෙන් උත්පාදනය ගිගාවොට් පැය 139 ක් දක්වා සියයට 16.3 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, ඉන්ධන තෙල් මගින් උත්පාදනය ගිගාවොට් පැය 1,004 ක් දක්වා සියයට 62.3 කින් සැලකිය යුතු ලෙස වූ වර්ධනය අතර, ගල්අඟුරු මත පදනම් වූ උත්පාදනය ගිගාවොට් පැය 2,809 ක් දක්වා සියයට 4.7 කින් වර්ධනය විය. පෞද්ගලික අංශය මගින් විදුලිය උත්පාදනය 2025 වසරේ එම සමාන කාලපරිච්ඡේදයේ වූ ගිගාවොට් පැය 2,245 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී ගිගාවොට් පැය 3,058 ක් දක්වා සියයට 36.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් විදුලිය උත්පාදනය ගිගාවොට් පැය 2,158 ක් දක්වා සියයට 16.6 කින් වර්ධනය විය. කාර්මික ක්‍රියාකාරකම්වල ව්‍යාප්තියට අනුකූලව කර්මාන්ත සඳහා විදුලිය විකිණීම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ ගිගාවොට් පැය 2,316 ට සාපේක්ෂව ගිගාවොට් පැය 2,426 ක් දක්වා සියයට 4.7 කින් වර්ධනය විය.

3.5 රූපසටහන | කර්මාන්ත අංශයේ සංයුතිය - 2026 පළමු භාගය [අ]



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
[අ] ස්ථාවර මිල ගණන් අනුව

3.6 රූපසටහන | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2026 පළමු භාගය[අ]



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
[අ] ස්ථාවර මිල ගණන් අනුව

සේවා

පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. යෙන් සියයට 53.5 කට දායකත්වය සපයන සේවා අංශය, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී සියයට 3.1 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා (සියයට 10.2), රක්ෂණ, ප්‍රතිරක්ෂණ සහ විශ්‍රාම වැටුප් අරමුදල් (සියයට 14.6), මගීන් හා භාණ්ඩ ප්‍රවාහනය, ගබඩා පහසුකම් සැපයීම (සියයට 3.4) සහ පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් (සියයට 12.8) යන අංශවල සිදු වූ ව්‍යාප්තිය ප්‍රධාන වශයෙන් හේතු විය.

විදුලි සංදේශ (සියයට 4.7), තැපැල් සහ කුරියර් කටයුතු (සියයට 4.8), නවාතැන්, ආහාර සහ බීම සේවා කටයුතු (සියයට 4.5) සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් (සියයට 3.4) යන උප අංශ ද 2026 වසරේ පළමු භාගයේ දී වර්ධනය විය. තොග සහ සිල්ලර වෙළඳාම (සියයට 1.5), වෘත්තීමය සේවා (සියයට 1.5), ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු (සියයට 1.7), සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් (සියයට 1.2), අධ්‍යාපනය (සියයට 1.0) සහ වෙනත් පෞද්ගලික සේවා කටයුතු (සියයට 0.7) යන අංශ සුළු වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂාව; අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව යන උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී සියයට 1.8 කින් සංකෝචනය විය.

3.2 වගුව | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්

දර්ශකය	2021	2022	2023	2024	2025	2025	2026 [අ]
වරාය සේවා						ජන. - අගෝ.	ජන. - අගෝ.
පැමිණි නැව් සංඛ්‍යාව	4,180	4,073	4,809	4,562	5,120	3,334	3,527
මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. 000)	109,356	100,376	103,794	120,203	125,383	84,580	90,110
මෙහෙයවන ලද මුළු බහළුම් (TEU 000)	7,249	6,862	6,950	7,792	8,301	5,435	5,995
ප්‍රති නැවිගත කිරීම් (TEU 000) [ආ]	6,050	5,832	5,754	6,623	6,587	4,353	4,828
විදුලි සංදේශ අංශය						ජූනි අවසානයට	ජූනි අවසානයට
ස්ථාවර දුරකථන (සංඛ්‍යාව '000)	2,852	2,651	2,308	2,122	2,627	3,473	2,708
ජංගම දුරකථන (සංඛ්‍යාව '000)	29,959	28,838	28,986	28,820	29,490	29,027	29,419
රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව '000)	1,587	1,388	1,163	1,046	1,564	2,393	1,660
අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව '000)	22,106	21,668	22,864	23,149	23,855	23,686	23,882
සෞඛ්‍ය අංශය							
පෞද්ගලික රෝහල්	243	250	ලැ.නො	ලැ.නො	ලැ.නො	ලැ.නො	**ලැ.නො.**
රජයේ රෝහල්	618	617	ලැ.නො	ලැ.නො	688	ලැ.නො	**ලැ.නො.**
ඇඳන් සංඛ්‍යාව (රජයේ)	78,228	78,228	ලැ.නො	ලැ.නො	91,551	ලැ.නො	**ලැ.නො.**
වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ)	20,209	21,045	ලැ.නො	ලැ.නො	25,055	ලැ.නො	**ලැ.නො.**
හෙදියන් සංඛ්‍යාව (රජයේ)	39,091	40,775	ලැ.නො	ලැ.නො	51,067	ලැ.නො	**ලැ.නො.**
මූල්‍ය අංශය						ජූනි අවසානයට	ජූනි අවසානයට
බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථානය	7,369	7,378	7,522	7,613	7,968	7,652 [ආ]	7,570
ණය කාඩ්පත් (ක්‍රියාකාරී)	2,054,985	2,054,896	1,987,857	1,990,271	2,165,600	2,093,738	2,274,221
						ජූනි. අවසානයට	ජූනි. අවසානයට
ලියාපදිංචි මූල්‍ය සමාගම් [ඇ]	39	37	33	32	32	32	30
විශේෂිත කල්බදු සමාගම්	3	1	1	1	1	**1**	-
සංචාරක අංශය						ජන. - අගෝ.	ජන. - අගෝ.
පැමිණි සංචාරක සංඛ්‍යාව	194,495	719,978	1,487,303	2,053,465	2,362,521	1,566,523	1,535,122
සංචාරක ඉපැයීම් (ඇ.ඩො. මිලියන)	507	1,136	2,068	3,169	3,219	2,290	2,061
හෝටල් කාමර නැවතුම් අනුපාතය	18.6	30.4	39.0	ලැ.නො	ලැ.නො	ලැ.නො	**ලැ.නො.**
ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදිංචි කිරීම්)						ජන. - අගෝ.	ජන. - අගෝ.
බස් රථ	281	404	685	146	2,096	853	3,105
මෝටර් කාර්	3,495	1,489	1,816	1,644	68,047	26,894	81,801

3.2 වගුව | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් (සම්බන්ධිතයි....)

දර්ශකය	2021	2022	2023	2024	2025	2025	2026 (අ)
භාණ්ඩ ප්‍රවාහනය රථ (ඇ)	2,593	940	523	1,284	3,792	1,700	5,728
යතුරුපැදි	8,011	9,060	20,200	65,289	254,817	127,745	308,292
ත්‍රිරෝද රථ	2,093	36	60	94	17,332	5,967	31,925
ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් (ඉ)	12,616	5,285	4,020	5,070	9,079	5,139	6,790
වෙනත් (ඊ)			586	883	6,937	3,283	7,694

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) නැවත ඇසිරීම ඇතුළත් වේ. (2021 - 2024)


(ඈ) විශේෂ කාර්ය වාහන, මෝටර් ලොරි සහ ලොරි අනෙකුත්

(ඉ) රෝද හතරේ ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් මෙහි ඇතුළත් වේ

(ඊ) වැන් රථ, ද්විත්ව කාර්ය වාහන, තනි කැබ රථ ක්වඩ්‍රිසයිකල් සහ මෝටර් නිවාස ඇතුළත් වේ

(උ) ETI මූල්‍ය සමාගම ඇතුළත් නොවේ. (2021 - 2024)

3.7 රූපසටහන | සේවා අංශයේ සංයුතිය: 2026 පළමු භාගය (අ)



මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
(අ) ස්ථාවර මිල ගණන් අනුව

ප්‍රවාහන සහ වරාය සේවා

මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා ගබඩා පහසුකම් සැපයීම යන උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී සියයට 3.4 කින් වර්ධනය විය. 2025 වසරේ පෙබරවාරි මස සිට මෝටර් රථ ආනයන සීමාවන් ලිහිල් කිරීමෙන් පසුව වාහන ආනයන ප්‍රමාණය ඉහළ යාම පිළිබිඹු කරමින් නව මෝටර් රථ ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ 96,056 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී 342,029 ක් දක්වා සියයට 256.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මුළු නව ලියාපදිංචි කිරීම්වලින් සියයට 68.5 කට දායකත්වය දරන යතුරුපැදි ලියාපදිංචි කිරීම් 234,354 ක් දක්වා සියයට 223.6 කින් වර්ධනය වූ අතර මෝටර් රථ ලියාපදිංචි කිරීම් 66,344 ක් දක්වා සියයට 383.4 කින් ද ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීම් 23,523 ක් දක්වා සියයට 718.8 කින් ද වර්ධනය විය. බස් රථ, ද්විත්ව කාර්යය රථ සහ භාණ්ඩ ප්‍රවාහන රථ ලියාපදිංචි කිරීම් ද පිළිවෙළින් සියයට 380.1 කින්, සියයට 256.2 කින් සහ සියයට 299.8 කින් වර්ධනය විය.

වරාය කටයුතු 2026 වසරේ පළමු භාගයේ දී පුළුල් විය. කොළඹ වරායේ මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 3.97 ට සාපේක්ෂව, 2026 වසරේ පළමු භාගයේ දී අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 4.44 ක් දක්වා සියයට 11.9 කින් වර්ධනය විය. මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාවෙන් සියයට 80.1 කට දායකත්වය සපයන ප්‍රතිනැවිගත කිරීම් සඳහා මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 3.56 ක් දක්වා සියයට 11.9 කින් වර්ධනය විය. මෙහෙයවන ලද දේශීය බහාලුම් සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 0.68 ක් දක්වා සියයට 8.3 කින් වර්ධනය වූ අතර නැවත ගබඩා කිරීම සඳහා මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 0.20 ක් දක්වා සියයට 24.6 කින් වර්ධනය විය. කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට ජාත්‍යන්තර වරායන්හි සමස්ත නැව් භාණ්ඩ මෙහෙයුම් සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ මෙට්‍රික් ටොන් මිලියන 63.0 ට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 67.4 ක් දක්වා සියයට 6.8 කින් වර්ධනය විය. මෙයින්, ගොඩබාන ලද භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 37.9 ක් දක්වා සියයට 8.7 කින් වර්ධනය වූ අතර පටවන ලද භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 29.4 ක් දක්වා සියයට 4.6 කින් වර්ධනය විය. මේ අතර, නෞකා ගමනාගමනය සියයට 6.1 කින් වර්ධනය වී නෞකා සංඛ්‍යාව 2,605 ක් විය.

විදුලි සංදේශ

විදුලි සංදේශ උප අංශය 2026 වසරේ පළමු භාගයේ දී සියයට 4.7 කින් වර්ධනය විය. සෙලියුලර් ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වූ මිලියන 29.0 ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට මිලියන 29.4 ක් දක්වා සියයට 1.4 කින් වර්ධනය විය. ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළුව අන්තර්ජාල ග්‍රාහකයින් සංඛ්‍යාව මිලියන 23.9 ක් දක්වා සියයට 0.8 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, රැහැන් රහිත දේශීය ලූප් සම්බන්ධතා (Wireless Local Loop connections) මිලියන 1.7 ක් දක්වා සියයට 30.6 කින් පහත වැටීම හේතුවෙන් ස්ථාවර දුරකථන සංඛ්‍යාව මිලියන 2.7 ක් දක්වා සියයට 22.0 කින් පහත වැටුණු අතර රැහැන්ගත සම්බන්ධතා මිලියන 1.0 ක් දක්වා සියයට 3.0 කින් පහත වැටුණි. ඒ අනුව, සෙලියුලර් ජංගම දුරකථන සම්බන්ධතා ඇතුළුව දුරකථන ඝනත්වය 2026 වසරේ දෙවන කාර්තුව අවසානය වන විට, 2025 වසරේ දෙවන කාර්තුව අවසානයේ වූ පුද්ගලයින් 100 කට 149.4 ට සාපේක්ෂව, පුද්ගලයින් 100 කට 146.2 දක්වා පහත වැටුණි

සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතය, 2025 වසරේ දෙවන කාර්තුවේ දී වූ සියයට 3.8 ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 4.0 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය. කාන්තාවන් සහ පිරිමින් අතර සේවා වියුක්ති අනුපාතය පිළිවෙලින් සියයට 6.1 ක් සහ සියයට 2.8ක් ලෙස වාර්තා විය. මේ අතර, කාන්තාවන් සඳහා සියයට 22.4 ක් වූ සහ පිරිමින් සඳහා සියයට 15.5 ක් වූ තරුණ වයස් කාණ්ඩයේ (වයස අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතය සියයට 17.8 ක් වූ අතර, එය සියලුම වයස් කාණ්ඩ අතුරින් වාර්තා වූ ඉහළම සේවා වියුක්ති අනුපාතය සනිටුහන් කරයි. අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට උසස් අධ්‍යාපනය ඇති අය අතර සේවා වියුක්ති අනුපාතය සියයට 6.7 ක් වූ අතර, එය පිරිමින්ට වඩා (සියයට 3.9) කාන්තාවන් අතර (සියයට 9.6) සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. සියලුම වයස් කාණ්ඩ සහ අධ්‍යාපන මට්ටම්වල කාන්තාවන් අතර සේවා වියුක්තිය පිරිමින් අතර සේවා වියුක්තියට වඩා ඉහළ මට්ටමක පැවතුණි.


මේ අතර, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ද 2025 වසරේ දෙවන කාර්තුවේ දී වූ සියයට 49.3 ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 50.0 දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී. පිරිමින් අතර සහ කාන්තාවන් අතර ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය පිළිවෙළින් සියයට 70.3 සහ සියයට 32.7 ක් විය. මුළු සේවා නියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව මිලියන 8.2 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එයින් සියයට 49.2 ක් සේවා අංශයේ ද, සියයට 27.3 ක් කර්මාන්ත අංශයේ ද සහ සියයට 23.4 ක් කෘෂිකර්මාන්ත අංශයේ ද නිරත විය.

3.3 වගුව | සංචාරක අංශයේ කාර්යසාධනය

මාසය	සංචාරකයින්ගේ පැමිණීම					සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන)				
	2022	2023	2024	2025(අ)	2026(අ)	2022	2023	2024	2025(අ)	2026(අ)
ජනවාරි	82,327	102,545	208,253	252,761	277,327	151.7	153.5	341.8	400.7	413.8
පෙබරවාරි	96,507	107,639	218,350	240,217	279,328	169.4	161.6	345.7	367.6	381.4
මාර්තු	106,500	125,495	209,181	229,298	183,979	161.2	188.8	338.4	354.0	244.8
අප්‍රේල්	62,980	105,498	148,867	174,608	135,643	108.7	148.2	225.7	256.7	164.3
මැයි	30,207	83,309	112,128	132,919	145,745	43.5	100.0	154.0	164.1	155.7
ජූනි	32,856	100,388	113,470	138,241	124,551	45.0	122.9	151.1	169.5	151.1
ජූලි	47,293	143,039	187,810	200,244	196,845	85.0	219.0	328.3	318.5	285.5
අගෝස්තු	37,760	136,405	164,609	198,235	191,704	67.9	210.5	282.1	258.9	264.4
සැප්තැම්බර්	29,802	111,938	122,140	158,971	158,557	40.5	152.2	181.0	182.9	185.6
ඔක්තෝබර්	42,026	109,199	135,907	165,193		54.9	136.7	185.6	186.1	
නොවැම්බර්	59,759	151,496	184,158	212,906		81.0	205.3	272.9	251.6	
දෙසැම්බර්	91,961	210,352	248,592	258,928		127.4	269.3	362.1	308.6	
එකතුව	**719,978**	**1,487,303**	**2,053,465**	**2,362,521**	**1,693,679**	**1,136.3**	**2,068.0**	**3,168.6**	**3,219.2**	**2,246.6**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
(අ) තාවකාලික
(ආ) සංශෝධිත

3.8 රූපසටහන | ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය



මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3.3 මුදල් අංශයේ වර්ධනයන්

2026 වසර තුළ උද්ධමන පීඩනයන් යළි මතුවීමත් සමඟ මුදල් තත්ත්වයන් ලිහිල් ස්ථාවරයක සිට වඩාත් දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් කරා පරිවර්තනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව 2026 වසරේ මුල් කාලයේ දී එක්දින ප්‍රතිපත්ති පොළී අනුපාතිකය සියයට 7.75 ක මට්ටමේ පවත්වා ගෙන ගියේය. 2026 වසරේ මැයි මාසයේ දී ගෝලීය බලශක්ති මිල ඉහළ යාම, දේශීය බලශක්ති මිලෙහි ඉහළ යාම, පෞද්ගලික අංශයේ ණය ලබා දීමේ අඛණ්ඩ ව්‍යාප්තිය සහ උද්ධමන අපේක්ෂාවන් කෙරෙහි ඇති විය හැකි අවදානම් පිළිබඳ අවධානය යොමු කරමින්, එක්දින ප්‍රතිපත්ති පොළී අනුපාතිකය පදනම් අංක 100 කින් සියයට 8.75 දක්වා ඉහළ නංවන ලදී. 2026 වසරේ සැප්තැම්බර් මාසයේ පැවති මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී එක්දින ප්‍රතිපත්ති පොළී අනුපාතිකය සියයට 8.75 ක මට්ටමේ පවත්වා ගැනීමට තීරණය කෙරුණු අතර, මීට පෙර සිදු කරන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම් ඉදිරි කාලසීමාව තුළ ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වනු ඇතැයි මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය අපේක්ෂා කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 8.25 ක් සහ සියයට 9.25 ක් ලෙස පැවතුණි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය සියයට 2.00 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමෙන් අනතුරුව, වෙළඳපොළ පොළී අනුපාතික පෙර කාලපරිච්ඡේදයේ දක්නට ලැබුණු අඩු අගයන්හි සිට ඉහළ අගයක් දක්වා වර්ධනය විය. සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොළී අනුපාතිකය 2026 වසරේ මාර්තු මස අග දී පැවති සියයට 9.86 ට සාපේක්ෂව 2026 වසරේ ඔක්තෝබර් මස 30 දිනෙන් අවසන් වූ සතිය සඳහා සියයට 11.23 ක් විය. සාමාන්‍ය බරිත නව ණය පොළී අනුපාතිකය 2026 වසරේ මාර්තු මාසයේ පැවති සියයට 11.33 සිට 2026 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 12.65 දක්වා ඉහළ ගිය අතර, නව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ණය සඳහා අදාළ අනුපාතිකය 2026 වසරේ සැප්තැම්බර් මස වන විට

සියයට 13.17 දක්වා ළඟා විය. මෙම වර්ධනයන් මගින් දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ණය ලබාදීමේ කොන්දේසි වෙත ක්‍රමයෙන් සම්ප්‍රේෂණය වීම පෙන්නුම් කරයි.

2026 වසර තුළ මුදල් ප්‍රසාරණය අඛණ්ඩව සිදුවූ නමුත්, එම ප්‍රසාරණයේ වේගය ණය ලබාදීමේ කොන්දේසි මෙන්ම විදේශීය අංශයේ වර්ධනයන් ද පිළිබිඹු කරයි. පුළුල් මුදල් සැපයුම (M2b) 2026 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට පෙර වසරට සාපේක්ෂව සියයට 11.1 ක වර්ධනයක් වාර්තා කරමින් දළ වශයෙන් රු. බිලියන 17,189.2 දක්වා වර්ධනය වී තිබුණි. 2026 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට පෞද්ගලික අංශය වෙත ලබා දී ඇති නොපියවුණු ණය ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව වර්ධන වේගය සියයට 23.6 දක්වා පහළ යමින් දළ වශයෙන් රු. බිලියන 11,768.7 දක්වා ඉහළ ගොස් ඇත. මෙම කාලය තුළ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශ වත්කම් ද ශක්තිමත් විය.

පෞද්ගලික අංශයේ ණය ලබා දීමේ අඛණ්ඩ ව්‍යාප්තිය මුදල් ප්‍රසාරණයේ වැදගත් මූලාශ්‍රයක් ලෙස පැවති අතර, 2026 වසරේ මැයි මාසයේ දී හඳුන්වා දෙන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ පියවරයන් හේතුවෙන් කාලයත් සමඟ ණය ලබාදීමේ වර්ධනය මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.4 වගුව | ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)


අංශය	2022	2023	2024 (ආ)	2025(අ)	පළමු භාගය	
					2025(ආ)	2026(අ)
කෘෂිකර්මාන්තය	**-4.1**	**1.6**	**1.2**	1.4	**0.6**	**-0.6**
තේ වගාව	-15.7	-1.5	1.7	1.4	5.9	-2.6
වී වගාව	-11.8	17.1	3.1	5.3	2.4	-11.2
රබර් වගාව	-9.8	-7.7	2.2	-6.0	-17.1	-8.5
ධාන්‍ය වගාව	-24.8	2.5	10.9	0.2	5.5	0.5
එළවළු වගාව	-5.5	2.9	2.8	-7.1	-0.8	2.2
සත්ව නිෂ්පාදන	-11.4	0.3	14.1	10.5	16.3	-1.3
වන වගාව, දැව හා වනාන්තර	14.8	-7.3	-2.1	10.7	6.8	12.5
ධීවර කර්මාන්තය	-10.5	3.0	1.9	-0.1	5.1	-19.1
කර්මාන්ත	**-16.0**	**-9.2**	**11.0**	**7.8**	**7.9**	**7.2**
පතල් හා කැණීම්	-31.0	-22.3	19.4	16.9	14.5	18.5
නිෂ්පාදන ක්‍රියාකාරකම්	-12.2	-3.2	7.6	6.2	7.0	33.3
අනෙකුත් කර්මාන්ත	-4.3	-3.0	5.9	8.9	4.8	6.6
ඉදිකිරීම්	-20.9	-20.8	19.4	9.2	9.6	15.1
සේවා	**-2.6**	**-0.2**	**2.4**	**3.3**	**3.3**	**3.1**
තොග හා සිල්ලර වෙළඳාම	0.0	0.1	1.3	1.4	1.5	1.5
ප්‍රවාහනය හා ගබඩා කිරීම	3.0	4.3	2.9	3.0	3.2	3.4
නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම්	27.0	26.0	31.4	12.4	12.7	4.5
තොරතුරු හා සන්නිවේදන	6.5	-2.2	4.2	8.6	3.0	9.3
මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම්	-11.1	-10.3	-1.2	11.2	13.5	10.9
නිෂ්චල දේපල ක්‍රියාකාරකම්	-12.1	-6.0	4.2	3.6	3.2	3.4
වෘත්තීමය සේවා	-17.7	2.4	3.5	2.4	2.7	1.5
අධ්‍යාපන, සෞඛ්‍ය හා සාමාජයීය ක්‍රියාකාරකම්	-2.0	0.7	1.0	2.0	1.4	1.0
රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව	1.2	-1.7	-2.9	-1.3	-2.5	-1.8
අනෙකුත් සේවා (ස්වයං සේවා හැර)	0.3	0.3	1.5	1.0	0.9	0.7
ද.දේ.නි.	**-7.3**	**-2.3**	**5.0**	5.0	**4.8**	**4.7**

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව


(අ) තාවකාලික

(ආ) සංශෝධිත

3.9 රූපසටහන | ඵලදා අනුපාත, මුදල් සමස්තයන්, මුදල් සැපයුම, සහ පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව


උද්ධමනය

2026 වසර තුළ උද්ධමන තත්ත්වයන් සැලකිය යුතු ලෙස වෙනස් විය. වසරේ මුල් කාලයේ දී අඩු අගයක පැවති කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කොං. පා. මි. ද. 2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2026 වසරේ සැප්තැම්බර් මාසයේ දී වූ සියයට 8.0 සිට 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 8.3 දක්වා ඉහළ ගිය අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර උද්ධමනයේ ඇති වූ සංඛ්‍යානමය පදනම් බලපෑමයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුව, 2026 වසරේ ඔක්තෝබර් මාසය සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ අගය 209.9 ක් විය. 2026 වසර තුළ උද්ධමනය ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් බලශක්ති මිල ගණන් ඉහළයාම සහ ඒ ආශ්‍රිත දෙවන අදියරේ බලපෑම් මෙන්ම පදනම් බලපෑම් සහ ආහාර මිල ගණන්වල සිදුවූ වර්ධනයන් හේතු වන ලදී.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය යටතේ ආහාර උද්ධමනය සැප්තැම්බර් මාසයේ දී වූ සියයට 8.7 සිට 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 8.8 දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන උද්ධමනය සැප්තැම්බර් මාසයේ දී වූ සියයට 7.7 සිට ඔක්තෝබර් මාසයේදී සියයට 8.0 දක්වා සුළු වශයෙන් ඉහළ යන ලදී. මූලික උද්ධමනය ද ඉහළ ගොස් ඇති අතර, එය 2026 වසරේ සැප්තැම්බර් මාසයේ දී වූ සියයට 5.4 සිට ඔක්තෝබර් මාසයේ දී සියයට 5.6 දක්වා ඉහළ ගිය අතර, උද්ධමන පීඩනයන් ක්‍රමයෙන් පුළුල් පදනමක පවතින බව පෙන්නුම් කරයි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වාර්තා කළ පරිදි, දත්ත ලබා ගත හැකි ආසන්නතම මාසය වන 2026 වසරේ සැප්තැම්බර් මාසයේ දී ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා. පා. මි. ද., 2021=100) මත පදනම් වූ උද්ධමනය සියයට 8.1 ක් වූ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ අගය 224.2 ක් විය.

2026 වසරේ ජූලි මස පැවති මූල්‍ය ප්‍රතිපත්ති සමාලෝචනයේදී සිදු කරන ලද පුරෝකථන වලට අනුව, මැදපෙරදිග අර්බුදකාරී තත්ත්වයන්ගේ බලපෑම් සහ එහි ව්‍යාප්ත බලපෑම් තාවකාලික වනු ඇතැයි යන උපකල්පනය මත, මතුපිට උද්ධමනය කෙටි කාලීනව සියයට 5ක ඉලක්කයට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි ද, ඉන්පසු ක්‍රමයෙන් අඩු වී මධ්‍ය කාලීනව එම ඉලක්කය වටා ස්ථාවර වනු ඇතැයි ද ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරනු ලබයි. ගෝලීය අස්ථාවරත්වය හේතුවෙන් ඉදිරි දැක්ම සඳහා වන අවදානම් ඉහළ මට්ටමක පැවතුන ද, මධ්‍ය කාලීන උද්ධමන අපේක්ෂාවන් පුළුල් ලෙස ස්ථාවර මට්ටමක පැවති බව 2026 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාව ද සඳහන් කරයි. ඒ අනුව, සුදුසු ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීමේදී මහ බැංකුව විසින් උද්ධමන පීඩන, ණය තත්ත්වයන් සහ විදේශීය අංශයේ වර්ධනයන් අඛණ්ඩව තක්සේරු කිරීමත් සමඟ මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දත්ත මත තීරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.10 රූපසටහන | මතුපිට, මූලික සහ ආහාර උද්ධමන විචලතා (පදනම් වර්ෂය : 2021 = 100)



මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3.5 වගුව | පාරිභෝගික මිල උද්ධමනය (පදනම් වර්ෂය 2021=100)

මාසය	2025				2026			
	මතුපිට උද්ධමනය (%)		මූලික උද්ධමනය (%)		මතුපිට උද්ධමනය (%)		මූලික උද්ධමනය (%)	
	ලක්ෂ්‍යාමය		ලක්ෂ්‍යාමය		ලක්ෂ්‍යාමය		ලක්ෂ්‍යාමය	
	කොළඹ	ජාතික	කොළඹ	ජාතික	කොළඹ	ජාතික	කොළඹ	ජාතික
ජනවාරි	-4.0	-4.0	1.2	-0.2	2.3	2.4	2.3	2.2
පෙබරවාරි	-4.2	-3.9	0.7	-0.6	1.6	1.6	2.1	2.2
මාර්තු	-2.6	-1.9	0.7	-0.6	2.2	2.4	2.5	2.7
අප්‍රේල්	-2.0	-0.8	0.8	-0.1	5.4	4.7	3.8	4.4
මැයි	-0.7	0.6	1.2	0.3	5.5	5.4	3.9	4.5
ජූනි	-0.6	0.3	1.5	0.6	6.8	6.5	4.0	5.0
ජූලි	-0.3	0.7	1.6	0.9	7.3	7.2	4.4	6.0
අගෝස්තු	1.2	1.5	2.0	1.5	8.0	8.1	5.1	6.3
සැප්තැම්බර්	1.5	2.1	2.0	1.9	8.0	8.1	5.4	6.4
ඔක්තෝබර්	2.1	2.7	2.2	2.1	8.3	-	5.6	-
නොවැම්බර්	2.1	2.4	2.4	2.2				
දෙසැම්බර්	2.1	2.9	2.7	2.6				

මූලාශ්‍රය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

3.4 කොටස් වෙළඳපොළ

2026 වසර තුළ කොළඹ කොටස් හුවමාරුවේ කටයුතු ඉහළ මට්ටමක පැවති නමුත් අගෝස්තු මාසයේ දී වෙළඳපොළ ගනුදෙනු සාපේක්ෂව පටු පරාසයක් තුළ සිදු විය. 2026 වසරේ සැප්තැම්බර් 30 දින වන විට සියලු කොටස් මිල දර්ශකය (ASPI) ඒකක 20,812.9 ක මට්ටමේ පැවති අතර ස්ටැන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL20) ඒකක 5,894.2 ක මට්ටමේ පැවතුණි. වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය දළ වශයෙන් රු. බිලියන 7,548.2 ක් විය. 2026 වසරේ ඔක්තෝබර් 30 දින දෛනික වෙළඳපොළ පිරිවැටුම දළ වශයෙන් රු. මිලියන 958.6 ක් විය.

2026 වසරේ කොටස් වෙළඳපොළ කාර්යසාධනය මඟින් මුදල් ප්‍රතිපත්ති වර්ධනයන්, ආයතනික කාර්යසාධනය, දේශීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ ගෝලීය හා භූ දේශපාලනික වර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන් වෙනස් වන ආයෝජකයන්ගේ විශ්වාසය පිළිබිඹු විය. 2026 ඔක්තෝබර් මාසය තුළ වෙළඳපොළ ක්‍රියාකාරකම් මධ්‍යස්ථ මට්ටමක පැවති අතර, එම මාසය තුළ සියලු කොටස් මිල දර්ශකය සියයට 3.5 ක පමණ සුළු පහළ යාමක් වාර්තා කරන ලදී. 2026 වසරේ සැප්තැම්බර් 30 වන දින රු. මිලියන 72.3 ක පමණ ශුද්ධ විදේශ ආයෝජන ගලා යෑමක් වාර්තා වූ අතර විදේශීය ආයෝජකයන්ගේ සහභාගීත්වය අඩු මට්ටමක පැවතුණි.

ආර්ථික වර්ධනයේ ගමන් මග, ආයතනික ඉපැයීම්, පොලී අනුපාතික, උද්ධමන අපේක්ෂාවන්, ස්වෛරී අවදානම් පිළිබඳ සංජානන සහ විදේශීය ආයෝජකයන්ගේ සහභාගීත්වය මගින් කොළඹ කොටස් වෙළඳපොළේ කාර්යසාධනයට අඛණ්ඩව බලපෑම් එල්ල වනු ඇත. දේශීය ප්‍රාග්ධන වෙළඳපොළේ සංවර්ධනයට සහාය වීම සඳහා සාර්ව ආර්ථික ස්ථාවරත්වය තවදුරටත් පවත්වාගෙන යාම සහ ආයෝජක විශ්වාසය වැඩිදියුණු වීම යන කරුණු තවදුරටත් වැදගත් සාධක ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.6 වගුව | ප්‍රාග්ධන වෙළඳපොළේ වෙනස්වීම්

දර්ශකය	2020	2021	2022	2023	2024	2025	සැප්තැම්බර් අවසානයට	
							2025	2026(අ)
සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100)	6,774	12,226	8,490	10,654	15,945	22,624	21,779	20,813
එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය	2,638	4,233	2,636	3,068	4,862	6,157	6,127	5,894
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.බිලි.)	2,961	5,489	3,847	4,249	5,696	8,069	7,752	7,548
ගණුදෙනුකරණ ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව	283	296	290	290	284	288	289	289
වාර්ෂික සාමාන්‍ය පිරිවැටුම (රු.බිලි.)	397	1,173	687	411	538	1,867	904	672
විදේශ විකුණුම් (රු.මිලි.)	104,165	86,689	36,863	37,088	58,492	95,560	73,847	87,258
විදේශ ගැනුම් (රු.මිලි.)	52,889	39,410	67,488	41,451	48,013	56,931	46,755	30,416
ශුද්ධ ගැනුම් (රු.මිලි.)	-51,276	-47,279	30,625	4,363	-10,479	-38,629	-27,092	-56,842

මූලාශ්‍රය : කොළඹ කොටස් හුවමාරුව හා ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) තාවකාලික

3.5. විදේශ අංශයේ වර්ධනයන්


ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2026 වසරේ පළමු මාස නවය තුළ දී නැවතත් පීඩනයකට ලක් විය. ඉහළ අපනයන ආදායම් සහ සේවක ප්‍රේෂණ ලැබීම්හි ඉහළ යාම මගින් ලද සහාය මධ්‍යයේ වුව ද, මැදපෙරදිග කලාපයේ උත්සන්න වූ ගැටුම් හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල සහ ඉන්ධන ආනයන වියදම ඉහළ යාමත්, වාහන ආනයනය ද නැවත ඉහළ යාමත් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. 2026 වසරේ පළමු මාස නවය තුළ දී අපනයන ආදායම ඇ. ඩොං. මිලියන 10,754.2 ක් දක්වා සියයට 5.3 කින් වර්ධනය වීම සහ ආනයන වියදම ද ඇ. ඩොං. මිලියන 18,665.7 ක් දක්වා සියයට 21.3 කින් වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ හිඟය 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩොං. මිලියන 5,174.4 ක සිට 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩොං. මිලියන 7,911.5 ක් දක්වා පුළුල් විය. සේවක ප්‍රේෂණ 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩොං. මිලියන 5,811.7 ක සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩොං. මිලියන 6,865.4 ක් දක්වා සියයට 18.1 කින් වර්ධනය විය. මේ අතර, මැදපෙරදිග කලාපයේ ගැටුම් නිසා ඇති වූ සංචරණ බාධා මධ්‍යයේ සංචාරක පැමිණීම් අඩුවීම හේතුවෙන් සංචාරක ආදායම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩොං. මිලියන 2,472.9 ක සිට 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩොං. මිලියන 2,245.2 ක් දක්වා සියයට 9.2 කින් අඩු විය.

ජංගම ගිණුම, 2025 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ ඇ. ඩොං. මිලියන 1,853.2 ක අතිරික්තයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩොං. මිලියන 420.4 ක හිඟයක් වාර්තා කරන ලදී. වෙළෙඳ හිඟය පුළුල් වීම සහ සේවා ගිණුමේ අතිරික්තය අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. සමස්ත ගෙවුම් ශේෂය 2026 වසරේ පළමු භාගයේ දී ඇ. ඩොං. මිලියන 136 ක අතිරික්තයක් වාර්තා කළ අතර, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී එය ඇ.ඩොං. මිලියන 522 ක අතිරික්තයක් විය. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි 2026 වසරේ පළමු මාස නවය තුළ දී ඇ. ඩොං. මිලියන 170.2 ක ශුද්ධ ගලා යාමක් වාර්තා වූ අතර, 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී එය ඇ. ඩොං. මිලියන 84.6 ක ශුද්ධ ගලා යාමක් විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළට ශුද්ධ ගලා ඒම් ලෙස 2025 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ඇ. ඩොං. මිලියන 178.0 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩොං. මිලියන 167.8 ක ශුද්ධ ගලා ඒමක් වාර්තා විය. චීන මහජන බැංකුවේ හුවමාරු පහසුකම ඇතුළුව, දළ නිල සංචිත 2026 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට ඇ.ඩොං. බිලියන 6.9 ක් වූ අතර, එය මාස 3.3 ක ආනයන ආවරණයක් සපයයි. මේ අතර, 2026 ඔක්තෝබර් මස අවසානය වන විට, වසර ආරම්භයේ සිට මේ දක්වා කාලසීමාව තුළ ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 6.8 කින් අවප්‍රමාණය විය.

3.11 රූපසටහන | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාතයේ වෙනස් වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන


අපනයන ආදායම ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන, විශේෂයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන සහ යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ මගින් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩො. මිලියන 10,215.1 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 10,754.2 ක් දක්වා සියයට 5.3 කින් වර්ධනය විය. කාර්මික අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 78.1 ක් නියෝජනය කරමින් අඛණ්ඩව විශාලතම දායකත්වය දරන අතර, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පිළිවෙලින් සියයට 21.5 ක් සහ සියයට 0.2 ක් වශයෙන් දායක විය.

ප්‍රධාන වශයෙන් ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන, ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදන සහ යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනයෙන් ලද ආදායම ඉහළ යාම හේතුවෙන් කාර්මික අපනයන ආදායම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩො. මිලියන 7,854.2 ක සිට 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 8,398.3 ක් දක්වා සියයට 6.9 කින් වර්ධනය විය. 2026 වසරේ පළමු මාස නවය තුළ දී ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ආදායම සියයට 52.1 කින් වර්ධනය වී ඇ. ඩො. මිලියන 1,094.8 ක් ද, රබර් නිෂ්පාදන සියයට 9.2 කින් වර්ධනය වී ඇ. ඩො. මිලියන 752.9 ක් ද, ආහාර, පාන සහ දුම්කොළ නිෂ්පාදන සියයට 6.1 කින් වර්ධනය වී ඇ. ඩො. මිලියන 702.6 ක් ද, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සියයට 45.8 කින් වර්ධනය වී ඇ. ඩො. මිලියන 516.0 ක් ද විය. කෙසේ වෙතත්, කාර්මික අපනයන ආදායමට ප්‍රධාන දායකත්වය සපයන රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩො. මිලියන 4,021.4 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 3,797.0 ක් දක්වා සියයට 5.6 කින් අඩු විය.

තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, මුහුදු ආහාර, එළවළු සහ රබර් මගින් ලද ආදායම අඩු වීම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ. ඩො. මිලියන 2,323.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 2,317.4 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් අඩු විය. තේ අපනයන ආදායම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,163.0 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,083.6 ක් දක්වා සියයට 6.8 කින් අඩු විය. මීට අමතරව, 2026 වසරේ පළමු මාස නවය තුළ මුහුදු ආහාර අපනයන ආදායම ඇ.ඩො. මිලියන 180.8 ක් දක්වා සියයට 2.0 කින් ද, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන ආදායම ඇ.ඩො. මිලියන 126.2 ක් දක්වා සියයට 19.4 කින් ද, එළවළු අපනයන ආදායම ඇ.ඩො. මිලියන 21.1 ක් දක්වා සියයට 20.4 කින් ද, රබර් අපනයන ආදායම ඇ.ඩො. මිලියන 21.0 ක් දක්වා සියයට 12.0 කින් ද අඩු විය. කෙසේ වෙතත්, 2026 වසරේ පළමු මාස නවය තුළ පොල් අපනයන ආදායම ඇ.ඩො. මිලියන 441.0 ක් දක්වා සියයට 3.6 කින් ද, කුළුබඩු අපනයන ආදායම ඇ.ඩො. මිලියන 423.2 ක් දක්වා සියයට 30.4 කින් ද, සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම ඇ.ඩො. මිලියන 20.6 ක් දක්වා සියයට 9.7 කින් ද වර්ධනය විය. මේ අතර, ඛනිජ අපනයන ආදායම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 18.1 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 24.5 ක් දක්වා සියයට 35.1 කින් වර්ධනය විය.

3.12 රූපසටහන | අපනයන සංයුතිය

ඇ.ඩො. බිලියන



මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන


ප්‍රධාන වශයෙන් මැද පෙරදිග ගැටුමෙන් අනතුරුව ඉහළ ගිය ආනයන මිල ගණන් මධ්‍යයේ ඉන්ධන ආනයන වියදම ඉහළ යාම සහ වාහන ආනයනය වැඩි වීම හේතුවෙන් පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන වියදම ඉහළ යාමත් සමඟ, ආනයන වියදම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 15,389.5 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 18,665.7 ක් දක්වා සියයට 21.3 කින් වර්ධනය විය. 2026 වසරේ පළමු මාස නවය තුළ දී පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම මුළු ආනයන වියදමෙන් පිළිවෙළින් සියයට 24.0 ක්, සියයට 56.0 ක් සහ සියයට 19.9 ක් විය.

ප්‍රධාන වශයෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන වියදම ඉහළ යාම හේතුවෙන්, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 3,816.4 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 4,484.6 ක් දක්වා සියයට 17.5 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් කිරි ආශ්‍රිත නිෂ්පාදන, මුහුදු ආහාර සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා වූ ආනයන වියදම ඉහළ යාමත් සමඟ ආහාර පාන ආනයන වියදම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,565.1 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,617.7 ක් දක්වා සියයට 3.4 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් පෞද්ගලික වාහන, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදන, ගෘහ උපකරණ සහ විදුලි සංදේශ උපකරණ සඳහා වන ආනයන වියදම වැඩි වීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,251.3 සිට ඇ.ඩො. මිලියන 2,866.9 ක් දක්වා සියයට 27.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් ඉන්ධන සඳහා වූ ආනයන වියදම ඉහළ යාම හේතුවෙන්, අතරමැදි භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 8,617.2 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 10,456.2 ක් දක්වා සියයට 21.3 කින් වර්ධනය විය. පිරිපහදු කළ බනිජ තෙල් ආනයන වියදම ඇ.ඩො. මිලියන 3,483.7 ක් දක්වා සියයට 60.4 කින් ද, බොරතෙල් ආනයන වියදම ඇ.ඩො. මිලියන 817.4 ක් දක්වා සියයට 27.1 කින් ද, ගල් අඟුරු ආනයන වියදම ඇ.ඩො. මිලියන 186.1 ක් දක්වා සියයට 26.9 කින් ද ඉහළ යාමත් සමඟ ඉන්ධන ආනයන වියදම 2026 වසරේ පළමු මාස නවය තුළ ඇ.ඩො. මිලියන 4,487.2 ක් දක්වා සියයට 51.5 කින් වර්ධනය විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග සඳහා වූ ආනයන වියදම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,037.3 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,961.7 ක් දක්වා සියයට 3.7 කින් අඩු විය. මේ අතර, ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,943.9 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,709.8 ක් දක්වා සියයට 26.0 කින් වර්ධනය විය. යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සඳහා වන ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,332.9 ක් දක්වා සියයට 26.3 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඇ.ඩො. මිලියන 803.4 ක් දක්වා සියයට 8.7 කින් ද, ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඇ.ඩො. මිලියන 569.8 ක් දක්වා සියයට 60.8 කින් ද ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රවාහන උපකරණ ආනයන වියදමෙහි මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වාණිජ කටයුතු සඳහා යොදාගන්නා වාහන ආනයන වියදම ඇ.ඩො. මිලියන 435.8 ක් දක්වා සියයට 60.7 කින් ඉහළ යාමයි.

3.13 රූපසටහන | ආනයන සංයුතිය

ඇ.ඩො. බිලියන



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ

සංචාරක පැමිණීම් 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ පුද්ගලයින් 1,725,494 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 1,693,679 ක් දක්වා සියයට 1.8 කින් අඩු විය. ඒ අනුව, සංචාරක ඉපැයීම් 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,472.9 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,245.2 ක් දක්වා සියයට 9.2 කින් අඩු විය. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මැද පෙරදිග කලාපයේ ගැටුම් උත්සන්න වීමෙන් අනතුරුව සංචාරක පැමිණීම් අඩු වීම වන අතර, සංචාරක ඉපැයීම් ඇස්තමේන්තු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් භඳුන්වා දුන් සංශෝධිත ක්‍රමවේදය යටතේ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම අඩු අගයකට සංශෝධනය කිරීමෙන් වූ බලපෑම ද ඊට යම්තාක් දුරට හේතු විය. 2026 වසරේ පළමු මාස නවය තුළ සංචාරක පැමිණීම් 437,414 ක් වාර්තා කරමින් ඉන්දියාව සංචාරක පැමිණීම් සඳහා විශාලතම මූලාශ්‍ර වෙළෙඳපොළ ලෙස පැවති අතර, එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, රුසියාව සහ ප්‍රංශය පිළිවෙලින් අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර විය. මේ අතර, විශේෂයෙන් දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ආපදා සහන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ලද ප්‍රේෂණ ගලා ඒම වැඩි වීමත් සමඟ සේවක ප්‍රේෂණ 2025 වසරේ පළමු මාස නවය තුළ දී වූ ඇ.ඩො. මිලියන 5,811.7 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 6,865.4 ක් දක්වා සියයට 18.1 කින් වර්ධනය විය.

ඇ. ඩො. මිලියන

අයිතමය	2022	2023	2024	2025(අ)	ජන. - සැප්.	
					2025(අ)	2026(අ)
අපනයන	**13,106**	**11,911**	**12,772**	**13,581**	**10,215**	**10,754**
කෘෂිකාර්මික අපනයන	**2,568**	**2,567**	**2,775**	**3,072**	**2,324**	**2,317**
තේ	1,259	1,310	1,436	1,507	1,163	1,084
අනෙකුත් කෘෂිකාර්මික අපනයන	1,309	1,257	1,339	1,565	1,161	1,234
කාර්මික අපනයන	**10,465**	**9,278**	**9,947**	**10,461**	**7,854**	**8,398**
රෙදිපිළි හා ඇඟළුම්	5,952	4,879	5,061	5,314	4,021	3,797
ආහාරපාන සහ දුම්කොළ	520	539	652	896	662	703
රබර් නිෂ්පාදන	977	902	976	915	690	753
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	581	598	486	492	354	516
ඛනිජ තෙල් නිෂ්පාදන	568	539	1,064	971	720	1,095
අනෙකුත් කාර්මික අපනයන	1,868	1,820	1,710	1,874	1,407	1,535
ඛනිජමය අපනයන	**50**	**39**	**25**	**24**	**18**	**25**
වර්ගීකරණය නොකළ අපනයන	**23**	**28**	**26**	**24**	**19**	**14**
ආනයන	**18,291**	**16,811**	**18,841**	**21,480**	**15,390**	**18,666**
පාරිභෝගික භාණ්ඩ	**2,813**	**3,044**	**3,466**	**5,518**	**3,816**	**4,485**
ආහාර සහ පාන	1,608	1,693	1,914	2,116	1,565	1,618
අනෙකුත් පාරිභෝගික භාණ්ඩ	1,205	1,351	1,551	3,402	2,251	2,867
අතරමැදි භාණ්ඩ	**12,439**	**11,007**	**11,915**	**11,859**	**8,617**	**10,456**
ඛනිජතෙල්	4,897	4,703	4,354	4,043	2,961	4,487
රෙදිපිළි හා ඇඟළුම්	3,065	2,371	2,847	2,749	2,037	1,962
තිරිඟු සහ බඩ ඉරිඟු	303	338	383	398	253	257
අනෙකුත්	4,174	3,595	4,331	4,669	3,366	3,750
ආයෝජන භාණ්ඩ	**3,030**	**2,745**	**3,448**	**4,090**	**2,944**	**3,710**
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,969	1,868	2,363	2,513	1,848	2,333
ගොඩනැගිලි ද්‍රව්‍ය	926	775	927	1,017	739	803
ප්‍රවාහන උපකරණ	132	99	57	556	354	570
අනෙකුත්	3	3	3	4	3	4
වර්ගීකරණය නොකළ ආනයන	**9**	**28**	**13**	**13**	**12**	**15**
වෙළඳ ශේෂය	**-5,185**	**-4,900**	**-6,069**	**-7,899**	**-5,174**	**-7,912**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

3.6 ගෝලීය ආර්ථික දැක්ම[1]

2025 වසරේ දී සියයට 3.5 ක වර්ධනයකින් පසු, 2026 වසරේ පෙබරවාරි මාසය අග දී පැන නැඟුණු මැද පෙරදිග ගැටුම, එහි ප්‍රතිඵලයක් ලෙස බලශක්ති වෙළඳපොළ සහ ප්‍රධාන නාවික මාර්ග අඩාල කරමින් හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම සහ අබණ්ඩව පවතින වෙළඳ ආතතීන් මධ්‍යයේ වුවද, ගෝලීය ආර්ථිකය 2026 වසරේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා මනා කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. ප්‍රධාන වශයෙන්, කෘත්‍රිම බුද්ධිය මගින් මෙහෙයවන තාක්ෂණ ක්‍රියාවලියෙන් ඇති වූ ප්‍රබල ඉල්ලුම ද ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වී ඇත.

අබණ්ඩ අවිනිශ්චිතතා මධ්‍යයේ වුව ද, ගෝලීය ආර්ථිකය ඔරොත්තු දීමේ හැකියාව ප්‍රදර්ශනය කරමින් පවතී. කෙසේ වෙතත්, රටවල් අතර වර්ධනය අසමාන වන අතර, තවදුරටත් ඇති විය හැකි කම්පනවලට ප්‍රතිචාර දැක්වීමේ අවකාශය සීමිතය. වෙළඳ කොන්දේසි හිතකර රටවලට හෝ තාක්ෂණ වටිනාකම් දාමයන්හි ප්‍රබල සහභාගිත්වයක් ඇති රටවලට ආරක්ෂිත ඉඩක් තිබෙන අතර, බලශක්ති ආනයනකාරී ආර්ථිකයන් ඉහළ ආනයන වියදම් සහ දුර්වල ඉල්ලුමට මුහුණ දෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2026 වසරේ ඔක්තෝබර් "ලෝක ආර්ථික දැක්ම" අනුව, ගෝලීය මුර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2026 වසරේ දී සියයට 3.1 ක මට්ටමකට මධ්‍යස්ථ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එය අප්‍රේල් පුරෝකථනයට වෙනසක් නොමැති අතර, 2027 වසරේ දී සියයට 3.4 මට්ටමකට යථා තත්ත්වයට පත්වනු ඇත. එම තත්ත්වය 2026 වසරේ අප්‍රේල් "ලෝක ආර්ථික දැක්ම" වාර්තාවට සාපේක්ෂව ප්‍රතිශතාංක 0.2 ක ඉහළ සංශෝධනයකි. 2025 වසරේ දී සියයට 4.1 කට පහත වැටුණු ගෝලීය

[1] *ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2026 ඔක්තෝබර් "ලෝක ආර්ථික දැක්ම" සහ ලෝක බැංකු භාණ්ඩ මිල දත්ත (The Pink Sheet) ඇසුරිනි.*

සමස්ත උද්ධමනය, ප්‍රධාන වශයෙන් ඉහළ බලශක්ති සහ ආහාර මිල ගණන් හේතුවෙන් 2026 වසරේ දී සියයට 4.7 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, රටවල් අතර සැලකිය යුතු විචලනයන් සහිතව 2027 වසරේ දී සියයට 4.1 දක්වා පහත වැටෙනු ඇත.

2026 වසරේ මුල් භාගයේ දී ගෝලීය මූල්‍ය කොන්දේසි තියුනු ලෙස දැඩි වූ අතර, ලිහිල් කිරීමට පෙර, විශේෂයෙන්, තාක්ෂණික ව්‍යාපාර කොටස් සම්බන්ධයෙන් වන ශක්තිමත් ආයෝජක විශ්වාසය බොහෝදුරට පිළිබිඹු කරමින් පෙර පැවති තත්ත්වයන්ට අනුව සාපේක්ෂව සහනශීලීව පවතී. කෙසේ වෙතත්, නැවත උද්ධමනය ඇති වීම පිළිබඳ සැලකිලිමත්භාවය, ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල අනාගත ගමන් මග පිළිබඳ අපේක්ෂා සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පිළිබඳ ගැටලු හේතුවෙන් බොහෝ රටවල ස්වෛරී බැඳුම්කර පොලී අනුපාතික ඉහළ ගොස් ඇත. දියුණු ආර්ථිකයන්හි දිගුකාලීන රාජ්‍ය බැඳුම්කරවල ඵලදායීතාව දශක කිහිපයකින් වාර්තා වූ ඉහළම මට්ටමට පැමිණ ඇති අතර, එමගින් නැගී එන වෙළඳපොළවල ණය ගැනීමේ පිරිවැය ඉහළ ගොස් තිබේ. විශේෂයෙන්, ආසියාවේ විනිමය අනුපාතික අතිශයින් අස්ථායී වී ඇති අතර, එය බලධාරීන්ගේ (මහ බැංකු) මැදිහත්වීම් සඳහා හේතු වී ඇත. මහ බැංකු, දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල ශක්තිය සහ යුද්ධය හේතුවෙන් ඇති වන ස්ථීර උද්ධමන අවදානම අතර තුලනය කරමින් ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති තීරණවලදී ප්‍රවේශම්කාරී ස්ථාවරයක් දරයි. මේ අතර, ප්‍රධාන ආර්ථිකයන් කිහිපයක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තවමත් ලිහිල් වන අතර, එහිදී රාජ්‍ය ණය දිගටම ඉහළ යන අතර අයවැය හිඟයන් පෙර පැවති තත්ත්වයන්ට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.

ගෝලීය වෙළෙඳාම සහ භාණ්ඩ වෙළඳපොළ

ගෝලීය වෙළඳ පරිමාව 2025 වසරේ දී සියයට 5.0 කින් වර්ධනය වූ අතර, 2026 වසරේ දී සියයට 4.6 කින් අඩු වී, 2027 වසරේ දී සියයට 4.7 දක්වා සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2026 වසරේ ඔක්තෝබර් "ලෝක ආර්ථික දැක්ම" පුරෝකථනවලින් පිළිබිඹු වන්නේ තීරු බදු හේතුවෙන් ඇති වන බලපෑම, වෙළඳ ප්‍රතිව්‍යුහගත කිරීම සහ සැපයුම්කරුවන් ආදේශ කිරීම හරහා වෙළඳ සබඳතා සහ නිෂ්පාදන දාමයන් ක්‍රමයෙන් සකස් වීම සහ තාක්ෂණ-ආශ්‍රිත වෙළඳ ප්‍රවාහවල වේගවත් වර්ධනයයි.

ජාත්‍යන්තර සමුද්‍රීය මාර්ගයෙන් සිදුකරන බොරතෙල් වෙළඳාමෙන් සියයට 35.0 ක් සහ ගෝලීය ද්‍රවීකෘත ස්වාභාවික වායු වෙළඳාමෙන් සියයට 20.0 ක් පමණ ප්‍රවාහනය වන හෝර්මුස් සමුද්‍ර සන්ධිය, 2026 වසරේ අගෝස්තු අග දක්වා ගල්ෆ් කලාපයේ තෙල් අපනයනය සඳහා වැඩි වශයෙන් වසා දමා තිබූ අතර, එතැන් පටන් කෙටි කාලීන සටන් විරාමය වෙනුවට අඩු තීව්‍රතාවයකින් යුත් ගැටුමක් ඇති වූ අතර, එය රතු මුහුද දක්වා ද ව්‍යාප්ත විය.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වසරේදී යම් මට්ටමක පාලනයක් පැවති ප්‍රධාන භාණ්ඩ මිල ගණන් කිහිපයක මිල ගණන්, 2026 වසරේදී තියුණු ලෙස ඉහළ ගියේය. ලෝක බැංකුවට අනුව, බලශක්ති මිල දර්ශකය 2025 වසරේ තෙවන කාර්තුවේ සාමාන්‍ය වූ 89.1 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී 125.4 දක්වා ඉහළ ගොස් ඇති අතර සැප්තැම්බර් මාසයේදී එය 148.9 ක් විය. එය 2025 වසරේ වාර්තා වූ සාමාන්‍යයට වඩා බෙහෙවින් ඉහළ අගයකි. බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිල තෙවන කාර්තුවේදී ඇ.ඩො. 97.1 ක සාමාන්‍යයක් වාර්තා කළ අතර, අප්‍රේල් මාසයේදී එය ඇ.ඩො. 120.4 ක උපරිමයකට ළඟා වී, ජූලි මාසයේදී ඇ.ඩො. 83.4 දක්වා පහත වැටී, සැප්තැම්බර් මාසයේදී නැවත ඇ. ඩො. 116.8 දක්වා ඉහළ ගියේය. මෙය 2025 වසරේදී වාර්තා වූ ඇ.ඩො. 69.0 ක සාමාන්‍යයට සාපේක්ෂව කැපී පෙනෙන ඉහළ අගයකි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව, පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් යුද්ධයට පෙර පැවති මට්ටම්වලට වඩා සියයට 70.0 ත් 95.0 ත් අතර ප්‍රමාණයකින් ඉහළ මට්ටමක පවතී. 2025 වසරේ දී පැවති ඇ.ඩො. 11.96 ක සාමාන්‍යයට සාපේක්ෂව යුරෝපීය ස්වාභාවික වායු මිල සැප්තැම්බර් මාසයේ දී බ්‍රිතාන්‍යය තාප ඒකක මෙට්‍රික් මිලියනයට (MMBtu) ඇ.ඩො. 25.42 දක්වා ඉහළ ගිය අතර එක්සත් ජනපද ස්වාභාවික වායු මිල බ්‍රිතාන්‍යය තාප ඒකක මෙට්‍රික් මිලියනයට ඇ.ඩො. 2.95 ක පහළ අගයක පැවතුනි. පොහොර මිල දර්ශකය, 2026 දෙවන කාර්තුවේ 188.2 දක්වා තියුණු ලෙස ඉහළ යාමෙන් අනතුරුව, තෙවන කාර්තුවේ දී 147.6 දක්වා පහත වැටුණු අතර, එය 2025 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ 153.4ට වඩා අඩු අගයකි. සැප්තැම්බර් මාසයේ දී මෙම දර්ශකය 147.0 ක මට්ටමක පැවතුණි. ධාන්‍ය වර්ගවල මිල ගණන් ප්‍රමුඛ කොටගෙන ආහාර මිල ගණන් ද ඉහළ ගිය අතර, 2025 වසරේ පැවති 109.2 ක සාමාන්‍යයට සාපේක්ෂව 2026 වසරේ සැප්තැම්බර් මාසයේ ආහාර මිල දර්ශකය 124.1 ක් විය. ලෝහ මිල ගණන් අඛණ්ඩව ඉහළ ගිය අතර, ලෝහ සහ ඛනිජ දර්ශකය 2025 වසරේ පැවති 112.2 ක සාමාන්‍යයේ සිට 2026 සැප්තැම්බර් මාසයේ දී 147.5 දක්වා ඉහළ ගියේය. මේ අතර, 2025 වසරේ දී ට්‍රෝයි අවුන්සයක් සඳහා ඇ.ඩො. 3,442 ක් ලෙස පැවති රත්තරන් මිල, 2026 වසරේ පළමු කාර්තුවේ පැවති ට්‍රෝයි අවුන්සයකට ඇ.ඩො. 4,876 අගයෙන් පහත වැටී සැප්තැම්බර් මාසයේදී ට්‍රෝයි අවුන්සයක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො.4,319 ක් ලෙස සටහන් විය. ඉදිරිය දෙස බලන විට, 2026 වසරේ දී බොර තෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය ඇ.ඩො. 95.74 ක් වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) අපේක්ෂා කරයි; මෙය 2025 වසරට වඩා සියයට 41.3 ක ඉහළ අගයක් වන අතර 2027 වසරේ දී එය ඇ.ඩො. 87.39 දක්වා අඩු වනු ඇත. තවද, 2026 වසරේ දී පොහොර මිල සියයට 10 කින් සහ ආහාර මිල සියයට 5 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.

කලාපීය සංවර්ධනය

දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2027 වසරේ දී සියයට 1.8 දක්වා පහත වැටීමට පෙර, 2025 වසරේ දී වාර්තා වූ සියයට 2.0 සිට 2026 වසරේ දී සියයට 2.1 ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, එය 2026 අප්‍රේල් "ලෝක ආර්ථික ඉදිරි දැක්ම" වාර්තාවේ පුරෝකථනයට වඩා ප්‍රතිශතාංක 0.3 කින් ඉහළ අගයකි. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරීත්වය රටවල් අතර විවිධාකාර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශුද්ධ බලශක්ති අපනයනය කරන රටවල් හිතකර වෙළඳ කොන්දේසිවලින් අර්ධ වශයෙන් ප්‍රතිලාභ ලබන අතර, ශක්තිමත් තාක්ෂණික ක්‍රියාකාරකම් මගින් පියවා නොගන්නේ නම් බලශක්ති ආනයනය කරන ආර්ථිකයන් ඉහළ යන බලශක්ති මිල ගණන් හේතුවෙන් දැඩි ආර්ථික පීඩනයකට මුහුණ දෙනු ඇත. ශක්තිමත් පුද්ගල පරිභෝජනය, ඵලදායිතා මට්ටම සහ තාක්ෂණය ආශ්‍රිත ආයෝජනවල සහාය ඇතිව, එක්සත් ජනපද ආර්ථිකය 2026 සහ 2027 යන වසර දෙකෙහිදීම සියයට 2.3 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඔවුන් ශුද්ධ බලශක්ති අපනයනකරුවෙකු වන බැවින් පවතින යුද්ධය හේතුවෙන් එරට ආර්ථිකයට එල්ල වන සෘජු බලපෑම සීමිත වනු ඇත. මේ අතර, බලශක්ති වෙළෙඳපොළ බාධාවන්ට වැඩි වශයෙන් නිරාවරණය වී ඇති යුරෝපා කලාපයේ ආර්ථික වර්ධනය 2026 වසරේ දී සියයට 1.1 ක් සහ 2027 වසරේ දී සියයට 1.2 ක් ලෙස පුරෝකථනය කර ඇත. නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි (EMDEs) ආර්ථික වර්ධනය, 2027 වසරේ දී සියයට 4.4 දක්වා යථා තත්ත්වයට පත්වීමට පෙර, 2025 වසරේ පැවති සියයට 4.5 සිට 2026 වසරේ දී සියයට 3.7 දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද, ප්‍රාථමික වෙළෙඳ භාණ්ඩ මත යැපීම, මැදපෙරදිග ගැටුමට නිරාවරණය වීම, ප්‍රේෂණ සහ සංචාරක ආදායම් මත රඳා පැවතීම සහ ගෝලීය තාක්ෂණික අගය දාමයන්හි ඔවුන්ගේ ස්ථානය අනුව ආර්ථික ඉදිරි දැක්ම රටින් රටට වෙනස් වේ. නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව වඩාත් ඔරොත්තු දෙන කලාපය ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර එය 2026 වසරේ දී සියයට 5.1 කින් සහ 2027 වසරේ දී සියයට 4.9 කින් වර්ධනය වනු ඇත. එහිදී ඉන්දියාව වසර දෙකේදී ම (මූල්‍ය වර්ෂ පදනම මත) සියයට 7.0 ක වේගයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකය ලෙස හඳුනාගත හැක. මේ අතර, චීනයේ ආර්ථික වර්ධනය 2026 වසරේ දී සියයට 4.5 දක්වා සහ 2027 වසරේ දී සියයට 4.0 දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැද පෙරදිග සහ මධ්‍යම ආසියානු කලාපයේ ආර්ථික වර්ධනය 2026 වසරේ දී සියයට 0.3 කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එහිදී බහරේනය, ඉරාකය, කුවේටය සහ කටාර් යන රටවල ආර්ථික වර්ධන වේගය 2026 වසරේ දී ඉලක්කම් දෙකේ අගයකින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

මෙය 2026 අප්‍රේල් ලෝක ආර්ථික ඉදිරි දැක්මේ පුරෝකථනයට වඩා ප්‍රතිශතාංක 2.2 ක පහළ අගයකි. කෙසේවෙතත්, හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා නැව්ගත කිරීමේ බාධාවන් ලිහිල් වීමෙන් පසු නිෂ්පාදන, අපනයන සහ සැපයුම් ජාලයන් සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමඟ එය 2027 වසරේ දී සියයට 6.3 දක්වා යළිත් ඉහළ යනු ඇත. උප සහරානු අප්‍රිකා කලාපය 2026 සහ 2027 යන වසර දෙකේදීම සියයට 4.5 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ලතින් ඇමරිකාව සහ කැරිබියන් කලාපය 2026 වසරේ දී සියයට 2.3 කින් සහ 2027 වසරේ දී සියයට 2.5 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගෝලීය ආර්ථික අවදානම්

ඉදිරි ආර්ථික දැක්ම තුළ තවදුරටත් ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යාමට ඇති අවදානම් ප්‍රබලව පවති. මැදපෙරදිග ගැටුම හෝ යුක්‍රේනයේ ගැටුම දිගුකාලීනව පැවතීම හෝ තවදුරටත් උත්සන්න වීම සහ හෝර්මූස් සමුද්‍ර සන්ධිය සහ රතු මුහුදේ මාර්ගවලට තවදුරටත් බාධා ඇතිවීම හේතුවෙන් බලශක්ති සහ ආහාර මිල ගණන් දීර්ඝ කාලයක් තිස්සේ ඉහළ සහ අස්ථායී මට්ටමක පැවතිය හැක. මන්දයත්, ගෝලීය තෙල් සංචිත, මීලෙහි විෂම ගැලපීම් ඇතිවිය හැකි පීඩාකාරී මට්ටම් කරා අඩුවෙමින් පවතින අතර යුරෝපයේ ඇතැම් ප්‍රදේශවල ස්වාභාවික වායු සංචිත ශීත ඍතුවට පෙර ඍතුමය සම්මතයන්ට වඩා පහළ මට්ටමක පවතින බැවිනි. අඛණ්ඩව ඉහළ යන භාණ්ඩ මිල ගණන් ජංගම ගිණුම් හිඟයන් පුළුල් කිරීමට, විනිමය අනුපාතික පීඩනයන් තීව්‍ර කිරීමට සහ සීමිත මූල්‍ය අවකාශයක් සහ බාහිර ස්ථාරක්ෂක සහිත බලශක්ති ආනයනය කරන නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ආහාර අනාරක්ෂිත භාවය ඉහළ නැංවීමට හේතු විය හැකි අතර, වඩාත් කල්පවත්නා උද්ධමනය හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය දිගුකාලීනව දැඩි ලෙස පවත්වා ගැනීමට සිදුවිය හැකිය. දැනට පවතින එල්නිනෝ තත්ත්වය ඇතුළු දරුණු කාලගුණික සිදුවීම්, සයිබර් ප්‍රහාර සහ නැවත අලුත් වූ වෙළෙඳ ආතතීන් මගින් තවදුරටත් පීඩනයන් එක් කළ හැක. කෘතිම බුද්ධිය ආශ්‍රිත ලාභදායිත්වය සහ ඵලදායිතා අපේක්ෂාවන් නැවත තක්සේරු කිරීම ආයෝජන තියුනු ලෙස අඩු කිරීමට, ප්‍රාග්ධන වෙළෙඳපොළ නිවැරදි කිරීම් සිදුකිරීමට සහ මූල්‍ය තත්ත්වයන් දැඩි කිරීමට හේතු විය හැකි අතර, එය තාක්ෂණික සැපයුම් දාමයන්ට ඒකාබද්ධ වී ඇති ආර්ථිකයන් වෙත ද පැතිර යා හැකිය. ධනාත්මක පැත්තෙන් ගත් කල, කෘතිම බුද්ධිය ආශ්‍රිත ආයෝජන වඩාත් ස්ථීර බව ඔප්පු කළ හැකිය. නව වෙළඳ විධිවිධාන මගින් පුරෝකථනය කිරීමේ හැකියාව වැඩිදියුණු කළ හැකි අතර සැපයුම් දාම ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කළ හැකිය. දිගුකාලීන ගැටුම් සමනය වීමේ තත්ත්වය සහ හෝර්මූස් සමුද්‍ර සන්ධිය හරහා නැව්ගත කිරීම නැවත ආරම්භ කිරීම, බලශක්ති මිල ගණන් සහ උද්ධමන පීඩනයන් ලිහිල් කරනු ඇත.

ගෝලීය ඉදිරි දැක්ම ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති බලපෑම

කුඩා විවෘත ආර්ථිකයක් ලෙස, ශ්‍රී ලංකාව ඉහළ බලශක්ති ආනයන පිරිවැය, දුර්වල වූ සංචාරක පැමිණීම් සහ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ තුළ මන්දගාමී බාහිර ඉල්ලුම ඉල්ලුම වැනි සාධක හරහා ගෝලීය තත්ත්වයන්ට නිරාවරණය වේ. මැදපෙරදිග ගැටුම සහ ඒ ආශ්‍රිත සැපයුම් බාධාවන් මෙන්ම, ඉන්ධන සහ පොහොර මිල ගණන් ඉහළ යාම මධ්‍යයේ වුව ද, 2025 වසරේ දෙවන කාර්තුවේ දී වාර්තා වූ සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාව සියයට 4.2 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2026 වසරේ ඔක්තෝබර් මාසයේ ලෝක ආර්ථික ඉදිරි දැක්මට අනුව, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2025 වසරේ පැවති සියයට 5.0 අගයට සාපේක්ෂව 2026 වසරේ දී සියයට 4.0 ක් සහ 2027 වසරේ දී සියයට 3.7 ක් වනු ඇතැයි පුරෝකථනය කරන අතර, ප්‍රධාන වශයෙන් ඉහළ බලශක්ති මිල ගණන් පිළිබිඹු කරමින් උද්ධමනය, 2025 වසරේ පැවති සියයට -0.5 සිට 2026 වසරේ දී සියයට 5.3 දක්වාත් 2027 වසරේ දී සියයට 5.4 දක්වාත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඊට අමතරව, ෆිච් රේටිංස් (Fitch Ratings) ආයතනය විසින් 2026 වසරේ සැප්තැම්බර් 22 වන දින නිකුත් කරන ලද ඔවුන්ගේ නවතම ශ්‍රේණිගත කිරීම්වලට අනුව ශ්‍රී ලංකාවේ දිගුකාලීන ණය නිකුත් කරන්නාගේ ණය පැහැරහැරීමේ අවදානම් ශ්‍රේණිගත කිරීම (Sri Lanka's Long-Term Issuer Default Rating (IDR)) ස්ථාවර ඉදිරි දැක්මක් සහිතව 'CCC+' හි සිට 'B-' දක්වා ඉහළ නංවා ඇති අතර, මෙය ආයෝජකයන්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීමට සහ විදේශ මූල්‍යයන පීඩනයන් සමනය කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ඉහළ ගිය බලශක්ති සහ පොහොර මිල ගණන් මෙන්ම අඛණ්ඩව පවතින භූ දේශපාලනික අවිනිශ්චිතතාවය ගෙවුම් ශේෂය, දේශීය මිල ගණන් සහ අපනයන තරඟකාරීත්වය කෙරෙහි, විශේෂයෙන්ම ඇඟලුම් ක්ෂේත්‍රය මත පීඩනයක් එල්ල කළ හැකිය. ඒ අනුව, අවිනිශ්චිත ගෝලීය වටපිටාවක් තුළ ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීම සඳහා තිරසර විචක්ෂණශීලී සාර්ව ආර්ථික කළමනාකරණය, අපනයන සහ වෙළෙඳපොළ විවිධාංගීකරණය සහ බාහිර ස්වාරක්ෂක අඛණ්ඩව රැස් කිරීම තවදුරටත් වැදගත් වනු ඇත.

වගුව 3.8 | තෝරාගත් රටවල ප්‍රධාන ආර්ථික දර්ශක : 2026 (පුරෝකථන)

රට	ද. දේ. නි. වර්ධනය (වාර්ෂික %)(අ)	උද්ධමනය %(අ)	සේවා වියුක්තිය %(අ)	රාජ්‍ය මූල්‍ය හිඟය (ද. දේ. නි.% ලෙස)(ආ)	දළ ණය (ද. දේ.නි. % ලෙස)(ආ)
ආජන්ටිනාව	2.1	32.5	7.6	0.5	70.4
ඕස්ට්‍රේලියාව	1.9	3.9	4.4	-2.4	50.6
බ්‍රසීලය	2.2	4.4	6.2	-7.7	96.5
කැනඩාව	1.1	2.8	6.5	-2.7	110.7
චිලී	0.6	3.7	9.5	-2.5	42.5
චීනය	4.5	1.0	5.1	-8.2	106.9
ප්‍රංශය	0.4	2.4	8.4	-4.9	118.4
ජර්මනිය	1.3	2.7	4.0	-3.8	64.6
ග්‍රීසිය	1.8	4.2	8.0	0.6	136.9
ඉන්දියාව	7.0	5.0	5.0	-7.4	83.4
ඉන්දුනීසියාව	5.1	3.3	4.7	-2.9	41.5
ඉතාලිය	0.8	3.3	5.6	-2.8	138.4
ජපානය	0.7	2.0	2.5	-2.0	204.4
කොරියාව	3.3	2.7	2.8	-1.5	54.4
මැලේසියාව	5.2	2.2	3.0	-3.3	69.5
මෙක්සිකෝව	1.5	3.8	2.8	-4.4	62.7
රුසියාව	0.9	6.1	2.2	-2.0	19.1
සිංගප්පූරුව	5.0	2.3	2.1	3.3	171.9
දකුණු අප්‍රිකාව	1.0	4.4	33.2	-4.9	78.9
ස්පාඤ්ඤය	2.5	3.7	9.8	-2.1	98.2
තායිලන්තය	2.1	2.1	1.0	-2.2	66.8
එක්සත් රාජධානිය	1.3	3.3	5.3	-3.9	103.6
ඇමෙරිකා එක්සත් ජනපදය	2.3	3.6	4.2	-7.5	125.8
වියට්නාමය	8.4	4.7	2.1	-2.0	29.8

මූලාශ්‍ර : (අ) ලෝක ආර්ථික දර්ශකය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2026 ඔක්තෝබර්, (ආ) Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2026 අප්‍රේල්.

04 රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය

4.1 සමාලෝචනය

විශේෂයෙන්ම මැදපෙරදිග ගැටුම් උග්‍රවීම හේතුවෙන් 2026 වසරේ දී රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රය ඉහළ බාහිර අවිනිශ්චිතතාවයක් හමුවේ ක්‍රියාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය බලශක්ති මිල ගණන්වල සිදුවූ උච්ඡාවචනයන් සහ වෙළෙඳ හා සැපයුම් දාමයන්ට සිදු වූ බාධාවන් හේතුවෙන් ආනයන වියදම් ඉහළ ගිය අතර, ගෙවුම් ශේෂයට සහ ශ්‍රී ලංකා රුපියලට දැඩි පීඩනයක් එල්ල කරමින් දේශීය උද්ධමන පීඩනය ඉහළ යාමට හේතු විය. මෙම තත්ත්වයන්, ඉන්ධන, බලශක්ති සහ අනෙකුත් ආනයනික අමුද්‍රව්‍ය පිරිවැය ඉහළයාම, විදේශ ව්‍යවහාර මුදලින් වන වගකීම් වැඩිවීම සහ මෙහෙයුම් ආන්තිකයන් මත විශාල පීඩනයක් ඇති කිරීම හරහා රාජ්‍ය ව්‍යවසායයන් වෙත බලපෑම් එල්ල කළේය.

එසේ වුවද, රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රය සිය මූල්‍ය කාර්යසාධනයේ සමස්ත වර්ධනයක් වාර්තා කර ඇත. ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 51 මඟින් 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 307.5 ක සමස්ත ලාභයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 366.9 ක සමස්ත ලාභයක් වාර්තා කර ඇත[1]. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්වල ශක්තිමත් ආදායම් කාර්යසාධනය, අඛණ්ඩ පිරිවැය කළමනාකරණ ක්‍රියාමාර්ග සහ සමස්ත ක්ෂේත්‍රය පුරා මෙහෙයුම් කාර්යක්ෂමතාව, යහපාලනය, වගවීම සහ මූල්‍ය විනය වැඩිදියුණු කිරීම සඳහා රජය ගෙන යන අඛණ්ඩ ප්‍රයත්නයන්ය. මේ අතර, රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් අදාළ කාලපරිච්ඡේදය තුළ එකතු කළ අයබදු සහ ලාභාංශ රු. බිලියන 14.6 සිට රු. බිලියන 19.9 ක් දක්වා වැඩි වී ඇත.

2026 වසරේ මුල් මාස දහය තුළ, රාජ්‍ය ව්‍යාවසාය සමුහයට රාජ්‍ය සමාගම් කිහිපයක් අලුතින් එකතු වන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යයන් භාර ගැනීම සඳහා ස්ථාපිත කරන ලද සමාගම් හය වන සී/ස ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (පුද්ගලික) සමාගම, සී/ස ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගම, සී/ස එනර්ජි වෙන්චර්ස් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස සීරීබී එම්ප්ලෝයීස් ෆන්ඩ්ස් (පුද්ගලික) සමාගම මෙන්ම සී/ස ස්කයි කෙයාර් හොස්පිටල් මැනේජ්මන්ට් සමාගම සහ සී/ස මල්ටි මොඩල් ට්‍රාන්ස්පෝට් සමාගම ඊට ඇතුළත් වේ.

පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ සැලකිය යුතු පරිවර්තනයක් සනිටුහන් කරමින්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා මෙට්‍රෝ ට්‍රාන්සිට් (පුද්ගලික) සමාගම, ක්ලීන් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ ආනයනය කරන ලද පත්ල පහත් බස් රථ 10 ක ඇණියක් සමඟින් 2026 මාර්තු මාසයේදී සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. එතැන් සිට එම බස් රථ ඇණිය 114 ක් දක්වා වර්ධනය වී ඇත.

රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රය ප්‍රතිසංස්කරණ කිරීමේ රජයේ ප්‍රතිපත්තියට සමගාමීව, අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණය සඳහා වූ විශේෂිත ඒකකයක් 2026 මාර්තු මාසයේ දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එම ඒකකය දැනට තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන් 33 ක් ඇවර කිරීමේ කටයුතුවල නිරතව සිටී. මේ අතර, රාජ්‍ය වාණිජ ව්‍යවසාය කළමනාකරණ පනතේ අවසන් කෙටුම්පත පිළියෙළ කර ගරු නීතිපතිතුමාගේ නිෂ්කාශනය සඳහා යොමු කර ඇත. මෙම පනත් කෙටුම්පතේ අරමුණු අතරට රාජ්‍ය වාණිජ ව්‍යවසායන් මඟින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය, දැරිය හැකි මිල, පවතින බව, තරහකාරීත්වය සහ ප්‍රවේශ විය හැකි බව ඉහළ නැංවීම මෙන්ම රජයේ වාණිජ වත්කම්වල දිගුකාලීන වටිනාකම වැඩි කිරීම ඇතුළත් වේ.

4.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

ලංකා බැංකුව

2025 වසර අවසානය වන විට රු. බිලියන 5,468 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 5,675 ක් දක්වා සියයට 3.8 කින් ඉහළ ගොස් ඇත. 2025 වසර අවසානය වන විට රු. බිලියන 4,389 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු පදනම 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 4,576 ක් දක්වා සියයට 4.3 කින් ඉහළ ගොස් ඇත. 2025 වසර අවසානය වන විට රු. බිලියන 2,372 ක් වූ ණය සහ අත්තිකාරම් 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 2,571 ක් දක්වා සියයට 8.4 කින් ඉහළ ගොස් ඇත. 2025 වසර අවසානය හා සැසඳීමේ දී සියයට 5.59 ක් වූ අදියර III ණය අනුපාතය 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 4.91 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 78.7 ක බදු පෙර ලාභය හා සසඳන විට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංකා බැංකුව රු. බිලියන 82.8 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රු. බිලියන 149 ක් දක්වා ශුද්ධ පොළී ආදායම සියයට 9 කින් ඉහළ යාමයි.

[1] *ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන්, 2026 වර්ෂය සඳහා සලකා බලා ඇත්තේ 2026.01.01 සිට 2026.03.09 දක්වා කාල සීමාවේ ලාභයයි.*

මහජන බැංකුව

2025 වසර අවසානය වන විට රු. බිලියන 3,708 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 3,839 ක් දක්වා සියයට 3.5 කින් ඉහළ ගොස් ඇත. 2025 වසර අවසානයේ රු. බිලියන 3,229.8 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, බොහෝ දුරට වෙනසක් නොමැතිව 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 3,230 ක් ලෙස පැවතුනි. 2025 වසර අවසානයේ රු. බිලියන 1,731 ක් වූ ණය හා අත්තිකාරම්, 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 1,933 ක් දක්වා සියයට 11.7 කින් ඉහළ ගොස් ඇත. 2025 වසර අවසානය වන විට සියයට 7.66 ක් වූ බැංකුවේ අදියර III ණය අනුපාතය, 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 6.6 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ වාර්තා කරන ලද රු. බිලියන 37.8 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ මහජන බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 44.5 ක් දක්වා සියයට 17.7 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ශුද්ධ පොළී ආදායම රු.බිලියන 110.9 ක් දක්වා සියයට 20 කින් ඉහළ යාමයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2025 වසර අවසානය වන විට රු. බිලියන 1,831 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 1,880 ක් දක්වා ආන්තික වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වසර අවසානයේ රු. බිලියන 1,608 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 1,640 ක් දක්වා සියයට 2 කින් වර්ධනය වී ඇත. 2025 වසර අවසානය වන විට පැවති රු. බිලියන 551 ක් වූ ණය සහ අත්තිකාරම් 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 610 ක් දක්වා සියයට 10.7 කින් ඉහළ ගොස් ඇත. 2025 වසර අවසානය වන විට සියයට 2.52 ක් වූ අදියර III ණය අනුපාතය 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 2.1 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 30.6 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 30.1 ක් දක්වා සුළු වශයෙන් පහළ ගොස් ඇති අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කාර්ය මණ්ඩල වියදම් රු. බිලියන 18.8 ක් දක්වා සියයට 17.5 කින් ඉහළ යාමයි.

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 3.5 ක ආදායමක් වාර්තා කළ අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලැබූ රු. බිලියන 5 ට සාපේක්ෂව සියයට 30 ක අඩු වීමකි. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් ආයෝජන ආදායම සහ ලාභාංශ ආදායම අඩු වීම හේතු වී ඇත. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2026 වසරේ පළමු මාස අට තුළ රු බිලියන 2.9 බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු බිලියන 4.4 කි. ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් පිළිබිඹු කරමින් 2025 වසර අවසානය වන විට රු. බිලියන 133.4 ක් වූ මුළු වත්කම් 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට රු. බිලියන 135.5 ක් දක්වා ඉහළ ගොස් ඇත.

2026 වසරේ පළමු මාස අට සඳහා සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එහි රක්ෂණ පරිපාලිත සමාගම් දෙක හරහා මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කර ඇත. සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම විසින් බදු පෙර ලාභයේ ආන්තික වැඩි වීමක් පෙන්නුම් කරමින් 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 2.11 ට සාපේක්ෂව සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 2.14 ක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගමෙහි බදු පෙර ලාභය පසුගිය වසරේ දී වූ රු. බිලියන 2.8 සිට සියයට 7.1 කින් රු. බිලියන 2.6 ක් දක්වා අඩු වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් ශුද්ධ රක්ෂණ හිමිකම් සහ ප්‍රතිලාභ සියයට 41.7 කින් රු. බිලියන 10.2 ක් දක්වා ඉහළ යාම හේතු වී ඇත .

ලංකා විදුලිබල මණ්ඩලය සහ අනුප්‍රාප්තික සමාගම්

ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල කොටසක් ලෙස, සී/ස ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (පුද්ගලික) සමාගම, සී/ස ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (පුද්ගලික) සමාගම සහ සී/ස නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගම, විදුලිබල කර්මාන්තය තුළ තම තමන්ට පැවරී ඇති කාර්යයන් සී/ස එනර්ජි වෙන්චර්ස් ලංකා (පුද්ගලික) සමාගම සහ සී/ස සීර්බී එම්ප්ලෝයිස් ෆන්ඩ් (පුද්ගලික) සමාගම යන ආයතන සමඟ එක්ව, අඛණ්ඩව ඉටු කරමින් පවතී.

ලංකා විදුලිබල මණ්ඩලයට අදාළව නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගම වෙත පැවරී ඇති වගකීම් පියවීම සඳහා රජය විසින් ලබා දෙන රු. මිලියන 17,213 ක සහනාධාරය සැලකිල්ලට ගෙන, 2026 ජූලි මාසයේදී සිදු කරන ලද තෙවන කාර්තුවට අදාළ විදුලි ගාස්තු සමාලෝචනයේදී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉදිරි විදුලි ගාස්තු සංශෝධනය සිදු කරන තෙක් දැනට පවතින අවසාන පාරිභෝගික විදුලි ගාස්තු නොවෙනස්ව පවත්වාගෙන යාමට තීරණය කරන ලදී . 2025 වසරේ පළමු මාස අට තුළදී ජල විදුලිය, තාප විදුලිය (ගල් අඟුරු), සුළං සහ වහල මත සවිකරන සූර්ය බලශක්තිය ඇතුළත්

සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ තාප විදුලිය (ඉන්ධන) ලෙස 35:29:25:11 ක්ව පැවති උත්පාදන සංයුතියට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ උත්පාදන සංයුතිය 25:28:27:20 ලෙස වෙනස් වී ඇත. විදුලි ඉල්ලුමේ වර්ධනය පිළිබිඹු කරමින්, සමස්ත විදුලි උත්පාදනය 2025 වසරේ පළමු මාස අට තුළ පැවති ගිගාවොට් පැය 12,004 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ගිගාවොට් පැය 12,893 ක් දක්වා සියයට 7.4 කින් ඉහළ ගොස් ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ ජල විදුලි උත්පාදනය ගිගාවොට් පැය 4,169 සිට 3,225 දක්වා සියයට 22.6 කින් පහත වැටී ඇත. වහල මත සවිකරන සූර්ය බලශක්ති පද්ධතිවලින් සිදු වූ විදුලි උත්පාදනය ගිගාවොට් පැය 1,195 සිට 1,700 දක්වා ආසන්න වශයෙන් සියයට 42 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියද, ඉහළ ගිය විදුලි ඉල්ලුම සහ පහත වැටුණු ජල විදුලි උත්පාදනය යන කරුණු දෙකෙහි ඒකාබද්ධ බලපෑම පියවා ගැනීම සඳහා මෙම වර්ධනය ප්‍රමාණවත් වී නොමැත. එබැවින්, විදුලි සැපයුම් අවශ්‍යතාව සපුරාලීම සඳහා ඉන්ධන පදනම් කරගත් තාප විදුලි උත්පාදනය ගිගාවොට් පැය 1,341 සිට 2,543 දක්වා සියයට 89.6 කින් ඉහළ නැංවීමට සිදු විය.

2026 වසරේ පළමු මාස අට තුළ විදුලිය අලෙවියෙන් ලැබූ ආදායම සැලකිය යුතු ලෙස රු. බිලියන 325.4 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංකා විදුලිබල මණ්ඩලය වාර්තා කළ රු. බිලියන 271.5 ක ආදායමට සාපේක්ෂව සියයට 19.9 ක වර්ධනයකි. 2026 වසර සඳහා වාර්තා වූ මෙම ආදායමට, 2026 මාර්තු 09 දක්වා ලංකා විදුලිබල මණ්ඩලය උපයාගත් රු. බිලියන 80 ක ආදායම සහ ඉතිරි කාලසීමාව තුළ සී/ස ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (පුද්ගලික) සමාගම විසින් උපයාගත් රු. බිලියන 245.4 ක ආදායම ඇතුළත් වී ඇත. එසේම, 2026 ජනවාරි 01 සිට මාර්තු 09 දක්වා කාලසීමාව තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු. බිලියන 1.48 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

4.1 වගුව | විදුලි උත්පාදනය සහ ධාරිතාවයේ සංයුතිය

	2025 ජන.-අගෝ. විදුලි උත්පාදනය			2026 ජන.-අගෝ. (තාවකාලික) විදුලි උත්පාදනය		
	ස්ථාපිත ධාරිතාවය මෙ.වො.	සමස්ත උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස	ශුද්ධ උත්පාදනය- ගි.වො.පැ.	ස්ථාපිත ධාරිතාවය මෙ.වො.	සමස්ත උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස	ශුද්ධ උත්පාදනය- ගි.වො.පැ.
ලංවිම/ ඊජිඑල්-ජල විදුලිය	1,533	35	4,169	1,533	25	3,225
ලංවිම/ ඊජිඑල් - තාප විදුලිය- ඉන්ධන	801	7	849	801	11	1,326
තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් - ඉන්ධන	482	4	491	582	9	1,216
තාප විදුලිය - ගල් අඟුරු	900	29	3,466	900	28	3,635
සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ සුළං	945	15	1,834	1,286	14	1,791
වහල මත සවිකල සූර්ය පැනල	1,684	10	1,195	2,529	13	1,700
එකතුව	**6,345**	**100**	**12,004**	**7,631**	**100**	**12,893**

මූලාශ්‍ර: ලංකා විදුලිබල මණ්ඩලය සහ සී/ස ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (පුද්ගලික) සමාගම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2025 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 556.9 ක ශුද්ධ ආදායමට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ ආදායම රු. බිලියන 796.7 ක් දක්වා සියයට 43.1 කින් වැඩි වී ඇත. කෙසේවෙතත්, 2025 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ වූ රු. බිලියන 514.3 ට සාපේක්ෂව, විකුණුම් පිරිවැය රු. බිලියන 780.7 ක් දක්වා සියයට 51.8 කින් වැඩි වී ඇත. ශුද්ධ ආදායමේ වර්ධනයට වඩා විකුණුම් පිරිවැය ඉහළ යාම හේතුවෙන්, 2025 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 42.6 ක් වූ දළ ලාභය, සියයට 62.4 කින් රු. බිලියන 16.0 ක් දක්වා අඩු වී ඇත.

දළ ලාභය පහත වැටී තිබුණ ද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2025 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. බිලියන 13.4 ක මෙහෙයුම් ලාභය හා සැසඳීමේ දී, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ මෙහෙයුම් ලාභය රු. බිලියන 20.9 ක් දක්වා සියයට 56 කින් වැඩි වී ඇත. මැදපෙරදිග කලාපයේ පැවති ගැටුම් හේතුවෙන් සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයට සහ සමස්ත ආර්ථිකයට ඇතිවූ අහිතකර බලපෑම් අවම කිරීම සඳහා 2026 අප්‍රේල් සිට ජුනි දක්වා කාලපරිච්ඡේදය තුළ රජයෙන් ලබා දුන් රු. බිලියන 41 ක සහනාධාරය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2025 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රු. මිලියන 91.3 ක උපලබ්ධි වූ විනිමය ලාභයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රු. බිලියන 5.2 ක උපලබ්ධි වූ විනිමය අලාභයක් වාර්තා කර ඇත. 2025 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ උපලබ්ධි නොවූ රු. බිලියන 4.8 ක විනිමය ලාභයට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ උපලබ්ධි නොවූ රු. බිලියන 8.4 ක විනිමය ලාභය හේතුවෙන්, මෙම අලාභය අර්ධ වශයෙන් අවම වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 21.3 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ බදු පෙර ලාභය රු. බිලියන 28.9 ක් දක්වා සියයට 35.7 කින් වැඩි වී ඇත. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාර්තා කර ඇති ලාභයේ තිරසාරභාවය තක්සේරු කිරීමේදී, සහනාධාර ආදායමේ දායකත්වය සහ විනිමය අනුපාතවල වෙනස්වීම් සැලකිල්ලට ගත යුතුය.

ශ්‍රීලංකන් ගුවන් සමාගම

මූල්‍ය ප්‍රතිව්‍යුහගතකරණයට සහ මෙහෙයුම් තිරසාරභාවය ඉහළ නැංවීමට සහය වීම සඳහා රජය විසින් සිදු කරන ක්‍රියාමාර්ග පැවතිය ද, ශ්‍රීලංකන් ගුවන් සමාගමට සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ තවදුරටත් මූල්‍ය අභියෝගවලට මුහුණ දීමට සිදු විය. 2026/27 මූල්‍ය වසරේ පළමු මාස පහ තුළ ශ්‍රීලංකන් ගුවන් සමාගම රු. බිලියන 154.6 ක මුළු ආදායමක් වාර්තා කළ අතර, එය 2025/26 වසරේ සමාන කාලපරිච්ඡේයේ දී රු. බිලියන 114.6 ක් විය. කෙසේ වෙතත්, 2025/26 මූල්‍ය වසරේ පළමු මාස පහ තුළ වූ රු. බිලියන 118.6 ට සාපේක්ෂව මුළු වියදම රු. බිලියන 160.4 ක් දක්වා සියයට 35.2 කින් ඉහළ ගොස් ඇත. ගුවන් යානා ඉන්ධන පිරිවැය සියයට 78.2 කින් පමණ තියුණු ලෙස ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාගම රු. බිලියන 5.8 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. රු. බිලියන 7.1 ක මූල්‍ය වියදම සහ රු. බිලියන 11.9 ක විදේශ විනිමය අලාභ හේතුවෙන් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූල්‍ය කාර්යසාධනය තවදුරටත් බලපෑමට ලක්විය. එක් වරක් සිදු කරන ගැලපීමට පෙර ශ්‍රීලංකන් ගුවන් සමූහයේ ශුද්ධ අලාභය රු. බිලියන 20.3 ක් වූ අතර, රු. බිලියන 11.4 ක් වූ රෝල්ස්-රොයිස් සමාගම විසින් රඳවා තැබූ වට්ටම් සහ අත්හිටුවා තැබූ බැරකම් ආපසු ගැලපීම හේතුවෙන්, එම අලාභය රු. බිලියන 8.9 ක් දක්වා අඩු විය.

2024 වසරේ දී කල් පිරුණු ඇ. ඩො. මිලියන 175 ක ස්වෛරීත්ව බැඳුම්කරය ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළුව, ගුවන් සමාගමේ හිඟහිටි මූල්‍ය බැඳීම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය විසින් අඛණ්ඩව පහසුකම් සලසන ලදී. ගුවන් සමාගමේ ණය ගැටළුව විසඳීම සඳහා 2025 වසරේ දී ආරම්භ කළ බේරුම්කරණ වැඩපිළිවෙළ හරහා පැරණි ණය නිරාකරණය කිරීම සඳහා පියවර ගනු ලැබූ අතර, කඩිනම් මෙහෙයුම් සහ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා ඇ. ඩො. මිලියන 30 ක කෙටිකාලීන මූල්‍ය සහායක් ද ලබා දෙන ලදී. ශ්‍රීලංකන් ගුවන් සමාගම සඳහා දිගුකාලීන ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාමාර්ග අනුගමනය කරන අතරතුර එහි මූල්‍යමය බාධාවන් ලිහිල් කරමින් මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම මෙම මැදිහත්වීම් තුළින් අපේක්ෂා කෙරේ.

තවද, 2026 ජූනි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රීලංකන් ගුවන් සමාගම සඳහා උපායමාර්ගික සමාලෝචනයක් සිදු කර ප්‍රතිව්‍යුහගතකරණ රාමුවක් සකස් කිරීම සඳහා ඉහළ මට්ටමේ කමිටුවක් පත්කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. මෙම කමිටුව විසින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, මූල්‍ය තිරසාරත්වය ශක්තිමත් කිරීම සහ ගුවන් සේවය රජයේ අඛණ්ඩ සහාය මත යැපීම අඩු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගැනීම අපේක්ෂා කෙරේ.

මේ අතර, 2026 වසරේ දී මැද පෙරදිග උත්සන්න වූ ආතතීන් හේතුවෙන්, ගුවන් මෙහෙයුම් අවහිර වීම, ගුවන් අවකාශය සීමා වීම, ගුවන් මාර්ග

වෙනස් කිරීමට බලපෑම් ඇතිවීම සහ මෙහෙයුම් පිරිවැය ඉහළ යාම මගින් ජාත්‍යන්තර ගුවන් සේවා ක්ෂේත්‍රයේ අවිනිශ්චිතතාවය වැඩි විය. මැද පෙරදිග ගුවන් මාර්ග ශ්‍රීලංකන් ගුවන් සමාගම කෙරෙහි ඇති වැදගත්කම හේතුවෙන්, එම කලාපයේ වත්මන් අස්ථාවරත්වය සමාගමේ මෙහෙයුම් සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි තවදුරටත් පීඩනයක් ඇති කරන ලදී. ගුවන් සමාගමේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමට සහ රජය මත ඇති විය හැකි රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීම සඳහා, තිරසර ප්‍රතිව්‍යුහගතකරණය, විවක්ෂණශීලී මුදල් ප්‍රවාහ කළමනාකරණය සහ වැඩි දියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාව අත්‍යවශ්‍ය වේ.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 56.1 ක ආදායමට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 58.7 ක ආදායමක් වාර්තා කර ඇති අතර, එය සියයට 4.6 ක වර්ධනයකි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ විශේෂයෙන්ම විදුලි ගාස්තු ඉහළ යාම හේතුවෙන් ජලය පොම්ප කිරීමේ පිරිවැය වැඩි වීම හේතුවෙන් 2026 වසරේ පළමු මාස අට තුළ විකුණුම් පිරිවැය රු. බිලියන 20.4 සිට රු. බිලියන 22.7 දක්වා සියයට 11.3 කින් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වසරේ එම කාලසීමාව තුළ වාර්තා වූ රු. බිලියන 35.7 ක දළ ලාභයට සාපේක්ෂව, 2026 වසරේ පළමු මාස අට තුළ දළ ලාභය සුළු වශයෙන් රු. බිලියන 35.9 ක් දක්වා ඉහළ ගොස් ඇත. දළ ලාභයේ සුළු වර්ධනයක් තිබියදීත්, 2025 වසරේ පළමු මාස අට තුළ වූ රු. බිලියන 25.2 ක බදු පෙර ලාභයට සාපේක්ෂව, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ මණ්ඩලයේ බදු පෙර ලාභය රු. බිලියන 24 ක් දක්වා සියයට 4.8 කින් පහත වැටී ඇත.

2026 වසරේ පළමු මාස අට තුළදී, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නව ජල සම්බන්ධතා 77,243 ක් පද්ධතියට එක් කර ඇති අතර, ඒ අනුව 2026 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත ජල සම්බන්ධතා සංඛ්‍යාව මිලියන 3.33 ක් දක්වා ඉහළ ගොස් ඇත. මේ අතර, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2025 වසරේ පළමු මාස අට තුළ නිෂ්පාදනය කළ ජලය ඝන මීටර් මිලියන 568 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජලය ඝන මීටර් මිලියන 594 ක් නිෂ්පාදනය කර ඇත. තවද, 2025 වසරේ එම කාලසීමාව තුළ අලෙවි කළ ජලය ඝන මීටර් මිලියන 429 ට සාපේක්ෂව, 2026 වසරේ පළමු මාස අට තුළ ජලය ඝන මීටර් මිලියන 448 ක් අලෙවි කර ඇත. තවද, සමාලෝචනයට ලක් කළ කාලසීමාව තුළ ආදායම් නොලබන ජලය ප්‍රතිශතය සියයට 24.52 සිට සියයට 24.57 දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක්ව ඇත.

2026 වසරේ පළමු මාස අට තුළ දී, ණය ආපසු ගෙවීම සහ ජල සම්පාදන ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම සඳහා සහාය වීම පිණිස මහා භාණ්ඩාගාරය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත හිමිකම් දායකත්වය ලෙස රු. බිලියන 10.8 ක් මුදලක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

2025 වසරේ පළමු මාස අට තුළ දී හසුරවන ලද අඩි විස්සේ සමාන බහාලුම් ඒකක මිලියන 5.43 හා සසඳන විට සියයට 10.3 ක වර්ධනයක් සමඟින් 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ කොළඹ වරාය අඩි විස්සේ සමාන බහාලුම් ඒකක මිලියන 5.99 ක් හසුරවමින් 2026 වසර තුළ ද සිය අඛණ්ඩ වර්ධනය පවත්වාගෙන ගොස් ඇත. ප්‍රතිනැව්ගත කිරීමේ මෙහෙයුම් අඩි විස්සේ සමාන බහාලුම් ඒකක මිලියන 4.83 ක් දක්වා සියයට 10.9 කින් ඉහළ යාම මෙම වර්ධනයට මූලිකවම හේතු වී ඇත.

වරාය ක්‍රියාකාරකම්වල වර්ධනය පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2026 වසරේ පළමු මාස අට තුළ මූල්‍ය කාර්යසාධනයේ වර්ධනයක් වාර්තා කර ඇත. මුළු ආදායම රු. බිලියන 61.0 ක් දක්වා සියයට 10.3 කින් ඉහළ ගිය අතර, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී මුළු ආදායම රු. බිලියන 55.3 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙහෙයුම් ලාභය රු. බිලියන 37.3 සිට රු. බිලියන 40.3 ක් දක්වා ඉහළ ගිය අතර, බදු පෙර ලාභය රු. බිලියන 39.2 සිට රු. බිලියන 43.2 ක් දක්වා ඉහළ ගොස් ඇත.

වරායේ ධාරිතාව, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ජාත්‍යන්තර තරඟකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ පියවර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාකර ඇත. බහාලුම් හැසිරවීමේ යටිතල පහසුකම් පුළුල් කිරීම, ප්‍රධාන නාවික සමාගම් සමඟ සම්බන්ධ වීම සහ අඛණ්ඩව සිදුවන වරාය නවීකරණ ක්‍රියාවලිය මඟින් අනාගත භාණ්ඩ හා බහාලුම් හැසිරවීම් වර්ධනයට සහාය වීම සහ කොළඹ වරාය කලාපය ප්‍රතිනැව්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස තවදුරටත් ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. යටිතල පහසුකම්, ඩිජිටල්කරණය සහ ගුණාත්මක සේවා සඳහා වන අඛණ්ඩ ආයෝජනය, ඉහළ යන ධාරිතාවයන් සහ කොළඹ වරායේ තරඟකාරීත්වය පවත්වාගෙන යාම සඳහා වැදගත් වනු ඇත. මේ අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී මැද පෙරදිග උත්සන්න වූ ආතතීන් ජාත්‍යන්තර නාවික සහ සමුද්‍රීය වෙළෙඳාම තුළ අවිනිශ්චිතතාවය වැඩි කරන ලදී. නාවික මාර්ගවලට සිදුවන බාධා, ඉහළ සමුද්‍ර ඉන්ධන පිරිවැය, නැව් මාර්ග තීරණවල වෙනස්කම් සහ ඉහළ යන සමුද්‍ර ආරක්ෂක අවදානම්

මඟින්, නැව් ගමනාගමනය, නාවික ප්‍රවාහන පිරිවැය සහ ගෝලීය වෙළෙඳ ප්‍රවාහයන්ට බලපෑම් සිදුවිය හැකිය. එවැනි කලාපීය නැව් මාර්ගවල සිදුවන වෙනස්කම් සහ ප්‍රතිනැවිගත කිරීමේ ඉල්ලුම හරහා කොළඹ වරායට නව අවස්ථා ද ජනිත විය හැකිය. ඒ අනුව, භූ-දේශපාලනික වෙනස්කම් සහ එමඟින් නාවික රටා, මෙහෙයුම් පිරිවැය සහ භාණ්ඩ පරිමාවන් කෙරෙහි ඇති වන බලපෑම් අධීක්ෂණය කිරීම, මතුවන අවදානම් කළමනාකරණය කිරීමේ දී තවදුරටත් වැදගත් වනු ඇත.

භාණ්ඩ හා බහාලුම් මෙහෙයුම වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය ඉහළ නැංවීම සහ ජාත්‍යන්තර නාවික සමාගම් සමඟ සම්බන්ධතාවය ශක්තිමත් කිරීම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම 2026 වසරේ පළමු මාස අට තුළ ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇත. මුළු ආදායම රු. බිලියන 35.8 ක් ලෙස සැලකිය යුතු වෙනසකින් තොරව පැවතුණි. මුළු මෙහෙයුම් වියදම් රු. බිලියන 14.9 ක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රු. බිලියන 20.9 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කළ අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට අනුරූප විය. විනිමය අනුපාත වෙනස්වීම්හි ප්‍රතිලාභ ලෙස, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම 2025 වසරේ පළමු මාස අට තුළ ලැබූ රු. බිලියන 2.5 ක විනිමය අලාභයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 3.5 ක විනිමය ලාභයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම 2026 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 28.6 ක බදු පෙර ලාභයක් වාර්තා කළ අතර, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වූ රු. බිලියන 22 ක බදු පෙර ලාභයට සාපේක්ෂව සියයට 30 ක වැඩිවීමකි.

සමාලෝචනය කරනු ලබන කාලපරිච්ඡේදය තුළදී, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් සම්බන්ධතා ශක්තිමත් කිරීමට සහ ගුවන්තොටුපළ සේවා වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ පියවර ගෙන ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ස්වයංක්‍රීය දේශසීමා පාලන ඉලෙක්ට්‍රොනික දොරටුවක් හඳුන්වාදීම මගී නිශ්ක්‍රාමණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ගනු ලැබූ තවත් පියවරක් වේ. එයට අමතරව, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් අභිලාශ ප්‍රකාශයක් නිකුත් කළ අතර, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ගුවන් සේවා, ප්‍රවාහන හා සැපයුම්, භාණ්ඩ ප්‍රවාහන සහ ඊට අදාළ වාණිජ කටයුතු සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ආයෝජකයින් හමුවීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

කෙසේ වෙතත්, 2026 වසර තුළ මැද පෙරදිග උත්සන්න වූ ආතතීන් මඟින් ගුවන් ගමන් කාලසටහන්, ගුවන් අවකාශයේ ලබාගත හැකි බව, මගී චලනයන් සහ ගුවන් සේවා මෙහෙයුම් පිරිවැය සඳහා විභව බලපෑම් ඇති කරමින් ගෝලීය ගුවන් සේවා ක්ෂේත්‍රය තුළ අවිනිශ්චිතතාවයක් ඇති කළේය. මෙම තත්ත්වය ගුවන්තොටුපළ මගී සහ ගුවන් යානා ගමනාගමනයට මෙන්ම මගීන්ට අදාළ වාණිජ ක්‍රියාකාරකම් ඇතුළුව ගුවන් සේවා සහ ගුවන් සේවා නොවන වාණිජ සේවා සඳහා ඇති ඉල්ලුමට බලපෑම් කළ හැකිය. ඒ අනුව, ජාත්‍යන්තර ගුවන් සේවා ක්ෂේත්‍රයේ ප්‍රවණතා සහ එමඟින් මගී සහ ගුවන් යානා ගමනාගමනය කෙරෙහි ඇති කරන බලපෑම් අඛණ්ඩව අධීක්ෂණය කිරීම ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ කාර්යසාධනය ඇගයීම සඳහා තවදුරටත් වැදගත් වේ.

4.2 වගුව | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බදු පෙර ලාභය

රු. මිලියන

	රාජ්‍ය ව්‍යවසාය	2024 තක්ෂ	2025 (තාවකාලික)	2026 (ජන.-අගෝ.) (තාවකාලික)
1	ලංකා බැංකුව	106,904	120,827	82,805
2	මහජන බැංකුව	41,584	64,409	44,531
3	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	26,268	44,493	30,107
4	රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව	158	737	585
5	නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව***	64	10	205
6	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	3,210	5,830	4,677
7	සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය	63,177	68,510	49,468
8	සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	3,546	6,891	2,918
9	ජාතික රක්ෂණ භාර අරමුදල	16,442	9,391	15,135
10	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	560	592	723
11	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	-3,182	-1,907	536
12	ලංකා විදුලිබල මණ්ඩලය**	141,605	-38,740	1,479
13	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	34,188	36,461	28,893
14	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	46,349	57,246	43,158
15	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	23,833	31,604	23,980
16	සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම	28,671	33,658	28,648
17	සීමා සහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම*	-7,595	-23,211	-12,640
18	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	547	4,312	480
19	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	-773	-899	-182
20	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	607	395	60
21	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව[අ]	-1,217	-565	-259
22	සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම	-64	1,410	1,468
23	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	396	-143	380
24	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	-69	-35	-73
25	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	-229	-222	-65
26	සීමා සහිත කුරුණෑගල වැවිලි සමාගම	415	635	332
27	සීමා සහිත හලාවත වැවිලි සමාගම	219	650	301
28	සීමා සහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව*	-7	84	30
29	ශ්‍රී ලංකා කජු සංස්ථාව	14	17	2
30	සීමා සහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම	-77	649	88
31	සීමා සහිත ලංකා පොස්පේට් සමාගම*	465	459	121
32	සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම*	-1	14	-18
33	සංවර්ධන ලොතරැයි මණ්ඩලය	4,197	7,487	7,149
34	ජාතික ලොතරැයි මණ්ඩලය	6,203	8,177	7,207
35	රාජ්‍ය ඖෂධ සහ නිෂ්පාදන සංස්ථාව	3,083	2,478	2,083
36	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	183	276	99
37	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	2,474	3,772	1,694
38	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	552	363	1,028
39	සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය	3	62	-55
40	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	-247	-191	-199
41	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	-176	-203	-90
42	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	25	35	4
43	රාජ්‍ය දැව සංස්ථාව	825	1,139	153
44	සීමා සහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව*	370	429	146
45	සීමාසහිත ලංකා සතොස සමාගම	-776	-536	-71
46	රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව	284	145	-218
47	ලංකා ධීවර සංස්ථාව[අ]	-53	132	1
48	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	-101	-376	276
49	සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම	-268	139	64
50	සීමා සහිත ලංකා සීනි සමාගම	-1,944	-3,193	-535
51	සීමා සහිත ලංකා පොහොර සමාගම[ආ]	118	-	-
52	සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම[ආ]	555	-	-
53	සීමා සහිත රාජ්‍ය පොහොර සමාගම*		723	279
	එකතුව	**541,316**	**444,421**	**366,889**

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

[අ] තාවකාලික

[ආ] මෙම සමාගම් දෙක ඒකාබද්ධ කිරීමෙන් රාජ්‍ය පොහොර සමාගම සංස්ථාගත කරන ලදී.

**2026 අප්‍රේල් - අගෝස්තු*

***2026 සඳහා, 2026.01.01 සිට 2026.03.09 දක්වා කාලය සඳහා බදු පෙර ලාභය*

****2026 ජනවාරි - ජූනි*

4.3 වගුව | රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු / ලාභාංශ ආදායම

රු. මිලියන

රාජ්‍ය ව්‍යවසාය	තත්‍ය			පුරෝකථන	
	2024	2025	31.08.2026 දක්වා	2027	2028
අයබදු	**33,190**	**47,332**	**16,002**	**50,286**	**50,505**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	-	6,088	-	6,000	6,000
ලංකා බැංකුව	-	5,000	-	5,000	5,000
මහජන බැංකුව	-	2,000	1,550	3,500	3,500
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	-	-	500	500
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	-	6,000	-	7,000	7,000
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	9,000	3,000	5,000	10,000	10,000
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	-	200	-	1,000	1,000
රාජ්‍ය දැව සංස්ථාව	-	585	100	250	250
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව	300	779	200	535	588
ජාතික රක්ෂණ භාර අරමුදල	2,919	4,973	602	2,000	2,000
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	1,468	1,688	185	100	100
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	25	145	115	50	50
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	928	1,150	-	1,269	1,396
ජාතික ලොතරැයි මණ්ඩලය	1,060	1,250	630	750	850
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	13	269	75	129	150
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	300	150	-	342	377
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	-	15	5	10	10
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	500	1,000	2,000	525	525
සිවිල් ගුවන් සේවා අධිකාරිය	750	1,000	100	350	350
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	100	487	400	890	699
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	850	280	150	325	350
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	-	5,000	-	825	825
ජාතික ගමනාගමන කොමිෂන් සභාව	250	300	250	300	300
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	-	275	250	45	45
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන අධිකාරිය	-	100	-	50	50
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	607	2,000	3,607	6,967	6,967
ජාතික ඖෂධ නියාමන අධිකාරිය	880	751	300	475	475
මාර්ග සංවර්ධන අධිකාරිය	1,749	2,128	-	-	-
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම	15	100	-	1	1
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	-	10	15	10	10
ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය	85	30	50	105	110
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	5	76	-	65	65
පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය	4	30	28	28	30
වෙනත් රාජ්‍ය ව්‍යවසායයන්	11,381	474	391	890	932
ලාභාංශ	**7,890**	**9,211**	**3,913**	**16,585**	**16,970**
සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	1,271	1,987	4	2,000	2,200
සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම	1,286	2,931	-	6,622	6,622
සීමා සහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම	158	-	-	200	200
සීමා සහිත ලංකා පොස්පේට් සමාගම	75	125	-	100	100
සීමා සහිත ලංකා ලේලන්ඩ් සමාගම	-	14	-	9	9
සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම	75	-	111	100	100
සීමා සහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම)	-	30	40	75	75
සීමා සහිත ලංකා පොහොර සමාගම	15	-	-	-	-
සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	30	-	-	-	-
සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගම	131	33	-	90	126
සීමා සහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව	50	116	-	90	101
සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම	-	227	680	230	230
සීමා සහිත ඩි ලා රූ ලංකා (පුද්ගලික) සමාගම	1,324	494	-	510	510
සීමා සහිත ලංකා විදුලිබල සමාගම	436	436	-	440	440
සීමා සහිත ලංකා කාර්මික වතු සමාගම	98	101	-	-	-
සීමා සහිත ලංකා කෘෂිකර්මාන්ත සමාගම	202	226	131	-	-
වැවිලි සමාගම්	559	214	264	421	433
සීමා සහිත රාජ්‍ය පොහොර සමාගම	-	65	181	60	124
සීමා සහිත ලංකා ත්‍රිපෝෂ සමාගම	100	123	-	100	100
වෙනත් රාජ්‍ය ව්‍යවසායයන්	2,080	2,090	2,503	5,538	5,600
එකතුව	**41,080**	**56,543**	**19,916**	**66,871**	**67,475**

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

05

2027 අයවැය සැකසීම සඳහා යොදා ගත් පදනම

5.1 සමාලෝචනය

2027 වසරේ අයවැයෙහි සාර්ව ආර්ථික සහ රාජ්‍ය මූල්‍ය ඇස්තමේන්තු, අයවැය සකස් කරන අවස්ථාවේ දී සිදු කරන ලද උපකල්පන, විශ්ලේෂණ හා විනිශ්චයන් මත පදනම් වේ. මෙම කොටස මඟින්, දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය, සේවා වියුක්තිය සහ විදේශ අංශය ඇතුළු ආදායම් හා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා සලකා බලනු ලබන ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක ගෙනහැර දක්වයි. තවද, එය ගෝලීය, මූල්‍ය අංශයේ සහ ශ්‍රම වෙළෙඳපොළේ වර්ධනයන් ආවරණය කරන අතර, ඇස්තමේන්තුවල සංවේදීතාවයන් ද ඉස්මතු කරයි.

5.2 දළ දේශීය නිෂ්පාදිතය

ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඇ.ඩො. 5,000 ඉක්මවා යමින්, ශ්‍රී ලංකාවේ ආර්ථිකය අඛණ්ඩව දෙවන වසරටත් 2025 වසරේ දී සියයට 5.0 කින් වර්ධනය විය. 2025 වසරේ අගභාගයේ දී ඇති වූ දිට්වා සුළි කුණාටුව සහ 2026 වසරේ පෙබරවාරි මාසයේ සිට ආරම්භ වූ මැදපෙරදිග ගැටුම යන ද්විත්ව කම්පනයන් මධ්‍යයේ වුව ද, 2026 වසරේ පළමු භාගයේ දී සාමාන්‍ය වශයෙන් සියයට 4.7 ක ආර්ථික වර්ධනයක් වාර්තා කරමින්, ආර්ථිකය පළමු කාර්තුවේ දී සියයට 5.1 කින් සහ දෙවන කාර්තුවේ දී සියයට 4.2 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් ඉන්ධන සැපයුම අඩාල වීම සහ කෘෂිකර්මාන්තයේ සියයට 2.3 ක සංකෝචනය හේතුවෙන් දෙවන කාර්තුවේ වර්ධනය මධ්‍යස්ථ වූ අතර, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් අංශයේ ප්‍රමුඛතාවයෙන් කර්මාන්ත අංශය සියයට 7.3 කින් ප්‍රසාරණය විය. සුළි කුණාටුවෙන් පසු සිදු කෙරුණු ප්‍රතිසංස්කරණ, දේශීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම සහ බලශක්ති සැපයුම සාමාන්‍යකරණය වීම මඟින්, මූලික තත්ත්වයන් යටතේ 2026 වසරේ දී ඇස්තමේන්තුගත සියයට 3.8 ට සාපේක්ෂව 2027 වසරේ දී ආර්ථිකය සියයට 4.0 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දිට්වා සුළි කුණාටුවෙන් සහ දිගු කාලීන වියළි කාලගුණයෙන් සිදුවූ හානි වලින් පසු කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය වන්නේ, අපනයන ඉලක්ක කරගත් අගය එකතු කළ අංශයක් බවට සංවර්ධනය කරන අතරම, එම අංශයේ ඵලදායිතාවය, තරඟකාරීත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව යථා තත්ත්වයට පත් කිරීම හා ඉහළ නැංවීමයි. වාරිමාර්ග යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම, ගුණාත්මක බීජ සැපයීම, ජල සම්පත් කාර්යක්ෂමව භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ ගෝලීය මිල ගණන් ඉහළ මට්ටමක පවතින පසුබිමක සහනදායී මිලකට පොහොර නියමිත කාලයේ දී ලබාගැනීමට හැකිවීම තහවුරු කිරීම මෙහි මූලික ක්‍රියාමාර්ග අතරට ඇතුළත් වේ. හානියට පත් පොදු යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ ද.දේ.නි. යෙන් සියයට 5.1 ක් වන රාජ්‍ය ආයෝජන මඟින්, කර්මාන්ත අංශය, විශේෂයෙන් ඉදිකිරීම් අංශය, පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිෂ්පාදන අංශය ද අපනයන විවිධාංගීකරණයෙන් සහ අගය එකතු කිරීමෙන් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ද.දේ.නි.යෙන් විශාලතම කොටස නියෝජනය කරන සේවා අංශය, මූල්‍ය, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, වෙළඳ සහ දේපළ වෙළඳාම් අංශවල වර්ධනයේ දායකත්වයෙන් අඛණ්ඩව ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වර්ධනය, රටේ සංවර්ධන උපාය මාර්ගයේ ප්‍රධාන තීරණාත්මක පදනමක් වන ඩිජිටල් ආර්ථිකයේ වේගවත් වර්ධනයත් සමඟ තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මූලාශ්‍ර වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම සහ සංචාරකයන්ගේ ආරක්ෂාව සහ තෘප්තිය සහතික කිරීමේ පියවරයන් ශක්තිමත් කිරීම මඟින් කලාපීය අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ වුවද සංචාරක ඉපයීම් ස්ථාවරව පවත්වාගෙන යාම කෙරෙහි රජයේ අවධානය තවදුරටත් යොමුව පවතී.

5.3 පාරිභෝගික මිල ගණන්

2026 වසරේ මාර්තු මස අගදී සියයට 2.2 ක් ලෙස පැවති මතුපිට උද්ධමනය, 2026 වසර මධ්‍යයේ සිට සියයට 5 ක ඉලක්කගත මට්ටමට වඩා ඉහළ යමින්, 2026 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 8.3 දක්වා ළඟා විය. මැද පෙරදිග ගැටුමෙන් පසු ඉහළ ගිය ගෝලීය ඛනිජ තෙල් මිල ගණන්, දේශීය ඉන්ධන මිල සහ විදුලි ගාස්තු අනුක්‍රමිකව සංශෝධනය කිරීම සහ කෘෂිකර්මාන්තයේ සැපයුම් අඩාල වීම මෙම වැඩිවීමට හේතු විය. 2026 වසරේ ඔක්තෝබර් මස වන විට, ආහාර උද්ධමනය සියයට 8.8 ක් ද, ආහාර නොවන උද්ධමනය සියයට 8.0 ක් ද, මූලික උද්ධමනය සියයට 5.6 ක් ද විය. මෙයට ප්‍රතිචාර වශයෙන් මහ බැංකුව 2026 වසරේ මැයි මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) සියයට 8.75 දක්වා පදනම් අංක 100 කින් ඉහළ නැංවීය.

දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, විවක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මැද පෙරදිග ගැටුමේ බලපෑම් පහව යාමේ හේතුවෙන්, උද්ධමනය 2027 වසරේ දෙවන භාගයේ දී ක්‍රමයෙන් සියයට 5 ඉලක්කය කරා අඩු වීමට පෙර කෙටි කාලීනව එම ඉලක්කයට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය 2027 වසරේ දී සියයට 4.0 ක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂිතය. මෙම ඉදිරි දැක්ම ගෝලීය බලශක්ති සහ භාණ්ඩ මිල ගණන් ක්‍රමයෙන් සාමාන්‍යකරණය, සුළි කුණාටුවෙන් සහ වියළි කාලගුණයෙන් යථා තත්ත්වයට පත්වීමෙන් පසු හිතකර කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අඛණ්ඩ විනිමය අනුපාත ස්ථාවරත්වය උපකල්පනය කරයි.

5.4 සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතය 2024 වසරේ දී වූ සියයට 4.4 සිට 2025 වසරේ දී සියයට 3.9 දක්වා අඩු විය. කෙසේ වුව ද, එය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 3.8 ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 4.0 ක් දක්වා සුළු වශයෙන් ඉහළගොස් ඇත. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ සියයට 31.7 ට සාපේක්ෂව 2026 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 32.7 දක්වා සුළු වශයෙන් ඉහළ ගිය ද, අඛණ්ඩ අඩු කාන්තා සහභාගීත්වය සහ බාහිර ශ්‍රම සංක්‍රමණය පිළිබිඹු කරමින් තවදුරටත් අඩු මට්ටමක පැවතුණි.

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම, සුළි කුණාටුවෙන් පසු ප්‍රතිසංස්කරණ සහ කර්මාන්ත හා සේවා අංශවල අපේක්ෂිත ප්‍රසාරණය හේතුවෙන් 2027 වසරේ දී සේවා වියුක්ති අනුපාතය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජය විසින් විශේෂයෙන් කාන්තාවන් සහ තරුණයින් අතර ශ්‍රම බලකා සහභාගීත්වය දිරි ගැන්වීම සඳහා ඉලක්කගත ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත.

5.5 විදේශීය අංශය

2025 වසරේදී ඇ.ඩො. බිලියන 1.7 ක ජංගම ගිණුම් අතිරික්තයක් වාර්තා කරමින් අඛණ්ඩව තෙවන වසරටත් වාර්තා වූ වාර්ෂික අතිරික්තයෙන් අනතුරුව, මැදපෙරදිග ගැටුම හේතුවෙන් 2026 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශ අංශය පීඩනයට ලක් විය. ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ ඇ.ඩො. මිලියන 2,047.0 ක අතිරික්තයට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස අට තුළ ජංගම ගිණුමෙහි ඇ.ඩො. මිලියන 290.6 ක හිඟයක් වාර්තා විය. ඉන්ධන ආනයනය ඇ.ඩො. මිලියන 4,072 දක්වා සියයට 61.6 කින් ඉහළ ගිය අතර, එමඟින් 2026 වසරේ මුල් මාස අට තුළ භාණ්ඩ වෙළඳ හිඟය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ ඇ.ඩො. බිලියන 4.3 සිට ඇ.ඩො. බිලියන 7.2 දක්වා පුළුල් විය.

සංචාරක ඉපැයීම් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වූ ඇ.ඩො. මිලියන 2,290.0 ට සාපේක්ෂව 2026 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ඇ.ඩො. මිලියන 2,061.1 ක් දක්වා සියයට 10.0 කින් පහත වැටී ඇත. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ශක්තිමත් ලෙස අඛණ්ඩව වර්ධනය වෙමින්, 2026 වසරේ මුල් මාස අට තුළ ඇ.ඩො. මිලියන 6,131.0 ක් දක්වා සියයට 19.8 කින් වර්ධනය වූ අතර, භාණ්ඩ අපනයනය ඇ.ඩො. මිලියන 9,376.9 ක් දක්වා සියයට 3.3 කින් වර්ධනය විය. දළ නිල සංචිත 2026 වසරේ අගෝස්තු මස අග වන විට ඇ.ඩො. බිලියන 6.9 ක් වූ අතර, 2026 වසරේ සැප්තැම්බර් මස අග වන විට ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල වසරේ මේ දක්වා කාලය තුළ සියයට 6.3 කින් අවප්‍රමාණය වී ඇත.

ගෝලීය බලශක්ති මිල ගණන් සාමාන්‍යකරණය වීම සහ සංචාරක ඉපැයීම් හා සේවක ප්‍රේෂණ අඛණ්ඩව ශුද්ධ ගලා ඒම් සඳහා සහාය වීම හේතුවෙන් 2027 වසරේ දී විදේශ අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සරල, විනිවිදභාවයෙන් යුතු සහ පුරෝකථනය කළ හැකි තීරු බදු රාමුවක් ස්ථාපිත කිරීම අරමුණු කරගත් ජාතික තීරු බදු ප්‍රතිපත්තිය සහ ජාතික අපනයන සංවර්ධන සැලැස්මට (2025–2029) සමගාමීව භාණ්ඩ හා සේවා අපනයන පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වැඩිදියුණු වූ විදේශ ශේෂයන්, අඛණ්ඩ සංචිත ගොඩනැඟීම සහ ශක්තිමත් වූ වෙළඳපොළ විශ්වාසය පිළිබිඹු කරමින් 2027 වසරේ දී විනිමය අනුපාතය පුළුල් ලෙස ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5.6 මුදල් සමස්තයන්

උද්ධමනය සියයට 5 ඉලක්කය කරා නැවත ගෙන ඒමේ මහ බැංකුවේ අරමුණට අනුකූලව මුදල් සැපයුම යෝග්‍ය මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. 2027 වසරේ දී ආදායම් සහ ප්‍රදානයන් ද.දේ.නි. යෙන් සියයට 15.8 ක් ලෙසත් අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 3.8 ක් ලෙසත් පුරෝකථනය කර ඇති බැවින්, රජයේ දළ මූල්‍යයන අවශ්‍යතා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙමඟින් දේශීය පොලී අනුපාත මත ඇතිවන පීඩනය අවම කර පෞද්ගලික අංශයේ ණය සහ ආයෝජන සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කරනු ඇත.

5.7 ආදායම

මෝටර් රථ ආනයනය නැවත ආරම්භ කිරීමත් සමඟ ලැබුණු එක් වරකට පමණක් සීමා වූ ආදායම් ලැබීම් වලින් පසු ආදායම් සාමාන්‍යකරණය වීම පිළිබිඹු කරමින්, 2027 වසරේ දී මුළු ආදායම ද.දේ.නි. යෙන් සියයට 15.8 ක් ලෙසත් බදු ආදායම ද.දේ.නි. යෙන් සියයට 14.6 ක් ලෙසත් ඇස්තමේන්තු කර ඇත. මධ්‍ය කාලීන ආදායම් උපාය මාර්ගය (2027–2031) යටතේ ප්‍රධාන වශයෙන් ආදායම් පරිපාලන පියවරයන් මඟින් ආදායම් වර්ධනය අපේක්ෂා කෙරේ. ආදායම් ඇස්තමේන්තුවලට පාදක වන උපකල්පන ඇමුණුම III හි විස්තර කර ඇත.

5.8 වියදම

2027 වසරේ අයවැයේ වියදම් ඇස්තමේන්තු, ද.දේ.නි. යෙන් සියයට 12.9 ක් එනම් රුපියල් බිලියන 5,030 ක් වන ප්‍රාථමික වියදම් සීමාව ඇතුළත සකස් කර ඇත. කෙසේ වුවද, 2027 වසරේ අයවැය සඳහා වන පරිපූරක ඇස්තමේන්තුවට ඇතුළත් කෙරෙන, දිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිසංස්කරණ සහ

පුනරුත්ථාපන කටයුතු වලට අදාළව උපයෝජනය නොවූ ප්‍රතිපාදන 2026 වසරේ සිට 2027 වසර දක්වා නැවත වෙන් කිරීම හේතුවෙන් මෙම සීමාව ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ඇස්තමේන්තු පහත සඳහන් කරුණු මත පදනම් වේ.

- **වැටුප් සහ වේතන:** ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ දළ වශයෙන් මිලියන 1.3 ක සේවක සංඛ්‍යාවක් සහිත රාජ්‍ය අංශයේ ශ්‍රම බලකාය මතය. 2027 වසරේ නව බඳවා ගැනීම් හරහා රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ නොයනු ඇතැයි උපකල්පනය කෙරේ. 2025 වසරේ අයවැයෙන් යෝජනා කරන ලද වැටුප් සංශෝධනයේ අවසන් අදියර සමඟ වාර්ෂික වැටුප් වර්ධකයන් ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇත.

- **විශ්‍රාම වැටුප් ගෙවීම්:** ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ 762,570 ක් වන ඇස්තමේන්තුගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව සහ 2025 වසරේ අයවැය හා 2026 වසරේ අයවැය මඟින් යෝජිත විශ්‍රාම වැටුප් ගැලපීම් මත වේ.

- **පොලී ගෙවීම්:** ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම සහ ණය ප්‍රමාණය අඩු වීම පිළිබිඹු කරමින් 2027 වසරේ දී පොලී වියදම ද. දේ. නි.යේ ප්‍රතිශතයක් ලෙස 2026 වසරේ දී වූ සියයට 7.3 සිට සියයට 6.8 දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2026 වසරේ දී මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමෙන් පසු ඉහළ ගිය දේශීය පොලී අනුපාතයන්ගෙන් මෙම අඩුවීමෙන් යම් ප්‍රමාණයක් පියවී යනු ඇත.

- **භාණ්ඩ හා සේවා:** භාණ්ඩ හා සේවා සඳහා වන වියදම රු. බිලියන 409 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

- **කුටුම්භ සඳහා සහනාධාර:** අස්වැසුම් වැඩසටහන සහ වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයන් සහ නිදන්ගත වකුගඩු රෝගීන් වෙනුවෙන් සහාය දෙන අනෙකුත් ඉලක්කගත වැඩසටහන් යටතේ අවශ්‍යතා මත පදනම් වූ අරමුදල් වෙන් කිරීම් සහ දිවිවා සුළි කුණාටුවෙන් සහ ඉහළ බලශක්ති මිල ගණන් වලින් පීඩාවට පත් කුටුම්භ සඳහා අඛණ්ඩ සහාය පිළිබිඹු කරමින් සමාජ ආරක්ෂණ ජාල සඳහා වන වියදම් තාර්කීකරණය වනු ඇතැයි අපේක්ෂිතය. ආබාධිත සොල්දාදුවන්ට සහාය වීම, ගැබිනි මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහන්, නොමිලේ ඖෂධ සැපයීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වන පොහොර සහනාධාර ඇතුළු අනෙකුත් ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම ද අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **රාජ්‍ය ආයතන සහ සංස්ථා සඳහා වන පැවරුම්:** බලශක්ති අංශයේ පිරිවැය නිරූපිත මිලකරණය සහ ප්‍රධාන රජය සතු ව්‍යවසායන් (SOEs) හි අඛණ්ඩ ප්‍රතිව්‍යුහගතකිරීම් හේතුවෙන් ඒවා වෙත වන පැවරුම් සීමාවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **රාජ්‍ය ආයෝජන:** 2026 වසරේ පශ්චාත්-ආපදා අවශ්‍යතා තක්සේරුවට අනුකූලව දිවිවා සුළි කුණාටුවෙන් හානියට පත් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමට සහ ප්‍රමුඛතා අංශවල ආයෝජනයට ප්‍රමුඛත්වය ලබා දෙන අතරම ප්‍රමුඛ නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් අඩු කරමින් 2027 වසරේ දී රාජ්‍ය ආයෝජන ද.දේ. නි. යෙන් සියයට 5.1 ක් පමණ වනු ඇත. 2026 වසරේ දී සම්පූර්ණ නොකළ දිවිවා ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සැපයීම 2026 වසර අවසානයේ සිදු කෙරෙන තක්සේරුවකින් පසුව තීරණය කරනු ලැබේ.

- **2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත:** මෙම පනත මේ වන විට බොහෝ දුරට ක්‍රියාත්මකව ඇති අතර 2027 වසරේ අයවැය සකස් කර ඇත්තේ 2026 වසරේ ජුනි මාසයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ 2027 වසරේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට අනුව වේ. පනත යටතේ ඇති රාජ්‍ය මූල්‍ය වගකීම් රාමුව, වියදම් කළමනාකරණය ඇතුළුව රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය, වගවීම, විනය සහ කාර්යක්ෂමතාව අඛණ්ඩව වැඩිදියුණු කරනු ඇත.

- **තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් විසඳුම්:** රජයේ ගෙවීම් ඩිජිටල්කරණය සඳහා 'GovPay' වේදිකාව පුළුල් කිරීම ඇතුළුව රට ඩිජිටල් සමාජයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රයත්නයන් මගින් රාජ්‍ය සේවා සැපයීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු ඇත.

- **ආයතන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය:** රාජ්‍ය ආයතන අතර සහයෝගිතාවය වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් අධීක්ෂණය මඟින් අයවැය ප්‍රතිපාදනවල සඵලදායිතාවය සහතික කරන අතර කාර්යයන් ද්විත්වකරණය වීම වළක්වාලනු ඇත.

- **බැඳීම් පාලන යාන්ත්‍රණ:** 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති බැඳීම් පාලන ක්‍රමවේදය (Commitment Control System) මඟින් රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රවාහ කළමනාකරණය ශක්තිමත් කරනු ඇත.

5.9 ණය ගැනීම්

2027 වසරේ රජයේ දළ ණය ගැනීමේ අවශ්‍යතාවය රු. බිලියන 3,800 ක් ලෙස පුරෝකථනය කර ඇත. 2027 වසරේදී අයවැය හිඟය 2026 වසරේ සංශෝධිත ඇස්තමේන්තුව වන ද.දේ. නි. යෙන් සියයට 3.7 ට සාපේක්ෂව ප්‍රතිශතාංක 0.1 කින් සියයට 3.8 දක්වා වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, දිට්වා සුළි කුණාටුවට අදාළ ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වාගෙන යාමට අදාළ වියදම් ඇතුළත් කරමින් 2027 අයවැය සමඟ ඉදිරිපත් කිරීමට නියමිත පරිපූරක අයවැය හේතුවෙන් 2027 වසරේ දී අයවැය හිඟය ද.දේ. නි. යෙන් සියයට 4.5 දක්වා පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය ණය 2027 දී පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, සාමාන්‍ය වාර්ෂික දළ මූල්‍යයන අවශ්‍යතා ද.දේ. නි. යෙන් සියයට 13 ට අඩුවෙන් සහ විදේශ ව්‍යවහාර මුදල් ණය සේවාකරණය 2027-2032 කාලය තුළ ද.දේ. නි. යෙන් සියයට 4.5 ට වඩා අඩුවෙන් පවත්වා ගැනීමට රජය කැපවී සිටී.

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ස්ථාපිත කර ඇති රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මේ වන විට පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වේ. එය රජයේ ණය කළමනාකරණය, ණය ඇපකර නිකුත් කිරීම සහ කළමනාකරණය කිරීම, ප්‍රතිණය දීමේ මෙහෙයුම් කළමනාකරණය (on-lending operations) සහ රාජ්‍ය ණය සටහන් කිරීම සහ වාර්තා කිරීම සඳහා වගකීම දරනු ලැබේ. 2027 වසරේ දී ණය ලබා ගැනීම මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සහ වාර්ෂික ණය ගැනීමේ සැලැස්ම මඟින් මෙහෙයවනු ලබන අතර, කල්පිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සහ විදේශ ව්‍යවහාර මුදල් ණය මත යැපීම අඩු කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ.

5.10 ඇස්තමේන්තුවල සංවේදීතාව

රාජ්‍ය මූල්‍ය හා ආර්ථික පුරෝකථන සඳහා පහත සඳහන් අවදානම් සහ අභියෝග ඇතුළුව අභියෝග කිහිපයක් බලපෑ හැකිය:

- **සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවය:** ආර්ථික තත්ත්වයන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵලවල ප්‍රධාන නිර්ණායකයක් වන අතර රාජ්‍ය මූල්‍ය තත්ත්වය පුරෝකථනය කිරීමේ දී අවිනිශ්චිතතාවයට මූලික හේතුව ද වේ. මැද පෙරදිග ගැටුමේ කාලසීමාව සහ තීව්‍රතාවය, ගෝලීය ඛනිජ තෙල්, ආහාර සහ පොහොර මිල ගණන්වල විචල්‍යතාවය සහ ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම හේතුවෙන් සත්‍ය ආදායම් සහ වියදම් ප්‍රතිඵල 2027 වසරේ අයවැය පුරෝකථන වලින් අපගමනය විය හැකිය. උද්ධමනය, පොලී අනුපාත සහ විනිමය අනුපාත වැනි විචල්‍යයන් ණය ගැනීමේ පිරිවැයට සහ සමස්ත රාජ්‍ය මූල්‍ය තත්ත්වයට සෘජුවම බලපාන අතර, ඒවා හදිසි වෙනස්වීම් වලට ලක්වීමේ අවදානමක් පවතී.

- **බාහිර කම්පන:** ශුද්ධ තෙල් ආනයනකරුවෙකු ලෙස ශ්‍රී ලංකාව, හෝර්මුස් සමුද්‍ර සන්ධිය වසා දැමීමෙන් පැනනඟින බාධා කිරීම් ඇතුළුව ගෝලීය බලශක්ති සැපයුමේ බාධා කිරීම් වල ඉහළ අවදානමකට ලක්ව ඇත. දිගුකාලීන ගැටුමක් මඟින් තවදුරටත් ආනයන පිරිවැය ඉහළ නැංවීම, සංචාරක ඉපැයීම් සහ මැද පෙරදිගින් ලැබෙන ප්‍රේෂණ ගලා ඒම අඩු වීම සහ ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල ඉල්ලුමට බලපෑම් ඇති කරමින් විනිමය අනුපාතිකය, උද්ධමනය සහ ආර්ථික වර්ධනය මත පීඩනයක් ඇති කිරීම සිදුකල හැකිය.

- **ස්වාභාවික විපත් සහ අයහපත් කාලගුණික තත්ත්වයන්:** ස්වාභාවික විපත් හේතුවෙන් ඇතිවිය හැකි රාජ්‍ය මූල්‍ය අවදානමේ ප්‍රමාණය දිට්වා සුළි කුණාටුව මඟින් පෙන්නුම් කළ අතර, ඒ සඳහා 2026 වසරේදී රු. බිලියන 500 ක පරිපූරක අයවැයක් අවශ්‍ය විය. ගංවතුර, නායයෑම්, සුළි කුණාටුවලට සහ නියඟවලට රට තවමත් නිරාවරණය වී ඇති අතර ඉන් ඕනෑම ව්‍යසනයක් ඉදිරි වසර තුළ සිදුවිය හැකිය. එවැනි සිදුවීම් තුළින් සහන, ප්‍රතිසාධන සහ ප්‍රතිසංස්කරණ සඳහා අනපේක්ෂිත වියදම් වල අවශ්‍යතාවයක් ඇති විය හැකි අතර එය කෘෂිකාර්මික නිෂ්පාදනයට, ශ්‍රම ඵලදායිතාවයට සහ වර්ධනයට අහිතකර ලෙස බලපෑ හැකිය.

- **පරිපාලන සහ ප්‍රසම්පාදන ප්‍රමාදයන්:** නිලධාරීවාදී බාධාවන්, තාර වැනි අමුද්‍රව්‍යවල හිඟයන් සහ ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් පශ්චාත්-සුළි කුණාටු ප්‍රතිසංස්කරණ ඇතුළුව රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මන්දගාමී විය හැකි අතර, වර්ධනයට සහ සේවා නියුක්තිය සඳහා ඒවායේ දායකත්වය අඩු විය හැකිය. ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති පිරිවැය ඉහළ යා හැකි අතර රාජ්‍ය වියදම්වල අකාර්යක්ෂමතා මෙන්ම එමඟින් රාජ්‍ය මූල්‍ය ශේෂය කෙරෙහි අමතර පීඩනයක් ඇති විය හැකිය.

- **නීති සම්පාදන ප්‍රමාදයන්:** රාජ්‍ය මූල්‍ය සම්බන්ධ ප්‍රධාන නීති අනුමත කිරීමේ ප්‍රමාදයන් අයවැය යෝජනා නියමිත කාලය තුල ක්‍රියාත්මක කිරීමේ අවිනිශ්චිතතාවයක් ඇති කළ හැකිය. බදු ප්‍රතිසංස්කරණ හෝ වියදම් අනුමත කිරීම් කල් දැමීම තුළින් ආදායම් හිඟයන්ට සහ වියදම් ඉක්මවා යාමට හේතු විය හැකි අතර, ණය ගැනීමේ අවශ්‍යතා

වැඩි කිරීම සහ රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට රජයට ඇති හැකියාව දුර්වල කළ හැකිය.

- **රජය සතු ව්‍යවසායන්හි (SOEs) හි කාර්යසාධනය:** රජය සතු ව්‍යවසායන් මෙහෙයුම් අවදානම්, විදේශ ව්‍යවහාර මුදල් සඳහා නිරාවරණයවීම් සහ භාණ්ඩ මිල කම්පනවලට යටත් වන අතර එමඟින් ඒවායේ ලාභදායිතාවයට සහ මූල්‍ය තිරසාරභාවයට බලපෑම් ඇතිවිය හැකිය. රජය සතු ව්‍යවසායන්හි දුර්වල ක්‍රියාකාරිත්වය, ප්‍රතිව්‍යුහගත කිරීම් ප්‍රමාද වීම හෝ බලශක්ති අංශයේ පිරිවැය නිරූපිත මිලකරණය ප්‍රතිපත්තිය වෙනස් කිරීම හේතුවෙන් අසම්භාව්‍ය වගකීම් පැනනැඟිය හැකි අතර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා අරමුණුවලට අභියෝග කළ හැකිය.

- **මූල්‍ය අංශයේ අවදානම්:** ස්වෛරී ණය වෙත නිරාවරණය වීම සහ රජය සතු මූල්‍ය ආයතන සඳහා රජයේ ඇපකර ලබාදීම ඇතුළුව මූල්‍ය පද්ධතියේ ඇතිවන පීඩනයන්, රාජ්‍ය මූල්‍ය පිරිවැය ඉහළ දැමිය හැකි අතර රජයේ මූල්‍යකරණ තත්ත්වයන්ට බලපෑම් කළ හැකිය.

2026.08.31 දක්වා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ණය භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි ලැයිස්තුව

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	2026.08.31 දින වන විට නිකුත් කළ වටිනාකම රු.මිලියන		2026.08.31 දිනට ණය වටිනාකම රු.මිලියන	
1	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	ලංකා විදුලිබල මණ්ඩලය	185,328.42	218,129.91	148,094.53	180,896.02
		ලංකා විදුලිබල (පෞද්ගලික) සමාගම	16,400.75		16,400.75	
		ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	16,400.75		16,400.75	
2	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB)	ලංකා බැංකුව සහ මහජන බැංකුව	29,521.34	29,521.34	9,837.17	9,837.17
3	ලංකා බැංකුව	ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව	500.00	470,685.48	500.00	260,465.42
		ලංකා විදුලිබල මණ්ඩලය	4,540.00		11.18	
		ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	220,000.00		105,851.72	
		ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	85.00		2.31	
		ජනතා වතු සංවර්ධන මණ්ඩලය	200.00		19.27	
		ලංකා කෝල් (පෞද්ගලික) සමාගම	49,500.00		33,807.21	
		ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල (NSBM)	8,600.00		3,765.00	
		ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	64,863.64		28,342.41	
		මාර්ග සංවර්ධන අධිකාරිය	118,970.03		84,875.72	
		රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව	1,126.81		990.61	
		රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	2,300.00		2,299.99	
4	චීන සංවර්ධන බැංකුව	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	115,595.70	115,595.70	61,719.28	61,719.28
5	චීන ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගම (China National Chemical Engineering No.14 Construction Co. Ltd)	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	14,358.85	14,358.85	5,825.54	5,825.54
6	කොමර්ෂල් බැංකුව	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	968.36	968.36	298.53	298.53
7	DFCC බැංකුව	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	6,026.24	11,026.24	2,381.81	5,642.68
		මාර්ග සංවර්ධන අධිකාරිය	5,000.00		3,260.87	
8	ඉන්දියානු අපනයන-ආනයන බැංකුව (Exim Bank)	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	85,966.14	85,966.14	50,921.03	50,921.03
9	හැටන් නැෂනල් බැංකුව (HNB)	ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පෞද්ගලික සමාගම	4,000.00	20,421.49	4,000.00	9,535.16
		ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	16,421.49		5,535.16	
10	සීමාසහිත හොංකොං සහ ෂැංහයි බැංකු සංස්ථාව (HSBC)	ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පෞද්ගලික සමාගම	14,477.91	14,477.91	9,673.16	9,673.16
11	චීන කාර්මික සහ වාණිජ බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	13,767.57	13,767.57	8,702.24	8,702.24
12	නෙදර්ලන්තයේ ING බැංකුව NV	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	31,541.21	31,541.21	30,323.73	30,323.73
13	ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA)	ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම	3,804.97	3,804.97	3,804.97	3,804.97
14	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA)	ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පෞද්ගලික සමාගම	152,751.92	152,751.92	55,421.41	55,421.41

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	**2026.08.31** දින වන විට නිකුත් කළ වටිනාකම රු.මිලියන		**2026.08.31** දිනට හිඟ වටිනාකම රු.මිලියන	
15	ජාතික සංවර්ධන බැංකුව (NDB)	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	21,380.43	21,380.43	12,050.36	12,050.36
16	ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB)	ලංකා විදුලිබල මණ්ඩලය	5,000.00	147,098.87	2,500.00	114,097.47
		ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	33,896.09		24,211.49	
		ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	32,710.61		24,304.24	
		මාර්ග සංවර්ධන අධිකාරිය	75,492.17		63,081.74	
17	මහජන බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	6,500.00	113,533.63	4,335.34	75,624.83
		ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	2,533.92		1,266.14	
		සීමාසහිත ලංකා නැව් සංස්ථාව	23,587.70		15,534.79	
		ජාතික පද්ධති මෙහෙයුම් පෞද්ගලික සමාගම	20,560.00		20,523.18	
		ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	4,563.98		2,144.98	
		මාර්ග සංවර්ධන අධිකාරිය	53,398.03		31,256.25	
		ශ්‍රී ලංකා රාජ්‍ය වතු සංස්ථාව	100.00		51.28	
		රාජ්‍ය මුද්‍රණ සංස්ථාව	2,290.00		512.87	
18	සම්පත් බැංකුව	මාර්ග සංවර්ධන අධිකාරිය	14,500.00	14,500.00	8,568.18	8,568.18
19	යුනික්‍රෙඩිඩ් බැංකුව ඔස්ට්‍රියා AG (UniCredit Bank Austria AG)	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	19,239.89	19,239.89	15,513.58	15,513.58
20	වී අලෙවි මණ්ඩලය	සමූපකාර තොග වෙළඳ සංස්ථාපිතය	880.00	880.00	729.60	729.60
21	අපනයන සංවර්ධන මණ්ඩලය	ලංකා බැංකුව සහ මහජන බැංකුව	60.00	60.00	60.00	60.00
		මුළු එකතුව	**1,499,709.91**	**1,499,709.91**	**919,710.37**	**919,710.37**

සටහන: විවිධ මුදල් ඒකකවලින් දැක්වෙන මුදල් ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් (LKR) වලට පරිවර්තනය කිරීම සඳහා, 2026 අගෝස්තු 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාත භාවිතා කරන ලදී.

සාර්ව ආර්ථික දර්ශක

1 වගුව | මූලික අංශයන්හි වර්ධන අනුපාතය (%) : 2024-2026

	2024	2025	2026	
			පළමු කාර්තුව(අ)	දෙවන කාර්තුව(අ)
ද.දේ.නි.	5.0	5.0	5.1	4.2
කෘෂිකර්මාන්තය	1.2	1.4	1.1	-2.3
කර්මාන්ත	11.0	7.8	7.2	7.3
සේවා	2.4	3.3	3.4	2.7
උද්ධමනය - ද. දේ.නි. අවධමනකය (2015 = 100) (%)	3.8	3.7	5.7	6.9
සේවා වියුක්ති අනුපාතය (%)	4.5	3.9	3.7	4.0

මූලාශ්‍රය :ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) නාවකාලික

2 වගුව | කෘෂිකාර්මාන්තයේ ප්‍රධාන උප අංශයන්හි කාර්තුමය වර්ධන අනුපාත : 2024 - 2026

අංශය	2024	2025(අ)	2026(අ)	
			පළමු කාර්තුව(අ)	දෙවන කාර්තුව(අ)
තේ (කි. ග්‍රෑම් මිලියන)	262.7	262.8	59.6	72.1
වර්ධනය (%)	2.6	0.0	-3.6	-1.9
රබර් (කි. ග්‍රෑම් මිලියන)	69.2	66.5	16.2	14.7
වර්ධනය (%)	7.4	-3.9	-13.6	-2.2
පොල් (ගෙඩි මිලියන)	2,790.1	3,040.3	944.8	834.3
වර්ධනය (%)	-12.0	9.0	64.8	6.2
මත්ස්‍ය (මෙ. ටොන්)'000	411.0	364.2	75.6	67.0
වර්ධනය (%)	1.1	11.3	-26.8	-17.3
	2024/25	**2025**	**2025/26**	
	මහ	**යල**	**මහ**	
වී (මෙ.ටොන්)'000	2,745.3	2,308.4	3,133.9	

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) නාවකාලික

3 වගුව | කාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය: 2024-2026

රු. මිලියන

අංශය	2024	2025(අ)	2026 (අ)	
			පළමු කාර්තුව(අ)	දෙවන කාර්තුව(අ)
ආහාරපාන හා දුම්කොළ නිෂ්පාදනය	954,409	1,004,413	304,409	210,923
වර්ධන අනුපාතය	6.1	5.2	5.8	3.7
රෙදිපිළි,ඇඟළුම් සහ සම් නිෂ්පාදන	500,210	540,558	173,671	101,017
වර්ධන අනුපාතය	11.0	8.0	-3.7	-1.4
රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	90,994	93,549	21,887	32,116
වර්ධන අනුපාතය	9.7	2.8	22.8	1.7
රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	60,972	62,587	10,663	18,555
වර්ධන අනුපාතය	8.6	2.6	-16.8	-4.2
ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන	86,813	100,890	33,154	28,744
වර්ධන අනුපාතය	2.5	16.2	12.9	13.1
කාර්මික අංශයේ එකතුව	**3,333,008**	**3,597,326**	**1,049,104**	**863,881**
කාර්මික අංශයේ සමස්ත වර්ධනය	**11.0**	**7.8**	**7.2**	**7.3**

මූලාශ්‍රය :ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) නාවකාලික

4 වගුව | විදුලිබල නිෂ්පාදනය සහ සේවා අංශයේ ක්‍රියාකාරිත්වය: 2025-2026

කාණ්ඩය	2025				2026 (අ)			
	කාර්තු 1	කාර්තු 2	ජුනි	ජන - ජුනි	කාර්තු 1	කාර්තු 2	ජුනි	ජන - ජුනි
විදුලි බල නිෂ්පාදනය								
විදුලි බල නිෂ්පාදනය (ස්වයංඋත්පාදනය හැර (GWh)	4,221	4,466	1,504	8,688	4,511	4,793	1,589	9,304
වර්ධන අනුපාතය	2.4	7.3	9.6	4.9	6.9	7.3	5.6	7.1
ජල විදුලි (සුළු පරිමාණ ජල විදුලි හැර)	1,271	1,704	626	2,975	1,213	1,081	388	2,294
වර්ධන අනුපාතය	1.0	37.0	33.7	18.9	-4.6	-36.6	-38.0	-22.9
ඉන්ධන	754	259	46	1,014	954	950	213	1,904
වර්ධන අනුපාතය	6.3	-56.3	-13.3	-22.2	26.4	266.2	360.4	87.8
ගල් අඟුරු	1,383	1,299	359	2,682	1,362	1,447	484	2,809
වර්ධන අනුපාතය	-6.2	-11.7	-23.3	-8.9	-1.5	11.4	34.6	4.7
NCRE (සුළු පරිමාණ ජල විදුලිය ඇතුළත්ව) (ආ)	813	1,203	473	2,016	982	1,315	504	2,297
වර්ධන අනුපාතය	19.9	40.6	23.6	31.4	20.8	9.2	6.5	13.9
ජල: ඉන්ධන: ගල් අඟුරු: NCRE අනුපාතය	30:18:33:19	38:6:29:27	42:3:24:31	34:12:31:23	27:21:30:22	23:20:30:27	24:13:30:32	25:20:30:25
ජලාශ වල ජල මට්ටම % (කාලපරිච්ඡේදය අවසානයේ සාමාන්‍ය)	75.5	65.3	72.7	70.4	68.4	44.5	51.2	56.4
වරාය සේවා	**කාර්තු 1**	**කාර්තු 2**	**අගෝස්තු**	**ජන - අගෝස්තු**	**කාර්තු 1**	**කාර්තු 2**	**අගෝස්තු**	**ජන - අගෝස්තු**
හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො.' 000)	30,850	32,186	10,847	84,580	32,292	35,060	10,970	90,110
වර්ධන අනුපාතය	1.1	10.9	-9.4	4.8	4.7	8.9	1.1	6.5
හසුරුවන ලද මුළු බහාලුම් ගණන (බහාලුම්' 000) (ඇ)	1,936	2,036	741	5,435	2,154	2,290	776	5,995
වර්ධන අනුපාතය	-3.6	8.2	16.8	5.7	11.2	12.5	4.7	10.3
විදුලි සංදේශ සේවා (ග්‍රාහකයින් සංඛ්‍යාව) (ඇ)								
	කාර්තු 1	**කාර්තු 2**			**කාර්තු 1**	**කාර්තු 2**		
ස්ථාවර දුරකථන (‘000)	3,543	3,473			2,732	2,708		
වර්ධන අනුපාතය	62.5	61.1			-22.9	-22.0		
ජංගම දුරකථන(‘000)	28,784	29,027			29,679	29,419		
වර්ධන අනුපාතය	2.9	0.1			3.1	1.4		
මුළු ස්ථාවර හා ජංගම දුරකථන (‘000)	32,328	32,500			32,411	32,127		
වර්ධන අනුපාතය	7.2	4.3			0.3	-1.1		
අන්තර්ජාල සහ විද්‍යුත් තැපෑල(‘000)	24,170	23,686			23,755	23,882		

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය

(ඇ) කොළඹ වරාය පමණි

(ඈ) කාලපරිච්ඡේදය අවසානයට

5 වගුව | අපනයන කාර්යසාධනය: 2025-2026

ඇ.ඩො. මිලියන

අයිතමය	2025 ජන.-අගෝ.	2026 ජන.-අගෝ.(අ)
කෘෂිකාර්මික නිෂ්පාදන	**2,030.2**	**2,015.4**
තේ	1,026.0	948.5
රබර්	20.8	18.9
පොල් නිෂ්පාදන	367.5	389.6
අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන	615.9	658.5
කාර්මික නිෂ්පාදන	**7,015.4**	**7,327.1**
රෙදිපිළි ඇඟළුම්	3,595.3	3,355.6
ඛනිජ තෙල්	654.7	944.9
අනෙකුත් කාර්මික නිෂ්පාදන	2,765.4	3,026.5
ඛනිජ අපනයන	**14.3**	**22.2**
අනෙකුත් අපනයන	**16.8**	**12.3**
මුළු අපනයන	**9,076.6**	**9,376.9**

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

6 වගුව | ආනයන කාර්යසාධනය: 2025-2026

ඇ.ඩො. මිලියන

අයිතමය	2025 ජන.-අගෝ.	2026 ජන.-අගෝ.(අ)
පාරිභෝගික භාණ්ඩ	**3,294.7**	**4,004.5**
ධාන්‍ය හා ඇඹරුම් නිෂ්පාදන	90.9	120.6
සීනි	245.8	206.6
අනෙකුත් ආහාර නිෂ්පාදන	1,082.9	1,120.6
අනෙකුත් පාරිභෝගික භාණ්ඩ	1,875.0	2,556.6
අතර මැදි භාණ්ඩ	**7,437.4**	**9,334.2**
ඉන්ධන	2,520.6	4,072.1
තිරිඟු හා බඩ ඉරිඟු	205.1	239.5
පොහොර	164.8	129.5
රෙදිපිළි හා ඇඟළුම්	1,793.5	1,713.2
අනෙකුත් අතරමැදි භාණ්ඩ	2,753.4	3,179.8
ආයෝජන භාණ්ඩ	**2,597.2**	**3,203.6**
අනෙකුත් ආනයන	**11.6**	**14.8**
මුළු ආනයන	**13,340.9**	**16,557.1**

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

7 වගුව | ගෙවුම් ශේෂය: 2026

ඇ.ඩො. මිලියන

අයිතමය	2026	
	කාර්තු 1 (අ)	කාර්තු 2 (අ)
වර්තන ගිණුමේ ශේෂය	**704**	**-986**
වෙළඳ ශේෂය	**-2,310**	**-3,179**
අපනයන	3,461	3,442
ආනයන	5,771	6,621
සේවා (ශුද්ධ)	**1,125**	**507**
ලැබීම්	2,016	1,512
ගෙවීම්	891	1,005
ප්‍රාථමික ආදායම් (ශුද්ධ)	**-376**	**-586**
ලැබීම්	164	144
ගෙවීම්	540	730
ද්විතීක ආදායම් (ශුද්ධ)	**2,264**	**2,272**
ද්විතීක ආදායම්: බැර	2,295	2,311
ද්විතීක ආදායම්: හර	31	39
ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**-2**	**0**
ප්‍රාග්ධන ගිණුම: බැර	2	3
ප්‍රාග්ධන ගිණුම: හර	3	3
වර්තන හා ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**702**	**-985**
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**646**	**-668**
සෘජු ආයෝජන : වත්කම්	**28**	**25**
සෘජු ආයෝජන : වගකීම්	**204**	**201**
කළඹ ආයෝජන : වත්කම්	**-0.3**	26
ණය සුරැකුම්	-0.3	26
කළඹ ආයෝජන : වගකීම්	**-74**	**-351**
කොටස් හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	-96	-39
ණය සුරුකුම්	22	-312
මූල්‍ය ව්‍යුත්පන්න	-	-
අනෙකුත් ආයෝජන : වත්කම්	**435**	**111**
විනිමය හා තැන්පතු	195	-63
වෙළඳ ණය අත්තිකාරම්	-64	-86
අනෙකුත් ලැබීම්	304	259
අනෙකුත් ආයෝජන : වගකීම්	**-98**	**436**
විනිමය සහ තැන්පතු	21	-62
ණය	-196	407
වෙළඳ ණය සහ අත්තිකාරම්	77	91
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	-	-
විශේෂ ගැනුම් හිමිකම් (SDRs)	-	-
සංචිත වත්කම්	**215**	**-542**
ශුද්ධ වැරදි හා අත්හැරීම්	**-56**	**318**
සමස්ථ ශේෂය	**456**	**136**

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

8 වගුව | විදේශ සංචිත

ඇ.ඩො. මිලියන

අයිතමය	2025 අවසාන	2026 මැයි	2026 ජූනි	2026 ජූලි	2026 අගෝ.
මුළු විදේශ සංචිත	12,306	12,997	12,602	13,247	13,459
ආනයන ආවරණ කළ හැකි කාල සීමාව (මාස)	6.9	6.5	6.3	6.5	6.5
දළ නිල සංචිත	6,838	6,881	6,458	6,600	6,929
ආනයන ආවරණ කළ හැකි කාල සීමාව (මාස)	3.8	3.5	3.2	3.2	3.4

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

9 වගුව | ගෙවීමට ඇති රාජ්‍ය ණය ප්‍රමාණය

ඇ.ඩො. මිලියන

අයිතමය	2026 අගෝස්තු අවසානයට (තාවකාලික)*
මධ්‍යම රජයේ විදේශ ණය සහ දේශීය ණය	**96,948**
මධ්‍යම රජයේ විදේශ ණය (අ) (ආ)	37,744
දේශීය මුදලින් නාමනය කරන ලද මධ්‍යම රජයේ දේශීය ණය (ඇ) (ඈ)	56,925
ඩොලර්වලින් නිකුත් කරන ලද දේශීය ණය	**2,279**
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (අ) (ඇ)	-
දේශීය ඩොලර් බැඳුම්කර (DDBs) (ඉ)	51
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය (FCBUs)	-
විදේශ විනිමයෙන් නාමනය කරන ලද දේශීය කාලීන ණය (ඉ)	2,184
විදේශ විනිමයෙන් නාමනය කරන ලද දේශීය ව්‍යාපෘති ණය (ඇ) (ඉ)	44

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

(අ) මධ්‍යම රජයේ නොපිය වූ විදේශ ණය පමණක් නිරූපණය කෙරේ. ණය සේවාකරණය, තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතු වූ නොගෙවූ ණය වාරික ද ඇතුළුව මධ්‍යම රජයේ හිඟ විදේශ ණය පමණක් නිරූපණය කර ඇත. අනෝවාසික හිමිකාරිත්වය සහිත භාණ්ඩාගාර බිල්පත් / බැඳුම්කර ඇතුළත් නොවේ. නොපිය වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය ඒවායේ හිමිකාරිත්වයේ නේවාසික අනේවාසික පදනම මත වර්ගීකරණය කර නොමැත. ප්‍රතිපත්තිය අනුගමනය කළ දින සිට එකතු වූ නොගෙවූ මූලික මුදල ද ඊට ඇතුළත් වේ. භාණ්ඩාගාර බිල්පත් / භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය හිමිකාරිත්වයන් ඇතුළත් කර නොමැත. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISBs) වල හිමිකාරිත්වය පිළිබඳ වර්තමාන නේවාසික/ අනේවාසික පදනම මත වර්ගීකරණය කර නොමැත.

(ආ) විදේශ මූලාශ්‍රයන් වෙතින් ලබාගත් නොපිය වූ ව්‍යාපෘති ණය සහ කාලීන ණය අගයයන් 2026.10.16 දින බාගත කරන ලද Meridian වාර්තා පදනම් කරගෙන සකස් කර ඇත (දත්ත පද්ධතියේ දත්ත සැකසුම් දිනය - 2026 අගෝස්තු අවසානය).

(ඇ) 2026 ඔක්තෝබර් 6 වන දින වාර්තා වූ ණය දත්ත මත පදනම්ව 2026 අගෝස්තු 31 වන විට ගෙවීමට ඇති භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, සුභුරුපාය ණය සහ පාරිතෝෂික ණය ඇතුළත් වේ. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල හිමිකාරිත්වය පිළිබඳ වර්තමාන පදිංචි/ නොපදිංචි පදනම මත වර්ගීකරණය කර නොමැත.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීමට 2011 සිට 2019 දක්වා දේශීය බැංකුවලින් ලබාගත් ණය ඇතුළත් වේ.

(ඉ) ඩොලර්වලින් නිකුත් කරන ලද දේශීය ණය යටතට දේශීය ඩොලර් බැඳුම්කර (DDBs) ඇතුළත් කර ඇත. CS-DRMS 2026 අගෝස්තු 21 දිනට (සමාප්ති දිනය: 2026 ජූනි 30).

** භාවිතා කළ විදේශ විනිමය අනුපාතිකය: ඇ.ඩො. 1 = රු. 328.0149 (දිනය = 2026 අගෝස්තු 31)*

10 වගුව | තෝරාගත් විදේශ විනිමය අනුපාතිකයන්ගේ විචලනය (ඇ. ඩොලරයට සාපේක්ෂව)

මුදල් ඒකකය	අධිප්‍රමාණය/ (+) / අවප්‍රමාණය (-)	
	2024 අවසාන- 2025 අවසාන	2025 අවසාන- 2026 අගෝස්තු අවසාන
ශ්‍රී ලංකා රුපියල්	-5.6	-5.5
ඉන්දියාන් රුපියල්	-4.7	-5.9
බංගලාදේශ ටකා	-2.2	-0.7
පාකිස්ථානු රුපියල්	-0.6	0.9
සිංගප්පූරු ඩොලර්	5.8	0.9
තායිලන්ත බාත්	8.7	-5.2
තායිවාන් ඩොලර්	4.3	-0.6
ඉන්දුනීසියාව රුපියා	-3.6	-5.7
පිලිපීන පෙසෝ	-1.7	-5.7
කොරියානු වොන්	2.1	4.9
ජපාන යෙන්	0.0	-2.1

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

11 වගුව | ශ්‍රී ලංකා මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත්

රු. බිලියන

කාලපරිච්ඡේදයේ අවසානයේ	දළ (මුහුණත් අගය)	ප්‍රති මිලදී ගැනීම් වලින් පසුව (පොත් අගය)
2015	105	79
2016	331	330
2017	10	26
2018	46	274
2019	75	125
2020	725	737
2021	1,417	1,960
2022	2,598	3,187
2023	2,744	1,956
2024	2,516	1,551
2025	2,509	1,601
2026 අගෝස්තු අවසන	2,493	1,274

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

12 වගුව | 2026 ජනවාරි සිට අගෝස්තු දක්වා පුද්ගලික අංශය සඳහා වාණිජ බැංකු මඟින් ලබා දී ඇති ණය

	ප්‍රමාණය රු. මිලියන	මුළු මුදලින් % ලෙස
1. කෘෂිකාර්මික හා ධීවර	**7,844,224**	**9.0**
එයින්.....		
තේ	1,620,819	1.9
රබර්	507,139	0.6
පොල්	503,155	0.6
වී	726,172	0.8
එළවළු සහ පලතුරු වගා කිරීම සහ සුළු ආහාර භෝග	581,951	0.7
පශු සම්පත් සහ කිරි ගොවිතැන	682,867	0.8
ධීවර	470,160	0.5
2. කර්මාන්ත	**32,144,568**	**37.0**
එයින්.....		
ඉදිකිරීම්	15,153,933	17.4
එයින්.....		
- පෞද්ගලික නිවාස මිලදී ගැනීම්/ඉදිකිරීම්/අළුත්වැඩියා කිරීම්	7,470,981	8.6
- නිල නිවාසය	675,557	0.8
ආහාර හා පාන වර්ග	2,120,268	2.4
රෙදිපිළිහා ඇඟළුම්	3,326,977	3.8
දැව හා ලී බඩු ඇතුලත්ව දැව නිෂ්පාදන	292,031	0.3
කඩදාසි හා කඩදාසි නිෂ්පාදන	510,631	0.6
රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්,ඖෂධ, සෞඛ්‍ය සහ රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	2,047,116	2.4
ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන	137,734	0.2
මූලික ලෝහ නිෂ්පාදන	640,093	0.7
සකස් කල ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ	2,550,957	2.9
අනෙකුත් නිෂ්පාදන	401,935	0.5
3. සේවා	**26,549,331**	**30.5**
එයින්....		
තොග සහ සිල්ලර වෙළඳාම	8,965,716	10.3
සංචාරක කර්මාන්තය	2,465,485	2.8
මූල්‍ය සහ ව්‍යාපාර සේවා	7,258,760	8.4
ප්‍රවාහනය	675,490	0.8
සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය	1,061,295	1.2
මුද්‍රණ සහ ප්‍රකාශන	172,792	0.2
අධ්‍යාපන	503,042	0.6
සෞඛ්‍ය	508,177	0.6
නාවික, ගුවන්, සැපයුම් සහ භාණ්ඩ ප්‍රවාහන	372,742	0.4

	ප්‍රමාණය රු. මිලියන	මුළු මුදලින් % ලෙස
4. පුද්ගල ණය සහ අත්තිකාරම් (ඇ)	**20,388,932**	**23.5**
එයින්.....		
කල්පවතින පාරිභෝගික භාණ්ඩ	974,226	1.1
උකස්	8,438,093	9.7
ණය කාඩ්පත්(ඇ)	1,623,323	1.9
පුද්ගල අධ්‍යාපනෙ	58,809	0.1
පොෘද්ගලින සනීපාරක්ෂාව	30,005	0.03
අනෙකුත්	8,510,634	9.8
එකතුව (ඉ)	**86,927,054**	**100.0**

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ණය, අයිරා, වට්ටම් කර මිලදී ගත් බිල්පත් ඇතුළත් වන අතර එකතු කිරීමේ ක්‍රියාවලියේදී මුදල් අයිතම බැහැර කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' යටතේ ඇතුළත් කර ඇති පුද්ගලික නිවාස ණය බැහැර කරන අතර ආරක්ෂිත ශුද්ධ යෝජනා ක්‍රමයට අදාළ ණය ද ඇතුළත් වේ.

(ඈ) සම්පාදනය කිරීමේ සහ වාර්තා කිරීමේ වෙනස්කම් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සතිපතා සහ මාසික ආර්ථික දර්ශකවල වාර්තා කර ඇති ක්‍රෙඩිට් කාඩ් හිඟ ශේෂයන්ගෙන් මෙම ශේෂයන් වෙනස් විය හැකිය.

(ඉ) මාසික සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශයට ලැබෙන මුළු ණය, සම්පාදනය කිරීමේ ක්‍රමවේදවල වෙනස්කම් හේතුවෙන් මුදල් සමීක්ෂණයට වඩා වෙනස් වේ.

සටහන:

2025 වසරේ අප්‍රේල් මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වෙත ලබා දී ඇති ණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරුද අඩංගු බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දෙන ණය සහ අත්තිකාරම් පිළිබඳ මාසික සමීක්ෂණයක් පැවැත්වීම ආරම්භ කරන ලදී. ඒ අනුව, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ මෙතෙක් සිදු කරන ලද කාර්තුමය සමීක්ෂණය අත්හිටුවන ලදී. නව සමීක්ෂණයේ අරමුණ වන්නේ මාසිකව එක් එක් අංශ අනුව ණය පිළිබඳ දත්ත රැස් කිරීම වන අතර එමඟින් පෞද්ගලික අංශයේ ණයවල නිතර සිදු වන විවලනයන් නිරීක්ෂණය කිරීමට සහ විශ්ලේෂණය කිරීමට හැකි වේ. ඒ අනුව, මෙම වෙනස්වීම් සිදුවන කාලයේදී (Transition Period) උප අංශ වල වර්ධන රටාවන්හි විවලනාවයන් බොහෝ දුරට බැංකු මට්ටමින් හඳුන්වා දුන් නැවත වර්ගීකරණයන් පිළිබිඹු කරන බැවින්, නව මාසික සමීක්ෂණයෙහි දත්ත සහ පෙර කාර්තුමය සමීක්ෂණයෙහි දත්ත අතර සෘජු සංසන්දනයක් සිදු කිරීම සුදුසු නොවේ.

13 වගුව | පොලී අනුපාතිකවල වෙනස්වීම් 2025-2026

පොලී අනුපාතය	2025 දෙසැ. අවසාන	2026 මැයි අවසාන	2026 ජූනි අවසාන	2026 ජූලි අවසාන	2026 අගෝ. අවසාන
ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය					
එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය(අ)	7.75	8.75	8.75	8.75	8.75
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)(අ)	7.25	8.25	8.25	8.25	8.25
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)(අ)	8.25	9.25	9.25	9.25	9.25
බර තැබූ සාමාන්‍ය අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)	8.04	9.10	9.23	9.01	8.85
බර තැබූ සාමාන්‍ය විවට වෙළඳපොල වෙන්දේසි අනුපාතික (එක් දින ප්‍රති මිලදී ගැනීම්)(ආ)	-	8.75	8.75	8.67	8.75
භාණ්ඩාගාර බිල්පත්					
දින - 91	7.74	9.36	10.14	9.86	9.06
දින- 182	8.27	9.68	10.21	10.21	9.44
දින- 364	8.45	9.83	10.17	10.2	9.89
ණය දීමේ අනුපාතය					
බර තැබූ සාමාන්‍ය ප්‍රමඛ ණය දීමේ අනුපාතිකය (AWPR) (සතිපතා)	9.07	9.9	10.62	10.67	10.95
බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය (AWPR) (මාසික)	8.87	9.75	10.34	10.50	10.88
බර තැබූ සාමාන්‍ය ණය දීමේ අනුපාතිකය (AWLR)	11.48	11.97	12.16	12.36	12.59
තැන්පතු අනුපාතය					
බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR)	6.78	6.95	7.20	7.39	7.52
බර තැබූ සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතිකය (AWFDR)	8.41	8.66	8.98	9.2	9.34

මූලාශ්‍රය :ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2024 නොවැම්බර් 27 වැනිදා සිට, OPR (Overnight Policy Rate - එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය) යනු මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. SDFR සහ SLFR යන අනුපාතික, ± පදනම් ලකුණු 50ක (basis points) පරතරයක් සහිතව OPR සමඟ සම්බන්ධ කර ඇත.

(ආ) අදාළ මාසය තුළ පැවති අවසන් 'එක්දින රෙපෝ' (overnight repo) හෝ 'ප්‍රති-රෙපෝ' (reverse repo) වෙන්දේසියේ බරිත සාමාන්‍ය අනුපාතිකය.

2027 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන

මෙම උපකල්පන 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වැනි වගන්තියට අනුකූලව දක්වා ඇත.

වර්ධන වේගයේ ප්‍රවණතා හෝ දිගු කාලීන සාමාන්‍යයන්, 2025 වසරේ එකතු කරන ලද තත්‍ය ආදායම සහ 2026 වසරේ පළමු මාස අට සඳහා වන ආදායම් ප්‍රගතිය, නව ක්‍රියාමාර්ග තුළින් ආදායම කෙරෙහි අපේක්ෂිත බලපෑම, සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ වර්ධනයන් සහ ආදායම් ප්‍රගතිය පිළිබඳ කාර්ය මණ්ඩලයේ විනිශ්චය ඇතුළත් ප්‍රධාන සාධක මත 2027 වසර සඳහා වන ආදායම් ඇස්තමේන්තු පදනම් වී ඇත.

මෙම පුළුල් උපකල්පනයන් පහත පරිදි විස්තර කෙරේ;

- දේශීය හා විදේශීය යන දෙඅංශයේම සහාභයෙන්ගෙන් 2027 වසරේ දී සියයට 4 – 5 ක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ අංශ තුනෙහිම එනම්, කාර්මික, සේවා සහ කෘෂිකාර්මික යන සියලුම අංශයන්හි පුළුල් වර්ධනයක් අපේක්ෂා කෙරේ.

- 2027 වසරේ දෙවන කාර්තුව වන විට සාමාන්‍ය උද්ධමනය සියයට 5 ක ඉලක්කය මත ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2027 වසරේ දී විරැකියා අනුපාතය සියයට 5 ට වඩා අඩු මට්ටමක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2027 වසරේ දී විදේශ විනිමය අනුපාතිකය සාපේක්ෂව ස්ථාවරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- 2027 වසරේ දී වාහන සඳහා ඇති ඉල්ලුම පහත වැටීමේ හැකියාව හේතුවෙන් 2026 වසරට සාපේක්ෂව මෝටර් වාහන ආශ්‍රිත ආනයන බදු වල ආන්තික අඩුවීම.

- වඩා යහපත් වූ සාර්ව ආර්ථික කළමනාකරණයක් උදෙසා රාජ්‍ය මූල්‍ය විනය වැඩි දියුණු කිරීමට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීම.

- රජය සතු ව්‍යවසායයන් (State-Owned Enterprises) පනත් කෙටුම්පත සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව (Public-Private Partnership) පනත් කෙටුම්පත හඳුන්වා දීමෙන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති රාජ්‍ය ආයෝජන කළමනාකරණ ක්‍රියාවලියට පූර්ණ වශයෙන් ඒකාබද්ධ කරනු ලැබීම සහතික කිරීම.

- ඩිජිටල්කරණ ප්‍රයත්නයන් තුළින් දූෂණ අවදානම් අවම කිරීම සහ ආදායම් පරිපාලන උපාය මාර්ගවල කාර්යක්ෂමතාව ඉහළ නංවමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවෙහි ආදායම් එකතු කිරීම ශක්තිමත් කිරීම.

- තනි පුද්ගලයන් සඳහා විද්‍යුත් ගොනු කිරීම (e-filing) අනිවාර්ය කිරීම, අපනයන සැපයුම්කරුවන් සඳහා වන බදු ප්‍රතිපූරණ ක්‍රියාවලිය විධිමත් කිරීම, විකුණුම්පොල ගෙවීම් (Point of Sales) යන්ත්‍ර භාවිතය බලාත්මක කිරීම සහ අවදානම් මත පදනම් වූ විගණන කාර්යක්ෂමතාව වැඩි කිරීම මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු අනුකූලතාව ශක්තිමත් කිරීම.

- ආදායම් එකතු කිරීම ඉහළ නැංවීම, විනිවිදභාවය, වගවීම සහ යහපාලනය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, සූදු කර්මාන්තය නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සූදු නියාමන අධිකාරියේ (Gambling Regulatory Authority) කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම.

- හඳුනාගෙන ඇති මධ්‍යකාලීන ආදායම් අරමුණුවලට අනුකූලව මධ්‍යකාලීන ආදායම් උපායමාර්ගය (2027–2031) ස්ථාපිත කිරීම සහ හඳුනාගෙන ඇති විභව ආදායම් ඉහළ නැංවීම් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉලක්කගත බදු ප්‍රතිපත්තිමය හා ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

අයිතමය/ එන්ජින් ධාරිතාවය	බදු අනුපාතය
(i) මෝටර් කාර් - පෙට්‍රල්	
සිලින්ඩර් ධාරිතාවය 1000 ට අඩු	ඒකකයකට රු. 1,992,000/- හෝ ඝන සෙන්ටිමීටරයකට රු. 2,450/-
සිලින්ඩර් ධාරිතාවය 1001 - 1300	ඝන සෙන්ටිමීටරයකට රු.3,850/-
සිලින්ඩර් ධාරිතාවය 1301 - 1500	ඝන සෙන්ටිමීටරයකට රු. 4,450/-
සිලින්ඩර් ධාරිතාවය 1501 - 1600	ඝන සෙන්ටිමීටරයකට රු. 5,150/-
සිලින්ඩර් ධාරිතාවය 1601 - 1800	ඝන සෙන්ටිමීටරයකට රු. 6,400/-
සිලින්ඩර් ධාරිතාවය 1801 - 2000	ඝන සෙන්ටිමීටරයකට රු.7,700/-
සිලින්ඩර් ධාරිතාවය 2001 - 2500	ඝන සෙන්ටිමීටරයකට රු. 8,450/-
සිලින්ඩර් ධාරිතාවය 2501 - 2750	ඝන සෙන්ටිමීටරයකට රු. 9,650/-
සිලින්ඩර් ධාරිතාවය 2751 - 3000	ඝන සෙන්ටිමීටරයකට රු. 10,850/-
සිලින්ඩර් ධාරිතාවය 3001 - 4000	ඝන සෙන්ටිමීටරයකට රු. 12,050/-
සිලින්ඩර් ධාරිතාවය 4000 ට වැඩි	ඝන සෙන්ටිමීටරයකට රු. 13,300/-
(ii) මෝටර් කාර් - ඩීසල්	
සිලින්ඩර් ධාරිතාවය 1500 ට අඩු	ඝන සෙන්ටිමීටරයකට රු. 5,550/-
සිලින්ඩර් ධාරිතාවය 1501 - 1600	ඝන සෙන්ටිමීටරයකට රු. 6,950/-
සිලින්ඩර් ධාරිතාවය 1601 - 1800	ඝන සෙන්ටිමීටරයකට රු. 8,300/-
සිලින්ඩර් ධාරිතාවය 1801 - 2000	ඝන සෙන්ටිමීටරයකට රු. 9,650/-
සිලින්ඩර් ධාරිතාවය 2001 - 2500	ඝන සෙන්ටිමීටරයකට රු. 9,650/-
සිලින්ඩර් ධාරිතාවය 2501 - 2750	ඝන සෙන්ටිමීටරයකට රු. 10,850/-
සිලින්ඩර් ධාරිතාවය 2751 - 3000	ඝන සෙන්ටිමීටරයකට රු. 12,050/-
සිලින්ඩර් ධාරිතාවය 3001 - 4000	ඝන සෙන්ටිමීටරයකට රු.13,300/-
සිලින්ඩර් ධාරිතාවය 4000 ට වැඩි	ඝන සෙන්ටිමීටරයකට රු. 14,500/-
(iii) මෝටර් කාර් - දෙමුහුන් - පෙට්‍රල්	
සිලින්ඩර් ධාරිතාවය 1000 ට අඩු	ඒකකයකට රු. 1,810,900/-
සිලින්ඩර් ධාරිතාවය 1001 - 1300	ඝන සෙන්ටිමීටරයකට රු. 2,750/-
සිලින්ඩර් ධාරිතාවය 1301 - 1500	ඝන සෙන්ටිමීටරයකට රු. 3,450/-
සිලින්ඩර් ධාරිතාවය 1501 - 1600	ඝන සෙන්ටිමීටරයකට රු. 4,800/-
සිලින්ඩර් ධාරිතාවය 1601 - 1800	ඝන සෙන්ටිමීටරයකට රු. 6,300/-
සිලින්ඩර් ධාරිතාවය 1801 - 2000	ඝන සෙන්ටිමීටරයකට රු. 6,900/-
සිලින්ඩර් ධාරිතාවය 2001 - 2500	ඝන සෙන්ටිමීටරයකට රු.7,250/-
සිලින්ඩර් ධාරිතාවය 2501 - 2750	ඝන සෙන්ටිමීටරයකට රු. 8,450/-
සිලින්ඩර් ධාරිතාවය 2751 - 3000	ඝන සෙන්ටිමීටරයකට රු. 9,650/-
සිලින්ඩර් ධාරිතාවය 3001 - 4000	ඝන සෙන්ටිමීටරයකට රු. 10,850/-
සිලින්ඩර් ධාරිතාවය 4000 ට වැඩි	ඝන සෙන්ටිමීටරයකට රු. 12,050/-
(iv) මෝටර් කාර් - දෙමුහුන් - ඩීසල්	
සිලින්ඩර් ධාරිතාවය 1000 ට අඩු	ඝන සෙන්ටිමීටරයකට රු. 4,150/-
සිලින්ඩර් ධාරිතාවය 1001 - 1300	ඝන සෙන්ටිමීටරයකට රු. 4,150/-
සිලින්ඩර් ධාරිතාවය 1301 - 1500	ඝන සෙන්ටිමීටරයකට රු. 4,150/-
සිලින්ඩර් ධාරිතාවය 1501 - 1600	ඝන සෙන්ටිමීටරයකට රු. 5,550/-
සිලින්ඩර් ධාරිතාවය 1601 - 1800	ඝන සෙන්ටිමීටරයකට රු. 6,900/-
සිලින්ඩර් ධාරිතාවය 1801 - 2000	ඝන සෙන්ටිමීටරයකට රු. 8,350/-
සිලින්ඩර් ධාරිතාවය 2001 - 2500	ඝන සෙන්ටිමීටරයකට රු. 8,450/-
සිලින්ඩර් ධාරිතාවය 2501 - 2750	ඝන සෙන්ටිමීටරයකට රු. 9,650/-
සිලින්ඩර් ධාරිතාවය 2751 - 3000	ඝන සෙන්ටිමීටරයකට රු.10,850/-
සිලින්ඩර් ධාරිතාවය 3001 - 4000	ඝන සෙන්ටිමීටරයකට රු.12,050/-
සිලින්ඩර් ධාරිතාවය 4000 ට වැඩි	ඝන සෙන්ටිමීටරයකට රු. 13,300/-
(v) මෝටර් කාර් - විද්‍යුත්	
මෝටර් කාර් - විද්‍යුත් - බාහිර මූලාශ්‍ර හෝ විදුලි ජනන යන්ත්‍ර මඟින්	
කි.වො. 50 ට වඩා අඩු	කි.වො. 1කට රු. 18,100/-
කි. වො. 51-100	කි.වො. 1කට රු. 24,100/-
කි. වො. 101 - 200	කි.වො. 1කට රු. 36,200/-
කි. වො. 200 ට වැඩි	කි.වො. 1කට රු. 96,600/-
මෝටර් කාර් - විද්‍යුත් - විදුලි සමුච්චිතය ආරෝපණය කිරීම සඳහා පමණක් වූ අභ්‍යන්තර දහන එන්ජිම සහිත	
කි.වො. 50 ට වඩා අඩු	කි.වො. 1කට රු. 30,770/-
කි. වො. 51-100	කි.වො. 1කට රු. 40,970/-
කි. වො. 101 - 200	කි.වො. 1කට රු. 41,630/-
කි. වො. 200 ට වැඩි	කි.වො. 1කට රු. 111,090/-

අයිතමය/ එන්ජින් ධාරිතාවය	බදු අනුපාතය
(vi) වෑන්	
පුද්ගලයින් 13-25 / ඩීසල්	ඒකකයකට රු. 5,432,650/-
පුද්ගලයින් 13 -25 / පෙට්‍රල්	සහ සෙන්ටිමීටරයකට රු. 2,100/-
පුද්ගලයින් 13ට වඩා අඩු/ ඩීසල්	200%
පුද්ගලයින් 13ට වඩා අඩු / පෙට්‍රල්	150%

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2 වගුව | දුම්වැටි සඳහා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) ව්‍යුහය (2026.10.31 දිනට)

කාණ්ඩය	දුම්වැටි 1,000 කට රුපියල්
දුම්වැටි 1ක දිගැති මි.මී.60 නොඉක්මවන	19,350
දුම්වැටි 1ක දිගැති මි.මී.60 ඉක්මවන එහෙත් මි.මී. 67 නොඉක්මවන	50,150
දුම්වැටි 1ක දිගැති මි.මී.67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන	71,450
දුම්වැටි 1ක දිගැති මි.මී.72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන	81,000
දුම්වැටි 1ක දිගැති මි.මී. 84 ඉක්මවන	90,050

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

3 වගුව | ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා වන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) අනුපාත ව්‍යුහය (2026.10.31 දිනට)

අයිතමය	ලීටරයට රු.
පෙට්‍රල්	72.00
ඩීසල් - ඔටෝ	50.00
ඩීසල්- සුපර්	57.00

මූලාශ්‍රය :රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

4 වගුව | සුරාබදු ආඥාපනත යටතේ සුරාබදු ව්‍යුහය (2026.10.31 දිනට)

වර්ගීකරණය	ලීටරයකට / කිලෝ ග්‍රෑමයකට බදු අනුපාතය (රු.)
මත්පැන් (නිරපේක්ෂ මද්‍යසාර ලීටරයට)	
විශේෂ අරක්කු	7,244
මොලෑසස්, තල්, පොල් සහ පදම් කළ අරක්කු	7,752
මෙරට සෑදූ විදේශීය මත්පැන්	7,969
සැර 5% හා 5% ට අඩු ධාන්‍ය මත්පැන්	5,735
සැර 5% ට වැඩි ධාන්‍ය මත්පැන්	6,015
වයින්	5,735
සකේ	1,567
කිරි පොන්සා මත්පැන්	3,982
සයිඩර්	4,347
එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය	
පොල් රා (තොග ලීටරයක් සඳහා)	5
මොලෑසස් (තොග කි. ග්‍රෑමයක් සඳහා)	10
ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සහල් (තොග කි. ග්‍රෑමයක් සඳහා)	10
ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන ඉරිඟු (තොග කි. ග්‍රෑමයක් සඳහා)	10
ආසවනය මඟින් ස්ප්‍රිතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන පළතුරු (තොග කි. ග්‍රෑමයක් සඳහා)	10
විදේශ මත්පැන්	
ආනයනික ධාන්‍ය මත්පැන් (බියර්) (තොග ලීටරයක් සඳහා)	135
ආනයනික වයින් (තොග ලීටරයක් සඳහා)	230
අනෙකුත් ආනයනික විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් හා වයින් හැර) (තොග ලීටරයක් සඳහා)	650
පානීය නොවන ස්ප්‍රිතු (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා)	6

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

5 වගුව | වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද (2026.10.31 දිනට)

අයිතමය	අනුපාතය
සාමාන්‍ය අනුපාතය	10.0%
සහනදායී අනුපාතය	7.5%, 5.0%, 2.5%

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

6 වගුව | එකතුකළ අගය මත බද්ද (2026.10.31 දිනට)

අනුපාතය	අයිතමය
ශූන්‍ය අනුපාතය	අපනයන භාණ්ඩ සේවා
සම්මත අනුපාතය (18%)	පොදු අයිතම
නිදහස් කිරීම්	එකතුකළ අගය මත බදු පනතේ පළමු උපලේඛනයේ III වන කොටසේ ලැයිස්තුගත කර ඇති භාණ්ඩ හා සේවා

මූලාශ්‍රය :රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

7 වගුව | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (2026.10.31 දිනට)

අනුපාතය	අයිතමය
සම්මත අනුපාතය (2.5%)	සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ I අ කොටසෙහි හා II කොටසෙහි ලැයිස්තුගත කර ඇති ද්‍රව්‍යයන් හා සේවා
නිදහස් කිරීම්	

මූලාශ්‍රය :රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

8 වගුව | ආනයන රේගු බදු ව්‍යුහය (2026.10.31 දිනට)

බදු අනුපාතය	සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංඛ්‍යාව
බදු රහිත	3,724
15%	526
20%	2,659
විශේෂිත	852
විශේෂිත සහ වටිනාකම් අනුව බද්ද (මිශ්‍ර)	412

මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

9 වගුව | බදු කුලී ආදායම

රු. මිලියන

අයිතමය	2025 (තාවකාලික)	2026 (සංශෝධිත)	2027 (ඇස්තමේන්තුගත)
රජයේ ගොඩනැගිලි සහ නිවාස මත බදු කුලී	2,213	2,399	2,645
රජයේ කැලෑ වලින් ලැබෙන ආදායම්	2,218	1,500	1,500
ඉඩම් සහ අනෙකුත් බදු කුලී	272	220	225
ප්‍රාදේශීය වැවිලි සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී	1,995	2,881	3,000
අනෙකුත්	1,146	1,500	1,630
මුළු බදු කුලී ආදායම	**7,843**	**8,500**	**9,000**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

10 වගුව | ගාස්තු සහ අයකිරීම්

රු. මිලියන

අයිතමය	2025 (තාවකාලික)	2026 (සංශෝධිත)	2027 (ඇස්තමේන්තුගත)
රජයේ මුද්‍රණාලය විසින් කරනු ලබන සේවා සඳහා අයකිරීම්	1,575	1,100	1,100
ගමන් බලපත්‍ර, වීසා සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා ගාස්තු	44,882	42,000	45,000
අපගමන බද්ද	53,477	50,000	65,000
මෝටර් රථ පනත යටතේ ගාස්තු සහ අනෙකුත් ලැබීම්	20,301	24,000	25,000
අනෙකුත් විවිධ මූලාශ්‍රයන්ගෙන් ලැබීම්	77,350	88,880	90,324
එකතුව	**197,584**	**205,980**	**226,424**

මූලාශ්‍රය :රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

11 වගුව | විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතය

කි. ග්‍රෑමයට රුපියල්

	අයිතමය	2025 සැප්. අවසානයට	2026 සැප්. අවසානයට
1	හාල්මැස්සන්	100	100
2	අල	80	80
3	රතුඑෑනු	50	50
4	බී - එෑනු	50	50
5	සුදු එෑනු	50	50
6	වටානා - සම්පූර්ණ	5	5
	වටානා - පියලි කළ	10	10
7	කඩල - සම්පූර්ණ	5	5
	කඩල - පියලි කළ	10	10
8	මුං ඇට	300	300
9	මයිසූර් පරිප්පු- සම්පූර්ණ	සත 25	සත 25
	මයිසූර් පරිප්පු - පියලි කළ	සත 25	සත 25
10	මිරිස් - නොඇඹරූ හෝ කුඩු නොකළ	100	100
	මිරිස් - ඇඹරූ හෝ කුඩු කළ	125	125
11	ටින් මාළු	200	200
12	සීනි	50	50
13	උඳු - සම්පූර්ණ	300	300
	උඳු - පොත්ත රහිත	300	300
14	කව්පි	300	300
15	කුරක්කන්	300	300
	මෙනේරි /අනෙකුත්	300	300
16	උම්බලකඩ	302	302
17	කරවල	100	100
18	නැවුම් දොඩම්	600	600
19	නැවුම් මිදි	600	600
20	නැවුම් ඇපල්	600	600
21	කොත්තමල්ලි - නොඇඹරූ හෝ කුඩු නොකළ	26	26
	කොත්තමල්ලි - ඇඹරූ හෝ කුඩු කළ	52	52
22	සූදුරු	162	162
23	මහදුරු	162	162
24	කහ - නොඇඹරූ හෝ කුඩු නොකළ	102	102
	කහ - ඇඹරූ හෝ කුඩු කළ	360	360
25	උළුහාල්	50	50
26	කුරක්කන් පිටි	150	150
27	උඳු පිටි	325	325
28	රටකජු	220	220
29	අබ ඇට	62	62
30	පාම් තෙල්/එළවළු තෙල් - පිරිපහදු නොකළ	250	250
	පාම් ඔලෙයින්	255	255
	පාම් ස්ටියරින්	250	250
	පාම් තෙල්- පිරිපහදු කළ	275	275
	එලවළුතෙල් - පිරිපහදු කළ	275	275
	පාම් මද තෙල් - පිරිපහදු නොකළ	250	250
	පාම් මද තෙල් - පිරිපහදු කළ	275	275
	පොල්තෙල් - පිරිපහදු නොකළ	125	125
	පොල්තෙල් - පිරිපහදු කළ	150	150
31	මාළු	10% හෝ රු. 400	10% හෝ රු. 400
32	මැකරල් මාළු (ජැක්/හෝර්ස් මැකරල්)	6	6
33	යෝගට්	2000	2000
34	බටර්	1500 (අනෙකුත් 2000)	1500 (අනෙකුත් 2000)
35	මාගරින් - මේදය 80%ට වැඩි	650	650
	- මේදය 80% ට අඩු	650	650
36	ලුණු	40 (බදු නිදහස් 30)	40 (බදු නිදහස් -30)
37	රටඉඳි	200	200

කි. ග්‍රෑමයට රුපියල්

	අයිතමය	2025 සැප්. අවසානයට	2026 සැප්. අවසානයට
38	වියලි මිදි	600	600
39	මැංගුස්ටින්	200	200
40	වියලි දොඩම්	125	125
41	පෙයාර්ස්	220	220
42	චෙරි - වෙනත්	315	315
43	ප්ලම්ස් සහ ස්ලෝස්	250	250
44	කිවි පළතුරු	175	175
45	දෙළුම් (වෙනත්)	600	600
46	පෙරන් ගාන ලද පිටි කරන ලද කේජු	600	600
47	ක්ලෙමන්ටයින්ස් - නැවුම්	120	120
48	ක්ලෙමන්ටයින්ස් - වියලි	250	250
49	අනෙකුත් (සිට්‍රස්) පළතුරු - නැවුම්	120	සාමාන්‍ය බදු අනුපාතය 26.11.2025 සිට
50	අනෙකුත් (සිට්‍රස්) පළතුරු - වියලි	250	250
51	ග්‍රේප් පෘට් - නැවුම්	285	285
52	ග්‍රේප් පෘට් - වියලි	300	300
53	දෙහි- නැවුම්	350	350
54	දෙහි - වියලි	400	400
55	අනෙකුත් (සිට්‍රස්) පළතුරු - නැවුම්	300	300
56	අනෙකුත් (සිට්‍රස්) පළතුරු - වියලි	375	375
57	විසස්	350	350
58	ඇප්‍රිකට්	350	350
59	චෙරි - ඇඹුල්	330	330
60	පීචස් සහ නෙක්ටරින්	310	310
61	එලවළු මේදය සහ තෙල්	160	160
62	මාගරින් -දියර	200	200
63	හාල්	65	65
64	බඩ ඉරිඟු	25	50

මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව